271 වන කාණ්ඩය - 11 වන කලාපය
தொகுதி 271 - இல. 11
Volume 271 - No. 11

2019 ජුනි 04 වන අඟහරුවාදා
2019 யூன் 04, செவ்வாய்க்கிழமை
Tuesday, 04th June, 2019

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
කොළඹ වරායේ නැඟෙනහිර බහාලුම් පර්යන්තය ඉන්දියාවට සහ ජපානයට පවරා දීම

**තේ පර්යේෂණ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී.

**කල් තැබීමේ යෝජනාව:**
මුලතිව් සහ මන්නාරම දිස්ත්‍රික්ක සඳහා ක්‍රීඩාංගණ

---

# பிரதான உள்ளடக்கம்

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**
கொழும்புத் துறைமுக கிழக்குக் கொள்கலன் முனையத்தை இந்தியா மற்றும் ஜப்பானுக்குக் கையளித்தல்

**தேயிலை ஆராய்ச்சி சபை (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

**ஒத்திவைப்புப் பிரேரணை:**
முல்லைத்தீவு மற்றும் மன்னார் மாவட்டங்களுக்கான விளையாட்டு மைதானங்கள்

---

# PRINCIPAL CONTENTS

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Handing Over of East Container Terminal at Colombo Port to India and Japan

TEA RESEARCH BOARD (AMENDMENT) BILL:
Read a Second, and the Third time and passed

ADJOURNMENT MOTION:
Stadiums for Mullaitivu and Mannar Districts

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2019 ජූනි 04 වන අඟහරුවාදා***
*2019 யூன் 04, செவ்வாய்க்கிழமை*
*Tuesday, 04th June, 2019*

**අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**[ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் பி.ப.1.00 மணிக்குக் கூடியது.
குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. DEPUTY CHAIRMAN OF COMMITTEES
[THE HON. SELVAM ADAIKKALANATHAN] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සහ තේරීම් කාරක සභාවේ රැස්වීම්
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம் மற்றும் தெரிவுக்குழுக் கூட்டம்
### MEETINGS OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS AND COMMITTEE OF SELECTION

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! "*Wanakkam", "Ayubowan"*!

The Hon. Speaker requested me to inform that he is unable to attend this House today since he is attending the Meeting of the Select Committee to Study and Report to Parliament its Recommendations to Ensure Communal and Religious Harmony in Sri Lanka.

I wish to inform that a Meeting of the Committee on Parliamentary Business will be held today at 3.00 p.m. in the Hon. Speaker's Chamber, and immediately after that, a Meeting of the Committee of Selection will also be held. Therefore, all Members of the respective Committees are kindly requested to be present at those Meetings.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා හා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් ඉදිරිපත් කරමි.

එම වාර්තාව තිරසර සංවර්ධනය සහ පරිසර සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්, මම 2017 වර්ෂය සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්, 2018.02.23 සිට 2018.10.12 දක්වා කාලයට අදාළව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.04.04 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ දෙවැනි වාර්තාවේ සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියා මාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන්, 2016 වර්ෂය සඳහා සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන්, 2018 වර්ෂය සඳහා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව සහ 2018 වර්ෂය සඳහා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තා රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන්, 2014, 2015 සහ 2016 වර්ෂ සඳහා සීමාසහිත ත්‍රිපෝෂ ලිමිටඩ්හි වාර්ෂික වාර්තා මම ඉදිරිපත් කරමි.

එම වාර්තා සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන්, 2013 වර්ෂය සඳහා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන්, 2018 වර්ෂය සඳහා කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා වෙනුවෙන්, 2016 වර්ෂය සඳහා ශ්‍රම වාසනා අරමුදලේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු සෙය්යිඩ් අලි සාහිර් මවුලානා මහතා**
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)

Hon. Deputy Chairman of Committees, I present the Report of the Sectoral Oversight Committee on Business and Commerce on "Companies (Amendment) Bill" and "Performance Report and Annual Accounts of the Department of Registrar of Companies for the year 2017", which were referred to the said Committee.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා (මහවැලි සංවර්ධන හා පරිසර රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும - மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith Mannapperuma - State Minister of Mahaweli Development and Environment)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව සහ ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද, "1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ නියෝග" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවල ඒකාබද්ධ වාර්තාව මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Akila Viraj Kariyawasam - *[Not in the Chamber.]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නුගේගොඩ, ජම්බුගස්මුල්ල මාවත, 9 වැනි පටුමඟ, අංක 16 දරන ස්ථානයෙහි පදිංචි එස්.එම්.එන්. සේනානායක මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා**
(மாண்புமிகு நாலக்க பிரசாத் கொலொன்னே)
(The Hon. Nalaka Prasad Colonne)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පොලොන්නරුව, කුරුප්පු හන්දිය, අංක 595/188 දරන ස්ථානයෙහි පදිංචි කේ.ජී. මල්කාන්ති මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Question No. 1 - 23/'18 - (2), Hon. Hesha Withanage.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Question No. 2 - 76/'18-(2), Hon. Dayasiri Jayasekara - *[Not in the Chamber.]*

## ගුණාත්මක චිත්‍රපට නිෂ්පාදනය: ගනු ලබන පියවර
### சிறந்த திரைப்படத் தயாரிப்பு: நடவடிக்கை
### PRODUCTION OF QUALITY FILMS: STEPS TAKEN

134/'18

**3. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2010 වර්ෂයේ සිට අද දක්වා ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයේ සිටි සාමාජිකයන්ගේ නම් හා ඔවුන්ගේ සේවා කාල සීමා කවරේද;

(ii) එම එක් එක් කාල සීමාව තුළ ප්‍රදර්ශනයට අනුමත කළ සිංහල චිත්‍රපටවල නම් කවරේද;

(iii) එම එක් එක් කාල සීමාව තුළ වාරණයට ලක්වූ සිංහල චිත්‍රපට හා ඒවායේ අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

(iv) එම චිත්‍රපට වාරණය කිරීමට ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය ගත් තීරණවලට හේතු කවරේද;

(v) යහ පාලන රජය යටතේ වාරණයෙන් තොරව ගුණාත්මක සිංහල චිත්‍රපට කලාවක් බිහිකිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணத்துறை மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ)(i) 2010 ஆம் ஆண்டு தொடக்கம் இன்று வரை பகிரங்க அரங்காட்டுகைச் சபையிலிருந்த அங்கத்தவர்களின் பெயர்கள் மற்றும் அவர்களின் சேவைக் கால எல்லைகள் யாவையென்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு காலப்பகுதியிலும் காட்சிப்படுத்தும் பொருட்டு அங்கீகரிக்கப்பட்ட சிங்களத் திரைப்படங்களின் பெயர்கள் யாவையென்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு காலப்பகுதியிலும் தணிக்கைக்கு உள்ளான சிங்களத் திரைப்படங்கள் மற்றும் அவற்றின் இயக்குநர்களின் பெயர்கள் யாவையென்பதையும்;

(iv) குறிப்பிட்ட திரைப்படங்களைத் தணிக்கை செய்யும் பொருட்டு பகிரங்க அரங்காட்டுகைச் சபையினால் மேற்கொள்ளப்பட்ட தீர்மானங்களுக்கான காரணங்கள் யாவையென்பதையும்;

(v) நல்லாட்சி அரசாங்கத்தின்கீழ் தணிக்கைகளற்ற தரமான சிங்களத் திரைப்படக் கலையை உருவாக்குவதற்கு எடுக்கப்படும் நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Cultural Affairs:

(a) Will he inform this House -

(i) the names and periods of service of the members of the Public Performance Board from 2010 up to now;

(ii) the names of the Sinhala films approved for screening during each of those periods;

(iii) the names of the Sinhala films subjected to ban within each of those periods and the names of the directors of those films;

(iv) the reasons for the decisions taken by the Public Performance Board to ban those films; and

[ගරු චමින්ද විජේසිරි මහතා]

(v) the steps taken under the Good Governance Government for the creation of quality Sinhala films free of bans?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඇමුණුම 01 සිට 09 දක්වා ඇත.

(ii) ඇමුණුම 10 සිට 19 දක්වා ඇත.

ඇමුණුම් **සභාගත*** කරමි.

(iii) 2012.08.18 වන දින චිත්‍රපට අධ්‍යක්ෂ ලූවී වැන්ඩස්ට්‍රාටන් මහතාගේ "මිස් ඩයිනමයිට්" චිත්‍රපටය.

මීට අමතරව පාලක මණ්ඩලයට ඉදිරිපත් කරන ලද ප්‍රසන්න විතානගේ මහතාගේ "ඔබ නැතුව ඔබ එක්ක" චිත්‍රපටය පිළිබඳ මතභේදයක් ඇති වීම නිසා තිරගත කිරීම අත්හිටුවන ලදී.

(iv) "මිස් ඩයිනමයිට්" චිත්‍රපයට වාරණය කෙරුණේ අසභ්‍ය දර්ශන හා ග්‍රාම්‍ය දෙබස් අඩංගු බැවිනි. ඒ දෙබස් සහ දර්ශන ඉවත්කොට 2016.06.17 දින යළි මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු "වැඩිහිටියන්ට වඩාත් සුදුසු" වර්ගීකරණය යටතේ ප්‍රදර්ශනයට අවසර දෙන ලදී.

"ඔබ නැතුව ඔබ එක්ක" ප්‍රදර්ශනය අත්හිට වූයේ එවක පාලකයන් ඒ චිත්‍රපටය මඟින් යුද හමුදාවේ මානසිකත්වය බිඳවැටිය හැකි බව උපකල්පනය කළ බැවිනි. 2015 නව පාලක මණ්ඩලය පත් කිරීමෙන් පසු චිත්‍රපටය නැවත සලකා බලන ලෙස අධ්‍යක්ෂ ඉල්ලීමක් කළේය. නව පාලක මණ්ඩලය කිසිදු සංස්කරණයකින් තොරව "වැඩිහිටියන්ට වඩාත් සුදුසු" වර්ගීකරණය යටතේ ප්‍රදර්ශනයට අවසර දුන්නේය.

(v) ගුණාත්මක සිංහල චිත්‍රපට කලාවක් බිහි කිරීම ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය විෂය පථයට අයත් කාර්යයක් නොවේ.

(ආ) අදාළ නොවේ.

ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න තිබෙනවා නම් ඇමතිතුමාට යොමු කරන්න පුළුවන්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු ඇමතිතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයේ කාර්යභාරය ගරු ඇමතිතුමා ලබා දුන් පිළිතුරේ සඳහන් වෙනවා. ගරු ඇමතිතුමනි, අද අපේ රටේ චිත්‍රපට කලාව ගත්තත්, නාට්‍ය කලාව ගත්තත් ඒ සෑම සියලු දෙයම විකෘති වෙලා තිබෙන බව අපි දකිනවා. ඒවා නරඹන සමහර කණ්ඩායම් ඒ විකෘති වූ දේවල් වැලඳ ගනිමින් ඒවා සමාජගත කරන්න උත්සාහ දරනවා. ඉන්දියානු සංස්කෘතිය තමයි බොහෝ වේලාවට මේ චිත්‍රපට තුළ දකින්න ලැබෙන්නේ. ඇත්තටම බැලුවොත් ඒ ඉන්දියානු සංස්කෘතියත් නොවෙයි. ඒ තුළ තිබෙන්නේ වෙනස් වූ වැඩ පිළිවෙළක්. ඒ නිසා අපට ආවේණික අපේ සංස්කෘතිය ආරක්ෂා වෙන සහ රටේ ජනතාවට, රටේ අනාගතයට ගැළපෙන විධියේ යම් කිසි වැඩ පිළිවෙළක් නිර්මාණය විය යුතු බව ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයට අපි යෝජනා කරන්නේ. සමහර අවස්ථාවල අපේ ඉතිහාසයේත් නැති දේවල් පිළිබිඹු වෙන විධියට තමයි ඒ කටයුතු සිද්ධ වන්නේ. ජාතීන් අතර ඇති ප්‍රශ්න අවුල් වන විධියේ චිත්‍රපට නිර්මාණය කිරීමට තමයි උත්සාහ කරන්නේ. හැබැයි ගරු ඇමතිතුමනි, අපේ ඉතිහාසයේදී එහෙම සිදු වෙලා නැහැ. ඒ නිසා කාලීන වශයෙන් මේ රටේ උද්ගත වී තිබෙන ප්‍රශ්නත් එක්ක බැලුවාම, අපේ රටේ සමගිය ඇති වන, ජාතීන් අතර ප්‍රශ්න ඇති නොවන විධියේ චිත්‍රපට නිෂ්පාදනය විය යුතුයි කියන කාරණය අපි දකිනවා. මේ සඳහා විශේෂ අවධානය යොමු කරන වැඩ පිළිවෙළක් ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයට තිබෙනවාද කියන කාරණය තමයි මට දැන ගන්න අවශ්‍ය වී තිබෙන්නේ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

මෙම අතුරු ප්‍රශ්නය ගරු ඇමතිතුමාට ඉදිරිපත් කරලා ලිඛිත පිළිතුරක් ලබා දෙන්නම්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු ඇමතිතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා අහනවා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා ඉදිරිපත් කර තිබෙන ප්‍රශ්නයේ අතිශයින් වැදගත් කාරණා කිහිපයක් අඩංගු වෙනවා. ජනමාධ්‍ය අමාත්‍යවරයා විධියට කටයුතු කර තිබෙන අපේ ගයන්ත කරුණාතිලක ඇමැතිතුමා මේ ප්‍රශ්නයට උත්තර දීමේ දී ගැටලුවක් ඇතිවන එකක් නැහැ කියලා මා හිතනවා. මේ රටේ චිත්‍රපට ක්ෂේත්‍රය වාගේම, ටෙලි නාට්‍ය ක්ෂේත්‍රය තුළත් රටට හෙළි නොවන මහා විශාල ප්‍රශ්නයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ ප්‍රශ්නය තමයි ටෙලි නාට්‍යයක් නිෂ්පාදනය කරන දේශීය කර්මාන්තකරුවාට, චිත්‍රපටයක් නිෂ්පාදනය කරන දේශීය කර්මාන්තකරුවාට එය ජාතික නාළිකාවක, එහෙම නැත්නම් ජාතික චිත්‍රපටි සංස්ථාවේ ප්‍රදර්ශනය කරගන්න නම්, අනිවාර්යයෙන්ම වෙනම අල්ලසක් ගෙවන්න සිදු වෙනවා. චිත්‍රපට කර්මාන්තයේ යෙදී සිටින ඕනෑම අධ්‍යක්ෂවරයකුගෙන්, ඕනෑම නිෂ්පාදකවරයකුගෙන් ඒ සම්බන්ධයෙන් ඇහුවොත් එය දැන ගන්න පුළුවන්. දේශීය නාළිකාවල ප්‍රදර්ශනය වන සමහර ටෙලි නාට්‍ය සඳහා දිනකට රුපියල් ලක්ෂ දෙකක මුදලක් ලැබෙනවා නම්, රුපියල් 25,000ක්, රුපියල් 30,000ක් හෝ සමහර විට රුපියල් 50,000ක් ඒ වෙනුවෙන් මැදිහත්වන මැදිහත්කරුවාට ඒ කර්මාන්තකරුවා විසින් ගෙවන්න ඕනෑ. ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමා ජනමාධ්‍ය අමාත්‍යවරයා වශයෙන් සිටි කාලයේ අපි ඒ සම්බන්ධයෙන් පැමිණිලි කළාම, එතුමා ඇවිල්ලා අප සමඟ සාකච්ඡා කළා. පසුගිය කාලයේ ජාතික චිත්‍රපට සංස්ථාවේත්, චිත්‍රපට කර්මාන්තයේත් යෙදී සිටි ප්‍රසිද්ධ ශිල්පියකුගේ, නළුවකුගේ ඕනෑකමට තමයි සියලුම චිත්‍රපට ප්‍රදර්ශනය සඳහා දින වකවානු තීන්දු වුණේ කියලා අපි දැක්කා. ගුණාත්මක චිත්‍රපට පිටිපස්සට යනවා. ගුණාත්මකභාවයද, එහෙම නැත්නම් චිත්‍රපටයේ

---

* **පුස්තකාලයේ තබා ඇත.**
* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* *Placed in the Library.*

තිබෙන ජනතා වැලඳ ගැනීමට එහා ගිය දේශපාලනයද, - [බාධා කිරීමක්] නළුවා කවුද කියලා දැනගන්න ඕනෑ නම් මා ඔබතුමාට ඒ ගැන පසුව කියන්නම්. මා කැමැති නැහැ, මේ සභාවේ නම් කියලා කාටවත් මඩ ගහන්න. මා හිතන හැටියට රටම ඒ ගැන දන්නවා. ඒ තත්ත්වයට මේ කර්මාන්තය වැටෙන්න දෙන්නේ නැතුව, වර්තමානයේ මේ වෙනුවෙන් මැදිහත් වීමක් කරන්න අමාත්‍යාංශය කටයුතු කරනවාද?

ඒ වාගේම මා ඔබතුමාට කියනවා, මට අදටත් මේ පිළිබඳව සැකයක් තිබෙන බව. ටෙලි නාට්‍ය කර්මාන්තයේ මේ තත්ත්වය අඩුවැඩි වශයෙන් සිද්ධ වෙනවා. මේ කර්මාන්තය සිදු කරන යම් පිරිසක් ඉන්නවා. ඒ නිසා මේක නතර කරලා, චිත්‍රපට අධ්‍යක්ෂවරුන්ට, නිෂ්පාදකවරුන්ට කාගේවත් පිටුපස යන්නේ නැතිව, වටිනාකමක් තිබෙන, ගුණාත්මකභාවයෙන් වැඩි, ජනතාව වැලඳ ගන්නා නිර්මාණවලට අවස්ථාවක් දෙන්න අමාත්‍යාංශය යම් පියවරක් ගන්නවාද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

අපි ඒක ගරු සජිත් ප්‍රේමදාස ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. ඒ වාගේම ඔබතුමා ජාතික නාළිකා ගැනත් කිව්වා. කාලයක් එවැනි තත්ත්වයක් තිබුණා. නමුත් අපේ රජය බලයට පත් වුණු ගමන්, මම තමයි එම විෂය භාර ඇමති වුණේ. ඒ කාලයේ නම් අපි ඒක සම්පූර්ණයෙන්ම පාලනය කළා. එහෙම දීමනා ලබා දීම අපි නතර කළා. අපි විද්වත් කමිටුවක් පත් කරලා, එම කමිටුවේ නිර්දේශ අනුව තමයි තෝරා ගත්තේ. අපි අදාළ අමාත්‍යවරයාට මෙය යොමු කරන්නම්.

## ග්ලයිෆොසේට් තහනම ඉවත් කිරීම : හේතු
## கிலைபோசெட் தடை நீக்கம்: காரணங்கள்
## LIFTING OF GLYPHOSATE BAN: REASONS

219/'18

**4. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2) :

(අ) (i) ග්ලයිෆොසේට් තහනම් කිරීමට රජය තීරණය කළ දිනය කවරේද;

(ii) ඒ සඳහා බල පෑ හේතු කවරේද;

(iii) එම තහනම සඳහා නිර්දේශ ඉදිරිපත් කළ විද්වත් සංවිධාන හෝ පුද්ගලයන් කවුරුන්ද;

(iv) ග්ලයිෆොසේට් තහනම ඉවත් කිරීමට රජය තීරණය කළ දිනය කවරේද;

(v) ඒ සඳහා බල පෑ හේතු කවරේද;

(vi) තහනම ඉවත් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කළ විද්වත් සංවිධාන හෝ පුද්ගලයන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள் அபிவிருத்தி, நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரகவள மூலங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கிலைபோசெட்டை தடைசெய்ய அரசாங்கம் முடிவுசெய்த திகதி யாது;

(ii) அதில் தாக்கம் செலுத்திய விடயங்கள் யாவை;

(iii) மேற்படி தடைக்கென சிபாரிசுகளை முன்வைத்த நிபுணர் அமைப்புக்கள் அல்லது நபர்கள் யாவர்;

(iv) கிலைபோசெட் தடையை நீக்க அரசாங்கம் முடிவு செய்த திகதி யாது என்பதையும்;

(v) அதில் தாக்கம் செலுத்திய விடங்கள் யாவை;

(vi) தடையை நீக்குவதற்கென சிபாரிசுகளை முன்வைத்த நிபுணர் அமைப்புக்கள் அல்லது நபர்கள் யாவர்;

என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock Development, Irrigation and Fisheries and Aquatic Resources Development :

(a) Will he inform this House-

(i) the date on which the government decided to ban glyphosate;

(ii) the reasons for taking such a decision;

(iii) the organizations of experts or individuals who made recommendations for that ban;

(iv) the date on which the government decided to lift the ban on glyphosate;

(v) the reasons for taking such a decision; and

(vi) the organizations of experts or individuals who made recommendations for lifting that ban?

(b) If not, why?

**ගරු පී. හැරිසන් මහතා (කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. ஹரிசன் - கமத்தொழில், கிராமியப் பொருளாதார அலுவல்கள், கால்நடை வளங்கள் அபிவிருத்தி, நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரகவள மூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. P. Harrison - Minister of Agriculture, Rural Economic Affairs, Livestock Development, Irrigation and Fisheries and Aquatic Resources Development)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2015.05.27 දින (අංක:අමප/15/0657/617/016 හා 2015.05.27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව)

(ii) ශ්‍රී ලංකාවේ ඇතැම් ප්‍රදේශවල ග්ලයිෆොසේට් වල් නාශකය සහ නිදන්ගත වකුගඩු රෝගය අතර සම්බන්ධතාවක් ඇති බවට නිරීක්ෂණය වීම.

(iii) මේ පිළිබඳව සමාජයේ විවිධ පාර්ශ්වයන්ගෙන් කරුණු ඉදිරිපත් විය. එම කරුණු ඉදිරිපත් කළ අය පිළිබඳ තනි පුද්ගල වශයෙන් හෝ සංවිධාන වශයෙන් ලිඛිත කරුණු එකතු කිරීමක් සිදු වී නැත.

(iv) 2018.05.09 දින (අංක: අමප/18/0925/801/004 හා 2018.05.09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව)

(v) වැවිලි ක්ෂේත්‍රය තුළ ග්ලයිෆොසෙට් වල් නාශකය සීමිත තත්ත්ව යටතේ භාවිත කිරීම සහ ග්ලයිෆොසෙට් තහනම මඟින් ශ්‍රී ලංකාවේ කෘෂි

[ගරු පී. හැරිසන් මහතා]

කාර්මික හා වැවිලි අංශයන්ට සිදු වූ බලපෑම යන මැයෙන් යුතු 2018 මාර්තු මස 27 වන දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පත් කළ විශේෂඥ කමිටුවේ නිර්දේශ අනුව අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සන්දේශයට ලබා දී ඇති 2018 මැයි 09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මාස 36ක කාල පරිච්ඡේදයක් සඳහා තේ සහ රබර් ක්ෂේත්‍ර සඳහා පමණක් ග්ලයිෆොසෙට් මත පනවා ඇති තහනම ඉවත් කරන ලදී.

(vi) ඔව්. ඇමුණුම 01හි දැක්වේ.

**ඇමුණුම 01**

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර හා ආයතනය | කමිටුවේ දරන නිලය |
|---|---|---|---|
| 01 | බී. විජයරත්න මහතා | ලේකම් - කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | කැඳවුම්කරු |
| 02 | ආචාර්ය ප්‍රියන්ත වීරසිංහ මහතා | අධ්‍යක්ෂ - උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය | සාමාජික |
| 03 | ආචාර්ය ජේ.ඒ. සුමිත් මහතා | පලිබෝධනාශක රෙජිස්ට්‍රාර් | සාමාජික |
| 04 | ආචාර්ය ලක්ෂ්මන් අමරසිංහ මහතා | විශ්‍රාමලත් අධ්‍යක්ෂ - ක්ෂේත්‍ර භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය | සාමාජික |
| 05 | මහාචාර්ය බුද්ධි මාරඹේ මහතා | වල් පැළෑටි විශේෂඥ - කෘෂි විද්‍යා පීඨය - පේරාදෙනිය | සාමාජික |
| 06 | ආචාර්ය අයි.එස්.බී. අබේසිංහ මහතා | අධ්‍යක්ෂ - තේ පර්යේෂණ ආයතනය | සාමාජික |
| 07 | ආචාර්ය එල්.එස්.කේ. හෙට්ටිආරච්චි මහතා | අතිරේක අධ්‍යක්ෂ - තේ පර්යේෂණ ආයතනය | සාමාජික |
| 08 | ආචාර්ය ජී.ජී. ජයසිංහ මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ - පර්යේෂණ, අපනයන භෝග දෙපාර්තමේන්තුව | සාමාජික |
| 09 | ආචාර්ය කුමුදුනී ගුණසේකර මහත්මිය | කෘෂි ව්‍යාපාර විශේෂඥ - ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය | සාමාජික |
| 10 | ඩී.ඒ. පෙරේරා මහතා | සභාපති - කුළු බඩු සභාව | සාමාජික |
| 11 | මහාචාර්ය සරත් ගුණතිලක මහතා | | සාමාජික |
| 12 | මහාචාර්ය ශාන්ති මෙන්ඩිස් මහත්මිය | | සාමාජික |
| 13 | ආචාර්ය රනිල් සේනානායක මහතා | | සාමාජික |

(ආ) අදාළ නොවේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු ඇමතිතුමනි, බොහොම ස්තුතියි. මම මේ වෙලාවේ ග්ලයිෆොසෙට් වකුගඩු රෝගය හා සම්බන්ධද, නැද්ද කියන එකට හේතුවක් දෙන්න යන්නේ නැහැ. නමුත් ඔබතුමාම කියන විධියට 2015 මැයි මාසයේ දී ග්ලයිෆොසෙට් තහනම් කිරීමට හේතුව, වකුගඩු රෝගය ඇතිවීම සඳහා මෙය බලපානවාය කියලා ඔබතුමා විශ්වාස කළ නිසා. කවර සංවිධානද, කවර විශේෂඥයන්ද මේක කියලා තිබෙන්නේ කියලා මම ඇහුවාම, ඔබතුමාට ඒ සම්බන්ධයෙන් කියන්න බැරි වුණා. හැබැයි, ඊට හරියටම අවුරුදු තුනකට පස්සේ ඔබතුමන්ලා ඒ තහනම ඉවත් කරනවා. එතකොටත් ඒක නිර්දේශ කළේ කවුද, මොන විශේෂඥයෝද, මොන වාර්තාවෙන්ද කියලා කියන්න බැරි වුණා. ගරු ඇමතිතුමනි, මම අහන්නේ මේකයි. අපේ රටේ ජනතාව කන - බොන, අඳින - පළඳින දේවලින් කොටසක් බදු හැටියට භාණ්ඩාගාරයට යවනවා. විද්‍යාව උගන්වා, උපාධි සහ පශ්චාත් උපාධි ලබා දීලා මේ ක්ෂේත්‍රවලට විශේෂඥයන් පත් කර ගන්නවා; නම් කර ගන්නවා; හදා ගන්නවා.

ඒ ගොල්ලන් ආචාර්යවරු, මහාචාර්යවරු දක්වා ඉගෙන ගන්නවා. මේ තීන්දු ගැනීමේදී ඒ අයගේ උපදෙස්, ඒ විශේෂඥතාව සැලකිල්ලට ගන්නේ නැද්ද? ඒ කියන්නේ, අවුරුදු තුනකට පස්සේ ග්ලයිෆොසෙට් තහනම ඉවත් කරනකොට, වකුගඩු රෝගයට ඒකේ තිබුණු සම්බන්ධය නැහැය කියා තහවුරු වෙලාද එය අයින් කළේ, එහෙම නැත්නම් තමුන්නාන්සේට එල්ල වුණු වෙනත් බලපෑමක් නිසා එසේ කළාද? ග්ලයිෆොසෙට් තහනම් කළේත්, ඒ තහනම ඉවත් කළේත් කවර විද්‍යාත්මක හේතුවක් මතද කියන එකයි මම අහන්නේ, ගරු ඇමතිතුමනි.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ගැන සොයා බලන්න කැබිනට් මණ්ඩලය විසින් විශේෂඥ අනුකමිටුවක් පත් කළා. එම අනුකමිටුවේ තීන්දුව අනුව තමයි, තේ සහ රබර් වගාවට පමණක් සීමාවන ආකාරයෙන් මාස තිස්හයක කාලයක් සඳහා ග්ලයිෆොසෙට් තහනම ඉවත් කර තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

එසේ තහනම් කරනකොට අදාළ කරගත් විශේෂඥ වාර්තාව මොකක්ද කියන එකයි මම ඔබතුමාගෙන් ඇහුවේ.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

විවිධ පාර්ශ්වයන්ගෙන් නැඟුණු චෝදනා සහ යෝජනා අනුව එය තහනම් කිරීමකට ලක් කර තිබෙනවා. මොකද, වකුගඩු රෝගය හා සම්බන්ධයි කියන නිර්ණායක මත තමයි ඒ තහනම පනවා තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු ඇමතිතුමනි, ඒ වාර්තා මොනවාද, ඒවායේ තිබෙන කරුණු මොනවාද, ඒවා ඉදිරිපත් කළේ කවුද, ඒ පුද්ගලයන් කවර විශ්වවිද්‍යාලයට, කවර ක්ෂේත්‍රවලට සම්බන්ධයිද කියන එක මේ රට දැනගන්නට ඕනෑ. මේ රටේ බොහෝ වෙලාවට සිදු වන්නේ මොකක්ද? විශේෂඥ මතය පැත්තක තිබෙනවා. එක්කෝ විශේෂඥයන් ඒවා කියන්නේ නැහැ. වෙන වෙන අය නොයෙක් කරුණු කාරණා කියනවා. අන්තිමට ජනතාව තුළ මහා භීතියක් ඇති කරන තුරු තමුන්නාන්සේලා සද්ද නැතිව ඉන්නවා. ග්ලයිෆොසෙට් කියන එකත් එක හේතුවක්. ඇස්බැස්ටෝස් සම්බන්ධයෙනුත් මේ ප්‍රශ්නයම තිබෙනවා. මම ඒ ප්‍රශ්නයත් අහලා තිබෙනවා. එම නිසා, මේවා තහනම් කරන්න හෝ ඉවත් කරන්න

හේතු වුණු විද්‍යාත්මක සාක්ෂි සහ ඒ වාර්තා පුද්ගලයන්ගේ නම් සමඟ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නය කියා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ඔබතුමා ඒ පිළිබඳව වෙනත් ප්‍රශ්නයක් ඇහුවොත්, ඒ සංවිධාන සහ පුද්ගලයන්ගේ තොරතුරු ඇතුළත් විස්තරාත්මක පිළිතුරක් අපට ලබාදෙන්න පුළුවන්.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

අමුතුවෙන් ප්‍රශ්නයක් අහන්න ඕනෑ නැහැ, ගරු ඇමතිතුමනි. මේ ප්‍රශ්නයේ, (අ) හි (iii) සහ (vi) කොටස්වලින් මම අසා තිබෙන්නෙත් මේ විද්වතුන්, පුද්ගලයන් කවුද, එහෙම නැත්නම් ඒ සංවිධාන මොනවාද කියන එකයි. "මෙන්න මේ අහවල් පුද්ගලයා මේ වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා, ඔහුගේ පරීක්ෂණ වාර්තාව මේක, ඔහු අහවල් විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙක්" කියා අඩු ගණනේ ඔබතුමා ඒ නම් ටික හෝ කියනවා නම්, අපට මේ කරුණු කාරණා තේරුම් ගන්න පුළුවන්.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ විධියට විස්තර වාර්තාවක් එක්ක එතුමා නැවත ප්‍රශ්නය ඇහුවොත්, ඒ අයගේ නම්, තනතුරු, ඉන්න විශ්වවිද්‍යාල සහ ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු ලබාදෙන්න මට පුළුවන්. එතුමා අසන ලද ප්‍රශ්නයට තමයි මේ පිළිතුර දීලා තිබෙන්නේ.

## විල්ගමුව ප්‍රදේශයේ වැලි ගොඩ දැමීම : පාරිසරික හානිය
## வில்கமுவ பிரதேசத்தில் மணல் அகழ்தல்: சுற்றாடல் பாதிப்பு
## SAND MINING AT WILGAMUWA AREA : ENVIRONMENTAL IMPACT

240/'18

5. **ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මහවැලි ගඟේ වැලි ගොඩ දැමීම සඳහා විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බලපත්‍ර ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුද්ගලයන්ගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) මෙම බලපත්‍ර ලබා දීම හේතු කොට ගෙන විල්ගමුව ප්‍රදේශයේදී මහවැලි ගඟට විශාල පාරිසරික හානියක් සිදුවන බව පිළිගන්නේද;

(iv) එසේ නම්, එම හානිය වැළැක්වීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள், பொருளாதார அலுவல்கள், மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு மாகாண அபிவிருத்தி மற்றும் இளைஞர் அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) மகாவலி கங்கையில் மணல் அகழ்வுக்காக வில்கமுவ பிரதேச செயலகத்தினால் அனுமதி பத்திரங்கள் வழங்கப்பட்டுள்ள நபர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி நபர்களின் பெயர்கள், முகவரிகள் மற்றும் தொலைபேசி இலக்கங்கள் யாவையென்பதையும்;

(iii) மேற்படி அனுமதிப்பத்திரங்கள் வழங்கியமை காரணமாக வில்கமுவ பிரதேசத்தில் மகாவலி நதிக்கு பாரிய சுற்றாடல்சார் பாதிப்பு ஏற்படுகின்றதென்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iv) ஆமெனில், அப்பாதிப்பை நிறுத்த அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies, Economic Affairs, Resettlement and Rehabilitation, Northern Province Development and Youth Affairs:

(a) Will he inform this House-

(i) the number of persons to whom permits have been issued by the Wilgamuwa Divisional Secretary's Division to engage in sand mining in the Mahaweli River;

(ii) the names, addresses and the contact numbers of the aforesaid persons;

(iii) whether it is admitted that an adverse environmental impact is caused to the Mahaweli river along the Wilgamuwa area as a repercussion of the issuance of these sand mining permits; and

(iv) if so, the steps that will be taken by the Ministry to avert this destruction?

(b) If not, why?

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 2017.01.01 දින සිට 2019.05.23 දින දක්වා නිකුත් කර ඇති වලංගු වැලි කැනීම් බලපත්‍ර සංඛ්‍යාව 297ක් වන අතර, එම බලපත්‍ර සියල්ලම එම ස්ථානයට අදාළව මධ්‍යම පරිසර අධිකාරිය මඟින් නිකුත් කරනු ලබන පාරිසරික නිර්වුල් සහතිකය, ප්‍රාදේශීය ලේකම් නිර්දේශය සහ අදාළ අනෙකුත් නිර්දේශ සම්පූර්ණ වූ ලිපිගොනුවලට

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

අදාළව, කැනීම් ඉංජිනේරු විසින් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කර නිකුත් කර ඇති බව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් වාර්තා කර ඇත.

ඉහත බලපත්‍ර අතරින් 2019.05.22 දින වන විට බලපත්‍ර 67ක් වලංගුව පවතින බව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් වාර්තා කර ඇත.

(ii) බලපත්‍ර ලබා දී ඇති පුද්ගලයන්ගේ තොරතුරු ඇමුණුම 01 ලෙස ඉදිරිපත් කරන අතර, එම බලපත්‍ර අතරින් දැනට වලංගු තත්ත්වයේ පවතින බලපත්‍ර පිළිබඳ තොරතුරු ඇමුණුම 02 ලෙස ඉදිරිපත් කරමි.

ඇමුණුම් **සභාගත*** කරමි.

(iii) වැලි ගොඩ දැමීම නිසා අනිවාර්යයෙන්ම පාරිසරික හානියක් සිදු වෙනවා.

රටේ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ගොඩනැඟිලි ද්‍රව්‍යයක් වන වැලි සඳහා ඉහළ ඉල්ලුමක් පවතින අතර, මෙතෙක් විල්ගමුව ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික තත්ත්වය ඉහළ මට්ටමකට ගෙන ඒමට මහවැලි නදිය ඉවහල් වී ඇත.

ගංගාවල වැලි කැනීම ස්වාභාවික පරිසරය වෙනස් කිරීමට හේතු වන නමුත්, රටේ සංවර්ධනය හා මිනිස් අවශ්‍යතා සඳහා එය තිරසාර ලෙස ප්‍රයෝජනය ගැනීම උදෙසා පරිසරයට අවම හානියක් වන පරිදි බලපත්‍ර නිකුත් කිරීම සිදු කරනු ලබයි. බලපත්‍රයක් නිකුත් කිරීම මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ, ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ සහ අවශ්‍ය පරිදි වාරිමාර්ග හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යනාදී ආයතනයන්හි නිර්දේශයන්ට යටත්ව සිදු කරනු ලබයි. පාරිසරික හානි අවම වන පරිදි කැනීම් කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය වන කොන්දේසි පැනවීම ඒ ඒ කැනීම් ස්ථානයන්ට අදාළව සෑම බලපත්‍රයකම පසු පිටෙහි සිදු කර ඇත.

කෙසේ වෙතත්, අනවසර කැනීම් සිදු කරන්නන් විසින් කරනු ලබන ක්‍රියා හේතුවෙන් සිදු වන හානිදායක තත්ත්වයන් වැළැක්වීමට පොලීසිය හා විශේෂ කාර්ය බලකායේ සහයෝගය ඇතිව නීති මඟින් කටයුතු සිදු කර ඇති බව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් වාර්තා කර ඇත.

(iv) අනවසර වැලි කැනීම්වලින් සිදු වන හානිය වැළැක්වීමට මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයක් වන භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මඟින් පහත ක්‍රියාමාර්ග ගනු ලැබේ.

කිසියම් පුද්ගලයකු විසින් කැණීම් බලපත්‍රයක් ලබා ගැනීමට ඉල්ලුම් කරනු ලබන මංකඩට අදාළව බලපත්‍රයක් නිකුත් කිරීමේ දී,

* එම ස්ථානයට අදාළව මධ්‍යම පරිසර අධිකාරිය මඟින් නිකුත් කරනු ලබන පාරිසරික නිරවුල් සහතිකය, ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය, අවශ්‍ය නම් අදාළ අනෙකුත් ආයතනවලින් ද - වාරිමාර්ග දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපර්තමේන්තුව වැනි ආයතනවල නිර්දේශ- ලබා ගනු ලබන නිර්දේශ මත පදනම්ව කැණීම් බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු සිදු කරනු ලැබේ.

  විධිමත් කැණීම් බලපත්‍රයක් නිකුත් කිරීමෙන් අනතුරුව බලපත්‍රය මඟින් පනවා ඇති කොන්දේසි පදනම් කර ගනිමින් කැණීම් කටයුතු පවත්වාගෙන යෑමේ දී එම ස්වාභාවික තත්ත්වයන් වෙනස් වීමකට ලක් වීම අවම කිරීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් විවිධ ක්‍රියා මාර්ග ගෙන ඇති අතර, ඒවා පහත පරිදි වේ.

* විල්ගමුව නිපෝන් පාලම ආශ්‍රිතව සිදුවන හානි අවම කිරීම සඳහා නිපෝන් පාලමේ සිට මීටර 500ත් කිලෝමීටර 01ත් අතර සීමාවෙහි නිකුත් කර තිබූ බලපත්‍ර 22ක් අවලංගු කිරීම හා කැණීම් මුක්ත කලාපයක් ලෙස හඳුනා ගැනීම.

* ශිල්පීය කැණීම් (අ) වර්ගයේ බලපත්‍රයක් යටතේ මසකට වැලි කියුබ් 210ක් ගොඩ දැමීමට අවසර දී තිබූ අතර, එය වර්තමානයේ ඇති සංචිත අනුව කියුබ් 75ක් දක්වා අඩු කිරීම සහ විශේෂ කොන්දේසි පැනවීම.

* විවිධ අවස්ථාවන්හිදී ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ සහ විශේෂ කාර්ය බලකායේ සහයෝගය ඇතිව වැටලීම් සිදුකොට අනවසර කැණීම් කටයුතු සිදු කරන්නන්ගේ මංකඩ අත් හිටුවීම.

* කොන්දේසි කඩ කරමින් විවිධ අක්‍රමිකතාවන් සිදු කරනු ලබන මංකඩවලට අදාළ කැණීම් කටයුතු සහ ප්‍රවාහන කටයුතු නවතා දැමීම.

* බලපත්‍රයේ සඳහන් කොන්දේසින්ට අනුව මංකඩ සකස් කර නොමැති ස්ථානවලට අදාළ බලපත්‍ර අත් හිටුවීම

* වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිර්දේශයන්ට යටත්ව මාස 03කට පමණක් වලංගු වන පරිදි භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් වැලි කැණීම් බලපත්‍ර නිකුත් කිරීම.

* ගැසට් අංක 1628/30 යටතේ, 2009.11.18 දින රක්ෂිත වනාන්තරයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද මහවැලි ගඟේ මාරක රක්ෂිතය ආශ්‍රිතව වැලි මංකඩට ප්‍රවේශ වන මාර්ග භාවිත කරන බලපත්‍රලාභීන් සම්බන්ධයෙන් බලපත්‍ර නිකුත් කිරීම එම ආයතනයේ නිර්දේශයට යටත්ව සිදු කිරීම සඳහා කටයුතු කිරීම.

* තවද, විවිධ අක්‍රමිකතාවන් නිසා උසාවියේ නඩු කටයුතුවලට අදාළ බලපත්‍ර අත්හිටුවීමට කටයුතු කිරීම.

* "හරිත තොටුපළක්" සංකල්පය යටතේ මංකඩ සකස් කිරීම.

* පුනරුත්ථාපන කටයුතු සඳහා සහ රුක් රෝපණ කටයුතු සඳහා බලපත්‍රලාභීන් පෙලඹවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

* මාසික ක්ෂේත්‍ර පරීක්ෂණ හරහා අවිධිමත් කැනීම් කටයුතු සිදු කරන බලපත්‍රයන්ට අදාළව ප්‍රවාහන බලපත්‍ර අත්හිටුවීමට කටයුතු කිරීම.

---

***** ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

* එසේම විශේෂ ක්‍රියා මාර්ගයක් වශයෙන් වර්තමානයේදී "සියලුම වැලි බලපත්‍රවලට අදාළ හරිත තොටුපළක් සංකල්පය" යටතේ විල්ගමුව ප්‍රදේශයේද කටයුතු කරන අතර, ඒ මඟින් සියලුම මංකඩ බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට අදාළව තිරසර අයුරින් සිදු කිරීම සඳහා දැනුවත් කිරීම් සහ පෙලඹවීම සිදු කරන අතර, නිසි ලෙස මෙම ක්‍රමවේදය අනුගමනය නොකරන බලපත්‍රලාභීන්ගේ බලපත්‍ර අහෝසි කිරීම සඳහා අවශ්‍ය කටයුතු ද, නිසි ලෙස කැනීම් සිදු කරනු ලබන බලපත්‍රලාභීන් ඇගයීම සහ දිරිමත් කිරීමට කටයුතු ද සිදු කෙරෙමින් පවතී.

(ආ) පැන නොනඟී.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය. මේ ප්‍රශ්නය සෑහෙන කාලයකට පෙරයි ඉදිරිපත් කළේ. නමුත්, මේ කාලයේ හෝ පිළිතුරක් ලැබීම ගැන මම සතුටු වෙනවා. මොනවා වුණත් විල්ගමුව ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රධාන ආර්ථික උපාය මාර්ග වන්නේ වැලි ගොඩ දැමීමයි. ඒක අපි පිළිගන්නවා. නමුත්, මෙතැන ගැටලුවක් තිබෙනවා ගරු රාජ්‍ය ඇමතිතුමනි. ඔබතුමා දන්නවාද දන්නේ නැහැ. එක මංකඩකට බලපත්‍ර කිහිපයක් නිකුත් කරනවා.

ඒ තුළ, 75ක, 100ක කියුබ් ප්‍රමාණයකට ඔබතුමන්ලා සීමා කරන්නට හැදුවාට, ඒක එහෙම සිදු වන්නේ නැහැ. ඒකේදී, "A," "B," "C" කියා එක මංකඩට බලපත්‍ර කිහිපයක් නිකුත් කරනවා. ඊළඟ කාරණාව මෙයයි. බොහෝ රජයේ සේවකයන්ට එහි එක මංකඩක් නොව එක එක්කෙනාගේ නම්වලින් අරගෙන මංකඩවල් කිහිපයක් තිබෙනවා. මම හැම දාම කථා කළේ මේ කාරණයයි. විල්ගමුව ප්‍රදේශයේ සැබෑ ලෙස ජීවත් වෙන අයට එහි මංකඩවල් නැහැ. බොහෝ විට ඒ මංකඩවල් තිබෙන්නේ එහි සිටින රජයේ සේවකයන්ටත් ඒ වාගේම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ බොහෝ නිලධාරීන්ටත්ය. ඒ පිළිබඳව ඔබතුමා සොයා බැලීමක් කරන්න කියන ඉල්ලීම කරනවා.

මගේ අතුරු ප්‍රශ්න මෙයයි. විල්ගමුව ප්‍රදේශය වාගේම මනම්පිටිය ප්‍රදේශයෙත් වැලි ගොඩ දැමීම ජීවිකාව කර ගත්ත පිරිසක් සිටිනවා. නමුත් එහි ජාවාරමක් සිදු වෙන බව ප්‍රකාශ වෙනවා. එක පෞද්ගලික ආයතනයක් මුල් කරගෙන රාජ්‍ය අනුග්‍රහයෙන් සිදු වෙන බව කියනවා. ඒ පිළිබඳව ඔබතුමා මේ ගරු සභාවට පැහැදිලි කිරීමක් කරන්න කියන එක මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය හැටියට මම ඉල්ලා සිටිනවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

මනම්පිටිය වැලි ජාවාරමක් සිදු වෙනවා. දැන් ඔබතුමිය ප්‍රකාශ කළා වාගේ මනම්පිටිය විතරක් නොවෙයි, විල්ගමුවේත් වැලි කැනීම් අයගේ විවිධ ජාවාරම් සිදු වෙනවා. විශේෂයෙන්ම මනම්පිටිය වැඩිපුර ජාවාරම් සිදු වෙනවා. ඒ සඳහා සමීක්ෂණ කමිටුවක් පත් කර ඒ ගැන හොයලා බලලා වාර්තාවක් ලබා දෙන්න අමාත්‍යාංශයෙන් කටයුතු කරනවා. ඉදිරියේදී ඒක අපට ලැබෙයි. ප්‍රශ්නයක් වශයෙන් මීට පෙරත් ඒ ගැන අහලා තිබෙනවා. ඒ වාර්තාවත් සමඟ තමයි, ඒකට උත්තරය දෙන්න වෙන්නේ. දැන් වාර්තාව ලැබෙමින් පවතිනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

වැලි කියුබ් ලක්ෂ 30ක් ගෙන්වලා තිබෙනවා කියන එකත් මම කියනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දෙවෙනි අතුරු ප්‍රශ්නය ගරු අනුර සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමා විසින් අසනවා ඇති.

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අතුරු ප්‍රශ්නයක් අහන්නට අවසරයි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, විශේෂයෙන්ම මනම්පිටියේ වැලි ගොඩ දැමීම ගැනයි අහන්නේ. මීට පෙර මනම්පිටියේ වැලි ගොඩ දාලා ජීවත් වුණේ පුද්ගලයන් 100ක පමණ ප්‍රමාණයක්. දැන් මනම්පිටියේ 200කට ආසන්න පුද්ගලයන් සංඛ්‍යාවක් ඉන්නවා, වැලි ගොඩ දාලා ජීවත් වන. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට සම්බන්ධ ආයතනයක් මනම්පිටියේ වැලි ගොඩ දැමීම සම්බන්ධ භාරකාරිත්වය අරගෙන තිබෙනවා. මේ ස්ථානයේ මේ වෙනකොට ලොකු මාෆියාවක් සිද්ධ වෙනවා ගරු රාජ්‍ය ඇමතිතුමනි. එම මාෆියාව තමයි, සමහර පුද්ගලයන්ට මෙතැනින් වැලි ටිපර් එකක් ගන්න සති දෙකක් විතර ඉන්න සිදු වුණත්, මෙතැන ඉන්න අයට යම් ගාස්තුවක් ගෙව්වොත් එක පැයෙන් වැලි ගන්නට පුළුවන් වීම. මම මේ තොරතුරු සියල්ල සොයා ගත්තා.

ඊට අමතරව ප්‍රබල පුද්ගලයකුගේ සහෝදරයෝ කිහිප දෙනෙකුට මෙතැනින් දවසකට වැලි ලොරි 40ක්, 50ක් ලබා දෙනවා. [බාධා කිරීම්] ඒක නිසා- [බාධා කිරීම්] මම කියන්නම්, අරලිය සමාගමටයි, "කේඑම්සී" සමාගමටයි දෙනවා. අරලිය සහ "කේඑම්සී". හොරෙන් කියන්නට ඕනෑ නැහැ. මේ සමාගම් දෙකට අවශ්‍ය ප්‍රමාණය දෙනවා ගරු රාජ්‍ය ඇමතිතුමනි. සාමාන්‍ය කෙනෙක් මෙතැනට වැලි ගැනීමට ගියාම, ඒ පුද්ගලයාට සතියක් ඉන්න වෙනවා. ඒ අනුව මෙතැන ලොකු මාෆියාවක් තිබෙනවා.

මම ඔබතුමාගෙන් අහන අනෙක් කාරණය තමයි, GSMB කියන ආයතනයට ගෙවන මුදල, ඒ වැලි ලබා ගන්නා අය ගෙවන්නේත් නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට සහ සම්පත් බැංකුවට. මම අහන්නේ නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට සහ සම්පත් බැංකුවට ගෙවන මුදල් ඇයි රාජ්‍ය බැංකුවකට ගෙවන්නට අවස්ථාව නැත්තේ? නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට සහ සම්පත් බැංකුවට ගෙවන මේ මුදල් රජයට ලැබෙනවාද? දැනට රාජ්‍ය බැංකු හැටියට ලංකා බැංකුව සහ මහජන බැංකුව තිබෙනවා. මේ බැංකු දෙකට ගෙවන්නේ නැතිව නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට සහ සම්පත් බැංකුවට මේ මුදල් ගෙවන නිසා අපි විශ්වාස කරනවා, මේ GSMB කියන ආයතනය රාජ්‍ය ආයතනයක් නොවෙයි කියලා. එහෙම නම් රාජ්‍ය ආයතනයක් නොවන පිරිසකට- [බාධා කිරීමක්] ඇයි මේ විශාල මාෆියාවට ඉඩ දීලා තිබෙන්නේ?

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය අහලා තිබුණේ විල්ගමුව ප්‍රදේශයේ වැලි ගොඩ දැමීම සම්බන්ධවයි. නමුත්, දැන් දෙවෙනි අතුරු ප්‍රශ්නය හැටියට අහන්නේ මනම්පිටිය ප්‍රදේශය ගැනයි. ප්‍රදේශ දෙකක්. නමුත්, ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරන පරිදි එතැන ගැටලු රාශියක් තිබෙන බවට වාර්තාවෙලා තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා නියෝගයක් නිකුත් කරලා තිබෙනවා, ඒ සඳහා වහාම පරීක්ෂණයක් කරන්නට. ඔබතුමා කියන ගැටලුවල යම් දෙයක් තිබෙනවා. ඒවා නිරාකරණය කිරීම සඳහා දැනටමත් කණ්ඩායමක් පත් කරලා තිබෙනවා. ඉතා නුදුරේදීම ඒ වාර්තාව ලැබෙනවා. ඒ අනුව, ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන මේ ප්‍රශ්නත් සැලකිල්ලට අරගෙන ඒවා විසඳීමට කටයුතු කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Question No. 6 - 255/'18-(2), the Hon. R.M. Padma Udhayashantha Gunasekera - *[Not in the Chamber.]*

[ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා]

Question No. 7 - 335/'18-(2), the Hon. Ishak Rahuman - *[Not in the Chamber.]*

Question No. 8 - 381/'18-(3), the Hon. S.M. Marikkar - *[Not in the Chamber.]*

Question No. 9 - 490/'19 - (2), the Hon. Ananda Aluthgamage.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## 'රජ දිනුම' ලොතරැයි දිනුම් ඇදීම : වංචාව

`ராஜ தினும' லொத்தர் சீட்டிழுப்பு: மோசடி
"RAJA DINUMA" LOTTERY DRAW : FRAUD

536/'19

**10.ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් මහජන සම්පත 'රජ දිනුම' නමින් ලොතරැයි දිනුම් ඇදීමක් සිදු කරන බවත්;

(ii) එම ලොතරැයියේ 3328වැනි දිනුම් ඇදීමෙන් අලුත්ම හයිබ්‍රිඩ් මෝටර් රථයක් ලබා දෙන බවට ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ප්‍රචාරක දැන්වීමක් පළ කළ බවත්;

(iii) එම දිනුම් ඇදීමේදී උඩුදුම්බර, මඩුගල්ල, කලමුන පදිංචි කේ. ඩබ්ලිව්. ජී. බී. කපුකොටුව මහතා මෝටර් රථය ජයග්‍රහණය කළ බවත්;

(iv) එම මෝටර් රථය 2017.01.25 දින ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පරිශ්‍රයේදී කපුකොටුව මහතාට භාර දුන් බවත්;

(v) වාහනයේ ලියා පදිංචි සහතිකය පරීක්ෂා කිරීමේදී ඒ මහතාට ලබාදී ඇත්තේ අලුත් (brand new) මෝටර් රථයක් නොව පාවිච්චි කර අලුත්වැඩියා කරන ලද (Reconditioned) මෝටර් රථයක් බවත්;

(vi) මේ ගැන ජාතික ලොතරැයි මණ්ඩලයට පැමිණිලි කළද, කිසිදු පිළිතුරක් ලබාදී නොමැති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා මෙම වංචාව සිදු කළ අයට එරෙහිව නීත්‍යානුකූල පියවර ගන්නේද;

(ii) කපුකොටුව මහතාට නව මෝටර් රථයක් ලබා දීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய லொத்தர் சபையினால் மஹஜன சம்பத `ராஜ தினும' எனும் பெயரில் லொத்தர் சீட்டிழுப்பொன்று நடத்தப்படுகின்றதென்பதையும்;

(ii) மேற்படி லொத்தரின் 3328 வது சீட்டிழுப்பின் மூலமாக புத்தம்புதிய ஹைபிரிட் மோட்டார் வாகனமொன்று வழங்கப்படுவதாக தேசிய லொத்தர் சபையினால் பிரச்சார அறிவித்த லொன்று வெளியிடப்பட்ட தென்பதையும்;

(iii) மேற்படி சீட்டிழுப்பில் உடுதும்பற, மடுகல்ல, கலமுனவில் வதியும் திரு. கே.டபிள்யு.ஜீ.பீ. கப்புகொட்டுவ மோட்டார் வாகனத்தை வென்றெடுத்தார் என்பதையும்;

(iv) மேற்படி மோட்டார் வாகனம் 2017.01.25 ஆம் திகதி இலங்கை ரூபவாஹிணி கூட்டுத்தாபன வளவில் வைத்து திரு. கப்புகொட்டுவவுக்கு கையளிக்கப் பட்டதென்பதையும்;

(v) வாகனத்தின் பதிவுச்சான்றிதழை பரிசீலிக்கை யில் அவருக்கு வழங்கப்பட்டுள்ளது புதிய (Brand New) மோட்டார் வாகனமல்லவென்பதையும் பாவித்து பழுதுபார்க்கப்பட்ட (Reconditioned) மோட்டார் வாகனமென்பதையும்;

(vi) இது சம்பந்தமாக தேசிய லொத்தர் சபைக்கு முறைப்பாடு செய்தபோதிலும் எவ்விதமான பதிலும் வழங்கப்படவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) இது சம்பந்தமாக விசாரணையொன்றை மேற் கொண்டு இந்த மோசடியை புரிந்தவர்களுக்கு எதிராக சட்ட நடவடிக்கைகளை மேற் கொள்வாரா;

(ii) திரு. கப்புகொட்டுவவுக்கு புதிய மோட்டார் வாகனமொன்றை வழங்க நடவடிக்கை எடுப்பாரா;

(iii) ஆமெனில் அத்திகதி யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Is he aware that-

(i) a lottery called Mahajana Sampatha "Raja Dinuma" is drawn by the National Lotteries Board;

(ii) the National Lotteries Board published an advertisement to the effect that a brand new hybrid motor car will be awarded in the 3328th draw of the aforesaid lottery;

(iii) Mr. K.W. G. B. Kapukotuwa of Kalamuna, Madugalla, Ududumbara won the motor car in the aforesaid draw;

(iv) the aforesaid motor car was handed over to Mr. Kapukotuwa at the premises of Sri Lanka Rupavahini Corporation on 25.01.2017;

(v) when the Registration Certificate of the vehicle was examined, it was evident that he had been given only a reconditioned motor car instead of a brand new car; and

(vi) though a complaint was made at the National Lotteries Board in this regard, no reply has been received?

(b) Will he inform this House-

(i) whether action will be taken to conduct an inquiry in this regard and take legal action against those who committed this fraud;

(ii) whether action will be taken to award a new motor car to Mr. Kapukotuawa; and

(iii) if so, the date on which it will be done?

(c) If not, why?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) ඔව්.

උඩුදුම්බර, මඩුගල්ල, කලමුන පදිංචි කේ. ඩබ්ලිව්. ජී. බී. කපුකොටුව මහතා එම මෝටර් රථය ජයග්‍රහණය කර ඇත.

(iv) ඔව්.

එම මෝටර් රථය 2017 .01.25වන දින එම ජයග්‍රාහකයාට බාරදී ඇත.

(v) නැත. මේ ත්‍යාගය සඳහා මෝටර් රථය මිලදී ගැනීමේදී අදාළ දේශීය නියෝජිත ආයතනය වෙතින් සෘජුව මිලදී ගෙන ඇත.

(vi) මේ ජයග්‍රාහකයා වෙනුවෙන් පෙනී සිටින නීතිඥ ජේ.එම්.යූ.ඩබ්ලිව්.බී. රඹුක්වැල්ල මහතා මඟින් 2017.08.08වන දින Letter of Demand එවා ඇත. එයට 2017.09.04වන දින උක්ත මෝටර් රථය මිලදී ගැනීමට අදාළ සියලු තොරතුරු ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ලබා දී ඇත.

(ආ) (i) පැහැදිලි වූ කරුණු අනුව එසේ වංචාවක් සිදුවී නොමැති බව නිරීක්ෂණය වේ. රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර විධිමත් පරිදි වාහනය මිලදී ගැනීමට කටයුතු කර ඇත.

(ii) එම මෝටර් රථය වෙනුවට නව මෝටර් රථයක් ලබාදීමට හැකියාවක් නොමැත.

(iii) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මඩුගල්ලේ පදිංචි කේ.ඩබ්ලිව්.ජී.බී. කපුකොටුව මහතාට ජාතික ලොතරැයි මණ්ඩලයෙන් පවත්වාගෙන යන "රජ දිනුම" ලොතරැයියෙන් brand new මෝටර් රථයක් ලබා දෙන බවට පුවත් පත්වල පළ කරපු දැන්වීම් තමයි මේ මගේ ළඟ තිබෙන්නේ. නමුත්, ඔහුට ලබාදී තිබෙන අපි සාමාන්‍යයෙන් කියන "වාහනයේ පොත" කියන එකේ සඳහන්ව තිබෙන්නේ reconditioned කියලායි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම එම පොත **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ උත්සවයේදී මෝටර් රථය බාර ගන්නකොට මේ පොතේ ඔක්කෝම බලන්නේ නැහැ නේ. උත්සවයේදී ඒ වාහනය ලබා ගන්නවා. ඊට පසුව ඔහු මේ සම්බන්ධයෙන් ජනාධිපතිවරයාටත්, විවිධ අයටත් ලියලා තිබෙනවා.

ඔබතුමා අවුරුදු දෙකකට පස්සේ හෝ උත්තර ලබා දීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. මම මෙම ප්‍රශ්නය ඉදිරිපත් කරලා තිබෙන්නේ 2017 අගෝස්තු 30වෙනි දායි. නමුත්, තවම මෙම අසාධාරණය විසඳිලා නැහැ. මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඒ පුද්ගලයාට තවම යුක්තිය ඉෂ්ට වෙලා නැහැ. මෙතැන පැහැදිලි වංචාවක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා ලොතරැයි ගැනත් අවිශ්වාසයක් ඇති වෙනවා. මොකද, brand new වාහන දෙනවා කියලා advertisement එක දානවා, මිනිස්සුන්ට reconditioned වාහන දෙනවා. ඒ නිසා මේ පිළිබඳව අලුතෙන් අමාත්‍යාංශ පරීක්ෂණයක් කරන්න ඔබතුමා ලැහැස්තිද? මොකද, මේ පුද්ගලයා තමන්ට වෙච්ච අසාධාරණය ගැන දිගටම කථා කරන නිසා.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

මෙහි තිබෙන තොරතුරු අනුව ඒ පුද්ගලයාට ලබා දීලා තිබෙන්නේ අලුත් වාහනයක්. ඔබතුමා කිව්වා වාගේ ගැටලුවක් තිබෙනවා. මොකද, එතැන ඒ වාහනය register කරලා තිබෙන්නේ reconditioned හැටියට නම්,- ඒ අළෙවි කටයුතු කරන්නේ හොන්ඩා සමාගමයි. ඒ අය 2016 වසරේ නොවැම්බර් මාසයේ ඒ offer එක දෙනකොට විශේෂයෙන්ම සඳහන් කරලා තිබෙනවා "Also note that registration, revenue licence and number plates will be free of charge. Even though the vehicle is brand new, this will be registered as reconditioned as this is imported through a dealer recommended by Honda and not through the manufacturer" කියා. මෙයින් අදහස් කරන්නේ මේකයි. මෙය manufacturerගෙන් ගෙනෙන්නේ නැති නිසාත්, dealer කෙනෙක් හරහා ජපානයෙන් ගෙනෙන නිසාත් තමයි අලුත් වුණත් reconditioned කියලා සඳහන් කරලා තිබෙන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ මාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය නොවෙයි. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, එතුමා එවපු පොතේ නම මම ඔබතුමාට එව්වා. මා ළඟ තිබෙන advertisement එකත් මම එවන්නම්. ඒක ඔබතුමන්ලා දාන්න. මොකද වාහන

---

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

[ගරු බිමල් රත්නායක මහතා]

වෙළෙඳ පොළේදී reconditioned කියන එක නිසා ඕනෑම පුද්ගලයෙක්ට විශාල අලාභයක් වෙනවා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ ඔය කරුණු දෙක අනුව මේ ගැන සාධාරණ පරීක්ෂණයක් කරන්න කියලායි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු මුදල් රාජ්‍ය අමාත්‍යතුමනි, පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් මියගිය අයට විශේෂයෙන්ම සහ තුවාල වෙච්ච අයට වන්දි ලබාදීමේ ක්‍රියාවලියක් ගැන ආණ්ඩුව ඒ ආසන්න අවස්ථාවේදීම කිව්වා. මිය ගිය අයට රුපියල් ලක්ෂ 10ක් සහ තුවාල වෙච්ච අයට උපරිම රුපියල් ලක්ෂ 3ක් ලබා දෙනවා කියලා කිව්වා. දැනට මාස දෙකකට ආසන්න කාලයක් ගතවෙලා තිබෙනවා. මේ සිදුවීමෙන් සදාකාලිකවම ආබාධිත තත්ත්වයට පත් වෙච්ච අයත්, ඒ වාගේම ඉතා දිගු කාලයක් වෛද්‍ය ප්‍රතිකාර ගන්න වෙන අයත් ඉන්නවා. ඒවාට අති විශාල වශයෙන් මුදල් වැය වනවා. ඒ වාගේම පවුල්වල ස්ථිර යැපෙන්නන් මිය ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා මා ඔබතුමාගෙන් දැන ගන්න කැමතියි, ඔබතුමන්ලා දිගු කාලීන වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය අයටත්, ස්ථිරවම ආබාධිත වෙච්ච අයටත්, පවුලේ යැපෙන්නන් අහිමි වෙච්ච අයටත් මුදල් අමාත්‍යාංශය පැත්තෙන් ලබා දෙන්න බලාපොරොත්තු වෙන ආර්ථික සහනය කුමක්ද කියන එක.

ඒ වාගේම ඔබතුමන්ලා විශාල හෝටල් හිමියන්ට යම්කිසි සහනාධාර දුන්නා කියලා කථා වනවා. නමුත් අද ජාතිවාදී ප්‍රශ්නයක් තිබෙන නිසා කුඩා හෝටල් හිමියන්ට, කුඩා ව්‍යාපාරිකයන්ට -ගොඩක් මිනිසුන්ට- විවිධ මට්ටමින් ව්‍යාපාර කර ගන්න බැරි වෙලා තිබෙන බව අපි දන්නවා. මෙන්න මේ සුළු ව්‍යාපාරික ප්‍රජාවට ඔබතුමන්ලා ලබා දෙන්න යන සහනය කුමක්ද කියන කාරණයත් මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ඔබතුමා කිව්වා වාගේ රුවන් විජේවර්ධන රාජ්‍ය ඇමතිතුමාත්, මමත් ගිහිල්ලා ඒ සාකච්ඡාවලට සම්බන්ධ වුණා. විශේෂයෙන්ම අපි කිව්ව පරිදි මිය ගිය අයට සම්පූර්ණයෙන්ම ඒ සහනය ලබා දෙනවා. සෑහෙන පිරිසකට දැනටම සහන ලබා දීලා තිබෙනවා. සහන ලබා දිය යුතු සුළු පිරිසක් තවමත් ඉන්නවා. ක්‍රමානුකූලව ඒ කටයුතු කරගෙන යනවා. ඒ නිසා සමහර ඒවා සම්පූර්ණ කරන්න බැරි වෙලා තිබෙනවා.

මේ ප්‍රහාරයෙන් තුවාල ලැබූ අය ඉන්නවා. ඒ වාගේම ජීවිත කාලයේදීම ප්‍රතිකාර කරන්න සිදු වන අයත් සිටිනවා. මේ රටේ පමණක් නොවෙයි, පිටරටවලට යවලා, වෛද්‍ය ප්‍රතිකාර ලබා ගන්න සිදු වන ස්වල්ප දෙනෙකුත් ඉන්නවා. අපි ඒ අයගේ විස්තර ලබාගෙන යනවා. ඔවුන් වෙනුවෙනුත් සහනයක් ලබා දෙන්න අපි බලාපොරොත්තු වනවා. ඒ සංවිධාන එක්කත් අපි සාකච්ඡා කරනවා. සමහර අයගේ පවුල්වල සාමාජිකයන් නැති නිසා, ඒ පවුල්වල භාරකාරයන් එක්ක සාකච්ඡා පවත්වලා, යම්කිසි සහනයක් ලබා දෙන්න අපි බලාපොරොත්තු වනවා. නමුත් ඒක සියයට සියයක්ම තීරණය වෙලා නැහැ. විශේෂයෙන්ම වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට නියමිත අය වෙනුවෙන් සහන ලබා දෙන්න කියලා අපි ජනාධිපති අරමුදලෙනුත් මුදල් ඉල්ලනවා.

ගරු මන්ත්‍රීතුමා හෝටල් හිමියන් ගැන ඇහුවා. සංචාරක ව්‍යාපාරයට දීලා තිබෙන සහන අපි ලබා දීලා තිබෙන්නේ ලොකු හෝටල්වලට -ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි වුණු සමාගම්වලට- විතරක් නොවෙයි. ඒ කියන්නේ, සුළු පරිමාණ ව්‍යාපාරිකයෙක් තවත් ආයතනයක් එක්ක ලියාපදිංචි වෙලා තිබෙනවා නම් අපි ඒකත් සලකනවා. මොකද, මේක සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ වෙන්න ඕනෑ කියන එකයි අපි බලන්න ඕනෑ. නැත්නම් වෙනත් ආර්ථික ගැටලු -ප්‍රශ්න- තිබෙන අයත් මේ සහනය ලබා ගන්න පුළුවන්. නමුත් මේක සංචාරක ව්‍යාපාරයට දෙන සහනයක්. මෙයින් හැමෝම ආවරණය වනවා. ඒ විතරක් නොවෙයි, එය බැංකුවලට විතරක් සීමා වෙලා නැහැ. බැංකු නොවන ආයතන - finance companies, leasing companies - හරහාත් මේ සහන ලබා ගන්නට පුළුවන්.

මහ බැංකුවෙන් ඒක ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ පිළිබඳව විස්තරාත්මකව circular එකක් මහ බැංකුවෙන් යවා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි.
Then, Question No. 11 - 565/'19 - (2), The Hon. Thushara Indunil Amarasena - *[Not in the Chamber.]*

## රජයේ ඉඩම් මහා පරිමාණ නිවාස ව්‍යාපෘති සඳහා පැවරීම : කොන්දේසි හා ගෙවීම්
## அரச காணிகளை பாரிய அளவிலான வீடமைப்புத் திட்டங்களுக்காக ஒப்படைத்தல்: நிபந்தனைகள் மற்றும் கொடுப்பனவுகள்
## TRANSFER OF GOVERNMENT LANDS FOR MEGA HOUSING PROJECTS: CONDITIONS AND PAYMENTS

591/'19

**12.** **ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) 2016 අය වැය යෝජනා අංක 290ට අනුව, ලැයිස්තුගත දේපළ වෙළඳාම් භාරයක් (Real Estate Trusts) පිහිටුවනු ලැබුවේද;

(ii) එවැනි භාරයක් පිහිටුවීමට අදාළ ප්‍රාරම්භක කාර්යයන් පිළිබඳ වගකීම පවරා දුන් පාර්ශ්ව කවරේද;

(iii) ලැයිස්තුගත ඒකක භාරයක් පිහිටුවීමකින් තොරව, රජයේ ඉඩම් මහා පරිමාණ නිවාස ව්‍යාපෘති සඳහා පෞද්ගලික ව්‍යාපාරිකයන්ට පවරා දී තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වන කොන්දේසි හා ගෙවීම් කවරේද;

(v) රජයේ ඉඩම්, මහා පරිමාණ නිවාස සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් පෞද්ගලික ව්‍යාපාරිකයන්ට පවරා දීමේදී ඒ සඳහා නිසි පරිදි අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී තිබේද;

(vi) එසේ නම්, පෞද්ගලික ව්‍යවසායකයන් තෝරා ගැනීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2016 ஆம் ஆண்டுக்கான வரவுசெலவுத்திட்ட முன்மொழிவு இலக்கம் 290 இற்கமைய, பட்டியலிடப்பட்ட ஆதன வியாபார நம்பிக்கைப் பொறுப்பொன்று (Real Estate Trusts) தாபிக்கப்பட்டதா; இன்றேல், ஏன் என்பதையும்;

(ii) அத்தகைய நம்பிக்கைப் பொறுப்பொன்றை ஆரம்பிப்பதற்கான ஆரம்பப் பணிகள் பற்றிய பொறுப்பு ஒப்படைக்கப்பட்ட தரப்பினர் யாவரென்பதையும்;

(iii) பட்டியலிடப்பட்ட அலகு நம்பிக்கைப் பொறுப்பொன்று தாபிக்கப்படாமலே, அரசாங்க காணிகள் பாரிய அளவிலான வீடமைப்புக் கருத்திட்டங்களுக்காக தனியார் தொழில்முயற் சியாளர்களிடம் ஒப்படைக்கப்பட்டுள்ளதா என் பதையும்;

(iv) ஆமெனில், அதற்கான நிபந்தனைகள் மற்றும் கொடுப்பனவுகள் யாவையென்பதையும்;

(v) அரசாங்க காணிகள், பாரிய அளவிலான வீடமைப்பு அபிவிருத்திக் கருத்திட்டங்களுக்காக தனியார் தொழில்முயற்சியாளர்களுக்கு ஒப் படைக்கப்படுகையில், அதற்கு உரியவாறு அமைச்சரவை அங்கீகாரம் வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(vi) ஆமெனில், தனியார் தொழில்முயற்சி யாளர்களை தெரிவுசெய்யும் போது பின்பற்றப் படுகின்ற முறையியல் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Will he inform this House-

(i) whether a Real Estate Trust was established as per Budget Proposal No. 290 of 2016; if not why;

(ii) the parties that have been assigned the task of doing the preliminary work for setting up a Trust of that nature;

(iii) whether government lands have been transferred to private businessmen for mega housing projects, without establishing a Listed Unit Trust;

(iv) if so, what are the conditions and payments applicable in that regard;

(v) whether proper Cabinet approval has been granted when government lands were transferred to private businessmen for mega housing projects; and

(vi) if so, of the methodology adopted in selecting private entrepreneurs?

(b) If not, why?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) දේපළ වෙළඳාම සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රාග්ධනය සැපයීමට සහ කුඩා ආයෝජකයින්ට දේපළ වෙළඳාම් ක්ෂේත්‍රයේ වර්ධනයෙහි ප්‍රතිලාභ සෘජුව ලබා ගැනීමට හැකි වන පරිදි ලැයිස්තුගත දේපළ වෙළඳාම් භාරයක් පිහිටුවීම සඳහා අදාළ පාර්ශ්වයන් සමඟ සාකච්ඡා කරන ලදී.

(ii) එකී ලැයිස්තුගත දේපළ වෙළඳාම් භාරයක් පිහිටුවීමට තවදුරටත් කටයුතු සිදු කරමින් පවතින අතර එය පිහිටුවීමෙන් අනතුරුව ඊට අදාළ ඒකකය මුද්දර බද්දෙන් නිදහස් කිරීමටද කටයුතු කරනු ඇත.

(iii) රජයේ ඉඩම් ව්‍යාපෘති සඳහා වෙන් කිරීමට අවශ්‍ය වන්නේ නම් නාගරික සංවර්ධන අධිකාරිය මඟින් නිසි නීතිමය පටිපාටි අනුගමනය කිරීමෙන් පමණක් සිදු කෙරේ.

(iv) ඉහත (iii) පිළිතුර අදාළ වේ.

(v) ඉහත (iii) පිළිතුර අදාළ වේ.

(vi) අදාළ නොවේ.

(ආ) පැන නොනඟී.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ලාංකීය දේපළ වෙළඳාම් ක්ෂේත්‍රයේ විශාල පරිවර්තනීය යෝජනාවක් ලෙස තමයි, ලැයිස්තුගත දේපළ වෙළඳාම් භාරයක් පිහිටුවීම පිළිබඳ යෝජනාවක් 2016 වර්ෂයේදී අය වැය ලේඛනයට එන්නේ. දැන් 2017, 2018 හා 2019 ආණ්ඩු කාල පරිච්ඡේදය අවසන්. හැබැයි, තවම සාකච්ඡා කරනවා. ඒ වාගේම කරන්න බලාපොරොත්තු වන දේවල් තව තිබෙනවා. ඒ අතර ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා පිළිගන්න ඕනෑ පාස්කු දින ප්‍රහාරයෙන් පස්සේ දේපළ වෙළඳාම් ක්ෂේත්‍රයට හා ඉදිකිරීම් ක්ෂේත්‍රයට දැවැන්ත පරිමාණයේ කම්පනයක් හා බලපෑමක් ඇති වෙලා තිබෙන බව. ඒක නිසා අධික මිලට අළෙවි කරමින් තිබුණු දේපළ එක්වර විකිණෙන්නේ නැතුව මුළු ලංකාව පුරාම ඉඩම් සහ දේපළ වෙළඳ පොළ සම්පූර්ණයෙන් ඇන හිටලා තිබෙනවා. ඒ ඇන හිටීම කරනකොටගෙන සමහර දේපළ වෙළඳ සමාගම්වලට ඉදිකිරීම් කටයුතු සඳහා advances ලබාගත් එම ඉදිකිරීම් කටයුතු නිම කරලා දෙන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා දැනට මහා පරිමාණයේ සමාගම් කීපයක අධ්‍යක්ෂවරු අත් අඩංගුවට අරගෙන තිබෙනවා කියලා ඔබතුමා පිළිගන්නවාද? ඒ තුළින් දැන් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ, විශේෂයෙන් මහල් නිවාස යනාදිය මත තමුන්නාන්සේලා අපි කවුරුත් නොදන්න දැවැන්ත අර්බුදයක් නිර්මාණය වනවා.

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කඩා වැටීම හා දේපළ අංශවල ඇති වුණු වෙනස නිසා 2017දී ලෝක මූල්‍ය අර්බුදයක් ඇති වුණා. ඒ ලෝක මූල්‍ය අර්බුදය බැංකු ක්‍රමය කඩා වැටෙන්න බලපෑවා. ගරු ඇමතිතුමනි, පාස්කු ප්‍රහාරයෙන් පසු දේපළ හුවමාරු සමාගම් මුහුණ දී තිබෙන බරපතළ ප්‍රශ්නය පිළිබඳ විශේෂ විමර්ශනයක් ශ්‍රී ලංකා මහ බැංකුවත් සමඟ මැදිහත් වී කරලා, ඒ විස්තර මෙම ගරු සභාවට දැනුම් දෙන්න සූදානම්ද කියලා මා අහන්න කැමතියි.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සංචාරක ව්‍යාපාරයට එල්ල වුණු ප්‍රහාරය ගැන ප්‍රතිචාරයක් දක්වා තිබෙනවා. කෙටි කාලයකින් ආපසු එය යථා තත්ත්වයට ගන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. මෙවැනි සිදුවීම් වූ රටවල් දිහා බැලුවාම, ඒ සඳහා අවුරුදු තුනක් පමණ කාලයක් ගත වී

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

තිබෙනවා. නමුත් අවුරුද්දක් තුළදී අපට මෙය යථා තත්ත්වයට ගැනීමට පුළුවන් වෙයි කියලා බලාපොරොත්තු වෙනවා. සංචාරක නොවන ආර්ථිකයේ අනෙක් ක්ෂේත්‍රවලටත් මෙහි බලපෑමක් තිබෙනවා, ඒ හැම අංශයක්ම එකිනෙකට සම්බන්ධ නිසා. විශේෂයෙන්ම සංචාරකයන් ගෙන්වා ගැනීමට අපි ප්‍රධාන වශයෙන් යොමු වෙන්න ඕනෑ.

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ තිබෙන ප්‍රශ්නය මෙයට විතරක් සම්බන්ධ නැහැ. ඉල්ලුම සැපයුම ගැන අපි දන්නවා නේ. ඉදිකිරීම් කටයුතු කරගෙන යනකොට මිල ඉහළ පහළ යනවා. කලින් කලට එවැනි දේවල් සිදු වෙනවා. බැංකු සම්බන්ධයෙන් මම යමක් කියන්න ඕනෑ. අපි බැංකු එක්කයි වැඩ කරන්නේ. සියලු බැංකුවලට මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න සිදු වෙනවා. නමුත් අපේ බැංකු පද්ධතිය ශක්තිමත්. අපේ බැංකු පද්ධතිය ශක්තිමත් නිසා මේ ප්‍රශ්නය විශාල ලෙස බැංකු පද්ධතියට බලපායි කියලා අපි විශ්වාස කරන්නේ නැහැ.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි.

මහල් නිවාස ඉදිකිරීම සඳහා පුද්ගලික අංශයට ඉඩම් ලබා දීම පිළිබඳ වගකීම දරන්නේ නාගරික සංවර්ධන අධිකාරියයි කියලා ඔබතුමා සඳහන් කළා. සජිත් ප්‍රේමදාස අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය මඟින් රජයට අයත් ඉඩම්, දේපළ විශාල ප්‍රමාණයක් නිවාස ඉදිකිරීම සඳහා මහා පරිමාණ සමාගම්වලට දීලා තිබෙනවා. එහෙම දෙන්නේ පුද්ගලික හිතවත්කම් මත ගජමිතුරන්ටද, එහෙම නැත්නම් මොන ක්‍රමයටද? නාගරික සංවර්ධන අධිකාරියේ නම් ප්‍රසිද්ධ දැන්වීම් පළ කරලා එවැනි දේපළ ලබා දෙන ක්‍රමයක් තිබෙනවා. නමුත් නිවාස, ඉදිකිරීම් අමාත්‍යාංශය එහෙම ලබා දෙනවා කියලා මම විශ්වාස කරන්නේ නැහැ. මගේ හෝමාගම මැතිවරණ කොට්ඨාසයේ තිබෙන රජයේ වටිනා ඉඩමක් පාවිච්චි කරලා ඉතා විශාල මහල් නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනවා. නිවාස ඉදිකිරීම් අමාත්‍යාංශය විසින් මහල් නිවාස ඉදිකිරීම සඳහා රජයේ දේපළ, එහෙම නැත්නම් රජයේ ඉඩම් පවරා දෙන ආකාරය පිළිබඳව ඔබතුමා ගරු ඇමතිතුමා සමඟ සාකච්ඡා කර අපට විස්තරයක් ලබා දෙනවා නම් හොඳයි කියලා මම හිතනවා.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මා හිතන හැටියට ඒ සම්බන්ධයෙන් කිසිම ගැටලුවක් නැහැ. ඕනෑ වෙලාවක එතුමාත් එක්ක කථා කරන්න පුළුවන්. අපේ නිවාස සංවර්ධන වැඩ පිළිවෙළ මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය හරහාත්, නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හරහාත් සිදු වෙනවා. සජිත් ප්‍රේමදාස ඇමතිතුමාත් ඒ වැඩ පිළිවෙළ නීත්‍යනුකූලව හරිහැටි කරගෙන යනවා. ඒ පිළිබඳ කිසිම ගැටලුවක්, ප්‍රශ්නයක් නැහැ. ඒ පිළිබඳව සොයා බලන්න ඕනෑ නම්, ඔබතුමා ළඟ විශේෂ විස්තර තිබෙනවා නම්, ඒ විස්තර ඉදිරිපත් කරන්න. එතකොට අපි ඒ ගැන සාකච්ඡා කරමු.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සංචාරක කර්මාන්තය පිළිබඳව එක ප්‍රශ්නයක් මුදල් රාජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න පුළුවන්ද?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, will you answer his question?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
Yes.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, හෝටල් සහ සංචාරක කර්මාන්තය ආශ්‍රිතව තිබෙන ව්‍යාපාර ලබාගෙන ඇති ණය සඳහා අවුරුද්දක සහනයක් ලබාදෙනවා කියලා එදා පාර්ලිමේන්තුවේදී අමාත්‍යතුමා පොරොන්දු වුණා. මේ කර්මාන්තයේ යෙදී සිටින අය බැංකුවලට ගිහින් මේ ණය සහනය ගැන කථා කළාම, අද වන කල් මුදල් අමාත්‍යාංශයෙන්වත්, ශ්‍රී ලංකා මහ බැංකුවෙන්වත් බැංකුවලට චක්‍රලේඛයක් එවා නැහැයි කියනවා. ඒ නිසා මේ පිළිබඳව ඉතාම කඩිනමින් ක්‍රියාමාර්ගයක් ගන්න ඕනෑය කියා මා ප්‍රකාශ කරනවා. ඒ සඳහා දැනටමත් ක්‍රියාමාර්ගයක් ගෙන තිබෙනවාද කියලා පැහැදිලි කරන්න පුළුවන්ද?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කඩිනමින් පියවර ගෙන තිබෙන බව කියන්න ඕනෑ. ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ඒ circulars ගිහින් තිබෙනවා. ශ්‍රී ලංකා මහ බැංකුවේ website එකේ ඒ circulars ඔක්කොම ඇති. ඒවායේ ඔක්කොම කරුණු පැහැදිලි කරලා තිබෙනවා. ඒ බැංකුවලට විතරක් නොවෙයි, මහ ජනතාවටත් ඒ සම්බන්ධයෙන් දැන ගන්න පුළුවන්. ඒ විස්තර සියල්ලක්ම එහි තිබෙනවා. එහෙම කියන බැංකු ශාඛාවක් තිබෙන බව ඔබතුමා දන්නවා නම්, කරුණාකරලා අපට දැනුම් දෙන්න. ඒ පිළිබඳව සොයා බලා, ඒ බැංකුවට අපි කථා කරන්නම්.

## කෑගල්ල දිස්ත්‍රික්කයේ වතු පවුල් සඳහා නව නිවාස: විස්තර

### கேகாலை மாவட்டத்தில் பெருந்தோட்டக் குடும்பங்களுக்கான புதிய வீடுகள்: விபரம்

### NEW HOUSES FOR ESTATE FAMILIES IN KEGALLE DISTRICT : DETAILS

679/'18

**13. ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) පැරණි වතු නිවාස (ලැයින් කාමර) වෙනුවට නව නිවාස ලබාදීමේ වැඩ පිළිවෙළ යටතේ නිවාස ලබා දී ඇති වතු පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙතෙක් නිවාස ලබා දී නොමැති වතු පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) නිවාස ලබාදීමේ වැඩසටහනට අනුව කෑගල්ල දිස්ත්‍රික්කයේ නිවාස ලබා දිය යුතු වතු පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙතෙක් නිවාස ලබා දී ඇති වතු පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) නිවාස ලබා නොදුන් වතු පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඇ) (i) එක් වතු නිවසක (ලැයින් කාමරයක) මේ වනවිට පවුල් කිහිපයක් එකට පදිංචි වී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, නව නිවාස ලබාදීමේ වැඩපිළිවෙළ කඩිනම් කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද ?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

மலைநாட்டுப் புதிய கிராமங்கள், உட்கட்டமைப்பு வசதிகள் மற்றும் சமுதாய அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பழைய பெருந்தோட்ட வீடுகளுக்குப் (லயன் அறைகள்) பதிலாக புதிய வீடுகளை வழங்கும் நிகழ்ச்சித்திட்டத்தின் கீழ் வீடுகள் வழங்கப் பட்டுள்ள குடும்பங்களின் எண்ணிக்கை யாது;

(ii) இற்றைவரை வீடுகள் வழங்கப்படாத பெருந் தோட்டக் குடும்பங்களின் எண்ணிக்கை யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) வீடுகளை வழங்கும் நிகழ்ச்சித்திட்டத்திற்கேற்ப கேகாலை மாவட்டத்தில் வீடுகள் வழங்கப்பட வேண்டிய பெருந்தோட்டக் குடும்பங்களின் எண்ணிக்கை யாது;

(ii) இற்றைவரை வீடுகள் வழங்கப்பட்டுள்ள பெருந்தோட்டக் குடும்பங்களின் எண்ணிக்கை யாது;

(iii) வீடுகள் வழங்கப்படாத பெருந்தோட்டக் குடும்பங்களின் எண்ணிக்கை யாது;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) (i) ஒரு பெருந்தோட்ட வீட்டில் (லயன் அறையில்) தற்போது எத்தனை குடும்பங்கள் ஒன்றாக வாழ்கின்றார்கள் என்பதை அறிவாரா;

(ii) ஆமெனில், புதிய வீடுகளை வழங்கும் நிகழ்ச்சித் திட்டத்தை துரிதமாக்குவாரா என்பதையும்;

(iii) ஆமெனில், அது எப்போது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Hill Country New Villages, Infrastructure and Community Development :

(a) Will he inform this House -

(i) the number of estate families that has been provided houses under the programme to provide new houses in place of the old estate houses (line rooms); and

(ii) the number of estate families that has not been provided houses up to now?

(b) Will he state-

(i) the number of estate families in Kegalle District that have to be provided houses under the programme to provide houses;

(ii) the number of estate families that have been provided houses up to now; and

(iii) the number of estate families that have not been provided houses?

(c) Will he also inform this House-

(i) whether he is aware of the fact that several families are residing in the same estate house (line room) by now;

(ii) if so, whether the programme to provide new houses will be expedited; and

(iii) if so, the date by which it will be done?

(d) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) අමාත්‍යාංශය විසින් නව පවුල් 5,738ක් වෙත 2015-2018 කාලය තුළ, ග්‍රීන් ගෝල්ඩ් නිවාස වැඩසටහන යටතේ නව නිවාස ලබා දී ඇත. එම මුළු නිවාස 5,738න් නිවාස 2,670ක වැඩ අවසන් කර ඇති අතර, ඉතිරි නිවාස 3,068හි වැඩ අවසන් කිරීමට ආසන්නව පවතී. අමාත්‍යාංශය විසින් 2019 වසරේදී නිවාස 1,535ක් සඳහා අනුමැතිය ග්‍රීන් ගෝල්ඩ් නිවාස වැඩසටහන යටතේ ලබා දී ඇත.

ඉන්දියානු ආධාර නිවාස වැඩසටහන යටතේ පළමු අදියර ලෙස නිවාස 4,000ක් සඳහා අනුමැතිය ලබා දී ඇත. ඉන් නිවාස 1,069ක වැඩ අවසන් කර ඇති අතර, ඉතිරි නිවාස 2,931හි වැඩ අවසන්වීමට ආසන්නව පවතී. දෙවන අදියරේ නිවාස 10,000ක් ඉදිකිරීමට අනුමැතිය ලබා දී ඇති අතර වැඩ කටයුතු සිදු වෙමින් පවතී.

(ii) පවුල් 221,566ක් (විස්තාරික පවුල් ඇතුළු) වෙත, මේ වන තෙක් නිවාස සපයා නොමැත.

(ආ) (i) කෑගල්ල දිස්ත්‍රික්කයේ පවුල් 12,742ක් වෙත මේ වැඩසටහන් යටතේ 2015 වසරේදී නිවාස සැපයීමට තිබුණි.

(ii) මෙම අමාත්‍යාංශය විසින් 2015 සහ 2018 වර්ෂ සඳහා කෑගල්ල දිස්ත්‍රික්කයට නිවාස 350ක් ලබා දී ඇත. ඉන් නිවාස 152ක වැඩ අවසන් අතර, ඉතිරි නිවාස 198හි වැඩ කටයුතු සිදුවෙමින් පවතී.

2019 වසරේදී මෙම අමාත්‍යාංශය විසින් ග්‍රීන් ගෝල්ඩ් නිවාස වැඩසටහන යටතේ නිවාස 90ක් අනුමත කර ඇත.

එමෙන්ම, අමාත්‍යාංශය විසින් ඉන්දියානු ආධාර නිවාස වැඩසටහන යටතේ වන නිවාස 10,000න්, නිවාස 700ක් සඳහා අනුමැතිය ලබා දී ඇත.

(iii) කෑගල්ල දිස්ත්‍රික්කයේ පවුල් 11,602ක් සඳහා නිවාස ලබා දී නොමැත.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(ඇ) (i) ඔව්.

(ii) දැනට අමාත්‍යාංශය මඟින් ග්‍රීන් ගෝල්ඩ් නිවාස වැඩසටහන යටතේ හා ඉන්දියානු ආධාර නිවාස වැඩසටහන යටතේ වතු සඳහා නීත්‍යානුකූල නිවාස ලබා දීම සිදු කරයි.

අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන්නේ නම්, නිවාස වැඩසටහන වේගවත් කළ හැකිය.

(iii) එකවිට වැඩි මුදල් ප්‍රමාණයක් වෙන් කර දෙන්නේ නම් නිවාස වැඩසටහන වේගවත් කළ හැකිය. එය අඛණ්ඩව ක්‍රියාත්මක වන වැඩසටහනක් බවත් දන්වනු කැමැත්තෙමි.

(ඈ) අදාළ නොවේ.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ගරු ඇමතිතුමනි, මගේ අතුරු ප්‍රශ්නයට ඔබතුමාට උත්තර දෙන්න පුළුවන් වෙයිද දන්නේ නැහැ.

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මෙම නිවාස ඉදිකිරීම සඳහා වෙන් කළ පර්චස් හතේ ඉඩම් සඳහා සින්නක්කර ඔප්පු ලබා දී තිබෙනවාද, ඒ වාගේම, මේ වර්ෂය සඳහා කෑගල්ල දිස්ත්‍රික්කයේ කොපමණ නිවාස ප්‍රමාණයක් ඉදිකරන්න මුදල් වෙන්කර තිබෙනවාද කියා මං දැන ගන්න කැමැතියි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
සින්නක්කර ඔප්පු ගැන ඔබතුමා ප්‍රශ්න කළා. අපි මේ වෙනකොටත් පර්චස් හතක භූමිය සඳහා සින්නක්කර ඔප්පු ලබා දෙන්න වැඩ කටයුතු කරගෙන යනවා.

අපි ළඟදී නුවරඑළිය දිස්ත්‍රික්කයේ සහ ගාල්ල දිස්ත්‍රික්කයේ පර්චස් 7ක හැම ඉඩමක් සඳහාම සින්නක්කර ඔප්පුවක් ලබා දුන්නා.[බාධා කිරීමක්] ඒ විධියට තවත් ඔප්පු සකස් වෙමින් තිබෙනවා. [බාධා කිරීමක්] කෑගල්ල දිස්ත්‍රික්කයේ නැතිව ඇති. අනෙක් දිස්ත්‍රික්කවල දීලා තිබෙනවා. නුවරඑළියේ දීලා තිබෙනවා, ගාල්ලේ දුන්නා. ඒ ඔප්පු බෙදා දීම්වලට මම සහභාගි වූ නිසා මම ඒවා ගැන දන්නවා. කෑගල්ල ගැන මම දන්නේ නැහැ. නමුත්, හැම තැනම එලෙස සින්නක්කර ඔප්පු සකස් වෙමින් පවතිනවා. වතු කම්කරුවන්ට පර්චස් 7ක අයිතිය ලබා දෙනවා. අනෙක් ප්‍රශ්න මම ගරු ඇමතිතුමාට යොමු කර, ඔබතුමාට පැහැදිලි පිළිතුරක් ලබා දෙන්නම්.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. එයත් මේකටම අදාළයි. පුරා විද්‍යාවට සහ වන සංරක්ෂණයට සම්බන්ධ භූමි එළි පෙහෙළි කර නිවාස හදාගෙන යන වැඩ පිළිවෙළක් තිබෙනවා. මේ පිළිබඳව ඔබතුමාට යම් කිසි පිළිතුරක් ලබා දෙන්න හැකියාව තිබෙනවාද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
එහෙම ස්ථානවල නිවාස හදන්න පුළුවන්කමක් නැහැ. ඒ පිළිබඳව ඔබතුමා වාර්තා කරන්න. එතකොට අපට ඒ පිළිබඳව දැනුම් දෙන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි.

Question No. 14 - 693/'19 (2), the Hon. Udaya Prabath Gammanpila.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
Sir, on behalf of the Prime Minister and Minister of National Policies, Economic Affairs, Resettlement and Rehabilitation, Northern Province Development and Youth Affairs, I ask for six months' time to answer the Question.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## වකුගඩු රෝගීන් සිටින පවුල්වල නිවාස : අලුත්වැඩියා සඳහා මූල්‍ය ආධාර
## சிறுநீரக நோயாளர் உள்ள குடும்பங்களின் வீடுகள்: திருத்துவதற்கான நிதியுதவி
## HOUSES OF FAMILIES WITH KIDNEY PATIENTS: FINANCIAL ASSISTANCE FOR REPAIRIS

759/'19

**15.** **ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් වකුගඩු රෝගීන් සිටින පවුල්වල නිවාස අලුත්වැඩියා කිරීම සඳහා ආධාර මුදලක් ලබා දෙන බව දන්නේද;

(ii) එම ප්‍රතිලාභය ඉල්ලුම් කිරීමට අවශ්‍ය කරන සුදුසුකම් සහ ඉදිරිපත් කළ යුතු ලේඛන කවරේද;

(iii) ඒ යටතේ නිවසක් අලුත්වැඩියා කිරීම සඳහා ලබා දෙන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මේ වන විට ඉහත සඳහන් නිවාස ආධාර ඉල්ලුම් කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එමඉල්ලුම්කරුවන් අතරින් නිවාස ආධාර ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සුදුසුකම් සපුරා ඇති ඉල්ලුම්කරුවන් සියල්ලන්ටම එම මුදල ලබා දෙනු ලබන දිනය කවරේද;

(iv) අලුත්වැඩියා කර ගැනීමට තරම්වත් නිවසක් නොමැති පැල්පත්වල ජීවත් වන වකුගඩු රෝගීන්ද සිටින බැවින්, ඔවුන්ට නිවසක් ඉදිකරදීමේ වැඩපිළිවෙළක් ආරම්භ කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணத்துறை மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபையினால் சிறுநீரக நோயாளர்கள் உள்ள குடும்பங்களின் வீடுகளை திருத்துவதற்கு உதவித் தொகை வழங்கப்படுகின்றதென்பதை அவர் அறிவாரா என்பதையும்;

(ii) மேற்படி அனுகூலத்தை பெற விண்ணப்பிப்பதற்கு தேவையான தகைமைகளும் சமர்ப்பிக்கப்பட வேண்டிய ஆவணங்களும் யாவை என்பதையும்;

(iii) அதன் கீழ் வீடொன்றை திருத்துவதற்கு வழங்கப்படும் தொகை எவ்வளவு என்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இதுவரையில் மேற்படி வீடமைப்பு உதவித் தொகையை பெறுவதற்கு விண்ணப்பித்துள்ள ஆட்களின் எண்ணிக்கை ஒவ்வொரு மாவட்டத்துக்கமைய வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி விண்ணப்பதாரிகளுள் வீடமைப்பு உதவித் தொகை வழங்கப்பட்டுள்ள ஆட்களின் எண்ணிக்கை ஒவ்வொரு மாவட்டத்துக்கமைய எவ்வளவு என்பதையும்;

(iii) தகைமைகளை பூர்த்தி செய்துள்ள விண்ணப்பதாரிகள் அனைவருக்கும் அத் தொகை வழங்கப்படும் திகதி யாதென்பதையும்;

(iv) திருத்துமளவுக்குக்கூட வீடு இல்லாத, குடிசைகளில் வசிக்கின்ற சிறுநீரக நோயாளர்களும் காணப்படுவதால், இவர்களுக்கு வீடொன்றை அமைத்துக் கொடுக்கும் வேலைத்திட்டமொன்றை ஆரம்பிப்பதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Cultural Affairs :

(a) Will he inform this House-

(i) whether he is aware of the fact that financial assistance is provided by the National Housing Development Authority for the repair of houses of families with kidney patients;

(ii) the qualifications required and the documents to be submitted, to apply for that benefit; and

(iii) the amount provided under that for the repair of a house?

(b) Will he also inform this House-

(i) the number of people who have applied for the aforesaid housing assistance by now per district, separately;

(ii) the number of people out of such applicants who have been provided with housing assistance per district, separately;

(iii) the date by which that money will be provided to all the applicants who have met the required qualifications; and

(iv) whether steps will be taken to start a programme to construct houses for kidney patients, as there are such patients who live in huts with no house to repair?

(c) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) 1. කාලික වකුගඩු රෝගයෙන් (CKDU) පෙළෙන සාමාජිකයා හෝ සාමාජිකයින් දැනට ජීවත්ව සිටීම.

2. කාලික වකුගඩු රෝගයට (CKDU) ගොදුරු වී රජයේ රෝහලක වකුගඩු රෝගී සායනයක ලියා පදිංචි වී සිටීම.

3. කාලික වකුගඩු රෝගය (CKDU) සඳහා විශේෂඥ වෛද්‍යවරයකුගේ නිර්දේශය මත අඛණ්ඩව ප්‍රතිකාර ගැනීම.

4. අදාළ ප්‍රතිලාභියා වෙත සෘජු හෝ වක්‍රව ඉදිකිරීමට යෝජිත නිවසේ හිමිකම තිබිය යුතුය. අදාළ හිමිකම ලිඛිත සාක්ෂි මඟින් සනාථ කිරීම අත්‍යවශ්‍ය වේ.

5. මීට පෙර ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ආධාර ලද ප්‍රතිලාභියකු නොවිය යුතුය.

6. ස්ථිර ආදායම් මාර්ගයක්/රැකියාවක් නොමැති අඩු ආදායම්ලාභී පවුලක් විය යුතුය.

(iii) නිවසක් වැඩිදියුණු කිරීම සඳහා උපරිමය රු.200,000.00ක් දක්වා ආධාර මුදලක් ලබාදෙනු ලැබේ.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(ආ) (i) 2019.03.08 දින දක්වා ලැබී ඇති ඉල්ලීම්වලට අනුව සකස් කළ ලේඛනය ඇමුණුම් අංක 01 යටතේ දක්වා ඇත.

ඇමුණුම් අංක 01

**කාලීක වකුගඩු රෝගය සඳහා 2016 වර්ෂයේ සිට 2019.03.08 දින දක්වා නිවාස අධාර ඉල්ලුම් කර ඇති පුද්ගල සංඛ්‍යාව**

| අනු අංකය | දිස්ත්‍රික්කය | ඉල්ලුම් කළ මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ඉල්ලුම් කළ මුළු මුදල රු.මිලියන |
|---|---|---|---|
| 1 | අනුරාධපුරය | 2077 | 611.020 |
| 2 | පොළොන්නරුව | 1950 | 506.650 |
| 3 | කුරුණෑගල | 445 | 123.250 |
| 4 | වවුනියාව | 191 | 72.000 |
| 5 | මාතලේ | 175 | 41.750 |
| 6 | බදුල්ල | 258 | 57.900 |
| 7 | මහනුවර | 79 | 22.200 |
| 8 | අම්පාර | 319 | 79.750 |
| 9 | ත්‍රිකුණාමලය | 147 | 42.300 |
| 10 | මුලතිව් | 525 | 208.520 |
| 11 | මොණරාගල | 149 | 46.645 |
| 12 | කළුතර | 93 | 25.550 |
| 13 | රත්නපුර | 90 | 29.200 |
| 14 | ගම්පහ | 21 | 6.300 |
| | **එකතුව** | **6519** | **1873.035** |

(ii) වකුගඩු රෝගීන් වෙනුවෙන් නිවාස ආධාර ලබාදීමේ වැඩසටහන සඳහා භාණ්ඩාගාරයෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන සීමාව තුළ ආධාර ලබා දුන් ප්‍රතිලාභී සංඛ්‍යාව ඇමුණුම් අංක 02 යටතේ දක්වා ඇත.

ඇමුණුම් අංක 02

**කාලීක වකුගඩු රෝගය සඳහා 2016 - 2019.03.08 දක්වා ලබා දුන් නිවාස ආධාර සංඛ්‍යාව**

| අනු අංකය | දිස්ත්‍රික්කය | ආධාර ලබා දුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ලබා දී ඇති මුදල (රුපියල් මිලියන) |
|---|---|---|---|
| 1 | අනුරාධපුරය | 1765 | 493.200 |
| 2 | පොළොන්නරුව | 1204 | 327.410 |
| 3 | කුරුණෑගල | 445 | 123.250 |
| 4 | වවුනියාව | 122 | 46.500 |
| 5 | මාතලේ | 141 | 32.500 |
| 6 | බදුල්ල | 70 | 12.100 |
| 7 | මහනුවර | 69 | 18.300 |
| 8 | අම්පාර | 319 | 70.850 |
| 9 | ත්‍රිකුණාමලය | 78 | 15.600 |
| 10 | මුලතිව් | 23 | 9.000 |
| 11 | මොණරාගල | 149 | 46.645 |
| 12 | කළුතර | 52 | 16.425 |
| 13 | රත්නපුර | 65 | 20.000 |
| 14 | ගම්පහ | 18 | 5.700 |
| | **එකතුව** | **4520** | **1237.480** |

(iii) මෙම වැඩසටහන වෙනුවෙන් එක් එක් වසර සඳහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන වෙන් කරන ප්‍රමාණයට අනුව ප්‍රතිලාභීන් සඳහා ආධාර ලබාදීම සිදු කරනු ලබයි. රෝගී තත්ත්වය හා නිවාස අවශ්‍යතාව අනුව ප්‍රමුඛතාව ලබා දියයුතු ආකාරයට ප්‍රතිලාභීන් වෙත ආධාර ලබාදීම සිදුකරයි.

(iv) I නව නිවසක අවශ්‍යතාව සහිත ඉඩමක් හිමි ඉල්ලුම්කරුවෙකුට උපරිමය රුපියල් 500,000.00ක සීමාව තුළ නිවාස ආධාර ලබාදීම දැනටමත් සිදු කරයි.

II උදාගම්මාන වැඩසටහන තුළ මෙවැනි ඉල්ලුම් කරුවන් සිටී නම්, නිවාස ඉදිකිරීම සඳහා ආධාර මුදල් හා අවශ්‍ය තාක්ෂණික සහාය ද ලබා දෙනු ලැබේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ගෝමරන්කඩවල, මොරවැව, පදවිශ්‍රීපුර, පුල්මුඩේ, සේරුවිල, කන්තලේ, තඹලගමුව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බහුතරයක වකුගඩු රෝගීන් සිටිනවා. මේ අය අතර පැල්පත්වල ජීවත් වන වකුගඩු රෝගීන් විශාල සංඛ්‍යාවක් ඉන්නවා. අන්න ඒ අයටත් නිවාස ආධාර ලබා දෙන ක්‍රමයක් පිළිබඳව ගරු ඇමතිතුමාගෙන් අසා දැනුවත් කරන්න පුළුවන් නම් ලොකු දෙයක්, ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

මා ලබා දුන් පිළිතුරට අනුව නම්, එවැනි අය අනිවාර්යයෙන්ම ඇතුළත් වන බව පෙනෙනවා. පැල්පත්වල ජීවත් වන අය අඩු ආදායම්ලාභී ගණයට වැටෙනවා නේ.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. මා සඳහන් කළ මොරවැව, ගෝමරන්කඩවල, පදවිශ්‍රීපුර යන ප්‍රදේශවල සමහර අයට රුපියල් ලක්ෂ පහක ආධාර දීලා තිබෙනවා. නමුත්, buildings පවා තිබෙන සමහර අයටත් මෙම ආධාර ලබා දී තිබෙනවා. Buildings පවා තිබෙන අයට මෙම ආධාර ලැබුණේ කොහොමද කියන කාරණය සම්බන්ධවත් ගරු ඇමතිතුමාගෙන් විමසා පිළිතුරක් ලබා දෙන්න කියා ඉල්ලීමක් කරනවා. මොකද, මම ඉහතින් සඳහන් කළ ආකාරයට, පැල්පත්වල ජීවත්වන වකුගඩු රෝගීන් ඊට වඩා විශාල සංඛ්‍යාවක් අපේ දිස්ත්‍රික්කය තුළ සිටිනවා. විශේෂයෙන්ම, වකුගඩු රෝගය හැදුණාට පසුව වෙනත් රැකියාවක් කරන්නට ඒ අයට අවකාශයක් නැහැ. ඒ මිනිස්සු ගොවිතැන්බත් කරමින් ජීවත් වන අය. නියඟය, වන අලි තර්ජන වැනි නොයෙකුත් ප්‍රශ්නවලට මුහුණ පා සිටින ඉතාමත්ම දුගී අය නිසා, ඒ අයට මේ සහනය ලබා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ඇත්ත වශයෙන්ම ඉඩමක් හිමි, නිවසක අවශ්‍යතාව තිබෙන පවුල්වලට තමයි රුපියල් ලක්ෂ 5 දීලා තිබෙන්නේ. ඔබතුමා කියන විධියේ දෙයක් සිදු වෙලා තිබෙනවාද කියා සොයා බැලීමට අපි ඇමතිතුමාට මේ කාරණය යොමු කරනවා.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම රුපියල් ලක්ෂ 5 මුදල buildings පවා තිබෙන අයට ලැබී තිබෙන බව මා

වගකීමෙන් කියනවා. ඒක ඇමතිතුමාගේවත්, කාගේවත් වරදක් නොවෙයි. එම ප්‍රාදේශීයව කටයුතු කරන කාගේ හරි වරදක් නිසා එය සිදු වෙලා තිබෙන්නේ. ඒ වරද නිවැරදි කරලා, අනෙක් අයටත් එම දීමනාව ලබාදෙන්න කියලා මා ඉල්ලීමක් කරනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
එහෙම ඒවා හරියට සිදුවෙලා තිබෙනවා. ගොඩනැඟිලි පවා හිමි, එවැනි නොයෙක් අය සමෘද්ධියත් සහනාධාරයත් ලබනවා. අපි එම කාරණයත් ඇමතිතුමාට යොමු කරන්නම්.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Second Round.

Question No.2 - 76/'18 - (2), the Hon. Dayasiri Jayasekara.

## 2018 මැයි මාසයේ ඇති වූ හදිසි ජල ගැලීම්වලින් පීඩාවට පත් ජනතාව: වන්දි
### 2018 மே மாதம் இடம்பெற்ற திடீர் வெள்ளப்பெருக்கினால் பாதிக்கப்பட்ட மக்கள்: இழப்பீடு
### PEOPLE AFFECTED BY FLASH FLOODS IN MAY 2018: COMPENSATION

76/'18

**2. ගරු මහින්ද අමරවීර මහතා (ගරු දයාසිරි ජයසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - மாண்புமிகு தயாசிறி ஜயசேகர சார்பாக)
(The Hon. Mahinda Amaraweera on behalf of the Hon. Dayasiri Jayasekara)
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) වර්ෂ 2018 මැයි මාසයේදී ඇති වූ හදිසි ජල ගැලීම්වලින් පීඩාවට පත් ජන සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) හානි වූ ජීවිත සංඛ්‍යාව කොපමණද;

(iii) හානි වූ නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ආපදා සහන කටයුතු සඳහා රජය වෙන්කළ මුදල කොපමණද;

(v) වන්දි වශයෙන් ගෙවන ලද මුදල කොපමණද;

(vi) වන්දි ලබාදුන් පවුල් සංඛ්‍යාව කොපමණද;

(vii) මේ වනවිට වන්දි ලබා දී නොමැති පවුල් සංඛ්‍යාව කොපමණද;

(viii) වන්දි ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாகம், அனர்த்த முகாமைத்துவம் மற்றும் கிராமியப் பொருளாதார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2018 மே மாதம் இடம்பெற்ற திடீர் வெள்ளப்பெருக்கினால் பாதிக்கப்பட்ட மக்களின் எண்ணிக்கை ஒவ்வொரு மாவட்டத்தின் அடிப்படையில் தனித்தனியே எவ்வளவென் பதையும்;

(ii) ஏற்பட்ட மரணங்களின் எண்ணிக்கை எவ் வளவென்பதையும்;

(iii) பாதிக்கப்பட்ட குடியிருப்புக்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(iv) அனர்த்த நிவாரண நடவடிக்கைகளுக்கு அரசாங் கம் ஒதுக்கிய தொகை எவ்வளவென்பதையும்;

(v) இழப்பீடாக செலுத்தப்பட்ட தொகை எவ்வளவென்பதையும்;

(vi) இழப்பீடு பெற்றுக்கொடுக்கப்பட்ட குடும்பங் களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(vii) இற்றைவரையில் இழப்பீடு பெற்றுக்கொடுக் கப்படாத குடும்பங்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(viii) இழப்பீடு பெற்றுக்கொடுக்கப்படாமைக்கான காரணங்கள் யாவையென்பதையும்;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Disaster Management and Rural Economic Affairs :

(a) Will he inform this House-

(i) in respect of each district separately, the number of people affected from the flash floods that occurred in May 2018;

(ii) the number of lives lost;

(iii) the number of houses that have been damaged;

(iv) the amount of money allocated by the government for disaster relief activities;

(v) the amount of money paid as compensation;

(vi) the number of families to whom the compensations have been paid;

(vii) number of families to whom the compensation have not been paid by now; and

(viii) the reason as to why compensations have not been paid?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

| | දිස්ත්‍රික්කය | බලපෑමට ලක් වූ | |
|---|---|---|---|
| | | පවුල් සංඛ්‍යාව | පුද්ගලයින් සංඛ්‍යාව |
| 1. | මහනුවර | 441 | 1,913 |
| 2. | ගාල්ල | 511 | 1,972 |
| 3. | රත්නපුර | 9,124 | 35,548 |
| 4. | බදුල්ල | 351 | 1,444 |
| 5. | නුවරඑළිය | 710 | 2,940 |
| 6. | කෑගල්ල | 1,582 | 5,990 |
| 7. | කළුතර | 1,580 | 6,147 |
| 8. | ගම්පහ | 12,929 | 50,734 |
| 9. | කුරුණෑගල | 3,661 | 12,630 |
| 10. | පුත්තලම | 12,516 | 45,676 |
| 11. | කොළඹ | 5,604 | 22,083 |
| 12. | මාතර | 140 | 505 |
| 13. | මොණරාගල | 14 | 52 |
| 14. | පොළොන්නරුව | 22 | 81 |
| 15. | මුලතිව් | 24 | 75 |
| 16. | හම්බන්තොට | 43 | 130 |
| 17. | වවුනියාව | 16 | 49 |
| 18. | අම්පාර | 4 | 15 |
| 19. | ත්‍රිකුණාමලය | 1 | 4 |
| 20. | අනුරාධපුර | 7 | 27 |
| 21. | යාපනය | 12 | 44 |
| 22. | මාතලේ | 72 | 269 |
| 23. | මඩකලපුව | 0 | 0 |
| | එකතුව | 49,364 | 188,328 |

වැඩිදුර තොරතුරු ඇමුණුම 03* මඟින් දැක්වේ.

(ii)

| | දිස්ත්‍රික්කය | හානි වූ ජීවිත සංඛ්‍යාව |
|---|---|---|
| 1. | ගාල්ල | 1 |
| 2. | රත්නපුර | 2 |
| 3. | බදුල්ල | 2 |
| 4. | නුවරඑළිය | 1 |
| 5. | කෑගල්ල | 3 |
| 6. | කළුතර | 2 |
| 7. | ගම්පහ | 4 |
| 8. | කුරුණෑගල | 3 |
| 9. | පුත්තලම | 3 |
| 10. | කොළඹ | 1 |
| 11. | මොණරාගල | 1 |
| 12. | පොළොන්නරුව | 2 |
| 13. | මඩකලපුව | 1 |
| | එකතුව | 26 |

වැඩිදුර තොරතුරු ඇමුණුම 03** මඟින් දැක්වේ.

(iii)

| | දිස්ත්‍රික්කය | නිවාස හානි | |
|---|---|---|---|
| | | පූර්ණ හානි | අර්ධ හා පාර්ශවීය හානි |
| 1. | මහනුවර | 7 | 187 |
| 2. | ගාල්ල | 10 | 247 |
| 3. | රත්නපුර | 19 | 610 |
| 4. | බදුල්ල | 0 | 289 |
| 5. | නුවරඑළිය | 10 | 333 |
| 6. | කෑගල්ල | 6 | 905 |
| 7. | කළුතර | 11 | 327 |
| 8. | ගම්පහ | 9 | 3,350 |
| 9. | කුරුණෑගල | 46 | 320 |
| 10. | පුත්තලම | 59 | 1,069 |
| 11. | කොළඹ | 1 | 2,742 |
| 12. | මාතර | 5 | 135 |
| 13. | මොනරාගල | 0 | 13 |
| 14. | පොළොන්නරුව | 0 | 20 |
| 15. | මුලතිව් | 1 | 23 |
| 16. | හම්බන්තොට | 1 | 41 |
| 17. | වවුනියාව | 0 | 15 |
| 18. | අම්පාර | 0 | 4 |
| 19. | ත්‍රිකුණාමලය | 0 | 1 |
| 20. | අනුරාධපුර | 0 | 3 |
| 21. | යාපනය | 1 | 5 |
| 22. | මාතලේ | 0 | 69 |
| 23. | මඩකලපුව | 0 | 0 |
| | එකතුව | 186 | 10,708 |

වැඩිදුර තොරතුරු ඇමුණුම 03** මඟින් දැක්වේ.

(iv) අදාළ තොරතුරු ඇමුණුම 04** මඟින් දැක්වේ.

(v) දිස්ත්‍රික්ක අනුව ගෙවන ලද මුදල සම්බන්ධ තොරතුරු ඇමුණුම 05** මඟින් දැක්වේ.

(vi) අදාළ තොරතුරු ඇමුණුම 05** මඟින් දැක්වේ.

(vii) ජාතික රක්ෂණ භාර අරමුදල මඟින් අදාළ තොරතුරු ඉල්ලුම් කර ඇත.

(viii) ජාතික රක්ෂණ භාර අරමුදල මඟින් අදාළ තොරතුරු ලද පසු ඉදිරිපත් කරමි.

(ආ) පැන නොනඟී.

---

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Question No.6 - 255/'18, - (2), the Hon. Pathma Udhayashantha Gunasekera.

## ප්‍රතිසංස්කරණය කළ වාරි මාර්ග: අනුරාධපුර දිස්ත්‍රික්කය
## புனரமைக்கப்பட்ட நீர்ப்பாசனத் திட்டங்கள்: அனுராதபுர மாவட்டம்
## RENOVATED IRRIGATION SCHEMES: ANURADHAPURA DISTRICT

255/'18

**6. ගරු මහින්ද අමරවීර මහතා (ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக)
(The Hon. Mahinda Amaraweera on behalf of the Hon. R.M. Padma Udhayashantha Gunasekera)

කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා පරිමාණ වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස් හෝ වැලි සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත් කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள் அபிவிருத்தி, நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரகவள மூலங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015, 2016 மற்றும் 2017 ஆம் ஆண்டுகளில் அனுராதபுர மாவட்டத்தில் புனரமைக்கப்பட்ட சிறிய, மத்திய மற்றும் பாரிய அளவிலான நீர்ப்பாசனத் திட்டங்கள் யாவையென்பதையும்;

(ii) ஒவ்வொரு புனரமைப்புப் பணிக்காகவும் மதிப்பிடப்பட்ட பணத்தொகை தனித்தனியாக எவ்வளவென்பதையும்;

(iii) மேற்படி புனரமைப்புப் பணிகளுக்காக கேள்விப் பத்திரங்கள் கோரப்பட்டனவா என்பதையும்;

(iv) ஆமெனில், அக் கேள்விப் பத்திரங்களைப் பெற்றுக்கொண்ட ஒப்பந்தகாரர்களின் பட்டியலொன்றை சமர்ப்பிப்பாரா என்பதையும்;

(v) மேற்படி ஒவ்வொரு வருடத்துக்கும் ஏற்புடையதான புனரமைப்புப் பணிகளின் பௌதீக மற்றும் நிதிசார் முன்னேற்றம் தனித்தனியாக யாதென்பதையும்;

(vi) மேற்படி புனரமைப்புப் பணிகளுக்கான சாத்தியக்கூறு ஆய்வு, சுற்றாடல் மற்றும் பொறியியல் அறிக்கைகளை சமர்ப்பிப்பாரா என்பதையும்;

(vii) மேற்படி புனரமைப்புப் பணிகளின் போது அகற்றப்பட்ட வண்டல் படிவு, மண் அல்லது மணலுக்காக கேள்விப் பத்திரங்கள் கோரப்பட்டனவா என்பதையும்;

(viii) ஆமெனில், அக் கேள்விப் பத்திரங்களை பெற்றுக்கொண்ட ஒப்பந்தகாரர்களின் பட்டியலொன்றை சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock Development, Irrigation and Fisheries and Aquatic Resources Development :

(a) Will he inform this House-

(i) minor, medium and major scale irrigation schemes renovated in Anuradhapura District in the years 2015, 2016 and 2017;

(ii) the estimated amount for each renovation work, separately;

(iii) whether tenders were called for the said renovation work;

(iv) if so, whether a list of names of the contractors who obtained those tenders will be submitted;

(v) physical and financial progress of the renovation work of that contract with relevance to each of the aforesaid years;

(vi) whether the feasibility study, environmental and engineering reports relevant to that renovation work will be submitted;

(vii) whether tenders were called for the silt, soil or sand removed in renovation work; and

(viii) if so, whether a list of names of the contractors who obtained those tenders will be submitted?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i)

| වර්ෂය | සුළු පරිමාණ වාරිමාර්ග |
|---|---|
| 2015 | වාරි ප්‍රතිසංස්කරණය |
| 2016 | වැව් ප්‍රතිසංස්කරණය |
| | එල්ලංගා ප්‍රතිසංස්කරණය |
| | ගංවතුර හානි |
| 2017 | අමුණු සුළු අලුත්වැඩියාව |
| | ඇළ මාර්ග වැඩිදියුණු කිරීම |
| | වැව් ගැඹුරු කිරීම |
| | මැනුම් සමීක්ෂණ කටයුතු සඳහා |
| | අත්හැර දමන ලද වැව් පිළිසකර කිරීම |
| | වැව් ප්‍රතිසංස්කරණය |
| | වැව් සුළු අලුත්වැඩියාව |
| | එල්ලංගා වැව් ප්‍රතිසංස්කරණය |

මධ්‍යම පරිමාණ වාරිමාර්ග - අනුරාධපුර දිස්ත්‍රික්කයේ 2015,2016 වසරවල මධ්‍යම පරිමාණ වාරිමාර්ග ව්‍යාපාර අසූ දෙකක් (82) සහ 2017 වසරේදී මධ්‍යම පරිමාණ වාරිමාර්ග ව්‍යාපාර අසූ තුනක් (83) වාරිමාර්ග පද්ධති මෙහෙයුම් හා නඩත්තු, නිර්මිත ඉදිකිරීම් සහ මූලස්ථායී වැඩ ප්‍රතිසංස්කරණය, කෘෂි මාර්ග වැඩි දියුණු කිරීම් කටයුතු, දෙපාර්තමේන්තු ඉඩම් හා අනෙකුත් වත්කම් ආරක්ෂා කර ගැනීම, ගංවතුර හානි අලුත්වැඩියාවන් සිදු කර ඇත. එම ව්‍යාපාර ඇමුණුම 01 මඟින් ඉදිරිපත් කර ඇත.

මහා පරිමාණ වාරි මාර්ග - 2015, 2016,2017 වසරවලදී මහා පරිමාණ වාරිමාර්ග ව්‍යාපාර දොළහක (12) වාරිමාර්ග පද්ධති මෙහෙයුම් හා නඩත්තු, නිර්මිත ඉදිකිරීම් සහ මූලස්ථායී වැඩ ප්‍රතිසංස්කරණය, කෘෂි මාර්ග නඩත්තු කටයුතු, ඇළ මාර්ග වැඩි දියුණු කිරීම් කටයුතු, දෙපාර්තමේන්තු ඉඩම් හා අනෙකුත් වත්කම් ආරක්ෂා කර ගැනීම, ගංවතුර හානි අලුත්වැඩියාවන් සිදු කර ඇත. එම ව්‍යාපාර පහත පරිදි ඉදිරිපත් කර ඇත.

| වර්ෂය | මහා පරිමාණ වාරිමාර්ග ව්‍යාපාර |
|---|---|
| 2015, 2016, 2017 | නුවරවැව |
| | තිසාවැව |
| | අභයවැව |
| | මහවිලච්චිය |
| | මහකනදරාව |
| | නාච්චාදූව |
| | තුරුවිල |
| | හුරුළුවැව |
| | මානන්කට්ටිය |
| | රාජාංගනය |
| | පදවිය |
| | වාහල්කඩ |

(ii)

| වර්ෂය | සුළු පරිමාණ වාරිමාර්ග | ඇස්තමේන්තු මුදල (රු.) | මුළු ඇස්තමේන්තු මුදල (රු.) |
|---|---|---|---|
| 2015 | වාරි ප්‍රතිසංස්කරණය | 116,400,000.00 | 116,400,000.00 |
| 2016 | වැව් ප්‍රතිසංස්කරණය | 151,855,000.00 | 472,011,266.00 |
| | එල්ලංගා ප්‍රතිසංස්කරණය | 18,920,000.00 | |
| | ගංවතුර හානි | 301,236,266.00 | |
| 2017 | අමුණු සුළු අළුත්වැඩියාව | 2,030,000.00 | 648,292,832.80 |
| | ඇළ මාර්ග වැඩිදියුණු කිරීම | 8,796,832.80 | |
| | වැව් ගැඹුරු කිරීම | 607,921,000.00 | |
| | මැනුම් සමීක්ෂණ කටයුතු සඳහා | 4,080,000.00 | |
| | අත්හැර දමන ලද වැව් පිළිසකර කිරීම | 3,000,000.00 | |
| | වැව් ප්‍රතිසංස්කරණය | 6,800,000.00 | |
| | වැව් සුළු අළුත්වැඩියාව | 4,060,000.00 | |
| | එල්ලංගා වැව් ප්‍රතිසංස්කරණය | 11,605,000.00 | |
| 2015, 2016, 2017 වසර සඳහා මුළු ඇස්තමේන්තු මුදල (රු.) | | | 1,236,704,098.80 |

| වර්ෂය | මධ්‍යම පරිමාණ වාරිමාර්ග | ඇස්තමේන්තු මුදල (රු.) | මුළු ඇස්තමේන්තු මුදල (රු.) |
|---|---|---|---|
| 2015 | මෙහෙයුම් හා නඩත්තු | 96,694,158.00 | 170,264,158.00 |
| | ගංවතුර හානි අලුත්වැඩියාවන් | 58,840,000.00 | |
| | දෙපාර්තමේන්තු රක්ෂිත හා ඉඩම් ආරක්ෂා කිරීම | 1,114,000.00 | |
| | ප්‍රධාන සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතු (දෙපාර්තමේන්තු ශීර්ෂ) | 9,875,000.00 | |
| | මූලස්ථායි වැඩ ශක්තිමත් කිරීම | 3,741,000.00 | |
| 2016 | මෙහෙයුම් හා නඩත්තු | 95,120,571.33 | 233,900,621.33 |
| | ගංවතුර හානි අලුත්වැඩියාවන් | 10,084,600.00 | |
| | දෙපාර්තමේන්තු රක්ෂිත හා ඉඩම් ආරක්ෂා කිරීම | 954,000.00 | |
| | ප්‍රධාන සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතු (දෙපාර්තමේන්තු ශීර්ෂ) | 111,737,000.00 | |
| | දෙපාර්තමේන්තු මාර්ග නඩත්තු කිරීම | 5,792,500.00 | |
| | මූලස්ථායි වැඩ ශක්තිමත් කිරීම | 10,211,950.00 | |
| 2017 | මෙහෙයුම් හා නඩත්තු | 78,377,558.33 | 175,393,458.33 |
| | ගංවතුර හානි අලුත්වැඩියාවන් | 64,285,000.00 | |
| | ප්‍රධාන සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතු (දෙපාර්තමේන්තු ශීර්ෂ) | 24,096,900.00 | |
| | දෙපාර්තමේන්තු මාර්ග නඩත්තු කිරීම | 2,318,000.00 | |
| | මූලස්ථායි වැඩ ශක්තිමත් කිරීම | 6,316,000.00 | |
| 2015, 2016, 2017 වසර සඳහා මුළු ඇස්තමේන්තු මුදල (රු.) | | | 579,558,237.66 |

| වර්ෂය | මහා පරිමාණ වාරිමාර්ග | ඇස්තමේන්තු මුදල (රු.) | මුළු ඇස්තමේන්තු මුදල (රු.) |
|---|---|---|---|
| 2015 | මෙහෙයුම් හා නඩත්තු | 112,099,712.00 | 155,582,577.00 |
| | ගංවතුර හානි අලුත්වැඩියාවන් | 38,345,295.00 | |
| | දෙපාර්තමේන්තු රක්ෂිත හා ඉඩම් ආරක්ෂා කිරීම | 1,939,800.00 | |
| | ප්‍රධාන සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතු (දෙපාර්තමේන්තු ශීර්ෂ) | 45,316,000.00 | |
| | දෙපාර්තමේන්තු මාර්ග නඩත්තු කිරීම | 3,197,800.00 | |
| 2016 | මෙහෙයුම් හා නඩත්තු | 101,830,514.77 | 258,991,644.77 |
| | ගංවතුර හානි අලුත්වැඩියාවන් | 28,561,930.00 | |
| | දෙපාර්තමේන්තු රක්ෂිත හා ඉඩම් ආරක්ෂා කිරීම | 6,521,000.00 | |
| | ප්‍රධාන සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතු (දෙපාර්තමේන්තු ශීර්ෂ) | 103,537,800.00 | |
| | දෙපාර්තමේන්තු මාර්ග නඩත්තු කිරීම | 6,854,100.00 | |
| | මූලස්ථායි වැඩ ශක්තිමත් කිරීම | 3,103,000.00 | |
| | ප්‍රධාන සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතු (අමාත්‍යාංශ වැය ශීර්ෂ) | 8,585,300.00 | |
| 2017 | මෙහෙයුම් හා නඩත්තු | 122,815,412.80 | 217,930,162.80 |
| | ගංවතුර හානි අලුත්වැඩියාවන් | 31,211,200.00 | |
| | දෙපාර්තමේන්තු රක්ෂිත හා ඉඩම් ආරක්ෂා කිරීම | 733,750.00 | |
| | ප්‍රධාන සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතු (දෙපාර්තමේන්තු ශීර්ෂ) | 26,340,500.00 | |
| | දෙපාර්තමේන්තු මාර්ග නඩත්තු කිරීම | 3,649,500.00 | |
| | මූලස්ථායි වැඩ ශක්තිමත් කිරීම | 2,732,000.00 | |
| | ප්‍රධාන සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතු (අමාත්‍යාංශ වැය ශීර්ෂ) | 30,447,800.00 | |
| 2015 2016 2017 | වෙලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය | | 1,082,790,803.11 |
| | දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය | | 754,808,952.44 |
| | ඵලදායිතා ප්‍රවර්ධන හා වාරිමාර්ග පද්ධතිය කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | | 49,020,178.69 |
| 2015, 2016, 2017 වසර සඳහා මුළු ඇස්තමේන්තු මුදල (රු.) | | | 2,564,442,318.81 |

(iii) සුළු පරිමාණ වාරිමාර්ග - ක්‍රියාත්මක කරන ලද රුපියල් මිලියන 05ට අඩු ව්‍යාපෘති සෘජු කොන්ත්‍රාත් ලෙස අදාළ ගොවි සංවිධාන වෙත පවරා ඉටු කරන ලද අතර ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අදාළ දිස්ත්‍රික්කයන් වෙත ලබා දෙන අතර දිස්ත්‍රික් භාර නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරු විසින් අදාළ කොන්ත්‍රාත් පිරිනමනු ලබයි.

මධ්‍ය හා මහා පරිමාණ වාරිමාර්ග - ටෙන්ඩර් කැඳවීමෙන් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන ලද ව්‍යාපෘතිද ඇති බව සඳහන් කරමි.

(iv) සුළු පරිමාණ වාරිමාර්ග - ඇමුණුම 02** මගින් දක්වා ඇත.

මධ්‍ය හා මහා පරිමාණ වාරිමාර්ග - අමුණුම 03** මගින් දක්වා ඇත.

(v) සුළු පරිමාණ වාරිමාර්ග

| වර්ෂය | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| 2015 | | වැඩ අවසන් | අවිච්ඡේද |
| 2016 | 91.18 | 89 | - |
| 2017 | 60.63 | 97 | 16 |
| | 57.93 | 65 | 121 |

මහා හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග - සියලුම කාර්යයන් වෙන් කරන ලද ප්‍රතිපාදන යටතේ අවසන් කර ඇති අතර භෞතික හා මූල්‍ය ප්‍රගතිය 100% දක්වා ළඟා කර ගෙන ඇති බව දන්වා සිටිමි.

(vi) සුළු පරිමාණ වාරිමාර්ග - අදාළ නොවේ.

මධ්‍ය හා මහා පරිමාණ වාරිමාර්ග - දැනට පවතින ව්‍යාපාරවල ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන හා අලුත්වැඩියා කිරීම් කටයුතු සඳහා ශක්‍යතා අධ්‍යයන වාර්තා සකස් කිරීම අවශ්‍ය නොවන බව කාරුණිකව සඳහන් කරමි. සියලු කාර්යයන් සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනයක් සිදුකර සැලසුම් කිරීමෙන් අනතුරුව ඇස්තමේන්තු සකස් කර ඇති බව සඳහන් කරමි.

වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය (DSWRPP) හා දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (CRIP ) සඳහා ශක්‍යතා අධ්‍යයන වාර්තා සකස් කර ඇත. ඵලදායිතා ප්‍රවර්ධන සහ වාරි පද්ධති වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියද (PEISEIP) රජයේ අනුමත ව්‍යාපෘතියක් බැවින් ව්‍යාපෘති සංකල්ප හා නිර්නායකයන්ට අනුව සියලු කටයුතු සිදු කරනු ලබයි.

(vii) නැත.

(viii) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

## අනුරාධපුර දිස්ත්‍රික්කයේ අබලන් වූ ග්‍රාමීය මාර්ග : ප්‍රතිසංස්කරණය

அநுராதபுரம் மாவட்டத்தில் பழுதடைந்துள்ள கிராமிய வீதிகள்: புனரமைப்பு

DILAPIDATED RURAL ROADS IN ANURADHAPURA DISTRICT: REVOVATION

335/'18

**7. ගරු කේ.කේ. පියදාස මහතා (ගරු ඉෂාක් රහුමාන් මහතා වෙනුවට)**

(மாண்புமிகு கே.கே. பியதாஸ - மாண்புமிகு இஷாக் ரஹுமான் சார்பாக )

(The Hon. K. K. Piyadasa on behalf of the Hon. Ishak Rahuman)

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මාර්ග බොහොමයක් අබලන් වීම හේතුවෙන් මහජනතාව දැඩි අපහසුතාවයට පත්වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, මෙම මාර්ග කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அநுராதபுரம் மாவட்டத்தின் பெருமளவிலான கிராமிய வீதிகள் பழுதடைந்துள்ளதன் காரணமாக பொதுமக்கள் பெரும் சிரமங்களுக்கு உள்ளாகியுள்ளனர் என்பதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், இவ்வீதிகளைத் துரிதமாக மறுசீரமைப்பதற்கு நடவடிக்கை எடுக்கப்படும் திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Internal & Home Affairs and Provincial Councils and Local Government :

(a) Will he inform this House-

(i) whether it is aware that the public is experiencing immense difficulties due to most of the rural roads in the Anuradhapura district being in a dilapidated state; and

(ii) if so, the date on which measures will be taken to renovate these roads immediately?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க)

(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

* *Answer tabled:*

(අ) (i) දනිමි.

(ii) උතුරු මැද පළාත් සභාව දිස්ත්‍රික්ක 02කින් සමන්විත වෙයි. මෙකී බල ප්‍රදේශය තුළ ග්‍රාමීය මාර්ග බොහොමයක් පවතී. එකී මාර්ග වලින් කොටසක් මධ්‍යම රජයේ ප්‍රතිපාදන වලින සහ ප්‍රාදේශීය සභා අරමුදල් යටතේ ප්‍රතිසංස්කරණයට කටයුතු කර ඇති අතර, තවමත් ප්‍රතිසංස්කරණය කිරීමට නියමිත මාර්ග 2019 වර්ෂයට අදාළ ප්‍රතිපාදන යටතේ ඉටු කිරීමට නියමිතය.

(ආ) අදාළ නොවේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**

(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)

(The Hon. Deputy Chairman of Committees)

ප්‍රශ්න අංක 8 - 381/'18 - (3), ගරු එස්.එම්. මරික්කාර් මහතා.

***** පුස්තකාලයේ තබා ඇත.***

*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

*** Placed in the Library.*

**ගරු කේ.කේ. පියදාස මහතා**
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු එස්.එම්. මරික්කාර් මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ප්‍රශ්න අංක 11 - 565/'19 - (2), ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා.

**ගරු කේ.කේ. පියදාස මහතා**
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next is, Question under Standing Order 27(2), to be asked by the Hon. Anura Dissanayake.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු සභානායකතුමනි, පිළිතුරු ලබා දෙන්නේ කවුද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු සාගල රත්නායක ඇමතිතුමා තමයි පිළිතුරු දෙන්න ඕනෑ. එතුමා කල් ඉල්ලා තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු මන්ත්‍රීතුමනි, එතුමා විදේශගත වීම නිසා පැමිණෙන ඊළඟ දිනයේ දී පැහැදිලි පිළිතුරක් ලබා දෙන බව සඳහන් කළා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගිය සතියේ මම EPF අරමුදල පිළිබඳව ප්‍රශ්නයක් අහනකොට ඔබතුමා ඔය ආකාරයටම එකඟ වුණා. අග්‍රාමාත්‍යතුමා අද පාර්ලිමේන්තුවේදී පිළිතුරක් ලබාදෙන බව සඳහන් කළා.

මම ඔබතුමාගෙන් විශේෂයෙන් විමසා සිටියා. එතකොට ඔබතුමා කිව්වා, මේ පාර්ලිමේන්තුවේ මේ සතියේ පළමු දිනයේ දී පිළිතුරක් ලබා දෙන බව. නමුත් එහෙම පිළිතුරක් අද තවම නැහැ.

EPF අරමුදල කොල්ල කෑම පිළිබඳව, අග්‍රාමාත්‍යවරයා තව මොහොතකින් එහෙම පිළිතුරක් ලබා දෙනවාද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඇත්ත වශයෙන්ම එහෙම කොල්ල කෑමක් සිදුවෙලා නැහැ. මෙතුමා ප්‍රශ්නය අහපු වෙලාවේ මම කිව්වා, සේවක අර්ථසාධක අරමුදලේ සල්ලිවලට ආණ්ඩුව වග කියනවා කියලා. ඒ සඳහා ආණ්ඩුව ඇප වෙලා තිබෙනවා. එතැන කොල්ල කෑමක් සිදුවෙලා නැහැ. උත්තරයක් දෙනවාය කියා කියූ බව මම පිළිගන්නවා. මේ සතිය ඇතුළත මම උත්තරයක් ලබා දෙන්නම්. මම ඒක පිළිගන්නවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කුකුළු කූඩු භාරගත් සමහර නරින් කියනවා, අපි කුකුළන් ගැන වග කියනවා කියලා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### කොළඹ වරායේ නැඟෙනහිර බහලුම් පර්යන්තය ඉන්දියාවට සහ ජපානයට පවරා දීම
### கொழும்புத் துறைமுக கிழக்குக் கொள்கலன் முனையத்தை இந்தியா மற்றும் ஜப்பானிடம் கையளித்தல்
### HANDING OVER OF EAST CONTAINER TERMINAL AT COLOMBO PORT TO INDIA AND JAPAN

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කොළඹ වරායේ නැඟෙනහිර බහලුම් පර්යන්තය අවබෝධතා ගිවිසුමක් යටතේ ඉන්දියාවට සහ ජපානයට පවරා දී ඇති බවට වන පුවත් හේතුවෙන් පැන නැඟී ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මෙම සභාවේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

කොළඹ වරායේ වැදගත්ම කොටසක් වූද, විශාල නැව් පැමිණිය හැකි ලෙසට 2015දී නවීකරණය කර තිබුණා වූද, ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් නැඟෙනහිර බහලුම් පර්යන්තය හෙවත් නැඟෙනහිර ජැටිය ඉන්දියාවට සහ ජපානයට පැවරීමට ආණ්ඩුව විසින් පසුගිය 28වන දා ගිවිසුම් අත්සන් කර ඇති බවට මාධ්‍ය වාර්තා කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සමාජයේ සියලු දෙනාගේම අවධානය වෙනත් දේවල්වලට යොමුවෙලා තිබෙන වෙලාවක, සමාජයේ විවිධ ගැටලුකාරී සහ අර්බුදකාරී තත්ත්වයක්, ව්‍යසනකාරී තත්ත්වයක් මතුවෙලා තිබෙන වෙලාවක, ආණ්ඩුව

ඉතාම කුමන්ත්‍රණකාරී හා සැලසුම් සහගත ලෙස පසුගිය 28වන දා මෙම ගිවිසුම අත්සන් කොට කොළඹ වරායේ නැඟෙනහිර ජැටිය ඉන්දියාවට සහ ජපානයට පවරා දී තිබෙනවා.

මෙම ජැටිය ලංකා බැංකුවේ ඩොලර් මිලියන 80ක ණය මුදලක ආධාරයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් 2015දී නවීකරණය කර තිබුණා. එහි ඉතිරි වැඩ කටයුතු අවසන් කර, මෙහෙයුම්වලින් ලාභ ලබා ගැනීම සඳහා කළ යුතු කාර්යයන් පිළිබඳව වරාය වෘත්තීය සමිති විසින් ඒ කාලයේම ආණ්ඩුවට යෝජනා ඉදිරිපත් කර තිබුණා. මොකද, 2015දී එම ජැටිය ණය මුදලක් අරගෙන නවීකරණය කොට අවසන් කර තිබුණත්, අවශ්‍ය අනෙකුත් උපාංග මිලදී ගැනීමට ආණ්ඩුව කටයුතු කළ නිසා එහි මෙහෙයුම් කටයුතු කළේ නැහැ. කෙසේ වුවද, ආණ්ඩුව පසුගිය කාලය පුරාවටම එම යෝජනා සැලකිල්ලට ගත්තේ නැහැ. විශේෂයෙන්ම එම යෝජනා මත පදනම් වෙමින් හිටපු වරාය අමාත්‍යවරයා විසින් කැබිනට් මණ්ඩලයට කරන ලද යෝජනාවක් ප්‍රතික්ෂේප කරන ලද බවද වාර්තා වුණා.

මා දන්නවා, අර්ජුන රණතුංග මහත්මයා වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා හැටියට කටයුතු කරන කොට, එම නැඟෙනහිර ජැටිය වරාය අධිකාරිය අතේ තබාගෙන -එහි හිමිකාරිත්වය වරාය අධිකාරිය සතුව තබාගෙන- එම ජැටිය රටේ ආර්ථිකයට ඉවහල් වන විධියට, ආර්ථිකයට ප්‍රතිලාභ ලැබෙන විධියට මෙහෙයවිය යුත්තේ කෙසේද කියන එක පිළිබඳව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළ බව. නමුත් තමුන්නාන්සේලාගේ කැබිනට් මණ්ඩලය කළේ මොකක්ද? එම කැබිනට් පත්‍රිකාව ප්‍රතික්ෂේප කළා. හැබැයි, මේ කැබිනට් මණ්ඩලය, එය ඉන්දියාවට සහ ජපානයට පවරා දෙන්න හදනකොට නවීන් දිසානායක අමාත්‍යතුමා පවා එක හෙළාම අත ඔසවනවා.

මෙවැනි තත්ත්වයක් තුළ ආණ්ඩුව එය රහසේම විදෙස් රටවල් දෙකකට පැවරීමට තීරණය කර තිබෙනවා. පසුගිය 28වැනි දින හදිසියේම ඉන්දියානු මහ කොමසාරිස්වරයා, ජපාන තානාපතිවරයා හා වරාය අමාත්‍යවරයා අතර අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුමක් මඟින් එහි පාලනය එම රටවලට පවරා දී ඇතැයි වාර්තා වෙනවා.

මේ වන විට කොළඹ වරායේ 'සවුත් ඒෂියා ගේට්වේ' බහලුම් පර්යන්තය ජෝන් කීල්ස් සමාගම මඟින් පාලනය වනවා. 'කලම්බු ඉන්ටර්නැෂනල්' බහලුම් පර්යන්තය චයිනා මර්චන්ට් හෝල්ඩිං සමාගම මඟින් පාලනය වනවා. මෙලෙස විදෙස් අයිතියකට පවරා දී ඇත්තේ විශාල නැව්වලට අදාළ මෙහෙයුම් සිදු කළ හැකි ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු එකම ජැටියයි.

වාර්තා වන අන්දමට ආණ්ඩුව විසින් මෙම ගිවිසුමට එළඹීමේ හදිසි තීරණය ගෙන තිබෙන්නේ ඉන්දියානු මැතිවරණයේ ප්‍රතිඵලය අනුව මෝදි නැවතත් අගමැති ධුරයට පත් වන බවට ස්ථිර වෙමින් තිබියදී ඉන්දියානු බලපෑමට නතු වීමෙනුයි.

නව ලිබරල්වාදී ආර්ථික ක්‍රමය ඉදිරියට ගෙන යෑම හැරෙන්නට වෙනත් විකල්පයක් නොමැති ආණ්ඩුව සිදු කරමින් සිටින්නේ කවර ආකාරයේ නාමකරණයක් යටතේ හෝ ස්වාභාවික සම්පත් සහ රාජ්‍ය දේපළ අයිතිය අත් හැරීමයි. රාජ්‍ය දේපළක් ලෙස තබා ගනිමින් ලාභ ලැබිය හැකිව තිබූ මෙම නැඟෙනහිර බහලුම් පර්යන්තය විදෙස් රටවලට පැවරීම ද එහිම දිගුවක් වන බව පැහැදිලියි. විශේෂයෙන් මේ හේතුවෙන්, වරායේ සේවය කරන 10,000ක් පමණ වන සේවකයන්ගේ රැකියා අහිමි වීමේ අවදානමක් ඇති බවට වෘත්තීය සමිති චෝදනා කරනවා. කොළඹ වරාය වැනි ආර්ථික මර්මස්ථානයක මෙබඳු රාජ්‍ය අයිතිය අත් හැරීමක් රටේ ආර්ථික ස්වාධීනත්වය පාවා දීමක් බවට ප්‍රකාශයට පත් වනවා.

විශේෂයෙන් චීනය කොළඹ වරාය ආශ්‍රිතව ස්ථානගත වීම නිසා ඉන්දියාවට ද එහි ස්ථානගත වීමේ බලවත් වුවමනාවක් තිබූ බව පැහැදිලියි. අපි දන්නවා, පසුගිය මහින්ද රාජපක්ෂ පාලනය මෙහි ඉතාම වැදගත්, දකුණු වරාය සංවර්ධන ව්‍යාපෘතිය ලබා දුන්නේ චීන සමාගමක් වෙත බව. ඒ නිසා ඉන්දියාවෙන් නිරන්තරයෙන් බලපෑම් එල්ල වුණා, වරායේ නැඟෙනහිර ජැටිය ඉන්දියාවට ලබා ගැනීම වෙනුවෙන්. ආණ්ඩුව සිදු කර ඇති මෙම ගිවිසුම අත්සන් තැබීම, පෙර තත්ත්වයට හිලව් කප්පමක් ගෙවීමක් ලෙස හැඳින්විය හැකියි.

විශේෂයෙන් රටේ ජනතාවගේ අවධානය වෙනත් දිශාවකට යොමු වී ඇති මොහොතක, ආණ්ඩුව ජනතාවට රහසේ හදිසියේම මෙම ගිවිසුම අත්සන් තැබීම මෙම සභාවේ අවධානයට ලක් විය යුතුයයි සිතනවා.

මේ තත්ත්වය තුළ පැන නඟින පහත ගැටලුවලට ගරු අමාත්‍යවරයා පිළිතුරු ලබා දෙනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

1. රටේ මුදල් ආයෝජනය කර නවීකරණය කරන ලද නැඟෙනහිර බහලුම් පර්යන්තයේ වැඩ අවසන් කොට ප්‍රයෝජනයට ගැනීම සඳහා වූ වෘත්තීය සමිති ඇතුළු වරාය අධිකාරියේ යෝජනා ප්‍රතික්ෂේප කරනු ලැබුවේ ඇයි?
2. කොළඹ වරායේ නැඟෙනහිර ජැටියේ පාලනය ඉන්දියාවට සහ ජපානයට පවරා දීමේ ක්‍රියාවලිය මේ වන විට අවසන් වී තිබේද?
3. විදෙස් රටකට පැවරීමෙන් තොරව නැඟෙනහිර ජැටිය වැඩි දියුණු කළ නොහැකි බවටත්, ලාභ ලැබිය නොහැකි බවටත් තීරණය කළේ කවුරුන් ද? ඒ සඳහා උපයෝගි කර ගන්නා ලද නිර්ණායකයන් කවරේ ද?
4. වරාය ජැටිය ඉන්දියාවට පැවරීම සඳහා ආණ්ඩුවට යම් බල කිරීමක් හෝ ඒ අන්දමේ කවර හෝ බලපෑමක් විදෙස් රටකින් ලංකාවට සිදු වී තිබේ ද? එසේ වී නම්, ඒ කවර රටකින් ද? ඒ කුමන ආකාරයෙන් ද?
5. පසමිතුරු බල කඳවුරු දෙකකට කොළඹ වරායේ හිමිකම් පැවරීම, -පැවති පාලනය කොළඹ වරායේ දකුණු ජැටිය චීනයටත්, පවතින පාලනය කොළඹ වරායේ නැඟෙනහිර ජැටිය ඉන්දියාවට සහ ජපානයටත් පැවරීම- කොළඹ වරාය යුදමය වශයෙන් අනාරක්ෂිත වීමට බල නොපාන්නේ ද? එසේ බල නොපාන බවට ආණ්ඩුවට ඇති සහතිකය කුමක් ද?
6. රටේ ආර්ථික මර්මස්ථානවල පාලනය රාජ්‍ය පාලනයෙන් ගිලිහීම රටේ ආර්ථික ස්වෛරීභාවයට තර්ජනයක් බව ආණ්ඩුව විසින් පිළිගනු ලබන්නේද? මේවා රාජ්‍ය අයිතියේ තබා ගනිමින් වැඩිදියුණු කිරීමට ආණ්ඩුව කටයුතු නොකරන්නේ මන්ද කියන කරුණ සම්බන්ධයෙන් මෙම පාර්ලිමේන්තුවට ගරු අමාත්‍යවරයා පිළිතුරු ලබා දෙනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඔබතුමාගේ මෙම ප්‍රශ්නයට ඉදිරියේදී පිළිතුරු දේවි, ගරු මන්ත්‍රීතුමනි. හැබැයි, මම ඔබතුමාට මතක් කරන්න කැමැතියි, මේ ආයතන දියුණු කරන්න අපට ප්‍රාග්ධනය නොමැති බව. එම නිසා අපි ප්‍රාග්ධනය ගෙන්වා ගන්න ඕනෑ. ණය වාරිකයි, පොලියයි ගෙවන්න අපේ අවුරුද්දේ ආදායම මදි. ඒක තමයි ඇත්ත තත්ත්වය. එම නිසා, මේ වාගේ ආයතන දියුණු කරන්න ප්‍රාග්ධනය ගන්න ඕනෑ. We need capital. දැන් බලන්න, එයාර් ලංකා එකත් එහෙමයි. එයාර් ලංකා එක ලාභයට පවත්වාගෙන යන්න පුළුවන්. නමුත් දියුණු කරන්න ප්‍රාග්ධනය නැහැ. ඒ නිසා ප්‍රාග්ධනය ගන්න ඕනෑ. අගමැතිතුමා මේ සඳහා දීර්ඝ උත්තරයක් ලබා දේවි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සභානායකතුමා යම් පිළිතුරක් ලබා දුන් නිසායි මේ ප්‍රශ්නය පැන නඟින්නේ. සභානායකතුමනි, විශේෂයෙන්ම මේකට භාණ්ඩාගාරයෙන් සල්ලි අවශ්‍යතාවක් තිබුණේ නැහැ. අන්න ඒක මතක තබා ගන්න.

ඊළඟට, තමුන්නාන්සේගේ ආදායම්, වියදම් පිළිබඳ ප්‍රශ්නය ජැටිය පිළිබඳ මේ ප්‍රශ්නයට කිසි සේත්ම ගැට ගැහෙන්නේ නැහැ. එයාර් ලංකා එක ගැන කිව්වොත්, එයාර් ලංකා එකේ නඩත්තුව වෙනුවෙන් භාණ්ඩාගාරය වාර්ෂිකව විශාල මුදලක් දරන බව ඇත්තයි. හැබැයි, වරාය අධිකාරිය උපයන මුදලින් විශාල ප්‍රමාණයක් රජයේ භාණ්ඩාගාරය වෙත ලබා දෙනවා. වරාය අධිකාරිය විසින් මෙන්න මේ කාරණා ඉතා හොඳින් පෙන්නුම් කරනු ලැබුවා. නැඟෙනහිර ජැටිය සංවර්ධනය කර අවසන් කරලායි තිබුණේ; ඒ සඳහා අවශ්‍ය වන දොඹකර මිලදී ගැනීම සඳහා අවශ්‍යතාවක් පමණයි පැන නැඟී තිබුණේ; රුපියල් මිලියන 800යි අවශ්‍ය වෙලා තිබුණේ. මේ රුපියල් මිලියන 800 තමුන්නාන්සේලාට දෙන්න බැරිද? ඇමතිවරුන්ට වාහන ආනයනය කිරීම වෙනුවෙන් පසුගිය කාලයේ කොපමණ මුදලක් වියදම් කළාද කියා අපි දන්නවා. කෘෂිකර්ම අමාත්‍යාංශයේ building එක පවත්වා ගෙන යාම වෙනුවෙන් මාසයකට රුපියල් මිලියන 22කට වඩා තමුන්නාන්සේලා වැය කරමින් තිබෙනවා. ඒ නිසා, මෙතැන මුදල් පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි තිබුණේ. වරාය අධිකාරිය ලාභ ලබන අධිකාරියක් බවට පත් වෙලා තිබුණා. ඒ වරාය අධිකාරියේම මුදල්වලින් මෙම ජැටියේ ඉතිරි වැඩ කටයුතු සංවර්ධනය කිරීමේ හැකියාව තිබුණා. ඒ හැකියාව තිබියදී තමයි තමුන්නාන්සේලා ඉන්දියානු රජය සහ ජපන් රජය වෙත මෙම ජැටියේ පරිපාලන කටයුතු සහ කොටස් පැවරීමට කටයුතු කර තිබෙන්නේ.

මම තමුන්නාන්සේලාට එක දෙයක් පැහැදිලි කළ යුතුයි. දේපොළ අවශ්‍ය අවශ්‍ය විධියට විකුණන්න, තිතෙන කොට විකුණන්න තමුන්නාන්සේලා මේ රටේ අයිතිකාරයෝ නොවෙයි. තමුන්නාන්සේලා මේ රටේ භාරකාරයන් විතරයි. අඩුම තරමින් මේ ගිවිසුම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ නැහැ. මේ වරායේ ජැටිය අවුරුදු ගණනාවකට ඉන්දියාවට සහ ජපානයට පැවරීම පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ කිසිදු විවාදයක් පැවැත්වුවේ නැහැ. මේක, එක්සත් ජාතික පක්ෂයේ පසු පෙළ මන්ත්‍රීවරු, මේ පාර්ලිමේන්තුව, මේ රට දන්නවාද කියා මම දන්නේ නැහැ. අරලියගහ මන්දිරයේදී ඉතා කුඩා පිරිසක් -තුන් කට්ටුවක්- එකතු වෙලා මේ රට විකිණීමේ ගිවිසුම් අත්සන් කරනවා. අග්‍රාමාත්‍යවරයාත්, සාගල රත්නායක අමාත්‍යවරයාත්, අරලියගහ මන්දිරයේ ඇති වන එකතුවක් විසින් තමයි මේ සියලු තීන්දු, තීරණ අරගෙන තිබෙන්නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ නිසා මේ විකිණීම් පිළිබඳ ගිවිසුම්, පැමිණි එකඟතාවන්, කරන ලද සාකච්ඡා, සාකච්ඡාවලට සහභාගි වූ අය පිළිබඳ විධිමත් වාර්තාවක් මේ පාර්ලිමේන්තුවට වහාම ඉදිරිපත් කළ යුතුයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

එය විකිණීමක් නොවෙයි. Partnership එකක් විධියටයි කරන්නේ. විකුණලා නැහැ.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ විකුණා දැමීමට ඇති වෙන සූදානම පිළිබඳව අපේ සම්පූර්ණ විරෝධය ප්‍රකාශ කරනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

එය විකුණලා නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

තමුන්නාන්සේලාට සල්ලි නැහැය කියා මේ දේවල් විකුණා ගෙන කන එක නොවෙයි කළ යුත්තේ. මේ සඳහා අවශ්‍ය මුදල් වරාය අධිකාරියට තිබෙනවා. ඒ අය සූදානමින් ඉන්නවා, මේ කටයුත්ත කරගෙන යන්න. අන්න ඒකයි අපි කියන්නේ.

මම තවත් කාරණයක් කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසුගිය මැයි 24වන දා මම කළ ප්‍රකාශයකදී මගේ අතින් වැරැද්දක් සිදු වුණා. ඒ පිළිබඳව මම නිවැරදි කිරීමක් කරන්න ඕනෑ. ලක්ෂ හයක ප්‍රමාණයකට සමෘද්ධිය ලබා දීම සඳහා ආණ්ඩුව කටයුතු කරන බව මම සඳහන් කළා. එහි ප්‍රචාරක වියදම් සඳහා රුපියල් ලක්ෂ 1,800ක් වියදම් කරනවාය කියා එහිදී මගේ අතින් වැරදීමකින් කියැවුණා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලක්ෂ 1,800ක් නොවෙයි, ඒ වෙනුවෙන් ලක්ෂ 3,000ක් වෙන් කර තිබෙනවා. වෙන් කර තිබෙන ලක්ෂ 3,000ත් වියදම් කරනවා. ඊට අතිරේකව, තම බැංකුවේ සල්ලිවලින් වර්ග අඩි 50ක cut-out එකක් දමන්නය කියා සෑම සමෘද්ධි බැංකුවකටම කියා තිබෙනවාය කියා අපට වාර්තා වෙලා තිබෙනවා. ඊටත් අතිරේකව, මේ සඳහා සමෘද්ධිලාභීන් රැගෙන එන ප්‍රවාහන වියදමත් සමෘද්ධි බැංකුවේ මුදලින් දරන්නය කියා දැනටමත් චක්‍රලේඛ යවා තිබෙනවා. ඒ විධියට මෙතැන ලක්ෂ 4,000කට ආසන්න ප්‍රමාණයක විශාල මුදල් නාස්තියක් සිද්ධ වෙනවා. ඒ කාරණය පිළිබඳව මම නැවතත් සඳහන් කරන්න ඕනෑ.

සමෘද්ධිය ලබා දීම පිළිබඳව අපට ප්‍රශ්නයක් නැහැ. තමුන්නාන්සේලා පිළිගෙන තිබෙනවා, මේ ආණ්ඩුව කාලයේ දුප්පතුන්ගේ ප්‍රමාණය තව ලක්ෂ හයකින් වැඩි වෙලා තිබෙන බව. ඒක නිසා නේ, ලක්ෂ හයකට අලුතින් සමෘද්ධිය දෙන්නේ. 1995දී මේ වැඩ පිළිවෙළ පටන් ගත්ත ප්‍රමාණයට වඩා, එන්න එන්නම දුප්පත්කම වැඩි වෙලා තිබෙනවා. මේ ආණ්ඩුව කාලයේ ඒක තවත් වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා ඒ සහනාධාර දෙන්න. හැබැයි, දේශපාලන වශයෙන් තමයි මේ ලැයිස්තු සකස් වෙන්නේ කියන එක තමයි අපට පෙනෙන්න තිබෙන්නේ. එක්සත් ජාතික පාක්ෂිකයන්ටයි මේ අවස්ථාව ලබා දෙන්නේ කියා කිරිඇල්ල ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවේ කළ කථාවේදීම කිව්වා. දේශපාලන පක්ෂයකට වැඩ කළ පමණින් රජයේ මුදල් එහෙම ලබා දෙන්නේ නැතිව, දුප්පත් අය තෝරලා, සාධාරණ ලෙස, ඒ අයට ඒ දෙන හොඳ දෙයක් දෙන්නය කියන යෝජනාවත් මා ඉදිරිපත් කරනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Wimal Weerawansa, what is your point of Order.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඔබතුමාගේ අවධානයට යොමු කරන්නේ මේ කාරණයයි. මේ රටේ කාදිනල්තුමා රතන හාමුදුරුවෝ උපවාසය කරන තැනට ගිය එක හරහා ජාතිවාදය ඇවිස්සෙනවාය කියා ගරු මංගල සමරවීර අමාත්‍යතුමා ප්‍රකාශයක් කර තිබෙනවා; එතුමාගේ Twitter ගිණුමේ සටහනක් තබා තිබෙනවා.

අති උතුම් කාදිනල් හිමිපාණන් ජාතිවාදය අවුස්සන කෙනෙක් නම් පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පස්සේ මේ රට ලේ විලක් වෙනවා. මේ රටේ ආගමික නායකයන්ට, මේ රට සන්සුන් කරන්න කටයුතු කළ ආගමික නායකයන්ට ඉතාම අසත්‍ය, පදනම් විරහිත චෝදනා කරනවා නම්; ඒ අයට එහෙම චෝදනා කිරීමේ සාධාරණත්වයක් තිබෙනවා ද? මේක ආණ්ඩුවේ මතයද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම 2019 අප්‍රේල් 21 වැනිදා ප්‍රහාරය සම්බන්ධයෙන් තේරීම් කාරක සභාවක් පත් කර තිබෙනවා. මම ආරාධනා කරනවා. අපේ හිටපු ගරු ජනාධිපතිතුමාත් ඇවිත් තිබෙනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඒක නොවෙයි අහන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පොඩ්ඩක් ඉන්න. මම කියන්න යන දේ තමුන්නාන්සේ කොහොමද දන්නේ? පොඩ්ඩක් වාඩි වෙන්න; please sit down! ගරු හිටපු ජනාධිපතිතුමාත් ඇවිත් සිටිනවා, තේරීම් කාරක සභාවට සහභාගි වෙන්න. තිබුණු බාධක ඉවත් වෙලා තමයි තිබෙන්නේ. මම එතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඔබතුමාගේ පක්ෂයේ, පොහොට්ටුවේ පක්ෂයේ අයට සහභාගි වෙන්න කියා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මේක reality show එකක්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමන්ලා සහභාගි වෙන්න. අනෙක් එක, ඉතා වැදගත් ප්‍රශ්නයක් අපිට අහන්නට තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය ආණ්ඩුව කාලයේ සහරාන් ඇතුළු තවුහිද් ජමාත් එකේ 30 ගණනකට ආණ්ඩුවෙන් පඩි දීලා තිබෙනවා. ආණ්ඩුවෙන් පඩි දීලා තිබෙනවා, සහරාන්ටත්. තේරීම් කාරක සභාවට එන්න. අපි ඔප්පු කරනවා. So, you may come. තේරීම් කාරක සභාවට එන්න. [බාධා කිරීමක්]

**ගරු මහින්ද රාජපක්ෂ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Mahinda Rajapaksa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තේරීම් කාරක සභාවක කථා කරපු දේවල් ගැන ප්‍රසිද්ධියේ ඔබතුමා කියන කාරණාව වැරදියි. මොකද, මිලේනියම් සිටි එකේදී වාගේ අන්තිමට වෙන්නේ, සාක්ෂිකාරයන් වශයෙන් බුද්ධි අංශයේ නිලධාරින් ගෙන්වීම තුළ ඒ බුද්ධි අංශයේ නිලධාරින්ව හෙළිදරව් වෙලා ඊට පස්සේ ඔවුන්ට ජීවිත ආරක්ෂාව ලබා දෙන්නට සිදු වෙවී. එම නිසා මේ තත්ත්වය ඇති කරන්නට එපා. මේවා ප්‍රසිද්ධියේ කරන දේවල් නොවෙයි. දේශපාලන අවශ්‍යතාවයක් සඳහා ප්‍රසිද්ධියක් ලබා ගන්නට ඕනෑ නම් ඒක වෙනම මාතෘකාවක් යටතේ කර ගන්න. අපි මේ අවස්ථාවේ බුද්ධි අංශයේ නිලධාරින්ව බිල්ලට දෙන්න එපා කියන ඉල්ලීමයි කරන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Leader of the House.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තේරීම් කාරක සභාවේ සාක්ෂි විමසන්නට කලින් සභාපතිතුමා ඒ අයට කියනවා, ජාතික ආරක්ෂාවට බලපාන යම් කිසි දෙයක් තිබෙනවා නම් ඒවා ප්‍රකාශ කිරීමෙන් වළකින්නය කියා. ඒ අයට දන්වලා තමයි සභාවේ වැඩ කටයුතු කරන්නේ. හැබැයි, මේ සහරාන්ට කොච්චර ගෙව්වාද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,"යන්නේ කොහේද මල්ලේ පොල්." උත්තරයක් තමයි දුන්නේ. තෙරීම් කාරක සභාව ගැන නොවෙයි මම ඇහුවේ. කාදිනල් හිමිපාණන් ජාතිවාදය අවුස්සනවාය කියා තමුන්නාන්සේලාගේ මුදල් ඇමති ප්‍රකාශයක් කර තිබෙනවා. මේක ආණ්ඩුවේ මතයද? [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කාදිනල් හිමිපාණන්ට විතරක් නොවෙයි. අපි දේශපාලනඥයෝ හැටියට සියලුම ආගමික නායකයින්ට ගරු කරන්නට දැන ගන්නට ඕනෑ. [බාධා කිරීම්] සියලු ආගමික නායකයින්ට. [බාධා කිරීම්] මහානායකවරු - [බාධා කිරීමක්]

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
At 3.00 p.m., Party Leaders' Meeting එක තිබෙනවා. ඔබතුමා Party Leaders' Meeting එකේදි කථා කරන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is your point of Order ?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ජාතිවාදය අවුස්සනවාය කියා කාදිනල් හිමිපාණන්ට මංගල සමරවීර චෝදනාවක් කරනවා. කෙලින් කියන්න ඒක පිළිගන්නවාද නැද්ද? ඒක ආණ්ඩුවේ මතයද නැද්ද? [බාධා කිරීම්] ඒක ආණ්ඩුවේ මතයද, නැද්ද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මංගල සමරවීර ඇමතිතුමා ඒකට උත්තර දෙයි. [බාධා කිරීම්] සහරාන්ට පඩි ගෙවපු එක ගැන මොකද කියන්නේ. තිස් දෙනෙකුට පඩි ගෙවා තිබෙනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Wimal Weerawansa, what is your point of Order?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාට බොහොම ස්තූතියි. තොරතුරු අනාවරණය වෙලා තිබෙනවා, සයිටම් කියන නෙවිල් ප්‍රනාන්දු රෝහල රජයට පවරාගෙන නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Commencement of Public Business - Notice of Motions.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I move,

"That this Parliament at its rising this day to adjourn until 10.30 a.m. on Thursday 06th June, 2019."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Now, we will move on to today's Business. Item No. 1 to be moved by the Hon. Navin Dissanayake.

## තේ පර්යේෂණ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත
## தேயிலை ஆராய்ச்சி சபை (திருத்தம்) சட்டமூலம்
## TEA RESEARCH BOARD (AMENDMENT) BILL

*දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[අ.භා. 2.22]

**ගරු නවින් දිසානායක මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு நவின் திஸாநாயக்க - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர் )
(The Hon. Navin Dissanayake - Minister of Plantation Industries)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙය ඉතාමත් කාලෝචිත සංශෝධනයක්. විශේෂයෙන්ම 1800 ගණන්වල පිහිටෙව්ව තේ පර්යේෂණ මණ්ඩලය අපේ රටේ පැරණිම පර්යේෂණ ආයතනයක් හැටියට හඳුන්වන්නට පුළුවන්.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is your point of Order?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊයේ ප්‍රකාශයට පත් වුණා ඇමතිවරුන්, නියෝජ්‍ය ඇමතිවරුන් සහ රාජ්‍ය ඇමතිවරුන් ගණනාවක් තනතුරුවලින් ඉල්ලා අස්වෙලා පසු පෙළ මන්ත්‍රීවරුන් හැටියට කටයුතු කරනවා කියා. නමුත්, අද පාර්ලිමේන්තුවේදී එවැනි දෙයක් - [බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
It is a point of Order.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Deputy Chairman of Committees, they are Party Leaders. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ අය පක්ෂ නායකයෝ. ගරු රිසාඩ් බදියුදීන් මැතිතුමා පක්ෂ නායකයෙක්; he is a Party Leader. [බාධා කිරීමක්] පක්ෂ නායකයෙක්. [බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
It has not yet been informed by the Presidential Secretariat. You can discuss it at the Party Leaders' Meeting.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමාත් පක්ෂ නායකයෙක් නිසාද ඉදිරි පෙළ ඉන්නේ? ඔබතුමා ඉන්න ඕනෑ - [බාධා කිරීමක්]

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, you may continue with your speech.

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
Thank you, Hon. Deputy Chairman of Committees.

මම ප්‍රකාශ කරමින් සිටියේ විශේෂයෙන්ම තේ පර්යේෂණ ආයතනය මාගේ දිස්ත්‍රික්කය වන නුවර එළිය දිස්ත්‍රික්කයේ පිහිටි අප රටේ පැරණිතම පර්යේෂණ ආයතනයක් බවයි. විශේෂයෙන්ම සුද්දන්ගේ කාලයේ, අධිරාජ්‍යවාදීන්ගේ කාලයේ තේ හා ඒ ආශ්‍රිත අනෙකුත් නිෂ්පාදන සම්බන්ධයෙන් පර්යේෂණ කිරීමට, ඒවායේ අභිවෘද්ධියක් ඇති කිරීමට, එහි සංවර්ධනයට -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! Will an Hon. Member propose the Hon. Anura Sidney Jayarathne to the Chair?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
I propose that the Hon. Anura Sidney Jayarathne do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. ANURA SIDNEY JAYARATHNE *took the Chair.*

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා තේ පර්යේෂණ මණ්ඩලය ශක්තිමත් කර, ප්‍රතිව්‍යුහගත කර අද තිබෙන ගෝලීය වූ තේ කර්මාන්තයත් සමඟ බද්ධ කර ඉදිරියට ගෙන යෑම අප සියලුදෙනාගේම වගකීමක්. තේ පර්යේෂණ ආයතනය පිහිට වූවාට පසුව, 1993දී තමයි තේ පර්යේෂණ මණ්ඩලය පිහිටුවලා තිබෙන්නේ. වෙළෙඳ පොළේ තිබෙන නොයෙකුත් වෙනස්වීම් සමඟ, විපර්යාස සමඟ තේ පර්යේෂණ මණ්ඩලයේ තිබෙන තත්ත්වයත් වෙනස් කරන්නට අපි බලාපොරොත්තු වෙනවා. මේ තේ පර්යේෂණ මණ්ඩලය ඉතාමත් සීමිත සම්පත්වලින් විශාල වැඩ කොටසක් සිද්ධ කරනවා කියන එක අලුතෙන් කියන්නට අවශ්‍ය නැහැ. එම නිසා මෙවැනි පර්යේෂණ ආයතනයක් ලංකාවේ තිබීම ගැන මම ඉතාමත් ආඩම්බර වෙනවා. අද තිබෙන ගෝලීයකරණය උඩ බහු ජාතික සමාගම් කෝටි ගණන්, ප්‍රකෝටි ගණන් තමන්ගේ පර්යේෂණ වෙනුවෙන් වියදම් කරනවා. අපිට මේ රටේ පර්යේෂණ සංස්කෘතියක් නැහැ. ඇත්ත වශයෙන්ම අපි දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 0.5ක ප්‍රමාණයක් පමණයි, සොච්චමක් පමණයි පර්යේෂණවලට පාවිච්චි කරන්නේ. දියුණු වෙන රටක් හැටියට අපි ඒ දියුණු වෙන ඉලක්කවලට යනවා නම් පැහැදිලිවම පර්යේෂණ - researches - වෙනුවෙන් මීට වඩා මුදල් ප්‍රමාණයක් වියදම් කරන්නට අවශ්‍යයි. මා යටතේ තේ පර්යේෂණ මණ්ඩලය, රබර් පර්යේෂණ ආයතනය, උක් පර්යේෂණ ආයතනය හා පොල් පර්යේෂණ ආයතනය තිබෙනවා.

අපගේ විද්‍යාඥයන්, මේ රටේ උගතුන්, බුද්ධිමතුන් ඉතාමත් සුළු පඩියකට මේ පර්යේෂණ ආයතනවලට ඇවිල්ලා ඉමහත් සේවයක් මාතෘභූමිය වෙනුවෙන් සිද්ධ කරනවා. රුපියල් 40,000ක, 50,000ක වැනි සුළු මාසික පඩියකට ඔවුන් මේ විශාල වැඩ කටයුත්ත කරනවා. නමුත්, ඔවුන් විදේශගත වුණොත් මීට වඩා ලක්ෂ ගණනින් මුදල් හම්බ කරන්න පුළුවන්. එම නිසා මම ප්‍රථමයෙන්ම ස්තුති කරන්න කැමැතියි, මේ තේ පර්යේෂණ ආයතනයේ සිටින ඒ සියලුම විද්‍යාඥයින්ට. මොකද, දැඩි කැපවීමකින්, උනන්දුවකින්, මහන්සියකින් අපේ රටට ඔවුන්ගේ සේවය ලබා දෙනවාට. විශේෂයෙන්ම මේ තේ පර්යේෂණ ආයතනය 1800 ගණන්වල පිහිටවූවේ ඉතාමත් කුඩා ආයතනයක් හැටියටයි. අද ලෝකයේ තේ ක්ෂේත්‍රය සම්බන්ධව ගත්තොත්, සම්පත් අඩු වුණත් ඉතාමත් හොඳ කීර්තිනාමයක් තිබෙන ආයතනයක් හැටියට මේ ආයතනය හඳුන්වන්න පුළුවන්. එම නිසා තේ පර්යේෂණ ආයතනයට පසුගිය අවුරුදු 4 තුළ මාගේ මහ පෙන්වීම මත රජයේ දායකත්වයෙන් මිලියන 500ක් පමණ අපි යොමු කරලා තිබෙනවා, මූලික පහසුකම් ටික දියුණු කරන්න. අපි තේ පර්යේෂණ ආයතනයට අවශ්‍ය උපකරණ ටික ලබා දීලා තිබෙනවා. විශේෂයෙන්ම අපි ඒ විද්‍යාඥයන්ට විදේශගත වෙලා ඔවුන්ගේ දැනුම දියුණු කිරීමට අවශ්‍ය සම්පත් ලබා දීලා තිබෙනවා. එම නිසා දැන් අපි උත්සාහ කරන්නේ තේ පර්යේෂණ ආයතනය හා වෙළෙඳ පොළ අතර තිබෙන සම්බන්ධය මීට වඩා දියුණු කරලා ඒ බද්ධවීම තවත් වැඩි කරන්නයි. මක් නිසාද, වෙළෙඳ පොළ -market එක- ඉල්ලන දේ තේ පර්යේෂණ ආයතනය ලබා දිය යුතුයි. එම නිසා පර්යේෂණ කරලා වැඩක් නැහැ, හුදෙකලාවේ. විශේෂයෙන්ම වෙළෙඳ පොළ මොකක්ද ඉල්ලන්නේ; ඒ වෙළෙඳ පොළේ අවශ්‍යතාව මොකක්ද කියන කාරණා හඳුනාගෙන තමයි අපි අපගේ පර්යේෂණ කළ යුත්තේ.

අද තේවලට විශාල ඉල්ලුමක් තිබෙනවා. මම අලුතින් කියන්න අවශ්‍ය නැහැ. විශේෂයෙන්ම විදේශ රටවල් රාශියකින්ම අපේ තේ ඉල්ලීම වැඩි වෙලා තිබෙනවා. දැන් මම එක උදාහරණයක් දෙන්නම්. අපගේ මිත්‍ර රටක් තමයි චීනය. චීනයත් තේ නිෂ්පාදනය කරන රටක්. But they produce green tea. They do not produce black tea. එම නිසා චීනයේ වෙළඳ පොළේ අපේ කළු තේවලට විශාල ඉල්ලුමක් තිබෙනවා. මම හිතන විධියට ඊළඟ අවුරුදු 10 තුළ චීනයයි, ජපානයයි අනිවාර්යෙන්ම අපගේ තේ ගන්නා රටවල් එක, දෙක, තුන ස්ථාන අතරට එනවා. එම නිසා ඒකත් හොඳයි. මොකද, අපට මැද පෙරදිග රටවල් මත පමණක් depend වෙන්න බැහැ. එම නිසා මේ විපර්යාසය ගෝලීයකරණය හරහා වෙනවා කියන එක පැහැදිලිව කිව යුතුයි. එම නිසා එදා සුද්දා පටන් ගත්ත තේ පර්යේෂණ ආයතනය අද මේ ඇති වෙන වෙළෙඳ පොළ ආර්ථිකය හරහා, ගෝලීයකරණය හරහාත් වෙනස් විය යුතුයි. එම නිසා ඒ වෙනස්කම් කරන්නේ කොහොමද? අපට ඒකපාර්ශ්විකව මේ වෙනස්කම් කරන්න බැහැ. අපි තේ පර්යේෂණ ආයතනයේ ඉන්න සියලුම පාර්ශ්වත් සමඟ සාකච්ඡා කළ යුතුයි. තේ ක්ෂේත්‍රය කියන්නේ විවිධත්වයට ලක් වුණු ක්ෂේත්‍රයක්. මේ තේ ක්ෂේත්‍රයේ කොටස් 5ක් ඉන්නවා. මෙහි නිෂ්පාදකයෝ ඉන්නවා; brokersලා ඉන්නවා; කර්මාන්තකරුවෝ ඉන්නවා. අද මේ රටේ සමස්ත තේ නිෂ්පාදනයෙන් සියයට 73ක් නිෂ්පාදනය කරන්නේ කුඩා තේ වතු හිමියන්. මේ සියලු දෙනාගේම අදහස් ලබාගෙන අපි එක තැනකට එන්න අවශ්‍යයි.

වැවිලි කර්මාන්ත ඇමතිවරයෙක් හැටියට අපේ ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමාත් කාලයක් කටයුතු කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට තිබෙන විශාලම අභියෝගය තමයි මේ පාර්ශ්වයන් එකතු කරන එක; එක තැනකට ගෙනෙන එක. ඒක ඉතාමත් අමාරුයි. මොකද, ඒ විවිධ පාර්ශ්වයන්වලට නා නා විධ

[ගරු නවින් දිසානායක මහතා]

අදහස් තිබෙනවා, මේ තේ ක්ෂේත්‍රය ඉදිරියට ගෙන යා යුත්තේ කොහොමද කියලා. උදාහරණයක් වශයෙන් exportersලාගේ අදහසක් තිබෙනවා, අමු තේ ලංකාවේ එක zone එකකට ගෙනැල්ලා blend කරලා, අගය වැඩි කරලා ආයෙත් පිටරට යවන්න. ඒ ගොල්ලන්ගේ මතය තමයි විශේෂයෙන්ම අපි අපගේම තේ සියයට 100ක් "Pure Ceylon Tea" කියලා යවන එකෙන් අපට තිබෙන සම්ප්‍රදායික markets අපට නැති වෙනවා කියන එක. ඇත්ත වශයෙන්ම මමත් ඇමතිවරයෙක් හැටියට සමහර අවස්ථාවල පිටරටවල්වල supermarketsවලට ගියාම ඒ රටවල අපගේ "Pure Ceylon Tea" කියන නාමය shelf එකේ නැති බව දකිනවා.

මක්නිසා ද, අනෙකුත් රටවල -විශේෂයෙන්ම ඩුබායිවල, නෙදර්ලන්තයේ, ජර්මනියේ- තේ කොළ එක තැනකට ගෙනැල්ලා blend කරනවා. Blend කරලා ඒ ගොල්ලන් market කරනවා. නමුත්, ඒ ගොල්ලන් වගාකරුවන් නොවෙයි; ඒ ගොල්ලන් නිෂ්පාදකයන් නොවෙයි. ඒ ගොල්ලන් marketeersලා පමණයි. ඒ ගොල්ලන්ගේ තේ brand කරනවා. ඉතින් අපිත් මේක කළේ නැත්නම්, ඉදිරියේ දී අපගේ තේ ටික අළෙවි කර ගන්න අපටත් අමාරු වෙනවා.

දැන් අපට තිබෙන තවත් අභියෝගයක් ගැන තමුන්නාන්සේලාට කියන්න අවශ්‍යයි. ඒ තමයි කෙන්යාව. අපි ලෝක තේ නිෂ්පාදනයෙන් තුන්වන ස්ථානයේ ඉන්නවා. කෙන්යාව, තේ නිෂ්පාදනයෙන් හතරවෙනි ස්ථානයේ ඉන්නවා. සමහර අවස්ථාවන්වල අපි හතරවෙනි ස්ථානයේ, කෙන්යාව තුන්වන ස්ථානයේ ඉන්නවා. පළමුවෙනියට ඉන්නේ චීනයයි. දෙවැනියට ඉන්නේ ඉන්දියාවයි. සමහර වෙලාවට අපි තුන්වැනියට ඉන්නවා, කෙන්යාව හතරවෙනියා. පසුගිය අවුරුදු දෙකේදී අපි හතරවෙනියට වැටුණා. දැන් අපේ තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 300ට වැඩි වෙලා තිබෙනවා. වැඩිම නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 340යි. ඉතින් අපි අතර මතයක් ඇති කර ගන්න ඕනෑ, අපගේ නිෂ්පාදනය කොච්චර වැඩි කරන්න පුළුවන්ද කියලා. අපට තේ කිලෝ ග්‍රෑම් මිලියන 400ට යන්න අමාරුයි. තේ කිලෝග්‍රෑම් මිලියන 500ට යන්නම බැහැ. තේ කිලෝග්‍රෑම් මිලියන 350ක් අතර අපට එන්න පුළුවන්. ඉතින් ඒ 350 විකුණන්නේ කොහොමද? මොන මුදලට ද විකුණන්නේ කියන එක අපේ auction එකෙන් අපට තීරණය වෙනවා.

මම කියන්න සතුටුයි, අපේ ලංකාවේ තිබෙන තේ වෙන්දේසියෙන් ඉහළම මිලක් අපේ තේවලට ලැබෙන බව. අපි ගිය අවුරුදු හතරේ මේක ආරක්ෂා කරලා තිබෙනවා. අපට නා නා විධ ප්‍රශ්න ඇති වුණා. මම එක ප්‍රශ්නයක් කියන්නම්. විශේෂයෙන්ම වල් නාශක සම්බන්ධයෙන් ඇති වුණු ප්‍රශ්නය ගැන කියන්න ඕනෑ. මේ වල්නාශක ප්‍රශ්නය සම්බන්ධව තේ පර්යේෂණ ආයතනය දිගටම අපට කිව්වේ මොකක්ද? මේ ආයතනවල ඉන්නේත් භූමි පුත්‍රයෝ; රටට ආදරය කරන මිනිස්සු. මම තේ පර්යේෂණ ආයතනයේ සියලුම විද්‍යාඥයන්ට කථා කරලා කිව්වේ, "මේ වල්නාශක සම්බන්ධව තමුන්නාන්සේලාගේ අවංක මතය මොකක්ද කියලා කරුණාකරලා මට කියන්න" කියලායි. ඔවුන් මට කිව්වා, "ඔව්, වල් නාශකවලින් යම් කිසි හානියක් වෙනවා. නමුත් වාණිජ කෘෂිකර්මය වෙනුවෙන් පැය 24න්, දවස් 7න් වල් නාශක අයින් කරන්න බැහැ, ඒකට යම් කිසි ක්‍රමයක් අවශ්‍යයි. යම් කිසි කාල සීමාවක් අවශ්‍යයි " කියලායි. නමුත්, අපි ගිහිල්ලා පැය 24න් වල් නාශක නැවැත්තුවා. ඉතින් මේ දවස්වල නිතරම මාධ්‍යයේ සිටි අපගේ රතන හාමුදුරුවන් සමඟත් මට මතවාදයක් ඇති වුණා. එය මතවාදයක් පමණයි. ප්‍රජාතන්ත්‍රවාදී රටක අපට එවැනි මතවාද තිබෙන්න ඕනෑ. මගේ අදහස වෙනස් වෙන්න පුළුවන්, රතන හාමුදුරුවන්ගේ අදහස වෙනස් වෙන්න පුළුවන්, පරිසරවේදීන්ගේ අදහස වෙනස් වෙන්න පුළුවන්. නමුත්, මම පැහැදිලිවම ක්‍රියා කළේ මගේ පර්යේෂණ ආයතනය මට කියන විධියටයි. ඉතින් ඔවුන් මට පැහැදිලිව කිව්වා විශේෂයෙන්ම මේ තේ පර්යේෂණ ආයතනයේ හිටපු විශේෂඥයෙක් මට කිව්වා "ඇමතිතුමනි, අපට තේ කර්මාන්තය ඉදිරියට ගෙන යන්න අමාරුයි, වල් නාශකවලින් තොරව" කියලා. මම වචන පාවිච්චි කළේ නැහැ. මම ග්ලයිෆොසේට් කියලා කිව්වේ නැහැ. මම හිතන්නේ අපේ ගරු සුසන්ත පුංචිනිලමේ මැතිතුමාත් ඒ කමිටුවේ හිටියා. නමුත්, මම ඒ කමිටුවේ වාර්තාව තවම දැකලා නැහැ ගරු මන්ත්‍රීතුමා.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ඔබතුමා ඒ වාර්තාව කියවලා බලන්න.

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
I never saw that report.

මම සතුටු වෙනවා, මම නිරන්තරයෙන්ම සටන් කරලා, මතවාදයක් ඇති කරලා මගේ මතය මම ශක්තිමත්ව ඉදිරිපත් කළා. Cabinet Papers හතරක් දැම්මා. මම කැබිනට් මණ්ඩලයේ දී කිව්වා, "වල් නාශක අවශ්‍යයි" කියලා.සටන් කරලා, සටන් කරලා අන්තිමටම අපට පුළුවන් වුණා, තේ කර්මාන්තයට, පොල් කර්මාන්තයට හා රබර් කර්මාන්තයට පමණක් ඉතාමත් සීමිත ප්‍රමාණයක් වල් නාශකය ලබා ගන්න. එම නිසා දැනට ඉතාමත් හොඳට ඒ වල් නාශක පාවිච්චි කරනවා. විශේෂයෙන්ම මම කියන්න කැමතියි තේ පර්යේෂණ ආයතනයත් එම වල් නාශකය පාවිච්චි කිරීමට ඔවුන්ගේ උපරිම දායකත්වය, උපරිම විශේෂඥ දැනුම අපට ලබා දෙනවාය කියලා.

තේ ක්ෂේත්‍රයේ ඇති "Pure Ceylon Tea" කියන නම අපේ නමක්. අපි මේ නාමය ආරක්ෂා කරලා තිබෙනවා; ඉදිරියටත් ආරක්ෂා කරනවා. නමුත් අපි තරග කරන්නේ යුනිලීවර්, නෙස්ලේ වැනි සමාගම් සමඟ. - මේ අවස්ථාවේ සිවලිංගම් මැතිතුමා මෙම ගරු සභාවේ ඉන්නවා.- කෙන්යාවේ තේ දලු නෙළන කම්කරුවෙකුට දවසට ගෙවන්නේ ඩොලරයයි. අපි කම්කරුවෙකුට ඩොලර් 6ක් ගෙවනවා. ඔවුන්ගේ නිෂ්පාදන වියදම ඉතාමත් අඩුයි. ඉතින් ඉහළ මිලකට, ඉහළ ලාභයකට ඒ ගොල්ලන්ට ඒ තේ විකුණන්න පුළුවන්.

එම නිසා ඒගොල්ලන්ගේ තේ නිෂ්පාදනය කරන ක්‍රමයත් වෙනස්. ඒගොල්ලන්ගේ තිබෙන්නේ CTC - cut, tear and curl - ක්‍රමය. අපේ තිබෙන්නේ සම්ප්‍රදායික ක්‍රමය. බහුජාතික සමාගම් අද අපේ රටින් ඉවත් වෙලා, කෙන්යාවට ගිහිල්ලා තිබෙනවා. මෙතැන තිබෙන ප්‍රශ්නය තමයි, මේ cut, tear and curl ක්‍රමය හරහා අපට පකිස්තානය නැති වෙලා තිබෙනවා; අපට ඊජිප්තුව නැති වෙලා තිබෙනවා. ඉතාම ඉහළ අගයකින් යුක්ත තේ අපි පකිස්තානයට අළෙවි කළා; ඊජිප්තුවටත් අළෙවි කළා. මේ රටවල් දෙකම අපට අහිමි වෙලා තිබෙනවා. නමුත් ඒ රටවල් දෙක අහිමි වීමෙන් අපි වැටිලා නැහැ. අපි චීනය හා ජපානය වැනි රටවල්වලට තේ යවනවා. දැන් අපි ශ්‍රී ලංකා තේ මණ්ඩලය හරහා උත්සාහ කරනවා, අලුත් markets රාශියක් අල්ලා ගන්න. අපි මේ අවුරුද්දේ පටන් ගන්නවා, ඇමෙරිකානු ඩොලර් මිලියන 50ක්- හිටපු මුදල් ඇමතිතුමා ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙන් මේ මුදල් ගන්න හදපු බව තමුන්නාන්සේලාට මතක ඇති. මම දුන්නේ නැහැ. මම සටන් කරලා, ඒ මුදල තියා ගත්තා. ඒ ඇමෙරිකානු ඩොලර් මිලියන 50 එලෙසම තිබෙනවා. තව මාසයකින්, මාස දෙකකින් අපගේ අළෙවිකරණ campaign එක ඉරානය ඇතුළු රටවල් 12ක පටන් ගන්න අපි බලාපොරොත්තු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම අමාරු තත්ත්වයන්ට අපට මුහුණ දෙන්න සිද්ධ වනවා. මොකද, අපි පුංචි දූපතක්. ලෝක බලවතුන් සටන් කරන කොට අපට ප්‍රශ්නයක් වනවා. තමුන්නාන්සේට මතක් කරන්න අවශ්‍යයි විශේෂයෙන්ම ඇමෙරිකාව සහ ඉරානය අතර දැන් ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙන බව. ඉරානය තමයි අපේ හොඳම market එක. නමුත් අපේ තේවලට අවශ්‍ය ගෙවීම් ටික අපට කරන්න බැහැ. මක් නිසාද, ඔවුන් ඇමෙරිකානු බැංකුව හරහා ඩොලර්වලින් ගෙවීම නතර කරලා තිබෙනවා. ඒ ගෙවීම් කරන්න අපට තුන්වැනි පාර්ශ්වයක් අවශ්‍යයි. ඉරානයට තේ ලබා දෙන exportersලාගේ විශාල ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, අපි ඉන්දියාව තරම් විශාල රටක් නොවෙයි. මේ ලෝක බලවතුන් සමඟ සටන් කරන්න අපට බැහැ. අපගේ මහ බැංකුවත්, ඉරානයේ මහ බැංකුවත් බද්ධ කරලා - සම්බන්ධ කරලා- ඇමෙරිකානු තානාපතිතුමාත් එක්කත් කථා කරලා, හොඳ ක්‍රමයක් මේ වෙනුවෙන් සලසා දෙන්න මම උත්සාහ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුරුමිණියෙක් හිටියා කියලා අපේ තේ රුසියාවට යන එක නැවැත්වුවා. ඒ අවස්ථාවේදීත් අපේ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ හිටපු සභාපතිතුමා ඇතුළු විශේෂඥ කණ්ඩායමක් රුසියාවට ගියා. "මේ කෘමියා අපේ රටින් නොවෙයි ආවේ. වෙනින් රටකින් ආවේ" කියලා ඔවුන් පැහැදිලිව ඒත්තු ගන්වලා දැක්වුවා. එම නිසා මේ ප්‍රශ්නය අපේ ජනාධිපතිතුමා කෙළින්ම පුටින් ජනාධිපතිතුමාත් එක්ක කථා කළා. සති දෙකක් ඇතුළත අපට ඒ තහංචිය ඉවත් කරන්න පුළුවන් වුණා. මේ අවස්ථාවේදී මෙම ගරු සභාවේ ජෝන් සෙනෙවිරත්න මැතිතුමා ඉන්නවා. එතුමාටත් පර්යේෂණ ආයතන තිබුණා මට මතකයි. පර්යේෂණ ආයතනවලට දැන් දක්වන සැලකිල්ල ඉතාම අඩුයි. ඇත්ත වශයෙන්ම තවත් මුදල් දෙන්න කියලා අපි භාණ්ඩාගාරයට කථා කරන කොට "මුදල් නැහැ. මුදල් දෙන්න බැහැ" කියායි ඔවුන් කියන්නේ. මොකද, පර්යේෂණය කියන්නේ වැදගත්කමක් නැති එකක් කියායි අපේ ආකල්පය තිබෙන්නේ. නමුත් ඇත්ත වශයෙන්ම දියුණු වූ රටවල් පර්යේෂණවලට ඉතාම ඉහළ අගයක් දක්වනවා. Developed countries give a lot of emphasis for research and analysis. But, unfortunately, we do not have the necessary attitude to develop research and analysis in various spheres in our country.

යුනිලිවර් වැනි සමාගමක්, නෙස්ලේ වැනි සමාගමක් ඇත්ත වශයෙන්ම ඇමෙරිකානු ඩොලර් මිලියන 200, 300 පර්යේෂණවලට යට කරනවා. අපේ රටේ දළ දේශීය නිෂ්පාදනය ඇමෙරිකානු ඩොලර් බිලියන 80යි. යුනිලිවර් සමාගමේ මුළු ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 200ක් පමණ වනවා. අපේ රටේ දළ දේශීය නිෂ්පාදනයටත් වඩා ඒ ප්‍රමාණය වැඩියි. තමුන්නාන්සේලාට හිතා ගන්න පුළුවන්, how global giants, large multinational companies attract buyers, how they earn revenue. Take for example, a company like Google. Its income is about US Dollars 200 billion. The revenue of Apple, the largest company in the world, is about US Dollars 500 billion! අපගේ ආදායම කීයද? මුළු රටේම ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 80යි. ගූගල් වැනි ආයතනයක ආදායම කීයද? අවුරුද්දක ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 500යි. එහෙම නම් අපි කොතැනද ඉන්නේ කියන එක ගැන, අපි අලුතෙන් හිතන්න අවශ්‍යයි.

විශේෂයෙන්ම "කොකා-කෝලා" ආයතනය ගැන බැලුවොත් "කොකා-කෝලා" ආයතනය පටන් ගත්තේ, 1890දී. මේ වනකොට අවුරුදු 100කටත් වැඩියි. අපි තවමත් "කොකා-කෝලා" බොනවා. අවුරුදු 100කට පස්සෙත් "කොකා- කෝලා" අලුතෙන් එනවා. "පෙප්සි" අලුතෙන් එනවා. ඒ රහමයි. හැබැයි, බෝතලය වෙනස් කරනවා. Marketing techniques වෙනස් කරනවා. දැන් "කෝක් සීරෝ" කියලා අලුතෙන් බීම වර්ගයක් ඇවිත් තිබෙනවා. "කෝක් සීරෝ" එකේ සීනි නැහැ. ඒ ආයතන ඒ ඒ markets target කරනවා; market research කරනවා. Market එකේ ඉන්න කට්ටිය segment කරනවා. Market එක ඇතුළෙත් ඒගොල්ලෝ වෙන් කරනවා. ඒගොල්ලෝ බිලියන ගණනක් වියදම් කරනවා. එහෙම නැතුව මේවා කරන්න බැහැ. එම නිසා අපි මේ තත්ත්වය තේරුම්ගත යුතුයි. අපි "Pure Ceylon Tea" කිය කියා හැම වෙලාවේම කියනවා. ඉතින්, Rebrand කරන්න අවශ්‍ය නැද්ද? සමාජය වෙනස් වෙන්නේ නැද්ද? ලෝකය වෙනස් වෙන්නේ නැද්ද? මම එක දෙයක් කළා. මම ඇමති ධුරය භාර ගන්නකොට අපේ මේ ඩොලර් මිලියන 50 සාමාන්‍ය සම්ප්‍රදායික විධියට පත්තර හා television එකේ advertise කරන්න තමයි තිබුණේ. මම කිව්වා, "මේක වැරදියි" කියලා. මට පොඩි හැඟීමක් තිබුණා Internet එක හරහා ප්‍රචාරණ කටයුතු කරන්න. මොකද, Facebook එකේ, Twitter එකේ හා YouTube එකේ තමයි දැන් තරුණ පරම්පරාව ඉන්නේ. හැම වෙලාවේම mobile phone එකේ ඉන්නේ; Facebook එකේ ඉන්නේ. YouTube එකට ගිහින් ඕනෑ දෙයක් බලන්න පුළුවන්. අපි අවුරුදු 150ක් සමරන අවස්ථාවේ television එකේ advertise කරන්න මිලියන ගණනක් වියදම් කරන්නේ නැතුව අපි ප්‍රථම වතාවට YouTube එකේ පමණක් ප්‍රචාරණ දැන්වීම් දැම්මා. එය අතිශයින් සාර්ථක වුණා. සුළු ගණනයි ගියේ. ඩොලර් 20,000ක්, 30,000ක් වැනි මුදලක් වැය කරලා ප්‍රේක්ෂකයින් විශාල පිරිසකට -මිලියන ගණනකට- අපේ "Pure Ceylon Tea" නාමය යවන්න අපට පුළුවන් වුණා. සාමාන්‍ය විධියට අපි advertise කළා නම්, ඊට වඩා දහ ගුණයක් අපට වියදම් කරන්න සිද්ධ වනවා. එම නිසා market research කියන එකත් වැදගත්.

මම ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය - TRI - ඇතුළෙත් දැන් වෙනම Market Research Unit එකක් හදලා තිබෙනවා. අපි උපාධිධාරීන් තුන්-හතර දෙනෙක් අරගෙන ඔවුන්ට කියනවා, market එක analyse කරන්න කියලා; අලුත් markets හඳුනා ගන්න කියලා. ඇමෙරිකාවේ ගත්තොත් තේවලට අලුත් ප්‍රවණතාවක් තිබෙනවා. හැබැයි, ඒගොල්ලන් ගන්නේ අඩු වටිනාකමක් තිබෙන තේ; බ්‍රසීලයේ සහ ආර්ජන්ටිනාවේ තේ; " Ready to Drink" - RTD - tea. ඒගොල්ලෝ සාමාන්‍ය විධියට තේ බොන්නේ නැහැ. ඒගොල්ලෝ high-quality tea ගන්න යන්නේ නැහැ. ඉතාමත් පහත් මට්ටමේ තේ තමයි ගන්නේ. අපට ඒ market එකටත් ඇතුළු වෙන්න පුළුවන්. අපට සියයට 5-10 අතර වෙළෙඳ පොළක් අල්ලා ගන්න පුළුවන්. අපි තේ අපනයනය කළ සාම්ප්‍රදායික රටවල් වන රුසියාව, ඉරානය, ඉරාකය හා සිරියාව වාගේ රටවල් දැන් නැවත තේ ගන්න එනවා. තේ අපනයනයේදී අපට ලිබියාව නැති වුණා. නමුත්, අපට සිරියාවේ වෙළෙඳ පොළ නැවත ලැබුණා. මොකද, පසුගිය අවුරුද්දේ සිරියාවේ යම්කිසි මට්ටමකට දේශපාලනය අතින් හොඳ තත්ත්වයක් ආවා. ජනාධිපති අසාද්ට පුළුවන් වුණා ආයෙත් ශක්තිමත් වෙන්න. එතකොට තේ ටික ගන්න පටන් ගත්තා. ලිබියාව කඩා වැටුණා. ඇත්ත වශයෙන්ම මම හිතන්නේ අපි පර්යේෂණ පැත්තෙන් ඉතාමත් ශක්තිමත් විය යුතු බවයි. අපට හොඳ product එකක් තිබෙනවා. මේ product එක ලෝකයට ලබා දෙන්නේ කොහොමද කියලා අපි පර්යේෂණ කළ යුතුයි. මම නිතරම අපේ පර්යේෂණ විශේෂඥයන්ට කියන්නේ, "Lab එකට සීමා වෙන්න එපා. Lab එකෙන් එබ්බට ගිහිල්ලා බලන්න. Field එකට යන්න" කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට විශාල ගැටලු -ප්‍රශ්න- තිබුණා. එකක් තමයි, සීනි ප්‍රශ්නය. දැන් අපට ප්‍රථම වතාවට පුළුවන් වෙලා තිබෙනවා, තේ කම්හල්වලින් සීනි මිශ්‍රකරණයක් කරනවා නම් ඒක විද්‍යානුකූලව ඔප්පු කරන්න. මීට මාස දෙකකට ඉස්සෙල්ලා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපතිතුමා සියලුම කර්මාන්තකරුවන් ගෙන්වලා ඔවුන්ට පැහැදිලිව කිව්වා, "සීනි මිශ්‍ර

[ගරු නවින් දිසානායක මහතා]

කළොත්, එය විද්‍යානුකූලව ඔප්පු කරන්න පුළුවන්. ඒ කැත වැඩේ කරන්න එපා. එහෙම කළොත්, උසාවියට ගෙනි යනවා" කියලා. අපි පැහැදිලිව ඊට විරුද්ධව ක්‍රියා කරනවා. තේ හා සීනි මිශ්‍රකරණය විශාල වශයෙන් සිද්ධ වුණා. මම සියලුදෙනාගෙන්ම ඉතාම ළෙන්ගතුව සහ බැගෑපත්ව ඉල්ලීමක් කරනවා, "මේ කටයුත්ත නවත්වන්න" කියලා. රත්නපුර ප්‍රදේශයේ මේ කටයුත්ත සිද්ධ වනවා. විශේෂයෙන්ම කුඩා තේ කම්හල්වල එය සිද්ධ වනවා. ගරු ජෝන් සෙනෙවිරත්න මන්ත්‍රීතුමා ඇතුළු රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු මන්ත්‍රීවරු සියලු දෙනාගෙන් මම ඉල්ලවා මේකට විරුද්ධව අපිත් එක්ක බද්ධ වෙන්න කියලා. මොකද, තේ කර්මාන්තය අපි ආරක්ෂා කරගත යුතුයි.

තේ කර්මාන්තය ආරක්ෂා කිරීමට ගෙනෙන මේ සංශෝධනය කාලෝචිතයි; වැදගත්; උචිතයි. මේ හරහා අපේ තේ පර්යේෂණ ආයතනය තවත් ශක්තිමත් වෙනවාය කියන පැහැදිලි අදහස තමුන්නාන්සේලාට ලබා දෙමින්, තමුන්නාන්සේලා මෙයට ලබා දෙන සහයෝගය ඉතා ඉහළින් අගය කරන බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.48]

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තේ කර්මාන්තය බහුලව තිබෙන රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවගේ නියෝජිතවරියක විධියට මේ කාරණය සම්බන්ධයෙන් වචන කිහිපයක් කථා කිරීමට ලැබීම ගැන මම බොහොම සන්තෝෂ වෙනවා. තේ කර්මාන්තයට රජය පැත්තෙන් ආයතන දෙකක් සම්බන්ධ වෙනවා. එකක් තමයි තේ මණ්ඩලය. අනෙක තමයි තේ පර්යේෂණ ආයතනය. ගරු ඇමතිතුමා සුබවාදීව තේ කර්මාන්තය ගැන කථා කළා. ඒක බොහොම හොඳයි. අමාත්‍යවරයකු විධියට එතුමා තේ කර්මාන්තය ඉහළට ගෙන යෑමට කටයුතු කිරීම ඉතා හොඳයි. හැබැයි, තේ නිපදවන ප්‍රදේශයක ජීවත් වන පුරවැසියකු විධියට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක විධියට අද තේ කර්මාන්තය දෙස ප්‍රායෝගිකව බැලුවොත්, තේ කර්මාන්තය කියන්නේ මරණයට පත් වෙමින් තිබෙන කර්මාන්තයක් බව මා කියන්න ඕනෑ. අද අපේ සාමාන්‍ය ජනතාව තේ වගාවෙන් ඈත් වෙමින් සිටිනවා. ඒ වාගේම, තේ කර්මාන්තශාලා බොහෝ ප්‍රමාණයක් වැහෙමින් පවතිනවා. මා විශ්වාස කරන හැටියට ඒකට ප්‍රධාන හේතුව තමයි, තේ මණ්ඩලය තමන්ගේ යුතුකම, තමන්ගේ වගකීම හරියට ඉටු නොකිරීම. තේ මණ්ඩලයේ වගකීම තමයි, මේ කර්මාන්තය හරියට නියාමනය කිරීම. පන්තියක ගුරුතුමියක් ඉන්නේ දරුවන් හරි තැනකට ගෙනෙන්නයි කියලා අපි දන්නවා. දරුවන්ට අයාලේ යන්න දුන්නොත්, ඒ දරුවෝ ඒ පාඩම ඉගෙන ගන්නේ නැහැ. අද තේ කර්මාන්තශාලා තේ දලු මිලදී ගැනීම සම්බන්ධයෙන් විශාල තරගයකට ගිහින් තිබෙනවා. අමු දලු සඳහා තිබෙන තරගකාරිත්වය නිසා කර්මාන්තශාලා හිමියන් විශාල වශයෙන් ණය වෙමින් අතරමැදියන්ට විශාල මුදලක් ගෙවනවා. අවසානයේ තේ කර්මාන්තශාලා හිමියන් ණය වෙලා, තේ කර්මාන්තශාලා වැහෙනවා. මේ තරගකාරිත්වය හොඳයි තමයි. තේ කර්මාන්තයේ තිබෙන නීතිය අනුව තේ විකුණුවාම ලැබෙන මුදලින් සියයට 68ක් යන්නේ අමු දලු හිමියන්ට; සියයට 32ක් යන්නේ තේ කර්මාන්තශාලා හිමියන්ට. කර්මාන්තශාලා හිමියාට ලැබෙන සියයට 32 තුළ ඔහුගේ සියලු වියදම් දරාගන්න ඕනෑ. හැබැයි, දැන් ඒ සියයට 32ට වඩා වැඩි මුදලක් යනවා අමු දලු අරගෙන තේ නිෂ්පාදනය කරන්න. මොකද, නියමිත මුදලට වඩා වැඩි මුදලක් ලබා දීලා කර්මාන්තශාලා හිමියන් අතරමැදියන්ගෙන් අමු තේ දලු ගන්න නිසා. ඒ මුදල කුඩා තේ වතු හිමියන්ට යන්නේත් නැහැ. මේ තත්ත්වය පාලනය කරන්න තේ මණ්ඩලය මැදිහත් වී යම් වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරන්න ඕනෑ. මේ ගැන තේ කර්මාන්තශාලා හිමියන් එක්ක කථා කරලා බලන්න. ඒ අය කියන්නේ විශාල වශයෙන් පාඩු ලබනවා කියලායි.

ඒ කර්මාන්තශාලා වැහුණාට පස්සේ තේ කර්මාන්තයට පැවතෙන්න බැහැ. ඒ අනතුරු, ඒ අවදානම අමාත්‍යාංශය සහ තේ මණ්ඩලය තේරුම් ගනියි කියලා මා විශ්වාස කරනවා. මා හිතන හැටියට දකුණු පළාතේ තේ කර්මාන්තශාලා හිමියන් මේ ගැන රජයත් එක්ක සාකච්ඡා කළා. ඒ තේ කර්මාන්තශාලා වැහුණොත් කුඩා තේ වතු හිමියන්ගේ තේ විකුණන්නේ කාටද? ඒ නිසා මේ ඇතිවී තිබෙන තත්ත්වය නියාමනය කරන්න Sri Lanka Tea Board එක යම්කිසි වැඩ පිළිවෙළක් ඉදිරිපත් කළ යුතුයි.

ගරු ඇමතිතුමා කිව්වා, චීනය, ජපානය වැනි ලෝකයේ අනික් රටවලින් අපේ තේවලට ඉල්ලුමක් ඇතිවෙමින් පවතිනවාය කියලා. අද ලෝකය මොන තේ ගත්තත්, අපේ රටේ තේවල තිබෙන සෞඛ්‍ය ගුණාත්මකභාවය - health benefits, මුළු ශරීරයටම තිබෙන සෞඛ්‍ය ගුණාත්මකභාවය පිළිබඳව විද්‍යාඥයන් දන්නවා ඇති. ශ්‍රී ලංකාවේ තේවල තිබෙන පොලිෆිනෝල් ප්‍රමාණය අනික් රටවල තේවල තිබෙන ප්‍රමාණයට වඩා හතර ගුණයක් වැඩියි. ඒ නිසා අපේ රටේ තේ අපේ රටට අනන්‍යයි. අපේ රටේ තේවල තිබෙන ගුණාත්මකභාවය නිසා ඒ රටවලට අලෙවි කරන්න ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ තේ පර්යේෂණ ආයතනය පියවර ගන්නවා.

විගණකාධිපතිතුමාගේ 2017 වාර්තාවෙන් Tea Research Institute එක ගැන යම් යම් ප්‍රශ්න නඟා තිබුණා. විගණකාධිපතිතුමාගේ වාර්තාවේ එතුමා සඳහන් කරනවා, තේ පැළ තවාන් ගැන. Tea Research Institute එකෙන් පවත්වාගෙන යන තේ පැළ තවාන්වල තිබෙන දුර්වලතාව නිසා සියයට 10ක් මැරුණු තේ පැළ ප්‍රමාණය සියයට 25 දක්වා වැඩිවෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. Tea Research Institute එක ගැන Auditor Generalගේ report එකේ තිබෙන සමහර කාරණා සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා පවා ඵලදායීතාවේ ප්‍රශ්න, ප්‍රායෝගිකභාවයේ ප්‍රශ්න ඉදිරිපත් කර තිබෙනවා.

ගරු වැවිලි කර්මාන්ත ඇමතිතුමනි, අපේ රත්නපුර දිස්ත්‍රික්කයේ වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලි ගොවීන් ඉතාම දුක්ඛිත තත්ත්වයකයි ඉන්නේ. ඔබතුමන්ලා 2015 බලයට එනකොට ගම්මිරිස්වලට නියම මිලක් ලබා දෙනවාය කියලා ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් කරලා ම බලයට ආවත්, අද ගම්මිරිස් වගාකරුවන් ජීවත්වෙන්න බැරි තත්ත්වයකට පත්වෙලා ඉන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමියට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

ගරු කනක හේරත් මන්ත්‍රීතුමාට වෙන් කර තිබෙන කාලයෙන් විනාඩි 5ක් මා ගන්නවා.

පසුගිය කාලයේ දින පනස් ගණනක් වැනි කෙටි කාලයකට පත් වුණු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජයෙන් පොහොර සහනාධාරය ලබාදීම නිසා තේ කර්මාන්තයට යම්කිසි නව පණක් ලැබුණා. ඒ නිසා තේ කර්මාන්තයේ නියැලෙන ගොවීන්ට විශාල

ශක්තියක් ලැබුණා. නමුත්, කොහොම කථා කළත්, මේ රටේ කුරුඳු ගොවියා ගත්තාම, මේ රටේ ගම්මිරිස් ගොවියා ගත්තාම, මේ රටේ තේ ගොවියා ගත්තාම -සමස්ත industry එකම- කනගාටුදායක තත්ත්වයකයි තිබෙන්නේ කියලා අපි දන්නවා.

අපි replantation ගැන කථා කරනවා නම්, දැන් වැවිලි සමාගම් තේ නැවත වගාව කොච්චර දුරට සිදු කරනවාද කියලා කල්පනා කර බලන්න, ගරු ඇමතිතුමනි. ඔවුන් වෙනත් වගාවන්වලට, - කටු පොල්ද, මොනවාද යනුවෙන් හඳුන්වන - palm oil නිෂ්පාදනයට අදාළ වගාවන්ට යොමු වෙලා තිබෙනවා. ප්‍රධාන වැවිලි සමාගම් අද තේ වගාවෙන් ඉවත් වෙමින් වෙනත් වගාවන් තමන්ගේ වැවිලි සමාගම්වලට හඳුන්වා දෙමින් පවතිනවා.

කුඩා තේ වතු හිමියන් නැවත වගාවෙන් ඉවත් වෙලා යම්කිසි මට්ටමකින් වෙනත් දේවල්වලට යොමු වෙමින් පවතිනවා. ඒ නිසා මම විශ්වාස කරනවා, නැවත වතාවක් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ - Sri Lanka Tea Board එකේ- වගකීම නියාමනය වන විධියට කටයුතු කළ යුතුයි කියලා. ගරු ඇමතිතුමා කිව්වා මේ කණ්ඩායම එකට එකතු කරගන්න අමාරුයි කියලා; ඔවුන්ගේ අදහස් එකට එකතු කරගන්න අමාරුයි කියලා. විකුණන්නේ කට්ටියක්; මිලදී ගන්නේ කට්ටියක්; broker වැඩේ කරන්නේ කට්ටියක්; තේ කර්මාන්තය කරන්නේ කට්ටියක්; අතරමැදියෝ තව ටිකක් ඉන්නවා. කුඩා තේ වතු හිමියෝ අතරමැදියාට බොහෝ වේලාවට -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට වේලාව දෙනවා කියපු මන්ත්‍රීතුමා කවුද?

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
කනක හේරත් මන්ත්‍රීතුමා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි.

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
තේ කර්මාන්තයේ හැබැවට ප්‍රශ්නයක් තිබෙන බව අප විශ්වාස කරනවා. ගරු ඇමතිතුමනි, කර්මාන්ත හිමියෝ තේවලට සීනි දමනවා නම්, ඒක අල්ලන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් අල්ලපු අයට නිරන්තරයෙන්ම දඬුවම් දෙන්න ඕනෑ. අදටත් ඒක නැවතිලා නැහැ, ගරු ඇමතිතුමනි. මොකද, තේ කර්මාන්තශාලා හිමියෝ අතර තිබෙන මේ තරගයේ දී මිලක් ලබා ගැනීම සඳහා සීනි දමන අය සීනි දමනවා. නොදමන අයට ඒ මිල ලබා ගන්න බැරිව, ඒ නිසා අමු දළු ලබා ගන්න බැරිව, විශාල තරගයකට ගිහිල්ලා ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. පසුගිය කාලයේත් සීනි දමපු අය හසු වුණා. ඒ සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග තවම අරගෙන නැහැ කියන එකයි මම හිතන්නේ.

හැබැයි, හිටපු සභාපතිවරයෙක් කිසිම දැනුමක් නැතිව, නිස්කාරණේ තේ කර්මාන්තශාලා හිමියන් විශාල ප්‍රමාණයකට චෝදනා කළා. එම කර්මාන්තශාලා හිමියන් රජයට කිව්වා, තේ මණ්ඩලය සතු තම තමන්ගේ කර්මාන්තශාලාවල තිබෙන සාම්පල ලෝකයේ තිබෙන ඕනෑම lab එකකින් test කරන්න; මේ සභාපතිතුමා කියන ආකාරයට නැතිව අඩුම ගණනේ ලංකාවේ කාර්මික තාක්ෂණ ආයතනයෙන් test කරන්න, නිවැරදි ප්‍රතිඵල ලබාගෙන ඒවායේ සීනි තිබුණොත්, ඒ අය ඕනෑම වගකීමකට යටත් වෙනවා කියලා. ගරු ඇමතිතුමා ඒක පිළිගත්තා. එම සභාපතිතුමාටත් එතැනින් යන්න සිද්ධ වුණා. නිවැරදි මිනිස්සු නිවැරදි විධියට තහවුරු වුණා. හැබැයි, වැරදි කරන මිනිසුන්, තේවලට සීනි දමන මිනිසුන් අදටත් ඒ කර්මාන්තශාලා ඒ තත්ත්වයෙන්ම පවත්වා ගෙන යනවා.

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
සීනි දමන කට්ටිය කවුද කියලා ඔබතුමියට ආරංචි වෙලා තිබෙනවා නම්, මට ඔත්තුව දෙන්න. මම ඒ සම්බන්ධව ක්‍රියා කරන්නම්.

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
ගරු ඇමතිතුමනි, තේ කර්මාන්තයේ නියැළෙන පවුලක් විධියට මට ඒ ගැන කියන්න බැහැ. හැබැයි, regulatorගේ වගකීමක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා අවංක බව අපි පිළිගන්නවා. ඔබතුමා, ඇහුම් කන් දෙන හොඳ සභාපතිතුමකු ශ්‍රී ලංකා තේ මණ්ඩලයට අලුතෙන් පත්කර තිබෙනවා. අපි ඒක පිළිගන්නවා. හැබැයි, මේ ප්‍රශ්නයට ශ්‍රී ලංකා තේ මණ්ඩලය මීට වඩා මැදිහත් වන්න ඕනෑ. මේ තේ දළුවලට සීනි දමන එක අල්ලන්න ඕනෑ. සමහර කර්මාන්තශාලා මිලක් ලබා ගන්නේම ඒ විධියටයි. සීනි දැම්මාම තේ කළු වනවා; තේවලට හොඳ පාටක් එනවා. එම නිසා එවැනි තේවලට හොඳ මිලක් ලැබෙනවා. එතකොට අනෙක් කර්මාන්තශාලා හිමියන්ට ඒ මිල ලබා ගන්න බැරි වනකොට ඒ කර්මාන්තශාලා වැහෙනවා. එතකොට තේ දළු ගන්න වෙන්නේත් අඩු මිලකට. නමුත්, ඉහළ මිලක් තිබෙන හැම කර්මාන්තශාලාවක්ම සීනි දමන්නේ නැහැ. හැබැයි, සමහර කර්මාන්තශාලා තේ සඳහා මිල ලබා ගන්නේ සීනි දමලා. එතකොට අනෙක් කර්මාන්තශාලාවලට ඒ මිලත් එක්ක තරග කරන්න බැරි වෙනවා. ඒ මිලට අනුව තමයි අමු දළු මිලදී ගන්නේත්. කුඩා තේ වතු හිමියන්ට සල්ලි ගෙවන්නේත් තමන්ට වෙළෙඳ පොළේ ලැබෙන මිල අනුවයි. එනම්, සියයට 68ක්. එතකොට අවංකව තේ නිෂ්පාදනය කරන කෙනාගේ තේවලට ලැබෙන මිල අඩුවනවා. එතකොට ඒ අය තරගයක් හදා ගෙන වැඩිපුර සල්ලි දීලා අමු දළු ගන්නවා. ඔවුන් එලෙස දළු මිලදී ගන්නේ ණය වෙලා. මේ තරගය නිසා අන්තිමට තේ කර්මාන්තශාලා වැහුණා. එම නිසා ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙන් අපි ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධයෙන් මීට වඩා මැදිහත්වීමක් කරන්න කියලා. මේ රටේ තේ කර්මාන්තය ආරක්ෂා කරන්න කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිමින් මා නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමියට ස්තුතියි. මීළඟට, ගරු හරීස් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා. ඊට ප්‍රථම කවුරු හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මේ අවස්ථාවේ දී ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතු ය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஹர்ஷன ராஜகருணா அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. ANURA SIDNEY JAYARATHNE *left the Chair, and* THE HON. HARSHANA RAJAKARUNA *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

[பி.ப. 3.04]

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා (පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ் - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி இராஜாங்க அமைச்சர்)
(The Hon. H.M.M. Harees - State Minister of Provincial Councils and Local Government)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இந்தச் சபையில் தேயிலைத் தொழிற்றுறை சம்பந்தமான விவாதம் நடைபெற்றுக்கொண்டு இருந்தாலும், எமது நாட்டின் தேசிய ஒருமைப்பாட்டையும் இன ஐக்கியத்தையும் கருத்திற்கொண்டு, அரசாங்கத்தில் அங்கம் வகித்த முஸ்லிம் அமைச்சர்கள் - அமைச்சரவை, இராஜாங்க மற்றும் பிரதி அமைச்சர்கள் - நேற்று தங்களுடைய பதவிகளை இராஜினாமாச் செய்ததன் பின்னணி பற்றி இந்தச் சபைக்குக் கூற விரும்புகின்றேன். உண்மையில் கடந்த ஏப்ரல் மாதம் 21ஆம் திகதி ஈஸ்டர் தினத்தன்று அப்பாவிக் கிறிஸ்தவ மக்கள்மீது நடாத்தப்பட்ட கொடூரத் தாக்குதலை இந்த நாட்டிலுள்ள முஸ்லிம் சமூகமும் முஸ்லிம் பாராளுமன்றத் தலைமைகளும் எந்தவோர் அடிப்படையிலும் அங்கீகரிக்க வில்லை. மாறாக, அதனோடு தொடர்புபட்ட தேசிய தௌஹீத் ஜமாஅத் அமைப்பின் உறுப்பினர்களைக் கைதுசெய்து, அவர்களுக்கு அதிகபட்சத் தண்டனை கொடுக்கவேண்டும் என்ற நிலைப்பாட்டிலே இருந்தார்கள். சம்பந்தப்பட்ட பயங்கரவாதக் குழுவின் உறுப்பினர்களைக் கைதுசெய்வதற்கு முஸ்லிம் மக்கள் பல தகவல்களைப் பாதுகாப்புத் தரப்பினருக்கு வழங்கியதை நாங்கள் மறக்க முடியாது. குறிப்பாக, இந்தக் குழுவின் உறுப்பினர்கள் சாய்ந்தமருதுப் பிரதேசத்தில் பதுங்கியிருந்தபொழுது, அந்தப் பிரதேசத்து மக்கள்தான் அவர்கள் தொடர்பில் தகவல் வழங்கினார்கள். அந்த வகையில், இராணுவத்தினர் அவர்களை அழிப்பதற்குக் காரணமாக இருந்தவர்கள் எமது பகுதி மக்கள் என்பதை நாங்கள் சுட்டிக்காட்ட விரும்புகின்றோம்.

இவ்வாறு இந்த நாட்டின் பாதுகாப்பை உறுதிப் படுத்துவதற்கும் இந்தப் பயங்கரவாதக் குழுவை அழிப்பதற்கும் முஸ்லிம் சமூகமும் அதன் தலைமைகளும் முழு ஒத்துழைப்பை வழங்கிவந்த நிலையில்தான் முஸ்லிம் சமூகத்தின் பிரதிநிதிகளான முன்னாள் அமைச்சர் கௌரவ றிஸாட் பதியுதீன், முன்னாள் ஆளுநர்களான ஆசாத் சாலி, ஹிஸ்புல்லாஹ் ஆகியவர்களுக்கு எதிராகப் பல குற்றச் சாட்டுகள் முன்வைக்கப்பட்டன. அதாவது, அவர்கள் இராஜினாமாச் செய்ய வேண்டும், அவர்களுக்குத் தண்டனை கொடுக்கப்பட வேண்டுமென்று தென்னிலங்கையிலிருந்து பல குரல்கள் எழுந்தன. இதன் உச்சக்கட்டமாக, பாராளுமன்ற உறுப்பினர் சங்கைக்குரிய ரதன தேரர் அவர்கள் புனித தலதா மாளிகைக்கு முன்பாகச் சத்தியாக்கிரகமிருந்து அவர்களுடைய இராஜினாமாவை வலியுறுத்தியிருந்தார். இதனால் நேற்று நாட்டின் பல பாகங்களிலுமுள்ள மக்கள் மத்தியில் ஒரு பதற்றமான சூழ்நிலை ஏற்பட்டிருந்தது. இந்த விடயமானது, ஒற்றுமைக்கும் அமைதிக்கும் பாரியதொரு சவாலான விடயமாக அமைந்திருந்தது. இது சம்பந்தமாக ஒரு முடிவெடுப்பதற்காக முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்களும் அமைச்சர்களும் ஒன்று கூடினார்கள். குறிப்பாக, இந்தக் குற்றச்சாட்டுகளுக்கு நாங்கள் முகங்கொடுக்க வேண்டும் என்று நான் கேட்டுக்கொண்டேன்.

"முஸ்லிம் தலைமைகள் இந்த அமைப்பினருடன் சம்பந்தப்பட்டிருக்கின்றார்கள், அவர்கள் தங்களுடைய அமைச்சு அதிகாரத்தைப் பயன்படுத்திச் சம்பந்தப்பட்டவர் களுக்கு உதவி செய்கின்றார்கள்" என்ற பல குற்றச் சாட்டுகளைக் குற்றஞ்சாட்டுகின்றவர்கள் முன்வைத் திருந்தார்கள். இந்தக் குற்றச்சாட்டுக்கள் தொடர்பில் நியாயமான அடிப்படையில், பக்கச்சார்பில்லாமல் விசாரணை நடத்தப்பட வேண்டுமென்றால் நாங்கள் எவரும் அமைச்சர்களாக இருக்க முடியாது. அந்த வகையில், நாங்கள் பதவிகளை இராஜினாமா செய்தோம். அந்த விசாரணைகளைச் சுதந்திரமாக நடத்துவதற்கு பாராளுமன்ற உறுப்பினர்களாக இருந்து இடமளிக்க வேண்டுமென்ற கருத்தியலின் அடிப்படையில் எங்களது அமைச்சர்கள் கௌரவ ரவுப் ஹகீம் அவர்கள், கௌரவ றிஸாட் பதியுதின் அவர்கள், கௌரவ கபீர் ஹாஷீம் அவர்கள், கௌரவ அப்துல் ஹலீம் அவர்கள் மற்றும் ஏனைய எமது இராஜாங்க, பிரதி அமைச்சர்கள் என நாங்கள் எல்லோரும் சேர்ந்து ஒருமித்த கருத்துக்கு வந்தோம். இது இந்த நாட்டின் பாதுகாப்பு மற்றும் நாட்டு மக்கள் மத்தியில் ஒற்றுமையையும் அமைதியையும் ஏற்படுத்துவதற்காக நாங்கள் எடுத்த மிகவும் முக்கியமான ஒரு தீர்மானமாகும். குற்றஞ்சாட்டியவர்களிடம் நாங்கள் கேட்பது என்னவென்றால், இப்பொழுது நீங்கள் எங்களைத் தாராளமாக விசாரியுங்கள்! என்பதாகும்.

அது சம்பந்தமான முறைப்பாடுகளை யூன் 12ஆம் திகதியிலிருந்து விசேட பொலிஸ் பிரிவிடம் கையளிக்கலாம் என்ற ஓர் அறிவித்தல் இப்பொழுது வந்திருக்கின்றது. இப்பொழுது நாங்கள் எந்த அமைச்சுப் பதவியிலும் இல்லை; எந்தவோர் அதிகாரத்திலும் இல்லை. நீங்கள் சுதந்திரமாக எங்களை விசாரணை செய்து, எங்கள்மீது குற்றமிருந்தால் எங்களைத் தண்டியுங்கள்! அல்லது எங்கள்மீதான எந்தக் குற்றச்சாட்டுகளும் நிரூபிக்கப்படவில்லை; எங்களுக்கு இந்தக் குற்றச்சாட்டுகளுடன் எந்தச் சம்பந்தமும் இல்லையென்பதை நாட்டு மக்களுக்கு அறிவியுங்கள் என்று நாங்கள் இந்த உயரிய சபையிலே கேட்டுக் கொள்கின்றோம். இதனூடாக இந்த நாட்டில் வாழ்கின்ற சிங்கள பௌத்த மக்கள் அதேபோன்று தமிழ் மக்கள், முஸ்லிம் மக்கள், கத்தோலிக்க மக்கள் மத்தியில் ஓர் ஐக்கியமும் இன ஒற்றுமையும் ஏற்படுவதற்கு வழியேற்படும். இந்தக் காலகட்டத்தில் இந்த உயரிய சபையில் இருக்கின்ற பாராளுமன்ற உறுப்பினர்கள் பொறுப்புணர்ச்சியுடன் நடந்துகொள்ள வேண்டும் என்றும் நாங்கள் கேட்டுக் கொள்கின்றோம். இந்த நாட்டு மக்கள் மத்தியில் பீதியை ஏற்படுத்திவிடக்கூடாது. என்ன நடக்குமோ என்ற பரஸ்பர சந்தேகங்கள் இந்த நாட்டில் இருக்கின்ற சமூகங்களுக்கிடையே இன்றும்கூட இருக்கின்றன. எல்லாச் சமூகத்தினரும் பதற்றத்தில் இருந்துகொண்டிருக்கிறார்கள். இதை நீக்கவேண்டிய பொறுப்பு எல்லாச் சமூகங்களிலுமிருக் கின்ற அரசியல் தலைமைகளின் கடமையாகும். அவர்கள் இதை முதலில் செய்ய வேண்டும்.

மிக முக்கியமாக, முஸ்லிம் சமூகத்தைச் சேர்ந்த இரண்டாயிரத்துக்கு மேற்பட்டவர்கள் கைது செய்யப்பட்டிருக் கிறார்கள். அவர்களில் NTJ என்ற இயக்கத்துடன்

தொடர்புபட்டவர்களை விடுவிக்குமாறு நாங்கள் கோர வில்லை. ஆனால், அப்பாவிகளான பல முஸ்லிம் சகோதரர்கள் கைது செய்யப்பட்டிருக்கின்றார்கள். அவர்கள் சம்பந்தமான விசாரணைகள் இன்னும் முடிக்கப்படவில்லை. எனவே, அவர்கள் சம்பந்தமாக விசாரணைகள் செய்யப்பட்டு, அவர்கள் விடுவிக்கப்பட வேண்டும், அவர்களுடைய குடும்பங்களுக்கு ஆறுதல் ஏற்படுத்தப்பட வேண்டும் என்பதே எங்களுடைய வேண்டுகோளாகும்.

இந்தத் தாக்குதல் தொடர்பில் விசாரணை செய்வதற்கு இப்பொழுது பாராளுமன்றத் தெரிகுழு நியமிக்கப்பட்டிருக் கின்றது. ஆனால், இந்தப் பாராளுமன்றத் தெரிகுழுவில் எதிர்க்கட்சியினர் அங்கம் வகிக்காமலிருக்கின்றார்கள். சம்பந்தப்பட்டவர்கள் இராஜினாமா செய்ய வேண்டுமென்று நீங்கள் வேண்டுகோள் விடுத்தீர்கள். இப்பொழுது அது நடந்திருக்கின்றது. எனவே, இந்தத் தெரிகுழுவில் நீங்களும் அங்கம்வகிக்க வேண்டுமென்று நாங்கள் உங்களிடம் அன்பாக வேண்டுகின்றோம். இந்த நாட்டில் சுயாதீனமாக விசாரணை நடைபெற்று, மக்களுக்கு நம்பிக்கை தரும் வகையில் எல்லோரும் ஒன்றுசேர்ந்து அந்தத் தெரிகுழுவின் அறிக்கையை வெளிப்படுத்த வேண்டும். அதனூடாக இந்த நாட்டு மக்கள் மத்தியில் பரஸ்பர நம்பிக்கையையும் இனங்களுக்கு மத்தியில் ஒற்றுமையையும் ஏற்படுத்துவதற்கு வழி ஏற்படும் என்பதே எங்களுடைய நிலைப்பாடாகும்.

முஸ்லிம் அமைச்சர்கள், ஆளுநர்கள் மற்றும் முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்கள் சம்பந்தமாக ஆளும் கட்சியிலும் எதிர்க்கட்சியிலும் உள்ள பல பாராளுமன்ற உறுப்பினர்கள் கடந்த பல வாரங்களாக பலவிதமான விமர்சனங்களைச் செய்திருந்தார்கள். உண்மையில் அது எங்களுக்குக் கவலைக்குரிய விடயமாக இருந்தது. ஆனால், இன்று இந்தச் சபையில் ஓர் ஆரோக்கியமான நிலைமை காணப்பட்டது. அதாவது, எதிர்க்கட்சியிலிருக்கின்ற உறுப்பினர்களும் சரி, ஆளும் கட்சியிலிருக்கின்ற உறுப்பினர்களும் சரி, நாங்கள் எடுத்த நிலைப்பாடு சம்பந்தமாக எந்த விமர்சனத்தையும் முன்வைக்காமல் இருந்தமை ஆரோக்கியமான ஒரு விடயமாகும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have only two more minutes.

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
Okay.

இந்த இராஜினாமா என்பது வெறுமனே எங்களுடைய தனிப்பட்ட அரசியல் நிகழ்ச்சிநிரலுக்காகச் செய்யப்பட்ட ஒன்றல்ல. இந்த நாட்டில் பல்லாயிரம் வருடங்களாக வாழ்ந்து வருகின்ற சமூகங்கள் ஒற்றுமையாக வாழவேண்டும், அவர்கள் மத்தியில் நம்பிக்கை கட்டியெழுப்பப்பட வேண்டும் என்பதற்காகத்தான் அந்த முடிவினை நாங்கள் எடுத்தோம். நாங்கள் இராஜினாமா செய்வதன் ஊடாக இந்த நாட்டு மக்களுக்கு நிம்மதியும் பாதுகாப்பும் ஏற்படுமென்ற ஒரு நம்பிக்கையில்தான் அந்த முடிவையெடுத்தோம். அது இன்று ஓரளவு நிறைவேறியிருக்கின்றது. எனவே, பாதுகாப்பு அமைச்சு, சட்டம் ஒழுங்கு அமைச்சு ஆகியவற்றுக்குப் பொறுப்பான மேதகு ஜனாதிபதி அவர்கள் தலையிட்டு, இது சம்பந்தமான விசாரணைகளைத் துரிதப்படுத்தி, இந்த நாட்டு மக்களுக்குத் தெளிவுபடுத்த வேண்டும். சம்பந்தப்பட்டவர்கள் யாராவது குற்றம் செய்திருந்தால், அவர்கள் சம்பந்தமாகவும் குற்றமற்றவர்கள் இருந்தால், அவர்கள் சம்பந்தமாகவும் தெளிவுபடுத்தி, இந்த நாட்டு மக்கள் மத்தியிலிருக்கின்ற சந்தேகங்களை நீக்க வேண்டும். அப்போதுதான் எங்களுடைய இராஜினாமாவுக்கு ஓர் அர்த்தம் இருக்கும் என்பதை நான் இந்தச் சபையில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இறுதியாக நாங்கள் வேண்டிக்கொள்வது என்னவென்றால், எங்களது அரசியல் வேறுபாடுகளுக்காக வெறுமனே குரோதமான பேச்சுக்களைப் பேசி, முஸ்லிம் சமூகத்தையோ அல்லது தமிழ்ச் சமூகத்தையோ அல்லது பௌத்த, கிறிஸ்தவ மக்களையோ தயவுசெய்து பலிக்கடா ஆக்கக்கூடாது என்பதாகும். எவ்வாறு கத்தோலிக்க மக்கள் பாதிக்கப் பட்டுள்ளார்களோ அதிலும் பல மடங்கு இந்த நாட்டிலுள்ள ஒவ்வொரு முஸ்லிமும் இன்று மனநிலையில் பாதிக்கப் பட்டுள்ளார். குறிப்பாக, குருநாகலில் நடந்த வன்முறையினால் பொருளாதார ரீதியாகவும் உயிரிழப்பு ரீதியாகவும் அந்த மக்கள் மிகவும் கஷ்டத்திற்குள்ளாகியிருக்கின்றார்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
Sir, please give me one more minute.

அந்த மக்களின் பெயரால் இந்த அரசியல் தலைமைகளிடம் நாங்கள் ஒரு விடயத்தைக் கேட்கின்றோம். நாளை முஸ்லிம் மக்கள் நோன்புப் பெருநாளைக் கொண்டாட இருக்கின்றார் கள். எனவே, தயவுசெய்து இந்த மக்களின் நிம்மதியான வாழ்வுக்கு - அவர்கள் சந்தோஷமாக வாழ்வதற்கு, அவர்களுடைய பெருநாள் ஓர் அர்த்தபுஷ்டியான பெருநாளாக அமைவதற்கு, இனிமேல் அவர்கள் இந்த நாட்டில் பயமில்லாமல் வாழ்வதற்கு இந்த நாட்டின் முக்கிய அரசியல் தலைமைகள் பாடுபட வேண்டும். இப்பொழுது இந்தச் சபையில் காட்டிய ஒத்துழைப்புக்கு அனைத்து அரசியல் தலைமைகளுக்கும் முஸ்லிம் சமூகத்தின் சார்பாக நான் நன்றி கூறி, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you very much. The next, the Hon. Hon. I. Charles Nirmalanathan. You have ten minutes.

[பி.ப. 3.17]

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்று பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர் கௌரவ நவீன் திஸாநாயக்க அவர்கள் தேயிலை ஆராய்ச்சி சபை (திருத்தம்) சட்டமூலத்தைச் சமர்ப்பித்திருக்கின்றார். தேயிலை ஆராய்ச்சிச் சபையைப் பலப்படுத்தி, அச்சபையினூடாக மேற்கொள்ளப்படுகின்ற ஆராய்ச்சியின்மூலம் தேயிலையின் தரத்தையும் அதன் உற்பத்தியையும் அதிகரித்து, தேயிலை ஏற்றுமதியை மென்மேலும் ஊக்குவிக்கின்ற அதேநேரத்தில்,

[ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා]

தேயிலை உற்பத்தியில் ஈடுபடுகின்ற தொழிலாளர்கள் அனைவரும் பயன்பெற வேண்டும். கௌரவ அமைச்சர் அவர்கள் உரையாற்றும்போது சில விடயங்களைக் கூறியிருந்தார். சில நாடுகளில் புதுவிதமான ஆராய்ச்சிக் கென்று தனியான நிறுவனங்கள் இருப்பதை நான் அவதானித்து இருக்கின்றேன். அந்நிறுவனங்களுக்கு அதிகளவு முக்கியத்துவம் கொடுத்த நாடுகள் இன்று வளர்ந்து இருக்கின்றன. இலங்கையைப் பொறுத்தவரையில் தேயிலை ஆராய்ச்சியாக இருக்கலாம், தெங்கு ஆராய்ச்சியாக இருக்கலாம், விவசாய ஆராய்ச்சியாக இருக்கலாம், ஆராய்ச்சிகளுக்கு அல்லது ஆராய்ச்சி நிறுவனங்களுக்குக் கொடுக்கின்ற முக்கியத்துவம் என்பது ஒரு சொற்ப அளவிலேதான் இருக்கின்றது.

விவசாய அமைச்சை எடுத்துக்கொண்டால், விவசாய அமைச்சில் 1% முக்கியத்துவத்தைத்தான் ஆராய்ச்சிக்குக் கொடுக்கின்றார்கள். உண்மையில் ஆராச்சிக்கு மிகவும் முக்கியத்துவம் கொடுக்கப்பட வேண்டும். அப்படியாக ஆராய்ச்சிக்கு முக்கியத்துவம் கொடுத்தால் மட்டுந்தான் அந்தத்துறை விருத்தி அடையும். அந்தத் துறைசார்ந்த மக்கள் அதன்மூலம் பலன்களைப் பெறக்கூடியதாக இருக்கும். அந்த வகையில், இன்றைய தினம் தேயிலை ஆராய்ச்சிச் சபையைப் பலப்படுத்துவது தொடர்பாக கௌரவ அமைச்சர் நவீன் திஸாநாயக்க அவர்களால் கொண்டுவரப்பட்ட இந்தச் சட்டமூலமானது மிக முக்கியமான ஒன்றாகும். அதற்காக கௌரவ அமைச்சர் அவர்களுக்கு எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்கள் தற்பொழுது இந்தச் சபையில் இல்லை. இருந்தாலும், கௌரவ அமைச்சருடைய கவனத்திற்கு ஒரு விடயத்தைக் குறிப்பிட வேண்டும். அதேநேரத்தில், அமைச்சினுடைய செயலாளர் மற்றும் தென்னை ஆராய்ச்சி நிலையத்தின் தவிசாளர் ஆகியோருடைய கவனத்திற்கும் நான் இந்தக் கோரிக்கையினை முன்வைக்கின்றேன். அதாவது, வட பிராந்தியத்தில் குறிப்பாக தென்னைப் பயிர்ச்செய்கை மிகவும் முக்கியமானதொரு பயிர்ச்செய்கையாகக் காணப்படுகின்றது. வடக்கிலிருக்கின்ற 5 மாவட்டங்களிலும் அதற்கு முக்கியத் துவம் கொடுக்கப்படுகின்றது. ஆனால், அதற்குரிய ஆராய்ச்சி நிலையங்கள் மற்றும் அமைச்சினூடாக வழங்கப்படுகின்ற ஆலோசனைகள் அல்லது தென்னைப் பயிர்ச்செய்கையினை ஊக்குவிப்பதற்கு எடுக்கப்படுகின்ற நடவடிக்கைகள் போதுமானதாக இல்லை. வட மாகாணத்தில் தென்னைப் பயிர்ச்செய்கைக்கு ஏற்ற சூழல் இருக்கின்றது. அரசாங்கம் என்ற வகையில், அமைச்சு அங்கிருக்கின்ற மக்களுக்கு அது தொடர்பான ஊக்குவிப்புக்களை வழங்க முன்வர வேண்டும்.

அதுபோல் இங்கு நான் இன்னுமொரு விடயத்தையும் விநயமாகக் கேட்டுக் கொள்ள விரும்புகின்றேன். அமைச்சர் அவர்கள் இந்தச் சபைக்கு வருகை தந்ததன் பின்பு இதற்குப் பதிலளிப்பார் என்று நான் எதிர்பார்க்கின்றேன். அதாவது,1994ஆம் ஆண்டு மன்னார் மாவட்டத்தில் மாந்தை மேற்குப் பிரதேச செயலகத்திற்குட்பட்ட வெள்ளாங்குளம் என்ற கிராமத்தில் கஜு வளர்ப்புத் திட்டம் ஒன்றைத் தமிழீழ விடுதலைப் புலிகள் ஆரம்பித்திருந்தார்கள். கஜு வளர்ப்பதற் கென்று அதற்கு அருகாமையில் அந்தப் பிரதேசத்து மக்களைக் குடியேற்றினார்கள். குறிப்பாக கணேசபுரம், சேவா லங்கா, இந்தியன் வீட்டுத் திட்டக் கிராம மக்களை உள்ளடக்கி அந்த கஜு பயிர்ச்செய்கையினை ஆரம்பித்தார்கள். அந்தப் பயிர்ச்செய்கை தொடர்பான சலகவிதமான நடவடிக்கை களையும் அந்த மக்களே கையாண்டு வந்தார்கள். தமிழீழ விடுதலைப் புலிகள் அதற்குரிய ஆயத்த நடவடிக்கைகளை மாத்திரமே அந்த மக்களுக்குச் செய்து கொடுத்தார்கள். யுத்தத்திற்குப் பிற்பாடு 2008ஆம் ஆண்டு, கஜு பயிர்ச்செய்கை மேற்கொள்ளப்பட்ட கிட்டத்தட்ட 600 ஏக்கர் நிலங்களில் இராணுவம் இருந்தது. அந்த இராணுவத்தினரை கஜு பயிர்ச்செய்கைப் பண்ணையிலிருந்து அகற்றி, அந்தப் பிரதேசத்து மக்களுடைய வாழ்வாதாரத்தைக் கட்டியெழுப் புவதற்கு ஏற்ற வகையில் மீளவும் அந்தப் பிரதேசத்தை அந்த மக்களிடம் ஒப்படைக்க வேண்டுமென்று வடக்கு, கிழக்கு அபிவிருத்திக்கான ஜனாதிபதி செயலணியிடம் நான் கோரிக்கை முன்வைத்திருந்தேன். அந்தக் கோரிக்கையினதும் மற்றும் சக பாராளுமன்ற உறுப்பினர்களுடைய கோரிக்கையினதும் அடிப்படையிலும், 275 ஏக்கர் நிலங்கள் பிரதேச செயலாளரிடம் ஒப்படைக்கப்பட்டன. அந்த நிலங்கள் ஒப்படைக்கப்பட்டதன் பின்பு, மாந்தை மேற்கு பிரதேசச் செயலகத்திற்குட்பட்ட புனர்வாழ்வளிக்கப்பட்ட போராளிகள் மற்றும் யுத்தத்தின் நிமித்தம் விதவையான பெண்களுக்கு அந்த 275 ஏக்கர் நிலங்கள் பகிர்ந்தளிக்கப்பட்டு, ஏற்கெனவே மேற்கொண்ட கஜு பயிர்ச்செய்கையைத் தொடர்ந்தும் அவர்கள் மேற்கொள்ள வேண்டுமென்று ஒரு தீர்மானம் எடுக்கப்பட்டது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Hon. Member, you have only two more minutes.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

அந்த கஜு பயிர்களைப் பராமரித்து அதன் பலாபலன்களை மக்கள் அனுபவிக்கக்கூடிய வகையில் ஒரு தீர்மானம் நிறைவேற்றப்பட்டது. மாந்தை மேற்குப் பிரதேச செயலாளரால் அது சம்பந்தமான ஒரு நேர்முகத் தேர்வும் நடத்தப்பட்டது. ஆனால், கஜு கூட்டுத்தாபனம் அந்த 275 ஏக்கர் நிலத்தைக் கூட்டுத்தாபனத்திற்கு எடுப்பதற்குப் பல முயற்சிகளைச் செய்கின்றது. அந்த நிலத்தை அவர் களிடமிருந்து விடுவிக்கும்படி அமைச்சரும் கூட்டுத் தாபனத்திற்கு பல அழுத்தங்களைப் பிரயோகிக்கின்றார். "புனர்வாழ்வளிக்கப்பட்ட போராளிகளுக்கு, யுத்தத்தின் நிமித்தம் கணவன்மாரை இழந்த பெண்களுக்கு வாழ்வாதாரமளிக்கின்றோம்; அவர்களை ஜனநாயக வழிக்குக் கொண்டுவருவதற்கு முயற்சி செய்கின்றோம்" என்று பல இடங்களில் அரசாங்கம் சொல்லி வருகின்றது. அதற்கு அமைவாக இந்த நிலங்களை அந்த மக்களுக்குப் பகிர்ந்தளிப்பதற்கு எடுத்த நடவடிக்கையை ஏன் நீங்கள் தடுக்கிறீர்கள்? என்பதை கௌரவ அமைச்சரிடம் நான் கேட்க விரும்புகின்றேன். உண்மையில் இது அந்த மக்களுக்கு ஒரு வரமாக அமையும். கஜு கூட்டுத்தாபனத்திற்கு நிலங்களை எடுக்கவேண்டுமென்றால், அந்த 275 ஏக்கர் போக அதற்கு அருகாமையில் இருக்கின்ற 325 ஏக்கர் நிலத்தை எடுத்துக் கொள்ளலாம். அதிலும் கஜு பயிர்கள் இருக்கின்றன. அது வன இலாகா திணைக்களத்தின்கீழ் இருக்கின்றது. அந்த நிலங்களை நீங்கள் எடுக்கலாம். அதைவிடுத்து, முன்னாள் போராளிகளுக்குக் கொடுக்கவிருந்த அந்த நிலத்தை மீண்டும் கஜு கூட்டுத்தாபனத்திற்கு வழங்கவேண்டுமென்ற அழுத்தங்களைத் தொடர்ச்சியாகப் பிரயோகித்து வருகிறீர்கள். உண்மையில் இது ஏற்றுக்கொள்ள முடியாத ஒரு விடயமாகும். கௌரவ அமைச்சர் அவர்கள் இருக்கும்போது நான் இந்த விடயத்தைக் குறிப்பிட விரும்பினேன். இதற்கான பதிலை

அமைச்சரிடமிருந்து பெற எதிர்பார்த்திருந்தேன். அமைச்சின் செயலாளர்கள் இதைப் புரிந்துகொள்ள வேண்டும். தமிழீழ விடுதலைப் புலிகளால் உருவாக்கப்பட்ட அந்தப் பண்ணையை கஜு கூட்டுத்தாபனத்திற்கு எடுப்பதை விடுத்து, அங்கு இருக்கின்ற நிலங்களில் நீங்கள் உற்பத்தியைச் செய்து அவற்றை கஜு கூட்டுத்தாபனத்துக்கு எடுக்க வேண்டும். ஆகவே, குறித்த நிலங்களை மக்களிடம் ஒப்படைக்கும்படி கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்டுக்கொள்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Thank you. ඊළඟට, ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.27]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - புத்தசாசன மற்றும் வடமேல் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Buddhasasana and Wayamba Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතා වැදගත් තේ පර්යේෂණ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත ගැන දෙවැනි වර කියවීමේ විවාදයේදී මේ කාරණය මම සඳහන් කරන්නට ඕනෑ. මගේ සහෝදරයන් දෙදෙනෙකුත් පළමු සිංහල ලාංකිකයන් හැටියට එදා එයිට්කන් ස්පෙන්ස් සමාගමේ, කඳපොල වතුයායේ තේ අංශයේ පාලනයට පත්වෙලා හිටියා. "තේ" කියන්නේ ලෝකය තුළ බලවත් දෙයක් මෙන්ම ලංකාවට ඉතා ආඩම්බරයක් ගෙන දෙන දෙයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොන දේ කරන්නත් රටක ස්ථාවරභාවයක් තිබෙන්න ඕනෑ. මම කියන්නේ, අපේ දේශීය නිෂ්පාදන දියුණුවීම, විදේශීය ආයෝජකයන් පැමිණීම, මේ රටේ සංචාරක ක්ෂේත්‍රය දියුණු වීම ආදී ඒ සෑම දෙයකටම රටේ ස්ථාවරයක් ඇති විය යුතු බවයි.

වර්තමානයේ ලංකාවට සිදුවී තිබෙන දේ ගැන අද මම කථා කරන්නේ බුද්ධ ශාසන ඇමතිවරයා හැටියටත් වඩා මේ පාර්ලිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්, ඇමතිවරයෙක් හැටියටයි. මොකද, බොහොම කනගාටුදායක තත්ත්වයක් මේ රටේ තිබෙන අවස්ථාවක, අපේ State Minister H. M .M. Harees මැතිතුමා සභාවේ කථා කළා. රජයේ මුස්ලිම් සහෝදර ඇමතිවරු, රාජ්‍ය ඇමතිවරු, නියෝජ්‍ය ඇමතිවරු මුස්ලිම් ජනතාව වෙනුවෙන් කියලා කැමැත්තෙන් තමන්ගේ තනතුරුවලින් ඉවත් වෙලා මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ පිටුපස වාඩි වෙලා, රජය පෙරළන්න දෙන්නේ නැතිව, රජයත් එක්ක වැඩ කරන්න ඔවුන් ලැහැස්ති වුණා. ඔවුන් කියා සිටියේ, "දැන් විශ්වාස භංග යෝජනා ගෙනෙන්න ඕනෑ නැහැ. ආණ්ඩුකාරවරු දෙදෙනාත් ජනාධිපතිතුමා අයින් කරලා තිබෙනවා. ඔන්න, අපේ ඇමතිවරුනුත් අයින් වුණා. මේ අවස්ථාවේ ඔය කථාවල් වැඩක් නැහැ" කියලායි. අපි දන්නවා, මේ පාර්ලිමේන්තුවේ ඕනෑම කුණුහරුපයක් කියන්න පුළුවන්; ඒ වාගේම, ඕනෑම බොරුවක් කියන්න පුළුවන්; ඕනෑම කෙනෙකුට මඩ ගහන්න පුළුවන්; නමුත්, ඒවායේ සත්‍යතාවක් නැතිව මිනිසුන්ට අධිකරණයට යන්න බැහැයි කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි තේරීම් කාරක සභාවක් පත් කළා. ජනාධිපතිතුමා සමඟ කථා කරද්දී, ලබන සිකුරාදා අපට එන්න කිව්වා. ඕනෑම කෙනෙකුට ඇවිල්ලා කථා කරන්න කිව්වා. මොකක්ද? ජ්‍යෙෂ්ඨ -Senior- DIGsලා තුන්දෙනෙක් CID එකට පත් කරලා තිබෙනවා. මුස්ලිම් ඇමතිවරුත් ඒ දේශපාලනඥයනුත් කියා සිටියේ, "අපට විරුද්ධව චෝදනා තිබෙනවා නම් පාර්ලිමේන්තුවේදී බොරුවට මඩ ගහන්නේ නැතිව මේ ඔක්කෝම තොරතුරු, කරුණු ටික CID එකට දෙන්න. CID එක පරීක්ෂණ කරලා ඔප්පු වුණොත් අප හිරේ දමන්න, එහෙම නැත්නම් ඕනෑ එකක් කරන්න" කියලායි. අන්න එහෙම තත්ත්වයක් අද තියෙද්දී, ජනාධිපතිතුමා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් තුන්දෙනෙක් පත් කිරීම ගැන මම සතුටු වෙනවා. අපිත් ඒවාට සහාය දෙනවා.

නාලන්දා විද්‍යාලයේ ඉගෙන ගත් කෙනෙක් විධියටත්, පාසලේදී සෑම ක්‍රීඩාවක්ම කරපු කෙනෙක් විධියටත් මම දැක්ක දෙයක් කියන්නම්. ඒක මතක තියාගන්න. ආණ්ඩු පක්ෂය, විපක්ෂය මේ පැත්ත හෝ ඒ පැත්ත වෙන්න පුළුවන්. බල තණ්හාව තුළින් යමක් කරන්න එපා කියා මම ඉල්ලා සිටිනවා. මොකද, 1958දී සිංහලය රාජ්‍ය භාෂාව කළ දේ නිසා සිද්ධවුණු දේ මම දැක්කා. පාර්ලිමේන්තුව තුළ අද තේරීම් කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කළා, කරු ජයසූරිය මැතිතුමා ප්‍රධානත්වයෙන්. එහි විපක්ෂ නායක මහින්ද රාජපක්ෂ මැතිතුමා හිටියා; අගමැතිතුමා හිටියා. ඒ වෙලාවේ මොකක්ද මම කිව්වේ? නාලන්දයේ ඉගෙන ගන්නා කාලයේ මම දැක්කා, සිංහලය රාජ්‍ය භාෂාව කරන්න ගිහිල්ලා ඉංග්‍රීසිය නැති කළ බව. දෙමළ අයට සිංහල ඉගැන්නුවේ නැහැ; සිංහල අයට දෙමළ ඉගැන්නුවේත් නැහැ. ගමේ Central College එකේ උගන්වපු ඉංග්‍රීසිය නැති කළා. කාටද මේකෙන් පහර වැදුණේ? සිංහලයාටයි. සිංහලයෙක්, නියම බෞද්ධයෙක් විධියටයි මම කථා කරන්නේ. එදා ඒ කරපු වැඩේ සිංහලයාට වැදුණේ කොහොමද? අද ගමේ පාසලේ ඉංග්‍රීසි නැහැ. අපේ ගම්වලින් ආ බුද්ධිමත් රාජ්‍ය සේවකයෝ ඉන්නවා. මේ අයට අද සමුළුවකට ගිහිල්ලා ඉංග්‍රීසියෙන් කථා කරන්න බැහැ. ඒ නිසා කනගාටුදායක තත්ත්වයක් මේ රටේ තිබෙන්නේ. මම මේක දැක්කා. ඒ නිසා මම අද තේරීම් කාරක සභාවේ වාර්තාවේදීත් කිව්වා, සිංහල, දෙමළ පමණක් නොව English language එකත් medium එකක් කරන්න ඕනෑ, ගම්වලට අයටත් ඉගෙන ගන්න ඉංග්‍රීසිය මාධ්‍ය භාෂාවක් කරන්න ඕනෑ කියලා. එහෙම නොවුණු නිසා එදා ත්‍රස්තවාදය ඇති වුණා.

මම 1960 නාලන්දා විද්‍යාලයේ cricket captain තනතුර දරද්දී ඒ කාලයේ කවුරුවත් උතුරට යන්නේ නැහැ. ඒ අවස්ථාවේදී යාපනයේ St. John’s College එකෙන් නාලන්දයට ආරාධනයක් ආවා, සුහද මිත්‍ර තරගයකට එන්න කියලා. කවුරුවත් යන්න බැහැ කිව්වා. මම කිව්වා, "මොකටද භය වෙන්නේ? අපි යමු" කියලා. එදා අපි යාපනයේ St. John’s College එකටත් ගියා. ඒ පළපුරුද්ද අපට තවම තිබෙනවා.

අද අපේ හටයින්ට ඉංග්‍රීසිවත්, දෙමළවත් කථා කරන්න බැහැ. එහෙම නම් මේ තත්ත්වය යළි ඇති වෙන්න ඕනෑ. පටු විධියට හිතන්න එපා. පටු විධියට හිතලා විනාශයක් වෙන නිසායි මම මේ කථා කරන්නේ. රටේ ආර්ථික ස්ථාවරත්වයක් ඇති වෙන්න නම්, දේශපාලන ස්ථාවරයක් තියෙන්න ඕනෑ. ජාති, ආගම්, කුලභේද මතු කරලා මේවා කරන්න බැහැ. 1958 දී ලී ක්වාන් යූ ආදර්ශයට ගත්තේ ලංකාව. අන්තිමට ලී ක්වාන් යූ තද නීති ගෙන ආවා. ගෙනැල්ලා, අන්තවාදී දේශපාලකයනුත් හිර කෙරුවා; වෘත්තීය සමිතිකාරයොත් හිර කෙරුවා. මොකද, ඒ රටේත් හිටියා මුස්ලිම්, දෙමළ, චීන ජාතිකයෝ. අද සිංගප්පූරුව ලෝකයේ දියුණු රටක් බවට පත්වෙලා ඉන්නවා. නමුත් අපි එන්න එන්නම හිඟන්නාගේ පාත්‍රයට වැටිලා. මේකට දේශපාලනඥයන්, පුරවැසියන්, පූජක පක්ෂය කියන හැම කෙනෙක්ම වග කියන්න ඕනෑ. මම මේ කථා කරන්නේ සිංහලයෙක් විධියටත්, බෞද්ධයෙක් විධියටත්. මෙය බුදුරජාණන් වහන්සේගේ ධර්මයට විරුද්ධව යෑමක් නොවෙයි. බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මය අනුව, අපට වෛරය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව තුළ ජීවිත ගමන යන්න බැහැ. සත්‍යය එයයි කියන එක මතක තියා ගන්න ඕනෑ.

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේ ඉන්න සිංහල අන්තවාදී කියන අයට මේ කථාව කියන්න මට දැන් අවස්ථාවක් ලැබුණා. කටුගම්පල ආසනයේ, බම්මන්නේ මුස්ලිම් පල්ලියක් තිබෙනවා. මට ආරාධනා කළා, නෝම්බි ඉවර වෙන අවස්ථාවේ එතැනට එන්න කියලා, කථා කරන්න. බෝපිටියේ නායක ස්වාමීන්වහන්සේ ඇතුළු අපේ හාමුදුරුවරුන්, බෞද්ධ බැතිමතුන්, පොලීසියේ උසස් නිලධාරින් ඔක්කෝම ආවා. එතැනදී කථාවක් කළා. කවුද, මේ කථාව කළේ? අපි ඔක්කෝගේම ඇසින් කඳුළු එන විධියේ කථාවක් කළා. කවුද, ඒ? රත්නපුරයේ කලීල් කියන මවුලවිතුමා. ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා එතුමා ගැන දන්නවා. කලීල් මවුලවිතුමා කළ කථාව, මහ පුදුම කථාවක්! ඒ වෙලාවේ කිව්වා, කාත්තන්කුඩියට 2017 බස්වලින් ගිහිල්ලා, අන්තවාදීන්ට විරුද්ධව උද්ඝෝෂණ කෙරුවා ලු. එතකොට එතුමාව මරන්න හදලා තිබෙනවා. ඒ තොරතුරු බුද්ධි අංශයට දුන්නා ලු. - බුද්ධි අංශයටත් දීලා තිබෙනවා.- එතුමා ළඟ ඒ සම්බන්ධ ලියවිලි තිබෙන බවත් කිව්වා. නෝම්බි අවස්ථාවේ පල්ලියේ වාඩිවෙලා ඉන්න තරුණ මුස්ලිම් ළමයින්ට එතුමා කිව්වා, "දැන ගනිල්ලා, අපේ ලේ සිංහල ලේ. අපේ වෙළෙන්දන් ලංකාවට ආවේ වෙළඳාමට. රජතුමා තමයි මෙහි කාන්තාවන් විවාහ කර ගන්න අවසර දුන්නේ" කියලා. එතුමාගේ භාෂාවෙන් එතුමා කිව්වා, "උඹලා දැන ගනිල්ලා, සිංහල ලේ තිබෙන අපි සිංහලයන් සමඟ සහෝදරයෝ විධියට ජීවත් වෙන්න ඕනෑ" කියලා. එතුමා පුදුම කථාවක් කළේ. "බෝම්බකාරයෝ 24දෙනෙක් පුහුණු කරලා හිටියා. මේ 24න් 12 දෙනෙකු දැන් මැරිලා. ඉතිරි 12 දෙනා හිරේ ඉන්නවා, එළියට අරින්න නම් එපා " කියලාත් එතුමා කිව්වා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
විනාඩි 10ක් ගියාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි 2ක් තිබෙනවා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
හොඳයි. මම තව විනාඩි දෙක තුනක් ගන්නවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
තේ කර්මාන්තය ගැන කියන්නද?

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
තේ කර්මාන්තය ගැන තමයි කියන්නේ. මොකද, රිදෙනවාද? මට පෙනෙනවා, රිදෙනවා වගේ කියලා. [බාධා කිරීමක්] ඔව්. මම දන්නවා.

ඒ නිසා මේ කථාව කියන්න ඕනෑ. රට දැන් හොල්මන් කරනවා, කට්ටිය. මම දන්නවා, කවුද කියලා. මේ කට්ටිය රට ගම්වල හොල්මන් කරලා භය ගන්වන්න හදනවා. උද්ඝෝෂණ. මේවාට අපි නීතිය ක්‍රියාත්මක කරන්න, කොන්ද පණ ඇතිව ලැහැස්ති වෙනවා. මේවා ගැන ක්‍රියා කරනවා. අපේ ස්වාමීන්වහන්සේලාගෙනුත් මම ඉල්ලනවා. මොකද, ලෝකයේ ගෞරව කරන පැරණිම වස්ත්‍රය කහ සිවුර. කහ සිවුරේ ගෞරවය අපි රැක ගන්න ඕනෑ. කැකිරාවේ සිද්ධිය ගැන මම කනගාටු වෙනවා. මම දන්නේ නැහැ, යම් පිරිසක් කැකිරාවේ ගිහිල්ලා කඩ කැඩුවේ සිවුරු ඇඳගෙනද නැද්ද කියලා. එයත් බොහොම කනගාටුදායක තත්ත්වයක්. ගලබොඩඅත්තේ ඥානසාර හාමුදුරුවෝ හිරේ යන්නට හාර මාසයකට ඉස්සෙල්ලා මාව හම්බවෙන්න අමාත්‍යාංශයට ආවා. ඔබතුමන්ලා මේවා දැන ගන්න. ගලබොඩඅත්තේ ඥානසාර හාමුදුරුවෝ මම ඉස්සරත් අඳුනනවා. උන්වහන්සේ ඇවිල්ලා මට කියනවා, "අපේ ඇමතිතුමා, මම මෙච්චර කල් වරදක් කළා. දැන් අපි සිංහල, දෙමළ, මුස්ලිම් සමගියක් ඇති කරනවා" කියලා. මම ඇහුවා, " හාමුදුරුවනේ! ඔබවහන්සේගේ කථාව බුදුරජාණන් වහන්සේ දමනය කළ ආලවකගේ වාගේ නේ" කියලා. උන්වහන්සේ කියනවා, "ඇත්ත. මේක දැන් මට පෙනෙනවා. මගේ හිත මට ඒක කියනවා" කියා. මම ඇහුවා, "වෙනස් වෙන්න හේතුව මොකක්ද?" කියලා. රුවැන්වැලි මහා සෑය ළඟ රැයක් භාවනා කෙරුවා ලු. - මේවා සභාගත වෙන නිසායි මම කියන්නේ.- එදා රෑ එළිවෙනතුරු භාවනා කරලා ඉන්නකොට උන්වහන්සේගේ හිත කිව්වා ලු, "60,000ක සිවුරු පූජාවක් කරන්න ඕනෑ" කියලා. මම ඇහුවා, "මොකටද හාමුදුරුවනේ?" කියලා.

රජ කාලයේත් ඒ වාගේ වරදක් වෙලා ස්වාමීන් වහන්සේලාට සිවුරු 60,000ක් පූජා කෙරුවා ලු. ඒ මත උන්වහන්සේ මගේ සහාය ඉල්ලුවා. උන්වහන්සේ හිරේ ඇතුළට යද්දි සිවුරු 12,000ක් ගෙන්වා තිබුණා. ජාතිවාදය, ආගම්වාදය, බලකාමීත්වය තුළ මේ රටේ හදාගන්නා යම් යම් බලවේගයන්ට ඉඩ දෙන්න අපි ලැහැස්ති නැහැ. අපි අද ජනාධිපතිතුමා එක්ක කථා කළේ ඒ ගැනයි. බෞද්ධයෙකු විධියට; ප්‍රතිපත්තියක් තිබෙන කෙනෙකු විධියට මගේ ඉල්ලීම වන්නේ එවැනි දේවල්වලට ඉඩ දෙන්න එපාය කියන එකයි. යම් වරදක් කර තිබෙන කෙනෙකු ඉන්නවා නම්, ඒ සම්බන්ධයෙන් තොරතුරු තිබෙනවා නම්, තමන් නීතිය අතට ගන්න යන්න එපා. CID එකට, බුද්ධි අංශයට, තමන්ගේ පළාතේ ඊට අදාළ අංශවලට ඒ තොරතුරු දෙන්න. ඒ අනුව, ඔවුන්ට නීතිය ක්‍රියාත්මක කරන්න ඉඩ දෙන්න.

මම අන්තවාදයට මුහුණ දුන් කෙනෙක්. අන්තවාදයට මුහුණ දුන් කෙනෙකු විධියට මම කියනවා, ත්‍රස්තවාදය විනාශ කළ යුතුයි කියලා. අපට ඒක සිංහල, දෙමළ, මුස්ලිම් කියලා දෙන්නත් බැහැ; ආගම් වශයෙන් දෙන්නත් බැහැ. අපි ලාංකිකයෝ සිටින සමාජයක් මේ රටේ හදන්න ඕනෑ. එහෙම නැතිව තේ ගැන කථා කෙරුවත්, මහා සංවර්ධනයක් ගැන කථා කෙරුවත්, මේවා ඔක්කෝම බොරු වැඩ. ඉස්සෙල්ලා මනස හදලා ඉන්න ඕනෑ. ලාංකිකයෝ විධියට සිතන වැඩ පිළිවෙළක් ඇතිවන්න ඕනෑ. එහෙම නම්, මෙතැනදි දේශපාලකයා, අරයාගේ පුතා, අරයාගේ තාත්තා කියලා තරාතිරම් බලන්න බැහැ. මෙවර ජාතික වෙසක් උත්සවයේදීත් ජනාධිපතිතුමාට මම කිව්වා, ලී ක්වාන් යූ වාගේ කොන්ද පණ ඇතිව අපි නීතිය ක්‍රියාත්මක කරමු කියලා. එහෙම නැතිව මේ රට හදන්න බැහැ. එක එක්කෙනාට ඕනෑ විධියට මේ දේවල් කඩාකප්පල් කරන්න, කුමන්ත්‍රණ කරන්න ඉඩ දෙන්න එපා. ඒවා කරන්න දෙන්න බැහැ. "ළමයි පාසල් යවන්න එපා, බෝම්බ ගහනවා" කිව්වා. ඊ ළඟ සතියේ මේ ඇත්තෝම Royal College එකේ ගේට්ටුව ළඟට ගිහිල්ලා කියනවා, ළමයින්ට "පාසල් එන්න" කියලා. ජාතියේ නාමයෙන් මම ඉල්ලා සිටිනවා, මෙහෙම දේවල් කරන්න එපාය කියලා. මේවා හරියන්නේ නැහැ. මේ ශාපය වදිනවා. ඒක මතක තබා ගන්න. ඔබතුමන්ලාගේ පළාතේ සිටි සිංහල ජාතිවාදය කථා කරපු රාජරත්නම්ට මොකද වුණේ?

ඔහු අතුගෑවිලා ගියා. එෆ්.ආර්. සේනානායකගේ පුතා වන ආර්.ජී. සේනානායක මහතා සිංහල ජාතිවාදය ගැන සිංහලෙන් කථා කරලා දඹදෙනිය ආසනයට තරග කළා. ඔහුව පැරැද්දුවේ සිංහලයෝමයි. මේ රටේ එවැනි දේවල් කරන්න බැහැ. ගරු සී.බී. රත්නායක මන්ත්‍රීතුමනි, ඔබතුමාත් මමත් බෞද්ධයෝ විධියට ආනන්දයේ එකට ඉගෙන ගත්තේ. මතක තියාගන්න, මේ රටේ ජාතිවාදය, ආගම්වාදය, කුලවාදය මතු කරන සියලුදෙනාම ස්වභාව ධර්මයේ නොපෙනෙන හස්තයකින් විනාශ කරනවා. එල්ටීටීඊ සංවිධානයත් විනාශ වුණා, දකුණේත් එහෙම වුණා. මේ අන්තවාදයත් විනාශ වෙලා යහපත් කාලයක් එනවා. ඒක මම භය නැතුව කියනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු අමාත්‍යතුමනි.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
හැබැයි, අපි මේ කඩාකප්පල් කිරීම්, කඩවල් වැහීම එක එක්කෙනාට ඕනෑ විධියට කරන්න දෙන්න බැහැ. එහෙම නම් අපි ප්‍රතිසංවිධානය වෙන්න ඕනෑ. අපේ ගම්වල සාමය ආරක්ෂා කරන්න, නීතිය ක්‍රියාත්මක කරන්න පොලිස් නිලධාරින් ඉන්නවා. අපිත් ඒ සඳහා ක්‍රියා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ දේ කෙරුණොත් විතරයි තේ ගැනත් කථා කරන්න පුළුවන්, සංවර්ධනය ගැනත් කථා කරන්න පුළුවන්. ඔක්කෝටම ඉස්සෙල්ලා මිනිසුන්ගේ මනස හදමු. ලාංකිකයන් විධියට හිතන සමාජයක් හදමු. මෙතැනට එන්නේ බලකාමිත්වයෙන්. තමුන්නාන්සේලාගෙන් කවුද පාර්ලිමේන්තුවෙන් අයින් වුණේ? මම දෙවතාවක් පාර්ලිමේන්තුවෙන් අයින් වුණු මිනිහෙක්. මම දෙවතාවක් පාර්ලිමේන්තුවෙන් අස් වුණු මිනිහෙක්. සමහරු තණ්හාවෙන් කුඩැල්ලෝ වාගේ කාගෙන මෙතැන ඉන්නවා. මට තණ්හාවක් නැහැ. ලාංකිකයෙක් විධියට මට ලොකු මේ රට. මම මේ වෙලාවේ මීට වඩා කාලය ගන්නේ නැහැ. නමුත් මම, මේ සභාවට මේ කාරණය කියන්න ඕනෑ; මේකට සවන් දීගෙන ඉන්න අයට කියන්න ඕනෑ. ලාංකිකයෝ විධියට මේ රට ගැන හිතන්න. මෙතැන අන්තවාදයක් ඇති කරන්න හදන්න එපා. සිංහලයෝ කියලා වෙනම, දෙමළ කියලා වෙනම, මුස්ලිම් කියලා වෙනම කටයුතු කළොත්, මේ රට කෑලිවලට කැඩෙනවා. මෝඩයෝ වාගේ වැඩ කරලා ජාත්‍යන්තර හස්තවලට හසුවෙන්න ඉඩ තියන්න එපා. ඉන්දියාව එක පැත්තකින් බලාගෙන ඉන්නවා. ඉස්ලාම් රාජ්‍යයන් තව පැත්තකින් ඉන්නවා. බටහිර රටවල් ඒ පැත්තේ ඉඳලා බලාගෙන ඉන්නවා. චීනය එහෙන් බලාගෙන ඉන්නවා. ඒ නිසා ඔළුව පාවිච්චි කරලා, ඥානාන්විතව වැඩ කරන්න කියායි මම ඉල්ලන්නේ. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා.3.42]

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනත සංශෝධනය කරන අවස්ථාවේ, තේ කර්මාන්තය සම්බන්ධයෙන් යම් වේලාවක් කථා කරන්නත්, ඊළඟට රටේ දැන් පවතින තත්ත්වය ගැන අදහස් දක්වන්නටත් බලාපොරොත්තු වෙනවා.

ප්‍රධාන වශයෙන් මේ පනතේ සංශෝධන සම්බන්ධයෙන් අපට විශාල ගැටලු නැහැ. නමුත්, පනත සංශෝධනය කිරීමට එහා ගිය පර්යේෂණවල අවශ්‍යතාව අපි දකිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ඔබතුමා දන්නවා, කෘෂිකාර්මික පර්යේෂණ කියන ඒවා ලෝකයේ ඉතාම ඉහළ මට්ටමට වර්ධනය වෙලා තිබෙන බව. පසුගිය මාස කිහිපයකට කලින් අපි සේනා දළඹු උවදුරට ලක් වුණු අවස්ථාවේත්, ඒ වාගේම මීට කලින් කුරුමිණි උවදුර පැමිණි අවස්ථාවේත් තායිවානයේ ලෝකයේ ඉහළම විශ්වවිද්‍යාලයක පර්යේෂකයෙක් විධියට වැඩ කරන ශ්‍රී ලාංකීය විද්‍යාඥයෙක් මම මුණ ගැසුණා. ඔහු පැහැදිලිව කිව්වා, ලංකාවේ තේවල කුරුමිණියන් ගැන, ඒ වාගේම සේනා දළඹු උවදුරට අදාළව ඉතාම සාර්ථක පරීක්ෂණ කරන්න පුළුවන්, කළ හැකියි, කළ යුතුයි, ඒවා අතිවිශාල මුදල් වැය වන දේවල් නොවෙයි කියන එක. ඔහු ඉතාම තරුණ ශ්‍රී ලාංකීය විද්‍යාඥයෙක්. මේ පනත සංශෝධනය කිරීමට අපි පක්ෂයි. නමුත්, අපි දකින දේ තමයි, පර්යේෂණ ආයතනවලින් අපේ රටේ මේ තත්ත්වය තව දුරටත් නඟා සිටුවන්න අවශ්‍ය කරන මැදිහත්වීම සිදු විය යුතුයි කියන එක. ඒ වාගේම, තේ කර්මාන්තයෙන් අතිවිශාල පිරිසක් ජීවත් වෙනවා. අතිවිශාල පිරිසක් ජීවත් වෙනවා වාගේම අපට විශාල ආදායමක් ලැබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් ඔබතුමා දන්නවා, අපේ රටේ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත්තොත්, තේවලින් ලැබෙන ආදායම එන්න එන්න අඩු වෙන බව. මහ බැංකු වාර්තා අනුව ගත්තොත් එය 2005දී අපේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.2යි. 2018 වෙනකොට ඒක සියයට 0.7යි. ඒ වාගේම තේ නිෂ්පාදනයේ පිරිවැය ගත්තොත්, 2001දී කිලෝ ග්‍රෑම් එකක් සඳහා රුපියල් 121ක් පමණ වුණා. අද එය රුපියල් 475ක් වාගේ ඉහළ මට්ටමකට ගිහිල්ලා තිබෙනවා.

ඒ එක්කම මම මෙතැනදී තව කාරණයක් මතු කරන්න කැමැතියි. අපේ තේ අපනයනයේදී මැද පෙරදිග රටවල්, ඒ වාගේම ඉරානය, රුසියාව වාගේ රටවල් විශාල වශයෙන් වැදගත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට මාස 4කට කලින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණා, ඉරානයට එරෙහිව සම්බාධක පැනවීම සම්බන්ධ ගැසට් පත්‍රයක්. එය විදේශ කටයුතු අමාත්‍යාංශය සකස් කර තිබුණා. ඒ ගැසට් පත්‍රය ගැන අපි ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී ප්‍රශ්න කළා. මොකද, ඇමෙරිකාවට ඉරානයත් එක්ක තිබෙන ප්‍රශ්නය වෙනම එකක්. ඒවා මත පදනම් වෙලා ලංකා ආණ්ඩුව ඉරානයට තහංචි පනවන්න ගියොත් ඇති වන තත්ත්වය පිළිබඳව අපි ප්‍රශ්න කළා. එතැනදී විදේශ කටයුතු අමාත්‍යාංශය යම්කිසි පැහැදිලි කිරීමක් කර තිබුණා, මේවා ඇමෙරිකානු සම්බාධක නොවෙයි, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සම්බාධක කියලා. කෙසේ වුවත්, අප දකින දේ තමයි, ඇමෙරිකාව සහ ඉරානය අතර තිබෙන ප්‍රශ්නය නිසා රටක් වශයෙන් ශ්‍රී ලංකාව විශාල පීඩාවකට ලක් වෙලා තිබෙනවාය කියන එක. මෙහි ඇති වැදගත්ම කාරණය තමයි, විදේශ කටයුතු අමාත්‍යාංශය එවැනි දෙයක් කරද්දී - ඇමෙරිකාව සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය කියන නිසා සම්බාධක පනවන්න මෙහේ ගැසට් ගහද්දී- අඩුම ගණනේ තේ මණ්ඩලයෙන් වත් ඒ ගැන විමසා තිබුණේ -අහලා තිබුණේ- නැති එක. අප මැදිහත් වෙලා තේ මණ්ඩලයෙන් වාර්තාවක් ගෙන්වා ගත්තාට පසුව තමයි ඔප්පු වුණේ, 'ඩොලර් මිලියන ගණනක මුදලක් ඉරානයෙන් ශ්‍රී ලංකාවේ තේ අපනයනකරුවන්ට ලැබිය යුතු වෙනවා. ඉරානය ඒ මුදල් ගෙවන්න ලෑස්තියි, ලංකාව ඒ මුදල් ගන්නත් ලෑස්තියි. හැබැයි, ඉරානයට ඩොලර්වලින් ගනුදෙනු කරන්න බැරි නිසා එය ගෙවන්න විධියක් නැහැ' කියන කාරණය. ඩොලර් මිලියන ගණනක් ශ්‍රී ලාංකීය අපනයනකරුවන්ට නොලැබී තිබෙනවා, මේ ප්‍රශ්නය නිසා. එවැනි සංවේදී කරුණක් සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහ මුදල් අමාත්‍යාංශයේ නිලධාරින් අඩු ගණනේ තේ කර්මාන්තය සම්බන්ධ ප්‍රධාන ආයතනවලින් වත් විමසීමක් කරනවා අපි දැක්කේ නැහැ.

[ගරු බිමල් රත්නායක මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් කාරණය තමයි, රටේ අභාග්‍යයට, විවිධ හේතු නිසා දැන් රුපියල කඩාගෙන වැටිලා ඩොලර් එකේ වටිනාකම වැඩි වෙලා තිබීම. ඩොලර් එක රුපියල් 175ට, 178ට, 180ට ගියත් තේ දලු හිමියාගේ දලුවලට ලැබෙන මිල වෙනස් වන්නේ නැහැ. රුපියල කඩාගෙන වැටීමෙන් වන ඔක්කෝම නරක දේවල් ඇතුළේ අපනයනය කරන අයට යම්කිසි වාසියක් ලැබෙනවා. නමුත්, ඒ වාසිය තේ දලු හිමියාට යන්නේ නැහැ. දලු හිමියාට ලැබෙන්නේ, දලු කිලෝවකට රුපියල් 85, 90, 95 අතර මුදලක් ම පමණයි. ඒ නිසා පහළ මට්ටමේ සිටින තේ දලු නිෂ්පාදනය කරන පුද්ගලයන්ට ඒ වාසිය නොලැබීමේ ප්‍රශ්නය තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තේ කර්මාන්තයේ දියුණුව වෙනුවෙන් සෙස් අරමුදලක් පවත්වාගෙන ගියා. දැන් ආණ්ඩුව කර තිබෙන දේ මොකක්ද? දැන් තේවලින් එන සෙස් බද්ද සහමුලින්ම -සියයට සියයක්ම- කෙළින්ම යන්නේ භාණ්ඩාගාරයට. නවීන් දිසානායක ඇමතිවරයා එයට විරුද්ධ වුණත් සිදු වන්නේ එයයි. ඒ මුදල් තේ කර්මාන්තයේ සංවර්ධනයට එන්නේ නැති නිසා තමයි, ඒ සෙස් අරමුදල දැන් සහමුලින්ම භාණ්ඩාගාරය විසින් ගිල ගන්නා නිසා තමයි කුඩා තේ වතු හිමියන් ඇතුළු තේ වතු හිමියන්ට පොහොර සහනාධාරය ලබා දීමේදී, නැවත පැළ වගා කිරීමේදී අවශ්‍ය සහන ලබා දෙන්න බැරි වෙලා තිබෙන්නේ. මොකද, ඕනෑම කර්මාන්තයක දියුණුව සඳහා පාවිච්චි කරන්න තමයි මෙවැනි අරමුදල් තිබෙන්නේ.

මේ කරුණු සඳහන් කරමින් අපි ඉල්ලා සිටිනවා, පර්යේෂණ වැඩි කරලා -ප්‍රායෝගිකව පර්යේෂණ කරලා- වැඩි ආදායමක් ගන්න කටයුතු කරන්න කියලා. ඒ වාගේම, ඇමෙරිකාව දෙන ලුණු කාලා ලංකාවේ තේ කර්මාන්තය විනාශ කර ගන්නේ නැතිව අපේ රටට ගැළපෙන විධියට මේ ආයෝජකයන්ට, අපනයනකරුවන්ට අවශ්‍ය සහන ලබා දෙන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ එක්කම රටේ ඇති වී තිබෙන මේ දේශපාලන වටා පිටාව ගැනත් අප කරුණු කීපයක් විශේෂයෙන්ම කියන්න ඕනෑ. ඔබතුමා දන්නවා, අපේ රටේ ආණ්ඩුවේ සිටි සියලු මුස්ලිම් අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් ඊයේ තනතුරුවලින් ඉවත් වූ බව. ඒ අය තනතුරුවලින් ඉවත් වෙලා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් වශයෙන් සිටිනවාය කියන තීරණයට ආවා. අපි දන්නවා, ඉවත් වූ ඒ සමහර ඇමතිවරුන්ට අදාළව බරපතළ දූෂණ චෝදනා තිබෙනවා කියලා. ඒ ගැන සැකයක් නැහැ. ඉවත් වූ ඒ සමහර ඇමතිවරුන්ගේ කාර්ය භාරය පිළිබඳව දිගු කාලීනව ගොඩ නැඟුණු විවේචනයක් පොදුවේ රටේ ජනතාවට තිබෙනවා. සමහර ඇමතිවරුන්ගේ භාවිතාව සම්බන්ධ ඒ විවේචනය ජනතාව අතර සිංහල, දෙමළ, මුස්ලිම් භේදයකින් තොරව තිබෙනවා. මොකද, ඒ අය හැමදාම ඇමතිවරු. ඒ අයගෙන් සමහරු මුස්ලිම් ජනතාවට දිගනදී ගහද්දී, අලුත්ගමදී ගහද්දී වචනයක් වත් කියන්න කට සොලවපු නැති ඇමතිවරු. ඒ අය කොයි ආණ්ඩුවේත් ඇමතිලා. එවැනි ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ගැන විවාදයක් නැහැ. නමුත්, අප ඊයේ දුටු දේ තමයි, හැම ආණ්ඩුවේම ඇමතිකම් ගන්නා මුස්ලිම් ඇමතිවරුන්ටත්, ආණ්ඩු පක්ෂයේ සිටින සමස්ත මුස්ලිම් මන්ත්‍රීවරුන්ටත්, ආණ්ඩු පක්ෂයේ පමණක් නොවෙයි, මේ රටේ සිටින සියලු මුස්ලිම් මන්ත්‍රීවරුන්ටත් එක තැනකට, එක දේශපාලන ක්‍රියා මාර්ගයකට එන්න සිද්ධ කළාය කියන කාරණය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා ඒ ස්ථාවරයට ඔවුන් ආවේ ඇයි කියලා. අපි හොඳින්ම දන්නා විධියට ඇත්තටම සමහර ඇමතිවරුන්ට ඇමතිකම දාලා දවසක්වත් ඉන්න බැහැ.

ඒ ගොල්ලන් ඒකට ඇබ්බැහි වෙලායි ඉන්නේ. සහරාන්ලාගේ බෝම්බයෙන් පස්සේ මේ රටේ සමස්ත මුස්ලිම් ප්‍රජාවම ඉලක්ක කරගෙන, ඉතා දැනුවත්ව ඇතැම් අය යම් යම් කටයුතු කළා. 21වැනි දා සිද්ධ වූ ඒ අන්තවාදී ප්‍රහාරය නිසා මුස්ලිම් ජනතාවට එරෙහිව සාමාන්‍ය ජනතාව තුළ ස්වභාවිකව විවේචනයක්, විරෝධයක්, හැඟීමක් එන එක අපට පිළිගන්න පුළුවන්. නමුත්, එහෙම නොවී, යම් පිරිසක් මේ සිද්ධිය අමු අමුවේ දේශපාලන ව්‍යාපාරයක් බවට පත් කරගෙන, නඩත්තු කළා. ඒක ඉතාම දුර්දාන්ත ආකාරයෙන් සිද්ධ වුණා. මුස්ලිම් මනුස්සයෙක් කියන්නේ ත්‍රස්තවාදියෙක් කියන ඒ Islamophobia එක මේ රටේ ජනමාධ්‍යවලින් තදට හැදුවා. ඒකෙන් වාසි ගත්ත දේශපාලන ව්‍යාපාරයක්, විශේෂයෙන් විපක්ෂයේ රාජපක්ෂ මැතිතුමාගේ පක්ෂයේ ඉන්න සැලකිය යුතු කණ්ඩායමක් හිටියා. නමුත් ඒ පක්ෂයේ ඔක්කෝම මන්ත්‍රීවරු නොවෙයි. මම ඒක වගකීමෙන් කියනවා. සැලකිය යුතු ලෙස ජාතිවාදී උන්මත්තකයන් වාගේ කටයුතු කරන පිරිසක්, සහරාන්ගේ සිංහල සහෝදරයන් කියලා හඳුන්වන්න පුළුවන් මට්ටමේ පිරිසක්, ඒ ගොල්ලන්ගේ media channels බලයත් යොදා ගෙන දැවැන්ත විරෝධයක් හැදුවා. එක්සත් ජාතික පක්ෂයේ සමහර මැති ඇමතිවරුත් ඒකට යටින් support කළා. මොකද, එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් ඡන්ද දිනන්න සිංහල ජාතිවාදය ඕනෑ. අපි ඒක දන්නවා. ඒ නිසා පාර්ලිමේන්තුවේ කරන කථාව නොවෙයි, එතුමන්ලාගේ ආසනයේදී කළේ. අපි ඒකත් දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුස්ලිම් මිනිස්සු සහරාන්ලාට විරුද්ධව අවුරුදු තුන හතරකට කලින් ආණ්ඩුවට, පොලීසියට ඔත්තු දුන්නාය කියන එක පිළිගන්න සාක්ෂි තිබියදී, මුස්ලිම් සමාජය මේ අන්තවාදයට සහමුලින්ම විරුද්ධ බව පෙනෙන්න තිබියදී ඒ ගැන කටයුතු කළේ නැහැ. නමුත් සමහර මුස්ලිම් නායකයන් ගැන මම එහෙම කියන්නේ නැහැ. සමහර මුස්ලිම් දේශපාලන නායකයෝ, ආගමික නායකයෝ සැලකිය යුතු පිරිසක් මේ අන්තවාදයට, අන්තවාදී මතයට -බෝම්බ පුපුරවන්න නොවෙයි- උදව් කළා. සිංහල, දෙමළ පොදු සමාජයක් සමඟ ජීවත් වෙන්න මුස්ලිම් මිනිස්සු තුළ තිබුණු සහජ, අවුරුදු දහසක උරුමය නැති කරලා, කොන් කරලා, මුස්ලිම් මනුස්සයා ආගමයි, වෙළඳාමයි කරන කෘතිම සත්වයකු බවට පත් කරන්න සමහර මුස්ලිම් ආගමික නායකයෝ, මුස්ලිම් නායකයෝ කටයුතු කළා. නමුත්, මුස්ලිම් සමාජය එතැනට තල්ලු වුණේ නැහැ. මුස්ලිම් සමාජය මේ අන්තවාදයට ආශීර්වාද කළේ නැති බව හොඳින්ම පෙනෙද්දීත් මුස්ලිම් මනුස්සයාට වට කරලා ගහලා ගහලා, අවසානයේ ඔවුන් තල්ලු කළා, අසූ ගණන්වලදී ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු ආපු ස්ථාවරයට එන්න.

එක පැත්තකින් මේ ත්‍රස්ත ප්‍රහාරය ගැන දැනුවත්ව ඉඳලාත්, ඒක වළක්වන්න කටයුතු කරපු නැති ජනාධිපතිවරයා, අගමැතිවරයා ඇතුළු මුළු ඇමති මණ්ඩලයම ඒකට වග කිව යුතු නිසා, මුස්ලිම් ඇමතිවරුනුත් ඒ වගකීමට අයිතියි. ඒ නිසා ඒ අය ඉල්ලා අස්වුණාට කමක් නැහැ. හැබැයි, මුස්ලිම් ඇමතිවරු පමණක් ඉල්ලා අස් වෙලා හරි යන්නේ නැහැ. ඔවුන් මුස්ලිම් වීම නිසා නොවෙයි මේකට වග කියන්න ඕනෑ, ඇමතිවරු වීම නිසායි. නමුත්, ප්‍රශ්නය ගෙනාවේ කොතැනටද? අමු ජාතිවාදී විධියට සහමුලින්ම මුස්ලිම් ජනතාවට විරුද්ධ තැනකටයි ප්‍රශ්නය ගෙනාවේ. මම ඒකට උදාහරණ දෙකක් කියන්නම්. මොකද, ජනතා විමුක්ති පෙරමුණ වශයෙන් අපට හොඳට අත්දැකීම් තිබෙනවා, අදහස් තිබෙනවා, මේ හදිසි නීති, අර නීති, මේ නීති, සාමාන්‍ය, සාධාරණ මිනිසුන්ට විරුද්ධව පාවිච්චි කරන්නේ කොහොමද කියලා. ඔබතුමන්ලා දන්නවා, 1987, 1990 කාලයේ තරුණයන් අත්අඩංගුවට ගෙන මරපු බව. යුද්ධය කාලයේ, දෙමළ වීම නිසා අවුරුදු දෙක, තුන, හතර, පහ නිකරුණේ අත්අඩංගුවේ තබා ගත්ත දෙමළ මිනිස්සු හිටියා. අද ඒ තත්ත්වයටම මුස්ලිම් ජනතාවත් පත් කරමින් තිබෙනවා. මම ඊට උදාහරණ දෙකක් කියන්න කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහියංගනයේ දී කාන්තාවක් අත්අඩංගුවට ගත්තා ඇයගේ ඇඳුමේ නැවක සුක්කානමක පින්තූරයක් තිබුණාය කියලා. ඇය අත්අඩංගුවට

ගත්ත එකත් වැරදියි. ඊළඟට, ඇය රිමාන්ඩ් කළා, ඇප දිය නොහැකි ආකාරයට. ICCPR කියන එක්සත් ජාතීන්ගේ ඒ සම්මුතියට අත්සන් කර තිබෙන නිසා, ඒ පනත, මහජනතාවගේ සිවිල් අයිතිවාසිකම් ආරක්ෂා කරන්න තිබෙන පනත පාවිච්චි කරලා අර කිසිම දෙයක් දන්නේ නැති දුප්පත්, නූගත් කාන්තාව රිමාන්ඩ් කළා ඇප දෙන්න බැරි විධියට, පොලීසියෙන්. මා දන්නා තරමින් ඊයේ තමයි ඇයට ඇප දුන්නේ. ත්‍රස්තවාදී කාන්තාවක් නම් ධර්ම චක්‍රය හෝ නැවක සුක්කානම ඇඳුමේ ගහගෙන යනවාද? හොඳ posh ඇඳුමක් ඇඳගෙන යන්න පුළුවන්නේ. මම තව උදාහරණයක් කියන්නම්. මීට මාසයකට කලින් පුත්තලමේදී අත්අඩංගුවට ගත්තා, මුස්ලිම් කාන්තාවක් ඇයගේ ස්වාමි පුරුෂයා එක්ක. ඇයගේ නම ෆාතිමා රිනෝසා. ඇය අත්අඩංගුවට ගත්තේ මොකටද? අත්අඩංගුවට ගත්තේ මුහුණ අර්ධ වශයෙන් වහ ගෙන ගියා කියලායි. මුහුණ වහගෙන යන්න එපා කියලා තිබියදී මුහුණ වහගෙන යන එකේ වැරැද්දක් තිබෙනවා තමයි.

හැබැයි, ඇයව රිමාන්ඩ් කළේ කොහොමද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇයව රිමාන්ඩ් කරලා තිබෙන්නේ මේ ICCPR එක යටතේ. මා දන්නා තරමට ඇය මාස නවයක ගැබිනි කාන්තාවක්. ඇය රිමාන්ඩ් බන්ධනාගාරයේ තවමත් ඉන්නවා. දරුවා හම්බ වෙන්න ළඟයි. හැබැයි, මේ ආණ්ඩුවේ නිලධාරීන්ට උපදෙස් දීලා තිබෙනවා. මොකක්ද? ඉතාම දරුණු ඇප දිය නොහැකි පනත් යටතේ මේ පුද්ගලයන්ව සිරගත කරන්න කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
බොහොම ස්තුතියි, ඔබතුමාට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුස්ලිම් ජනතාවගේ සහයෝගය ගන්නේ නැතිව අන්තවාදය පරාජය කරන්න බැහැ. අපි ඒකට පොත් පාඩම් කරන්න ඕනෑ නැහැ. දෙමළ ජනතාවත් සම්බන්ධ වෙච්ච ඒ මහා පරිමාණ යුද්ධයේ දී අපි ඒක ඉගෙන ගෙන තිබෙනවා. ඒක නිසා අපි කියන්නේ අන්තවාදය පරද්දන්න ජාතිවාදයට, ආගම්වාදයට මේ ආකාරයේ දරුණු සැලකිලිවලින් බැහැ කියන එකයි. වව්නියාවේ ඉඳලා Elephant Pass දක්වා බස් එක හැම තැනම නතර කරනවා. වෙන කොහේවත් බස් එක check කරන්නේ නැහැ. වැඩිපුරම ත්‍රස්තවාදීන් අහුවුණේ කාත්තන්කුඩියේ. හැබැයි, ඒ පැත්තට යන බස් check කරන්නේ නැහැ. එම බස් check කරන්න කියලා විශේෂයෙන් කියනවා නොවෙයි. දෙමළ ජනතාවට වෙනම දනවනවා. වවුනියාවෙන් පස්සේ හැම බස් එකක්ම check කරනවා. Check කරනවා නම් රටේම check කරන්න. මේ බස්වල check කරද්දී මොකක්ද බලන්නේ? ඉස්පිරිතාලයකට ගියත් මොකක්ද බලන්නේ? වඩිවේල් සුරේෂ් මන්ත්‍රීතුමනි, ඉස්සර බැලුවේ දෙමළද කියලා. දැන් හැඳුනුම්පතේ බලන්නේ මුස්ලිම්ද කියලා.

මට ළඟදී අපේ තරුණ සංගමයේ නංගිලා දෙන්නෙක් කිව්වා, ඒ ගොල්ලන් ගිය බස් එකේ අනෙක් කවුරුවත් බස්සන්නේ නැතුව වේල් එක දාගෙන ආපු -මුහුණ වහගෙන ආපු අය නොවෙයි- පන්ති යන ගෑණු ළමයි දෙන්නෙක් විතරක් බස් එකෙන් බස්සලා register කළා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ත්‍රස්තවාදීන් ඩෙනිමක් ඇඳලා උඩින් නිකම් T-shirt එකක් ගහගෙන ආවොත් check කරන්නේ නැහැ නේ. ඒක නිසා මුස්ලිම් අනන්‍යතාව විනාශ කරන්න එපා. මුස්ලිම් මිනිසුන්ට සාධාරණ අනන්‍යතාවක් තිබෙනවා. මුහුණ වහගෙන යන එක හෝ අඩු වයසෙන් කසාද බඳින එක නොවෙයි. නමුත් මිනිසුන්ට සංස්කෘතික අවශ්‍යතාවක් තිබෙනවා. ඒවාට පහර දීමෙන් ඔවුන් අන්තවාදයට තල්ලු කරනවා.

මම මේ කාරණය ගැනත් අහන්න කැමැතියි. රතන හාමුදුරුවන්ගේ උපවාසයෙන් පස්සේ ඇමතිවරු අස් වුණා. ආණ්ඩුකාරවරු තුන්දෙනෙක් අස් වුණා. දැන් රට දිනලද? ජනාධිපතිතුමා විසින් ආණ්ඩුකාරවරයා විධියට මුසම්මිල් මහත්මයා පත් කරලා තිබෙනවා. දැන් කවුරු හරි ආයෙත් උපවාස කරන්න යනවාද? රතන ස්වාමීන් වහන්සේ උපවාසය කළේ මුළු ආණ්ඩුවම ගෙදර යවන්න කියලා නම්, අපිත් ඒකට යනවා. මේකට වග කියන්න ඕනෑ, මුස්ලිම් මිනිස්සු පමණක් නොවෙයි. ජනාධිපති, අගමැති සහමුලින්ම වග කියන්න ඕනෑ. හැබැයි, ජාතිවාදී ලෙස තමයි ඒක කළේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අවසන් කරන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒක නිසා අපි කියන්න කැමැතියි, මේක ජාතිවාදී බිල්ලෙක් බව. මේ අන්තවාදී බිල්ලා මුස්ලිම් සමාජයත් ගිලගෙන තිබුණා. ඒ තමයි සහරාන්ලා. රාජපක්ෂ මහත්මයාත් පසු ගිය කාලයේ ජාතිවාදය ක්‍රමානුකූලව පෝෂණය කළා. දැන් රාජපක්ෂ මහත්මයාත් ඒ ජාතිවාදී බිල්ලාගේ බෙල්ල මුලට අහුවෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතිවාදය ලිහා දැම්මාට පස්සේ තමන්ට ඕනෑ වෙලාවට බෝතලයට දමා ගන්න බැහැ. අද රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා මේ ජාතිවාදයට කැමැතියි. මොකද දැන් රටේ ආර්ථික ප්‍රශ්න ගැන මිනිස්සු මොකුත් කථා කරන්නේ නැහැ. බඩු මිල ගැන කථා කරන්නේ නැහැ. මේ ගැන තමයි කථා කරන්නේ. මට ඔබතුමා විනාඩියක් දෙන්න. මූලාසනාරූ ගරු මන්ත්‍රීතුමනි, මම දන්නවා, මම වෙලාව වැඩි පුර ගත්තා කියලා.

ජනතා විමුක්ති පෙරමුණ වශයෙන් අපි ඉල්ලා සිටින්නේ මෙයයි. මුස්ලිම් ජනතාව රට පැත්තට -ශ්‍රී ලංකාව පැත්තට- දිනා ගැනීම වෙනුවෙන් කළ යුතු හැම දේම කළේ නැත්නම් මේ අන්තවාදය බෝවෙනවා; ව්‍යාප්ත වෙනවා; මුළු රටම විනාශයට පත් වෙනවා. ඒක තමයි අපි පසු ගිය දවස්වල දැක්කේ. ජනාධිපතිවරයා තමන්ගේ දේශපාලන වාසි වෙනුවෙන්, අගමැතිවරයා තමන්ගේ දේශපාලන වාසි වෙනුවෙන්, රාජපක්ෂ මහත්මයා තමන්ගේ දේශපාලන වාසි වෙනුවෙන් කටයුතු කළේ. රාජපක්ෂ මහත්මයා ළඟ එල්ලිලා සිටින සහරාන් වර්ගයේ සිංහල ජාතිවාදී කල්ලිය නිසා අද මොකක්ද සිදුවෙලා තිබෙන්නේ? අද මුළු රටම එකම ජාතිවාදී ගින්නකට ගිහිල්ලා තිබෙනවා. ඒක නිසා ජනතා විමුක්ති පෙරමුණ වශයෙන් අපි ඉතාමත් වග කීමෙන් මේ කාරණය කියනවා. ඔබතුමා බලන්න, අපි විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කළා. අපි විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරන කොට අපට කිව්වා, අපි ආණ්ඩුව රකින්නයි ඒක කරන්නේ කියලා. රනිල් වික්‍රමසිංහ මහත්මයා එක්ක රැට deal දාන වීරවංශ උන්නැහේලා, ගම්මන්පිල මහත්මයලා තමයි රනිල් වික්‍රමසිංහ මහත්මයා, ජනාධිපතිතුමා අත් හැරලා මුස්ලිම් මන්ත්‍රීවරුන් විතරක් ඉලක්ක කරලා විශ්වාස භංග යෝජනාව දැම්මේ. අද රිසාඩ් බදියුදීන් ඇමතිතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න බැහැ. මොකද ඇමතිවරුන්ට විතරයි විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න පුළුවන්. අපි ජනතා විමුක්ති පෙරමුණ වශයෙන් දේශපාලන deal නැතුව, හරියට රට ගැන කල්පනා කරලා විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කළා. සදාචාරයක්

[ගරු බිමල් රත්නායක මහතා]

තිබෙනවා නම් ඔබතුමන්ලාගේ ආණ්ඩුව අස් වෙන්න ඕනෑ. ඔබතුමන්ලාට රට පරිස්සම් කරන්නත් බැහැ, මහජන සාමය ගෙනෙන්නත් බැහැ, ජාතිවාදය පරද්දන්නත් බැහැ. ඇත්තටම දැන් තිබෙන්නේ ආණ්ඩුවම අස්වෙලා ඡන්දයකට යන එකයි. ඒකේ වග කීම මුස්ලිම් මිනිහාට විතරක් පවරපු ජාතිවාදී පදනමෙන් විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා.

ඒක තමයි රටේ ජනතාව ඇවිළුණේ. හැබැයි, ජනතා විමුක්ති පෙරමුණේ අපි දුර දිග බලලා ඉදිරිපත් කළ විශ්වාස භංග යෝජනාව විතරයි දැන් තිබෙන්නේ. එම නිසා අපි රටේ ජනතාවට කියන්නේ ජාතිවාදයට කොටු වෙන්නට එපා; ජාතිවාදයට ගොදුරු වෙන්නට එපා; අන්තවාදයට ගොදුරු වෙන්නට එපා කියන එකයි. මුස්ලිම් මිනිහාට ගහලා දිනන්නට පුළුවන් දෙයක් නැහැ. එම නිසා අපි සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාවට මතක් කරලා දෙන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මේ රටේ තිස් අවුරුදු යුද්ධයෙන් කිසිදු සිංහල, දෙමළ හෝ මුස්ලිම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ දරුවෙකු නැති වුණේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම research කරලා තිබෙනවා. තිස් අවුරුදු යුද්ධයෙන් එකදු සිංහල, දෙමළ හෝ මුස්ලිම් මන්ත්‍රීවරයකුගේවත් දරුවෙකු නැති වුණේ නැහැ. මම කියන්නේ නැහැ, එහෙම වෙන්න ඕනෑ කියලා. පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් එකදු මන්ත්‍රීවරයකුගේවත් දරුවෙකු හෝ අඩුම තරමින් ඥාතියකුවත් නැති වුණේ නැහැ. යුද්ධයක් ආවොත් වන්දි ගෙවන්නේ, ජාතිවාදයෙන් වන්දි ගෙවන්නේ සාමාන්‍ය මිනිස්සුයි.

අපි ඉතාමත්ම කනගාටු වෙනවා, මේ රටේ මුස්ලිම් ජනතාවට එරෙහිව ඇති කර තිබෙන මේ ජාතිවාදී තත්ත්වය ගැන. ඒ වාගේම, කතෝලික ජනතාවට කළ ප්‍රහාරය ගැන අපි කනගාටු වෙනවා. සිංහල ජනතාව ඉතාම desperateවෙලා තිබෙනවා, කලකිරීමට පත්වෙලා තිබෙනවා. අපි ඒ ගැන ඉතාම කනගාටු වෙනවා. එම නිසා අපි තුන්ගොල්ලන්ම එකතුවෙලා ජාතිවාදය පරද්දලා, අපේ මාතෘ භූමිය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් ජාතික සමඟිය පැත්තෙන් ක්‍රියාමාර්ග තෝරා ගන්න ඕනෑ කියන කාරණය සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු වඩිවේල් සුරේෂ් රාජ්‍ය අමාත්‍යතුමා. You have 12 minutes.

ඊට ප්‍රථම කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு ஹர்ஷன ராஜகருணா அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. HARSHANA RAJAKARUNA *left the Chair, and* THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වඩිවේල් සුරේෂ් රාජ්‍ය ඇමතිතුමනි, කථා කරන්න.

[பி.ப. 4.01]

**ගරු වඩිවේල් සුරේෂ් මහතා (වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வடிவேல் சுரேஷ்- பெருந்தோட்டக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Vadivel Suresh - State Minister of Plantation Industries)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தேயிலை ஆராய்ச்சி சபை (திருத்தம்) சட்டமூலம் சமர்ப்பிக்கப்பட்டிருக்கின்ற இந்தச் சந்தர்ப்பத்திலே பெருந்தோட்டக் கைத்தொழில் இராஜாங்க அமைச்சர் என்ற வகையிலே நான் பெருமை கொள்கின்றேன். எனது அமைச்சர் கௌரவ நவீன் திஸாநாயக்க அவர்களுக்கு என்னுடைய நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன். ஒரு சிறந்த திருத்தச் சட்டமூலமாக நான் இதனைப் பார்க்கின்றேன். காரணம், 'Ceylon Tea' எனப்படும் இலங்கைத் தேயிலையை அறிமுகப்படுத்தி அதன்மூலம் இந்த நாட்டுக்கு விலாசம் தேடிக்கொடுத்தவர்கள் எங்களுடைய மலையக மக்களாவர். இலங்கையினுடைய வரலாற்றையே முழுமையாகத் திருப்பிப்போட்ட பெருமை அந்த மலையக மக்களையே சாரும். அவ்வாறான ஒரு துறையின் இராஜாங்க அமைச்சராக இந்த அரசாங்கத்தில் நான் இருக்கின்றவேளையில் இவ்வாறான ஒரு சட்டத் திருத்தத்தைக் கொண்டுவந்து இந்தத் தேயிலைத் துறையை ஊக்குவித்து, தேயிலை ஆராய்ச்சியை நவீனமயப்படுத்துவது சம்பந்தமாக எடுக்கப்பட்டிருக்கின்ற தீர்மானத்தை வரவேற்கத்தக்க ஒன்றாகவே நான் பார்க்கின்றேன்.

தேயிலைத் தொழில் துறையின் பாதுகாப்பு மற்றும் பராமரிப்பு பற்றியும் மற்றும் கம்பனிக்காரர்களுக்குக் கொடுக்கப்பட்டிருக்கின்ற தேயிலைத் தோட்டங்களின் நிலைமை பற்றியும் தேயிலைத் தொழிற்சாலைகளின் நிலைமை பற்றியும் ஆராய்ந்து, தேயிலைத் தொழிற்றுறையின் தரத்தை மேம்படுத்துவது சம்பந்தமாக நடவடிக்கை எடுக்கவேண்டியது காலத்தின் கட்டாயமாகும். ஆனால், தேயிலைத் தோட்டங்களைக் காப்பாற்றி அதனைத் தரம் உயர்த்துவதற்கு முன்னர் அங்குள்ள தொழிலாளர்கள் காப்பாற்றப்பட வேண்டும். அந்தத் தொழிலாளர்களுடைய முழுமையான சேவை நலன்களைக் கருத்திற்கொண்டு இந்தத் துறையை ஊக்குவித்து, இந்தத் தேயிலை ஆராய்ச்சிச் சபை மூலமாக இந்தத் தொழில்துறைக்கு ஒரு சக்தியை வழங்குவது சிறந்ததோர் அம்சமாகும். அதேபோன்று, இந்த நவீன யுகத்திற்கேற்ற வகையிலே தேயிலைத் தொழில்துறையையும் மாற்ற வேண்டிய ஒரு நிலைமை ஏற்பட்டிருக்கின்றது. அதற்காகத்தான் இந்தச் சட்டமூலம் கொண்டு வரப்பட்டிருக்கின்றது. ஆகவே, இந்தச் சட்டமூலத்திற்கு அனைவரும் ஆதரவளிக்க வேண்டிய கட்டாயம் இருக்கின்றதென்பதை நான் இங்கு கூறிக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ அமைச்சர் நவீன் திஸாநாயக்க அவர்கள் இந்தத் தேயிலைத் துறை சம்பந்தமான விடயங்களை விபரமாகத் தெரிவித்திருக்கிறார். எமது நாட்டின் தேயிலைக்கான விலையை சர்வதேச ரீதியில் நிர்ணயம் செய்வதிலுள்ள பிரச்சினைகளுக்கு எவ்வாறு முகங்கொடுப்பது என்பது

பற்றியும் அதன் தரத்தை மேம்படுத்துவது போன்ற இந்தத் துறை சம்பந்தமான அனைத்து விடயங்களையும் தெளிவாக எடுத்துரைத்தார். இந்தத் துறை சம்பந்தமாக அனைவருக்கும் ஒரு பொறுப்பிருக்கின்றது; கடமை இருக்கின்றது. இதற்கு அனைவரும் முழுமையான பங்களிப்பை வழங்க வேண்டும். இன்று இந்தத் துறையில் 22 தனியார் கம்பனிகள் இருக்கின்றன. அவை இந்தத் தேயிலைத் தொழிற்சாலைகளை மூடிவிட்டுச் செல்கின்ற நிலைமை, அதேபோன்று தமது கம்பனியுடைய தேயிலை விலையை அதிகரித்துக் கொள்வதற்காகக் கலப்படம் செய்கின்ற நிலைமை போன்றனவும் காணப்படுகின்றன. பல தேயிலைத் தொழிற்சாலைகளில் தேயிலைத் தூளுக்குள் சீனி கலக்கப்பட்டதாக நாங்கள் அண்மையில் அறிந்தோம். அப்படியான செயற்பாடுகளை எல்லாம் செய்யுபோது, தேயிலையின் தரம் குறைக்கப்படுகின்றது. இந்த நாட்டினுடைய பொருளாதாரத்தைத் தங்களுடைய முதுகிலே சுமந்து, நாட்டினுடைய பொருளாதாரத்தை ஊக்குவிக்கத் தோட்டத் தொழிலாளர்கள் செய்யும் சேவையை நான் இந்தச் சந்தர்ப்பத்திலே இந்த உயரிய சபையிலே பாராட்டுகின்றேன். அந்தத் தோட்டத் தொழிலாளர்கள் அவ்வளவும் செய்தும், "வேலியே பயிரை மேய்வது போல" சில கம்பனிக்காரர்கள் தேயிலைத் தூளுக்குள் சீனி மற்றும் ஏனைய பொருட்களைக் கலந்து இந்தத் தேயிலைத் துறையை முழுமையாக அழித்தொழிக்கின்றார்கள். அவர்களுடைய வருமானத்தை அதிகரித்துக் கொள்வதற்காகச் செய்யப்படும் இவ்வாறான செயற்பாடுகளை நான் வன்மையாகக் கண்டிக்கின்றேன்.

தேயிலைத் தோட்டங்களுடைய பராமரிப்புத் தொடர்பில் Special Task Force ஒன்றை PMMD - Plantation Management Monitoring Division - உருவாக்கி, அந்தத் தேயிலைத் தோட்டங்களை கண்காணிப்பதுடன் random check, spot check போன்றவற்றைச் செய்து தேயிலையினுடைய quality இனை அதிகரிப்பதற்குரிய வேலைத்திட்டங்களை மேற்கொள் வதற்கும்கூட இன்று நாங்கள் அனுமதி பெற்றிருக்கின்றோம். கௌரவ அமைச்சர் நவீன் திஸாநாயக்க அவர்களோடு இணைந்து சில வேலைத்திட்டங்களை நான் மேற்கொண்டிருக் கின்றேன். இவ்வாறான வேலைத்திட்டங்களையெல்லாம் செய்து தேயிலைத் தோட்டங்களுடைய பராமரிப்பு, தொழிற்சாலைகளுடைய பராமரிப்பு போன்றவற்றைக் கண்காணிக்கும்போது, தேயிலையினுடைய தரம் உயர்ந்து செல்லும். அதற்காக இந்தத் தேயிலை ஆராய்ச்சிச் சபையிலே மாற்றத்தைக் கொண்டுவரவேண்டிய அவசியமிருக்கின்றது. தோட்டங்களிலே வேலை செய்கின்ற தொழிலாளர்கள் நிம்மதியாக வாழவேண்டும். ஆனால், இன்று இந்த நாட்டிலே நடைபெற்றிருக்கின்ற சம்பவங்களைப் பார்க்கும்போது, மனதுக்கு மிகக் கவலையாக இருக்கின்றது.

இன்றைக்கு அங்கே RPC இன் கீழுள்ள 22 கம்பனிகளதும் நிலப்பரப்பு அதிகமாக இருக்கின்றது. 'Tea smallholders' என்று சொல்லப்படுகின்ற சிறு தேயிலைத் தோட்ட உரிமையாளர்களது காணிகளின் பரப்பளவு குறைவாக இருக்கின்றது. ஆனால், இந்த நாட்டில் உற்பத்தி செய்யப்படுகின்ற தேயிலையில் நூற்றுக்கு எழுபத்தைந்து வீதத்துக்கு மேலான அளவு தேயிலையை சிறு தேயிலைத் தோட்ட உரிமையாளர்கள் உற்பத்தி செய்கின்றார்கள். இலங்கை அரசாங்கத்தினுடைய கூடுதலான காணிகளைப் பராமரிக்கின்ற இந்த 22 கம்பனிகளுடைய உற்பத்தி வெறுமனே 23 - 24 வீதமாகத்தான் இருக்கின்றது. ஆகவே, இது சம்பந்தமாகக்கூட எதிர்காலத்திலே நாங்கள் நடவடிக் கைகளை எடுக்கவேண்டியிருக்கின்றது. மலையகத்திலே இருக்கின்ற இளைஞர், யுவதிகளுக்குக் காணிகளைப் பிரித்துக் கொடுத்து, இந்தச் சிறு தேயிலைத் தோட்ட உரிமையாளர் களைப்போல அவர்களையும் சிறு தேயிலைத்தோட்ட உரிமையாளர்களாக்கி, தேயிலையின் தரத்தை உயர்த்தக்கூடிய ஏற்பாடுகளைச் செய்வதற்குரிய திட்டங்களை நாங்கள் வகுத்துக் கொண்டிருக்கின்றோம். அதனை விரைவில் அறிமுகப்படுத்தவிருக்கின்றோம்.

தோட்டக் கம்பனிக்காரர்களுக்கு நாங்கள் உறுதி எழுதிக் காணிகளைச் சொந்தமாகக் கொடுத்திருக்கின்றோம் என்று அவர்கள் நினைக்கக்கூடாது. அனைத்துப் பெருந் தோட்டங்களும் அரசாங்கத்துக்குச் சொந்தமானவை. PMMD - Plantation Management Monitoring Division- மூலமாக இவற்றை முழுமையாக, நேரடியாகக் கண்காணிக்கக்கூடிய அனுமதியை நான் பெற்றிருக்கின்றேன். எனது வேலைத் திட்டங்களையும் நான் அறிமுகப்படுத்தியிருக்கின்றேன். ஆகவே, எதிர்வரும் காலத்திலே இந்தத் தேயிலைத் துறையையும் பாதுகாத்து, அங்கு சேவை செய்கின்ற தொழிலாளர்களையும் பாதுகாத்து, அவர்களுடைய நலன்புரி வேலைத்திட்டங்களையும் சரியான முறையிலே செய்து, எங்கெங்கெல்லாம் தேயிலை பயிரிடக்கூடிய இடங்கள் இன்று காடாகியிருக்கின்றனவோ, அந்த இடங்களெல்லாவற்றையும், பரம்பரை பரம்பரையாகத் தேயிலைத் துறையிலே அனுபவமிக்க, மலையகத்திலேயிருக்கின்ற வேலையற்ற இளைஞர், யுவதிகளுக்குப் பகிர்ந்தளித்து, அவர்களையும் தேயிலை உற்பத்தியில் ஈடுபடுத்திச் சிறு தேயிலைத் தோட்ட உரிமையாளர்களாக்கி, தேயிலையின் தரத்தை உயர்த்த வேண்டிய வழிவகைகளைச் செய்யவேண்டிய வேலைத் திட்டங்களை நாங்கள் முன்னெடுத்துக் கொண்டிருக்கின்றோம். எதிர்வரும் காலங்களில் அதனை முழுமையாக நடைமுறைப் படுத்துவதற்குரிய செயற்பாடுகளை நாங்கள் செய்து கொண்டிருக்கின்றோம் என்பதை இந்தத் தருணத்தில் தெரிவித்துக்கொள்கின்றேன்.

அத்தோடு, தற்போது நாட்டிலுள்ள நிலைமையினையிட்டு நான் மிக வேதனைப்படுகின்றேன். மதத்தால் வேறுபட்டாலும், மொழியால் ஒன்றுபட்டிருக்கின்ற முஸ்லிம் சகோதரர்கள் சம்பந்தமாகச் சில விடயங்களை நாங்கள் இங்கே கூறவேண்டும். மலையக மக்கள் இந்த நாட்டிலே என்றுமே இனவாதம் பேசியது கிடையாது. மலையக மக்கள் இந்த நாட்டில் வாழ்கின்ற சிங்கள, முஸ்லிம் மக்களோடு கரம் கோர்த்து வாழ்ந்துகொண்டிருக்கின்றவர்கள். இந்த நாட்டிலே பல சிங்களத் தலைவர்களை, ஜனாதிபதிகளை உருவாக் கியவர்கள் மலையக மக்கள். அந்த வகையில், மலையக மக்கள் என்றுமே இனவாதத்தை விரும்பாதவர்கள். கடந்த காலங் களிலே நடைபெற்ற சில கசப்பான சம்பவங்களைப் பார்க்கும்போது, மலையக மக்களுடைய பிரதிநிதியென்ற வகையிலே என்னுடைய மனவருத்தத்தை இந்தச் சந்தர்ப்பத்திலே நான் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன். இன்று நாங்கள் முஸ்லிம் சகோதரர்களுடன் ஒன்றுபட்டு, அவர்களது உதவியோடு மலையக மக்களுக்குச் சேவை செய்து கொண்டிருக்கின்றோம்; அவர்களோடு இணைந்து செயற் பட்டுக் கொண்டிருக்கின்றோம். ஆகவே, இனவாதத்தைத் தூண்டும் செயல்களை மலையக மக்கள் எப்போதும் ஏற்றுக்கொள்ளமாட்டார்கள். மலையக மக்கள் இந்த நாட்டிலே இனவாதம் எற்படுவதற்கு எந்தச் சந்தர்ப்பத்திலும் துணைபோனது கிடையாது. அவர்கள் இந்த நாட்டினுடைய பொருளாதாரத்துக்காகத்தான் தங்களுடைய சக்தியை முழுமையாகப் பயன்படுத்தியிருக்கின்றார்களே தவிர, எந்தக் காரணம் கொண்டும் இனவாதத்தை ஏற்படுத்துவதற்குத் துணைபோகவில்லை. அவர்கள் பொருளாதாரத்திலே பின் னடைந்திருந்தாலும்கூட நாட்டினுடைய பொருளாதாரத்தைத்

[ගරු වඩිවේල් සුරේෂ් මහතා]

தங்களுடைய முழு மூச்சாகக் கொண்டு செயற்பட்டு வருகின்றார்கள். எனவே, இனவாதத்தை ஏற்படுத்துவதற்கு எந்தச் சந்தர்ப்பத்திலும் நாங்கள் இடமளிக்க முடியாது. எனினும், இன்று இனவாதத்தைத் தூண்டுகின்ற சில சம்பவங்கள் இடம்பெற்றுக் கொண்டு இருக்கின்றன. தமிழ் பேசும் மக்கள் என்ற வகையிலே, முஸ்லிம் மக்களுக்குக் காவல்காரர்களாக இருந்து, அவர்களைக் காப்பாற்ற வேண்டிய கடமையும் பொறுப்பும் எங்களுக்கு இருக்கின்றது. ஆகவே, அவர்களைக் காப்பாற்றுவதற்குக் கரம் கோர்க்குமாறு நான் எங்களுடைய பெரும்பான்மைச் சிங்கள நண்பர்களைக் கேட்டுக்கொள்கின்றேன்.

1983ஆம் ஆண்டு இந்த நாட்டிலே ஓர் இனக்கலவரம் ஏற்பட்டதன் காரணமாகத் தமிழ் மக்கள் தங்களுடைய சொத்துகளை எல்லாம் விட்டுவிட்டு இந்தியாவுக்கு ஓடிச் சென்றார்கள். இந்த நாட்டின் பொருளாதாரம் வீழ்ச் சியடைந்தது; தோட்டங்கள் கைவிடப்பட்டன; தொழிற்சாலைகள் மூடப்பட்டன. இன்று அவ்வாறானதொரு நிலைமை முஸ்லிம் மக்களுக்கு வரும்போது, அவர்களும் இந்த நாட்டைவிட்டு ஓடிச் செல்வார்களேயானால், இந்த நாட்டினுடைய பொருளாதாரத்தின் நிலைமை என்னவாகும்? என்று நாங்கள் சிந்திக்க வேண்டும். இந்த நாட்டிலே வாழுகின்ற சிங்கள மக்களில் 90 வீதமானவர்கள் நல்ல மக்கள் - தங்கமான மனிதர்கள் என்பது எங்களுக்குத் தெரியும். அதேபோன்ற மனிதர்கள் முஸ்லிம் மக்களிலும் தமிழ் மக்களிலும் இருக்கின்றார்கள். ஆனால், சிறு தொகையினர் இந்த நாட்டிலே இனவாதத்தைத் தூண்டி, அதன்மூலம் குழப்பத்தை ஏற்படுத்தி, இனங்களுக்கு இடையிலேயுள்ள சுமுக நிலைமையையும் ஒற்றுமையையும் இல்லாமல் ஆக்குவதற்குரிய நடவடிக்கைகளை மேற்கொண்டு வருகின் றார்கள். அவ்வாறு செயற்படக்கூடாது. சிறுபான்மை மக்களுடைய பிரதிநிதி என்ற வகையிலே, நான் அதை வன்மையாகக் கண்டிக்கின்றேன். நாங்கள் காலங்காலமாக ஒற்றுமையாக வாழ்ந்துகொண்டிருக்கின்றோம். எமது முன்னோர்கள் தமிழ், சிங்களம், முஸ்லிம் என எல்லோருடனும் இணைந்து வாழ்ந்திருக்கிறார்கள். இந்த நாட்டின் சுதந்திரத்துக்காகத் தமிழ் மக்களும் முஸ்லிம் மக்களும் போராடி இருக்கின்றார்கள். நாம் அதை மறந்துவிடக்கூடாது. இன்று வடக்கு, கிழக்குவாழ் தமிழ், முஸ்லிம் மக்கள், மலையக மக்கள், ஏனைய பிரதேசங்களில் வாழுகின்ற முஸ்லிம் மக்கள் என நாங்கள் எல்லோரும் சிங்கள மக்களோடு ஒற்றுமையாக வாழ்ந்து கொண்டிருக்கின்றோம். ஆகவே, கசப்பான சம்பவங்கள் ஏற்படுத்தப்படக்கூடாது.

மாணவர்கள் பாடசாலைக்குச் செல்வதற்குப் பயந்துகொண்டிருந்த ஒரு காலம் இருந்தது. இந்த நாட்டுக்கு உல்லாசப் பிரயாணிகள் வராமல் இருந்ததால், உல்லாசப் பிரயாணத்துறை வீழ்ச்சியடைந்ததோடு மட்டுமன்றி, இந்த நாட்டின் பொருளாதாரமும் முழுமையாக வீழ்ச்சியடைந்தது. "Ceylon Tea" பொருளாதாரத்திலே சக்திமயப்படுத்தப்பட வேண்டுமென்றால், அதற்கு உல்லாசப் பிரயாணத்துறையும் இன்றியமையாததாக இருக்கின்றது. ஆனால், அண்மையில் அத்துறையில் ஒரு வீழ்ச்சி காணப்பட்டது. இன்று ஓரளவுக்கு நிலைமை மாறிவரும்போது, சிறு சிறு விடயங்களை எல்லாம் பெரிதுபடுத்தி, அதன்மூலம் இனவாதத்தைத் தூண்டி, இந்த நாட்டைக் குட்டிச்சுவராக்கி விடாதீர்கள் என்று நான் பொறுப்புவாய்ந்தவர்களிடம் பொறுப்புடன் கேட்டுக்கொள் கின்றேன். ஆகவே, நாங்கள் அதிலிருந்து விலகி இருக்கவேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

இந்தப் பாராளுமன்றத்தில் இருக்கின்ற 225 உறுப்பினர் களுக்கும் பாரிய பொறுப்பும் கடமையும் இருக்கின்றது. நாங்கள் இச்சபையில் ஒன்றாக இருக்கின்றோம் என்றால், இந்தப் பாராளுமன்றத்தின் canteen இல் ஒன்றாக அமர்ந்து சாப்பிடுகின்றோம் என்றால், கூட்டங்களில் ஒன்றாகக் கலந்துகொள்கின்றோம் என்றால், ஏன் நாங்கள் எங்களுடைய மக்களைப் பிரிந்து இருக்கவேண்டும் என்று சொல்ல வேண்டும்? அவர்கள் ஒற்றுமையாக இருக்கக்கூடிய விதத்தில் தலைமைத்துவத்தை வழங்கவேண்டிய பொறுப்பும் கடமையும் எங்களுக்கு இருக்கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மலையகம்வாழ் இந்திய வம்சாவளி மக்களான என்னுடைய தொப்புள்கொடி உறவுகள் சார்பாக நான் இந்த உயரிய மன்றிலே ஒரு விடயத்தைக் கேட்டுக்கொள்கின்றேன். இந்த நாட்டிலே இரத்த ஆறு ஓடக்கூடாது. அனைத்து இன சமூகங்களும் ஒன்றாக, ஒற்றுமையாக வாழக்கூடிய வழிவகைகளையும் அது தொடர்பான கருத்துக்களையும் தெரிவியுங்கள்! அரசியல் தலைவர்கள் தங்களது கருத்துக்களைத் தெரிவிக்கும்போது, இந்த நாட்டிலே ஒற்றுமையை ஏற்படுத்துவது சம்பந்தமான கருத்துக்களைத் தெரிவிக்க வேண்டும். எந்தவொரு சமூகமும் எந்தவோர் இனமும் எந்தவொரு மதமும் இனவாதத்தை விரும்பவில்லை. ஆகவே, அரசியல் தலைவர்கள் இச்சபையிலும் சரி, வெளியிலும் சரி, இந்த நாட்டிலே மக்கள் ஒற்றுமையாக வாழவேண்டும் என்பதை உணர்த்துகின்ற வகையில் உரைகளை நிகழ்த்தவேண்டுமென்று கோருகின்றேன்.

தேயிலைத் தொழிற்றுறை என்னுடைய இரத்தம்! தேயிலைத் தொழிற்றுறையில் நான்காவது, ஐந்தாவது பரம்பரையாக நாங்கள் வாழ்ந்துகொண்டு இருக்கின்றோம். நாங்கள் பிறந்தவுடன் முதலில் கண்ட மரம் என்றால், அது தேயிலை மரம். சுவாசம் என்றால், அது தேயிலைத் தூளின் சுவாசம். அதனைத் தூய்மைப்படுத்தி, சுத்தப்படுத்தி தரமானதொரு நிலைக்குக் கொண்டுவரவேண்டிய பொறுப்பு இன்று எமக்கு இருக்கின்றது. ஐக்கிய தேசியக் கட்சி அரசாங்கத்திலே, கௌரவ ரணில் விக்கிரமசிங்க அவர்கள் பிரதம மந்திரியாகப் பதவி வகிக்கும் காலத்திலே, மலையகத்திலே பிறந்த எனக்குப் பெருந்தோட்டக் கைத்தொழில் இராஜாங்க அமைச்சுப் பதவியை அவர் வழங்கி இருக்கின்றார். அந்த வகையில் கௌரவ நவீன் திஸாநாயக்க அவர்களோடு கரம்கோர்த்து, இந்தத் தேயிலைத் தொழிற்றுறையை மேம்படுத்துவதற்கு நான் முழுமையாகப் பாடுபடுவேன் எனத் தெரிவித்துக்கொண்டு, உங்களுக்கு நன்றி தெரிவித்து, விடைபெறுகின்றேன். வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමා.

[අ.භා. 4.13]

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
**(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)**
**(The Hon. Mahinda Yapa Abeywardena)**

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා ඇමතිතුමාත්, ගරු බිමල් රත්නායක මැතිතුමාත් මේ සිද්ධිය සම්බන්ධයෙන් අද බොහොම වැදගත් විධියට කරුණු ඉදිරිපත් කළා. ජාතිවාදය මතු කරගෙන මේ ගමන යන්න එපාය කියන එකයි එතුමන්ලාගේ කථාවේ තේමාව වුණේ. ඒක ඉතාම නිවැරැදියි. හැබැයි, ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා ඇමතිතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ හිටියා නම් මම එතුමාගෙන් අහනවා, 1983 අවුරුද්දේ දෙමළ කඩ කඩනකොට, ඒවා විනාශ කරනකොට එතුමාට ඒ ඥානය පහළ වුණේ නැත්තේ මොකද කියලා. එතුමා එදාත් ඇමතිවරයෙක් ලෙස කටයුතු කළා නේ. එතුමාගේ බල ප්‍රදේශයේත් ඒ දෙය සිද්ධ වුණා; දෙමළ අයගේ කඩ කැඩුවා. ඒ වෙලාවේ කවුරුවත් ඒ ගැන කථා කළේ නැහැ. අලුතින්ම පත් වෙලා ආපු මන්ත්‍රීවරු හැටියට අපි විතරයි එදා ඒ ගැන කථා කරන්න හිටියේ. එහෙම කථා කරලා අවසානයේ අපට එක්සත් ජාතික පක්ෂයෙන් යන්න වුණා; අපි යැව්වා. ඒක තමයි, ඇත්ත කථාව. එහෙම කරලා, දැන් නම් බුදු වෙලා වාගේ තමයි එතුමන්ලා කථා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ජාතිවාදය ගැන කථා කරනකොට මට දැන් මතක් වුණේ, 2005දී පැවැති ජනාධිපතිවරණයේදී මෙතුමන්ලා කිව්වේ මොනවාද කියන එකයි. ඒ දේවල් ඔබතුමියටත් මතක ඇති. මහින්ද රාජපක්ෂ මහත්මයාට විරුද්ධව එදා මෙතුමන්ලා මොනවාද කිව්වේ? "මුස්ලිම් ආගමට දැවැන්ත තර්ජනයක් තිබෙනවා" කියලා කිව්වා; "මේ පුද්ගලයා බලයට පත් වුණොත්, අර loudspeakers දමාගෙන ආගම කියන එක නතර කරාවි, මුස්ලිම් ආගමට මෙහෙම කරයි, අර විධියට කරයි" කියා එදා දැවැන්ත ප්‍රචාරයක් ගෙන ගියා. නමුත්, එදා එතුමාගේ වාසනාවට හෝ වෙනත් හේතුවක් නිසා හෝ රටේ වාසනාවට හෝ එතුමා ජනාධිපතිවරණයෙන් ජයග්‍රහණය කළා. නමුත්, 2015දී මොකද වුණේ? 2015 ජනාධිපතිවරණය වෙලාවේත් මොනවාද ඇද්දේ? මේ, රතන හාමුදුරුවෝ කියන්නේ කවුද? ගලගොඩඅත්තේ ඥානසාර හාමුදුරුවෝ කියන්නේ කවුද? උන්වහන්සේලා මොනවාද කළේ? එදා මේ ආණ්ඩුව බලයට ගේන්න උන්වහන්සේලා මහන්සි වුණේ නැද්ද? මහින්ද රාජපක්ෂ මැතිතුමාට විරුද්ධව මේ සභාවේ කථා කරමින් රතන හාමුදුරුවෝ එදා මොනවාද කිව්වේ? "මහින්ද රාජපක්ෂ ගෙදර යවනවා, යවනවා, යවනවාමයි" කියා තමයි අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ එදා වැඩේ පටන් ගත්තේ. ඒ කාලයේ ඒ සඳහා මොනවාද පාවිච්චි කළේ? පාවිච්චි කරන්න පුළුවන් සියලුම දේවල් පාවිච්චි කළා.

මේ සහරාන් කියන්නේ කවුද? 2015දී මේ ආණ්ඩුව බලයට ගේන්න මුස්ලිම් ගම්මානවලට ගිහින් කථා කරපු, දේශන පවත්වපු කෙනෙක් තමයි සහරාන් කියන්නේ. ඔහු අපේ ගමටත් -වැලිගමට- ඇවිත් කථා කළා. ඔහු දැවැන්ත දේශන පැවැත්වූවා. ඒ විතරක් නොවෙයි, ඔහු කාත්තන්කුඩියේත්, අනෙක් පළාත්වලත් දිගටම ඒ කාර්යය කර තිබෙනවා. ඔහු හොඳ දේශකයෙක්; මිනිස්සු හොඳට නම්මවා ගන්න පුළුවන් ශක්තියක් තිබෙන කථිකයෙක්. ඔහු, එදා මේ ආණ්ඩුව බලයට ගේන්න කථා කළ කෙනෙක්. ඔහු බෝම්බ ගහනවා. ඒ බෝම්බවලට විරුද්ධව ඒ ආණ්ඩුවටම උදවු කළ උදවිය දැන් උපවාස කරනවා. මොකක්ද මේ වෙන්න යන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒක නොවෙයි මෙතැන තිබෙන ප්‍රශ්නය වන්නේ. පසුගිය අවුරුදු හතරහමාරක කාලය තුළ මේ ආණ්ඩුව මොනවාද කළේ? තීරණයක් ගන්න බැරිව හිටියා. බුද්ධි අංශයේ අය හිරේ දැම්මා; ඒ මිනිසුන්ට හිරිහැර කළා. ඒ මිනිස්සු රට වෙනුවෙන් කුමක් හෝ සේවයක් කළා නම්, ඔවුන් මේ රටට තවදුරටත් සේවය කරන එක එපා කෙරෙව්වා; ඔවුන්ට රට වෙනුවෙන් කථා කරන්න දුන්නේ නැහැ. ඊට අමතරව, කරන්න පුළුවන් දූෂණ සියල්ලම මේ අය කළා. ශ්‍රී ලංකා මහ බැංකුව කොල්ල කෑවා; අදත් ඒක කරනවා. මේ ආණ්ඩුව දැවැන්ත මුදල් මංකොල්ලයක් සිද්ධ කළා; අදත් කරගෙන යනවා. ඒවා සේරම යට කරන්න ගෙනාපු ක්‍රමය තමයි මේක. ඒ ගැන අද කවුරුවත් කථා කරන්නේ නැහැ. මහ බැංකුවේ හොරකම දැන් මේ අයට අමතකයි. විදුලිය මිලදී ගැනීමේදීත් ඊයේ-පෙරේදා දැවැන්ත හොරකමක් කළා. ඒ ගැන දැන් කවුරුත් කථා කරන්නේ නැහැ. ඒවා සියල්ලම යටපත් වෙලා තිබෙනවා. දැන් සහරාන් ගැන විතරයි කථා කරන්නේ. මේ හැම දෙයක්ම මේ ආණ්ඩුවේ කුමන්ත්‍රණයි. මේ සියල්ලම පිටුපස මේ ආණ්ඩුව හිටියා.

අද මේ අය ජාතිවාදයක් මතු කරනවා. මොකද, දැන් ජනාධිපතිවරණය ළඟයි නේ. මෙච්චර කාලයක් ගහපු පොතම තමයි දැන් ඊළඟ වාරයේත් ගහන්න හදන්නේ; ඒකෙන්ම තමයි ආයෙත් ගොඩ වෙන්න හදන්නේ. මේ ආණ්ඩුවට තිබුණු දූෂණ සියල්ලම අද රිසාඩ් බදියුදීන් ඇමතිවරයා පිටින් ඇරියා. ආණ්ඩුවේ සියලුම මුස්ලිම් ඇමතිවරු ටික අයින් කරලා මේ ආණ්ඩුව ඒක සෝදා ගත්තා. දැන් ඒ ගොල්ලෝ තමයි වැරැදිකාරයෝ වෙලා තිබෙන්නේ.

ආණ්ඩුවේ හිටපු අනෙක් වගකිව යුත්තෝ-අගමැතිතුමා, ජනාධිපතිතුමා- සියලු දෙනාම මේකෙන් බේරුණා. ඒ ගොල්ලෝ ඇඟ සෝදා ගත්තා. මේගොල්ලන් පිටින් මේක තියා ගත්තා. මේක තියා ගන්න උදව් කළේ කවුද? රතන හාමුදුරුවෝ. උදව් කළේ කවුද? ඥානිස්සර හාමුදුරුවෝ. අර ක්‍රමයම තමයි ආපසු යන්නේ. අර උපක්‍රමයම තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ආපසු යන්නේ. මේ ආණ්ඩුව දැවැන්ත ජනතා අප්‍රසාදයකට ලක් වෙලා හිටිය වෙලාව. ඒ වෙලාවේ සහරාන් ඇවිල්ලා බෝම්බයක් ගැහැව්වා. ඒ ගැන මිනිස්සු එක්කොම කථා කළා. එතැනින් ඉවරයි. ඊට පස්සේ ආණ්ඩුව ගැන කථා කරන්නෙත් නැහැ. රටේ අනෙක් දේවල් ගැන කථා කරන්නෙත් නැහැ. මේ සියල්ලම එකම සිද්ධියක සිද්ධි මාලාවන් පමණයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. එම නිසා මේ රට මේ ගෙනියන්නේ කොහාටද කියන එක ගැන ජනතාව මීට වඩා අවදියෙන් ඉන්නට ඕනෑ. මේ ආණ්ඩුවට උදව් කරපු උදවිය, මේ ආණ්ඩුව මෙතැනට ගෙනෙන්න කටයුතු කරපු උදවිය තමයි අද ජාතියට මේ මහා විනාශය කළේ. ඒ පැත්තෙන් ආණ්ඩුව ජාතික විනාශයක් කළා. ජාතිවාදය ඉස්සරහට අරගෙන ඉතිරි විනාශය කළා. ඒකයි මම කිව්වේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එදා 1983 දෙමළ කඩ කැඩූ වෙලාවේ එතුමා ඒ ආණ්ඩුවේ හිටපු වැදගත් ඇමතිවරයෙක් හැටියට එතුමාට ඒ කාර්යය මතක නැති වුණාය කියා. අපි ඒ වෙලාවේ කථා කළා. අපි ඒ වෙලාවේ විරුද්ධ වුණා. අපි අදත් ඒකට විරුද්ධයි. අපි දකුණු පළාතේ එකම මුස්ලිම් කඩයක්වත් කඩන්න ඉඩ දුන්නේ නැහැ. එහෙම කරන්න අපි මිනිසුන්ට ඉඩ දුන්නේ නැහැ. අපි ඒ මිනිසුන් ආරක්ෂා කළා. අද වනතුරුත් ඒ ආරක්ෂාව අපි එහෙම කර ගෙන යනවා. ඒ වෙනුවෙන් අපි සියලු දෙනාම කැප වුණා. මේකට අපි රෑ දවල් නැතිව නිදි මැරුවා. අපි රෑ එළි වනතුරු මොකද වන්නේ කියා බලාගෙන සිටියා. අපි එහෙම දේවල් වෙන්න ඉඩ හැරියේ නැහැ. ඒකෙන් අපි ඒ මිනිසුන්ව ආරක්ෂා කළා. මේක අපේ රටේ ජාතිවාදයක් නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මේ රටේ අන්තර්ජාතිකව ඇති කරනවා, මේ ආණ්ඩුව නැවතත් කෙසේ හෝ බලයට ගෙනෙන්න. ඒ උපක්‍රමයේ එක පියවරක් මෙය.

මේ ආණ්ඩුවේ කුණු සේරම සෝදා ඉවර කළා. දැන් ජනතාවට වෙන කිසි දෙයක් නැහැ. ජනතාව වර්ගවලට බෙදුවා. දැන් කඩලා ඉවරයි. මුස්ලිම් වර්ගය වෙනම කැඩුවා. සිංහල බෞද්ධ කියා තව කොටසක් කැඩුවා. දෙමළ කියා තව කොටසක් කැඩුවා. මෙහෙම කඩලා ඉවරයි. අපේ ජාතිය දැන් හතරට පහට කඩලා ඉවරයි. ඒක තමයි ඊළඟ මැතිවරණයේ පියවර. එහෙම තමයි ඊළඟ

[ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා]

මැතිවරණයේ ගමන යන්නේ. මෙතෙක් මේ රටේ ජනතාව මේ රජයට විරුද්ධව ගෙනාපු දැවැන්ත උද්ඝෝෂණය, දැවැන්ත විරෝධය හතරට පහට කඩා දැම්මා. ඒකයි මේ කළේ. ඒකට අපේ සමහර අය ගිහින් අහු වුණා. අපි කිව්වේ ඒකයි. මේ රට විනාශ කරන ඉතාමත්ම සූක්ෂම වැඩ පිළිවෙළක එක පියවරක් හැටියට මම ඔබතුමියට කියනවා. මේක ජනතාව දැන ගන්නට ඕනෑ. මේ ආණ්ඩුව ගෙන යන දූෂිත පාලනය, මේ ආණ්ඩුව ගෙන යන ජනතා විරෝධි පාලනය මෙතැනින් නතර කරන්නට ජනතාව සූදානම් වෙලා සිටියදී ඒ විරෝධය හතරට පහට කඩා දැන් එය කැළිවලට කඩා වෙන් කර තිබෙනවා. මේක මෙහෙම වෙන්නට දෙන්න බැහැ. මේ රට ආරක්ෂා කර ගන්නට නම් අපි මේ කුමන්ත්‍රණය ගැන අවබෝධයෙන් කටයුතු කරන්නට ඕනෑ. ඒ ගැන අවබෝධයෙන් කටයුතු කරන්නට නම් මේ රටේ ජනතාවට මේ ගැන තොරතුරු දෙන්නට ඕනෑ. මොකක්ද මේ වුණේ කියා. එම නිසා අපි ඒ සම්බන්ධයෙන් අපේ යුතුකම ඉටු කරනවා. ජනාධිපතිවරණයේදී කොයි ආකාරයෙන් කටයුතු කළයුතුද කියන එක ගැන නිවැරදි පියවර අපි ජනතාවට යෝජනා කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. ඊළඟට, ගරු මුතුසිවලිංගම් මැතිතුමා.

[பி.ப. 4.23]

**ගරු මුතු සිවලිංගම් මහතා**
(மாண்புமிகு முத்து சிவலிங்கம்)
(The Hon. Muthu Sivalingam)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்று பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சின்கீழ் வருகின்ற, தேயிலை ஆராய்ச்சி சபை (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு பேசுவதில் நான் மகிழ்ச்சியடைகின்றேன். இறப்பர், தேயிலை போன்ற பெருந்தோட்டங்கள் இன்று முழுமையாக நாசப்படுத்தப்பட்டு, அவற்றால் எந்தவித பிரயோசனமும் இல்லாமல் ஆக்கப்பட்டுவிட்டது. ஆகவே, அந்தத் தோட்டங்களை இவர்கள் மீண்டும் புனரமைக்க வேண்டுமானால் அங்கே வேலைசெய்யும் தோட்டத் தொழிலாளர்களின் குடும்பங்களுக்கு அதனைப் பிரித்துக்கொடுத்து, சிறு தேயிலைத் தோட்டக் கைத்தொழிலை எப்படிப் பராமரிக்கிறார்களோ அவ்வாறு பராமரிக்க அவர்களுக்கு உதவிகளையும் செய்துகொடுத்தால், அதன்மூலம் எங்களுடைய சமூகமும் முன்னேறக்கூடிய வாய்ப்பிருக்கும், தோட்டத்தொழிலையும் காப்பாற்றக்கூடிய ஒரு வழியேற்படும்.

பெருந்தோட்ட மக்கள் எதிர்நோக்கும் பிரச்சினைகள் ஏராளம். பெருந்தோட்டக் கம்பனிகள் தொழிலாளர்களுக்கு வழங்க வேண்டிய சலுகைகள், கொடுப்பனவுகள் சம்பந்தமாகக் கூடிய கவனம் செலுத்துவதில்லை. உதாரணமாக, ஊழியர் சேமலாப நிதியை உரிய நேரத்திற்குச் செலுத்துவதில்லை. தொழிலாளர்கள் ஓய்வுபெற்ற பின்னர் அவர்களுடைய ஓய்வூதியத்தை ஒரு மாதத்திற்குள் வழங்க வேண்டுமென்று சட்டம் இருந்தாலும்கூட, அதனை அவர்கள் செலுத்த வேண்டிய திணைக்களங்களுக்கு உரிய காலத்திற்குக் கொடுப்பது கிடையாது. கம்பனிகள் தொழிலாளர்களின் ஊதியத்திலிருந்து அறவிடப்படும் வங்கிக்கடன், கோவில் நிதி, 'மரணாதார' நிதி ஆகியவற்றைச் உரிய காலத்தில் செலுத்தாததால், மக்கள் மீண்டும் மீண்டும் அவர்களுடைய பணத்திற்கே வட்டி கொடுக்க வேண்டிய சூழ்நிலை ஏற்படுகின்றது. வங்கிக் கடன் செலுத்தும்போதும் அதிக வட்டி செலுத்தவேண்டியுள்ளது. 'மரணாதார' நிதி பெறுவதிலும் பல பிரச்சினைகளை எதிர்நோக்குகின்றனர். அரச பெருந்தோட்டக் கூட்டுத்தாபனம் சார்ந்த தோட்டங்களை காணி மறுசீரமைப்பு ஆணைக்குழு - LRC - கையேற்கும்போது அத்தோட்டங்களிலுள்ள தொழிலாளர்களின் பிரச்சினைகள் சம்பந்தமாகக் கவனம் செலுத்துவதில்லை. அவர்களுடைய தொழில், கொடுப்பனவுகள் சம்பந்தமாக எவ்வித நடவடிக்கையும் எடுப்பதில்லை. எனவே, அவ்வாறான தோட்டங்களைக் கையேற்கும்போது முன்கூட்டியே பிரச்சினைகளுக்குத் தீர்வு காண வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். 23.05.2019 அன்று காலி மாவட்டத்தில் வல்லாந்துவ தோட்டத்தை LRC இனர் திடீரெனக் கைப்பற்றி அங்குள்ள மக்களுக்கு இம்சையைக் கொடுத்துவிட்டார்கள்.

இன்று பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர் பேசும்பொழுது, கென்யாவில் ஒரு நாள் சம்பளம் ஒரு டொலர் என்றும் இங்கே அதிகமாக வழங்கப்படுகின்றது என்றும் சொன்னார். What is the purchasing power of Dollar in Kenya? It is very high. ஸ்ரீலங்காவிலே பகல் நேரத்தில் ஒருவன் சாப்பிட வேண்டுமானால், கட்டாயம் அவனுக்கு ஒரு டொலர் வேண்டும். அப்படியிருக்கும்போது அதையும் இதையும் சம்பந்தப்படுத்தித் தோட்டத்தொழிலாளர்களை மீண்டும் மீண்டும் நாசப்படுத்திவிடக்கூடாது. உதாரணமாக, கம்பனிகளுக்குத் தோட்டங்களைக் கையளித்த பின்னர் அவற்றை முறையாகப் பராமரிக்காததால், புற்களுக்கு மருந்தடிக்காததனால் இன்று அங்கு புலிகளும் விஷ ஜந்துக்களுமே காணப்படுகின்றன. பாம்புக் கடிக்கும் குளவிக் கொட்டுக்கும் தேள் கொட்டுக்கும் அட்டைக் கடிக்கும் அவர்கள் ஆளாகிறார்கள். இப்படிப்பட்ட நிலை தொடர்ந்தால், நீங்கள் அங்கேயிருக்கின்ற தேயிலைத் தோட்டத் தொழிலாளர்களை எப்படிக் காப்பாற்ற முடியும்? ஒருபோதும் அவர்களைக் காப்பாற்ற முடியாது. எனவே, இந்த விடயங்களில் பெருந்தோட்டக் கம்பனிகள் அக்கறைகாட்ட வேண்டும்.

புற்களுக்கு மருந்தடிக்கும் மருந்தைக் கொண்டுவர வேண்டாமென எல்லோருமே ஒரே குரலில் குரலெழுப்பியதை 2 - 3 மாதங்களுக்கு முன்னர் நான் பாராளுமன்றத்தில் அவதானித்தேன். அவ்வாறு மருந்தடிப்பதைத் தடுப்பதனால் தேயிலைத் தோட்டங்கள் துப்புரவாக இருக்கக்கூடிய வாய்ப்பே கிடையாது. இந்த நிலை நீடித்தால் இன்னும் 5 வருடங்களில் தேயிலைத் தொழில் துறை முழுமையாக மூடப்பட்டுவிடும். அப்படிச் சாதாரணமாக மூடிவிடலாமென நினைக்காதீர்கள். அங்கு தோட்டத் தொழிலாளர்கள் இலட்சக்கணக்கில் வாழ்கின்றார்கள். நாங்கள் பிறந்தது, வளர்ந்தது எல்லாம் தேயிலைத் தோட்டத்திலேயாகும். அந்தத் தோட்டங்களைப் பிரித்துக் கொடுப்பதால் அரசாங்கத்திற்கோ தோட்டத்துறைக்கோ என்ன நட்டம் ஏற்படப்போகின்றது? அப்படியொன்றும் பாதிப்பு ஏற்படாது. அந்த நிலங்களை 2-3 ஏக்கர் வீதம் ஒவ்வொரு குடும்பத்துக்கும் பிரித்துக்கொடுங்கள்! அந்த மக்கள் தேயிலைத் தோட்டத்தில் அனுபவம் மிக்கவர்கள்; அதனைப் பராமரித்து, நாட்டுக்கு நல்லது செய்வார்கள், தங்களுடைய குடும்பத்தினையும் பராமரித்துக் கொள்வார்கள். எனவே, தோட்டங்களைப் பிரித்துக் கொடுக்கின்ற நடவடிக்கைகளில் அக்கறையெடுக்குமாறு சம்பந்தப்பட்ட அமைச்சை நான் கேட்டுக்கொள்கின்றேன்.

தோட்டத்திலே வீடுகள் கட்டப்படுகின்றன; 'லயன்'கள் ஒழிக்கப்படுகின்றன என்று பல காலமாகக் கூறப்படுகின்றபோதிலும் இன்னும் பழைய ஓட்டு 'லயன்'கள்

அப்படியேதான் இருக்கின்றன. அப்படி 'லயன்'களில் குடியிருப்பவர்களுக்குப் புதிய வீடுகள் கிடைப்பது கிடையாது. இருந்தாலும் நான் யாரையும் குறை சொல்லவில்லை. ஒரு குறிப்பிட்டளவு காணியைக் கொடுத்து, வீடு கட்டுவதற்குரிய பொருட்களையும் கொடுத்தாற்கூட அவர்களால் தற்காலிக வீடுகளை அமைத்துக் கொள்ள முடியும். தற்போது எங்கு பார்த்தாலும், 'லயன்'கள் தீப்பிடித்து எரிகின்றன என்ற செய்தியை அவதானிக்க முடிகின்றது. தீப்பிடித்து எரிவதற்குக் காரணம் எல்லோருக்கும் நன்றாகத் தெரிந்ததுதான். ஓட்டை உடைசலான தகரம் கொண்டமைந்த 'லயன்'கள்தான் அங்கே காணப்படுகின்றன. அங்கே மழைக்காலத்தில் மின்சாரத்தை இயக்குகின்றபொழுது தீப்பற்றிக்கொள்கின்றது. இந்த நிலை தொடரக்கூடாது.

அமைச்சர் அவர்கள், தேயிலை உற்பத்தி தொடர்பாகவும், தேயிலை வளத்தினைப் பாதுகாப்பது தொடர்பாகவும் அதிகநேரம் இங்கு பேசினாரே தவிர, தோட்டத் தொழிலாளர் களைப் பற்றி ஒன்றும் பேசவில்லை. நாங்களும் தோட்டத் துறையில் பங்குதாரர்கள்தான்! காலஞ்சென்ற எங்களுடைய தொண்டமான் ஐயா அவர்களது காலத்திலே, தோட்டத்தை அரசாங்கம் எடுத்து காணி இல்லாதவர்களுக்குப் பிரித்துக் கொடுப்பதென்றால், முதலிலே அவர்களுக்கு வீடுகளைக் கட்டிக்கொடுத்து, அவர்களுக்குத் தேவையான போக்குவரத்து வசதிகள் மற்றும் மின்சார வசதிகளை வழங்கி, அதற்குப் பின்னர் அவர்களுடைய வேலை இழப்பிற்கான நஷ்டஈட்டினையும் பெற்றுக்கொடுத்த பிறகுதான் அந்தத் தோட்டம் பிரித்துக் கொடுக்கப்பட்டது. இன்றைய நிலை அப்படியில்லை. LRC இனர் இரவோடிரவாக முடிவெடுத்துவிட்டு notice ஒட்டி எங்களுடைய மக்களை வெளியேறச் சொல்கின்றார்கள். இவ்வாறான செயற் பாட்டினால் பல பிரச்சினைகள் உருவாகக்கூடிய வாய்ப்பு ஏற்படும்.

தேயிலைத்தோட்டத் தொழிலாளர்களைப் பொறுத்தமட்டில் - இந்திய வம்சாவளி மக்களைப் பொறுத்தமட்டில், நாங்கள் அமைதியாக இருக்கின்றோம். இந்த நாட்டு மக்களோடு ஒன்றிணைந்து வாழவே விரும்புகின்றோமே தவிர, இவ்வாறு 3ஆம் தரப் பிரஜைகளாக, அடிமட்டப் பிரஜைகளாக எங்களைத் தள்ளிவைத்து மிதிப்பதை எங்களால் ஏற்றுக்கொள்ள முடியாது. எனவே, இதில் அமைச்சர் அவர்கள் கவனம் செலுத் தவேண்டும். தேயிலையைப் பறித்து ஆதாயம் தேடுவதுதான் கம்பனிக்காரர்களின் நோக்கமாக இருக்கின்றது. அவர்கள் எந்த அபிவிருத்தியையும் மேற்கொள்வது கிடையாது; அரசாங்கம் மேற்கொள்கின்ற அபிவிருத்திக்கு உதவி செய்வதும் கிடையாது. இளைஞர்களுக்கு ஒரு விளையாட்டு மைதானம் அமைப்பதற்குக் காணி கேட்டாற்கூட கொடுப்பது கிடையாது. அதற்குப் பல காரணங்களைச் சொல்கின்றார்கள்; பணம் கட்டச் சொல்கின்றார்கள். இப்படியான நிலைமை காணப் பட்டால், இந்த மக்கள் எப்படி, எந்த வகையில் இந்த நாட்டிலே முன்னேற முடியும்? ஆகவே, தேயிலை, இறப்பர் தோட்டங்களை நீங்கள் அபிவிருத்தி செய்கின்ற அதேநேரம், அந்த மக்களுடைய அபிவிருத்தியிலும் கவனஞ்செலுத் தவேண்டுமென்று கேட்டு விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තූතියි. මීළඟට, ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මන්ත්‍රීතුමා.

[பி.ப. 4.29]

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා (වරාය හා නාවික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அப்துல்லா மஹரூப் - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை பிரதி அமைச்சர்)
(The Hon. Abdullah Mahrooff - Deputy Minister of Ports and Shipping)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்!*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சு தொடர்பான இன்றைய விவாதத்தில் எனக்குப் பேசுவதற்குச் சந்தர்ப்பம் கிடைத்தமையையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். தோட்டத் துறையிலுள்ள முரண்பாடுகள் தொடர்பாகவும் அதனைத் தீர்த்துவைப்பது தொடர்பாகவும் இங்கு அமைச்சரால் முன்மொழியப்பட்ட விடயம் பற்றிப் பலரும் பேசினார்கள். எனக்கு முன்னர் பேசிய இராஜாங்க அமைச்சர் வடிவேல் சுரேஷ் அவர்கள் சிறுதோட்டத் தொழிற்துறைக்கும் பெருந்தோட்டத் துறைக்குமுள்ள ஏற்றத் தாழ்வுகள் பற்றியும் இந்த நாட்டினுடைய தேசிய வருமானத்தை அதிகரிப்பதில் சிறுதோட்டத் தொழிலாளர்களுடைய பங்களிப்பினைப் பற்றியும், அவர்கள் முகங்கொடுக்கின்ற பிரச்சினைகள் தொடர்பாகவும் விரிவாகக் கூறியிருந்தார். இருப்பினும், எங்களுடைய சமூகத்தினுடைய எதிர்பார்ப்புப் பற்றியும் எங்களுடைய சமூகத்தினுடைய மன உளைச்சல் பற்றியும் இந்த நாட்டுப் பெரும்பான்மை மக்களுக்கு ஒரு செய்தியைச் சொல்வதற்காக நான் இந்தச் சந்தர்ப்பத்தைப் பயன்படுத்த விரும்புகின்றேன்.

இந்த நாட்டிலே ஆயிரம் வருடங்களுக்கு மேலாகவும் அதாவது, மன்னர் ஆட்சிக் காலத்திலிருந்து, இந்த நாட்டை ஆளவந்த ஒல்லாந்தர், ஆங்கிலேயர் காலத்திலிருந்து, மாறிமாறி ஆட்சிக்கு வந்த ஐக்கிய தேசியக் கட்சியினதும் ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியினதும் ஆட்சிக்காலம் வரை, இந்த நாட்டினுடைய பாதுகாப்புக்கும் உரிமைக்கும் பங்கம் விளைகின்றபோது, அதனைத் தீர்க்குமுகமாக ஆட்சியாளர் களோடு, இந்த நாட்டினுடைய அரசுகளோடு தோள்நின்று உழைத்த இந்த நாட்டு முஸ்லிம் சமூகத்தினர் இன்று அச்சத்தோடு வாழக்கூடிய ஒரு சூழலைச் சம்பந்தப்பட்டவர்கள் உருவாக்கியிருக்கின்றார்கள்.

நாட்டிலே சட்டம், ஒழுங்கு என்பன எவ்வாறிருக்க வேண்டுமென்று யாப்பு கூறுகின்றது. ஜனாதிபதி என்றால் யார்? பிரதம மந்திரி என்றால் யார்? அமைச்சரவை என்றால் என்ன? என்பன பற்றி அந்த யாப்பில் தெளிவாகக் கூறப்பட்டிருக்கின்றது. மாறாக, இங்கு என்ன நடைபெற்றுக் கொண்டிருக்கின்றது? Law and Order - சட்டமும் ஒழுங்கும் யாருடைய கையிலிருக்க வேண்டும் என்பதைத்தான் நாங்கள் தீர்மானிக்க வேண்டியவர்களாக இருக்கின்றோம். இந்த நாட்டில் சட்டமும் ஒழுங்கும் சீர்குலைந்திருந்தால், அத்துரலிய ரத்ன தேரர் அவர்கள் தன்னுடைய உண்ணாவிரதத்தை ஜனாதிபதி மாளிகைக்கு முன்னால் செய்திருக்கலாம். ஏன், அவர் தலதா மாளிகைக்கு முன்னால் உண்ணாவிரதம் இருந்தார்? இதனால் முஸ்லிம் சமூகம் தேரர்களுடைய நடவடிக்கையில் சந்தேகம் கொண்டது. நீதிமன்றத்தை உதாசீனப்படுத்திச் சட்டத்தையும் ஒழுங்கையும் சீர்குலைத்த ஞானசார தேரர் சிறையைவிட்டு வெளியே வரும்போது "நான் இனி எனது மத அனுஷ்டானங்களைச் செய்யப்போகின்றேன்" என்று கூறினார். அவ்வாறு அவர் கூறி 2 - 3 நாட்கள் செல்வதற்குள் எதிர்க்கட்சியிலேயுள்ள முக்கிய தலைவர்களைச் சந்தித்துவிட்டு, இந்த அரசாங்கத்துக்கு, இந்த நாட்டினுடைய

[ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා]

ஜனாதிபதிக்கு மணித்தியாலங்களிலே காலக்கெடு விதித் திருந்தார். சட்டமும் ஒழுங்கும் ஞானசார தேரருடைய கையிலும் எங்களுடைய சக பாராளுமன்ற உறுப்பினர் அத்துரலிய ரத்ன தேரருடைய கையிலும் இருந்தால், இந்த நாட்டு மக்களுடைய நிலை என்ன என்பதைப்பற்றிச் சிந்தியுங்கள்!

நேற்றைய நிலைமையைப் பற்றி உங்களுக்கு நான் கூறுகின்றேன். இந்த நாட்டிலுள்ள 25 மாவட்டங்களுள் 8 மாவட்டங்களிலே வாழ்ந்த முஸ்லிம்கள் நேற்றுக் காலையிலிருந்து ஒரு பதற்றமான சூழ்நிலையில் மிகக் கவலையோடும் பயத்தோடும் பாதுகாப்பற்ற சூழலிலே இருந்தார்கள். கெக்கிராவையிலே ஞானசார தேரருடைய கைக்கூலிகளான இரண்டு பிக்குமாரின் தலைமையிலே ஆயிரக்கணக்கானவர்களைத் திரட்டிக்கொண்டு, அங்கிருக் கின்ற பள்ளிவாசல்களைத் தாக்கினார்கள். கண்டியிலே ஒரு முஸ்லிம் இளைஞர் அவர்களுக்குக் குறுக்கே சென்றதற்காக அவரை நையப்புடைத்தார்கள். இந்த நிலையில் 1983ஆம் ஆண்டுக் கலவரம் போன்றதொரு கலவரத்தை கொழும்பு, களுத்துறை மாவட்டங்களில் முஸ்லிம்களுக்கு எதிராக உருவாக்கிவிடுவார்களோ என்று முஸ்லிம்கள் பயந்தார்கள்.

ஏப்பிரல் 21ஆம் திகதிய தாக்குதலுக்குப் பிறகு இராணுவமும் படையினரும் பல தேடுதல்களை நடத்தினார்கள். நூற்றுக்கும் மேற்பட்ட பள்ளிவாசல்கள் தேடுதலுக்குள்ளாக்கப்பட்டன. அங்கு T-56 அல்லது LMG அல்லது வேறு பயங்கரமான ஆயுதங்கள் கைப்பற்றப் படவில்லை. அங்கு ஹஜ்ஜுப் பெருநாள் காலங்களிலே பக்கத்திலேயிருக்கின்ற கிராம மக்களுக்கு 'உழ்ஹிய்யா' கொடுப்பதற்காகப் பாவிக்கின்ற கத்திகளைக் கைப்பற்றிவிட்டு பெரும் ஆயுதங்களைக் கைப்பற்றியதுபோன்று ஊடகங்களிலே பிரச்சாரம் செய்தார்கள். இலங்கையில் 2 - 3 மிகக் கேவலமான ஊடகங்கள் இருக்கின்றன. அந்த ஊடகங்களை எமது சமூகம் மட்டுமல்ல, நாட்டு மக்கள் அனைவரும் பார்த்துக் கொண்டிருக்கின்றார்கள். அன்று முஸ்லிம் சமூகம் விரும்பிப் பார்த்த ஓர் ஊடகம் இன்று 90 வீதம் எமது சமூகத்துக்கு எதிரான நடவடிக்கைகளை முன்னெடுத்துச் செல்கின்றது. இதனால் அதனை எமது சமூகம் 100 வீதம் நிராகரிக்கின்ற ஒரு நிலைமையை அவர்கள் உருவாக்கியிருக்கின்றார்கள்.

எனது கட்சியினுடைய தலைவர் றிஸாட் பதியுதீன் அவர்கள் இந்த நாட்டிலேயிருந்த அரசாங்கங்களிலே அதாவது, முன்னாள் ராஜபக்ஷ அரசாங்கத்திலும் தற்போதைய அரசாங்கத்திலும் ஒரு சிறந்த அமைச்சராகச் செயற்பட்டிருக் கின்றார். ஐக்கிய தேசியக் கட்சித் தலைவராலும் ஸ்ரீலங்கா சுதந்திரக் கட்சியின் முன்னாள் தலைவராலும் ஏன், தற்போதைய மேதகு ஜனாதிபதி அவர்களாலும்கூட ஒரு சிறந்த அமைச்சராக அவர் ஏற்றுக்கொள்ளப்பட்டவர். அவருடைய அமைச்சுப் பொறுப்பிலே அவருக்குக் கொடுக்கப்பட்ட ஒரு நிறுவனம், ஏற்கெனவே இரண்டு பிரதான அமைச்சர்களிடம் இருந்தபோது நஷ்டத்தின் காரணமாக இழுத்து மூடப்பட்டிருந்தது. ஆனால், இன்று அந்த 'சதொச' நிறுவனம் 500க்கும் மேற்பட்ட கிளைகளுடன் மிகவும் இலாபத்தோடு நவீனமயப்படுத்தப்பட்ட Food City போன்று செயற்பட்டுக் கொண்டிருக்கின்றது. அவருக்குக்கீழே 35க்கு மேற்பட்ட நிறுவனங்கள் இருக்கின்றன. நஷ்டத்தில் இயங்கிய நிறுவனங்கள் அத்தனையும் இன்று இலாபமீட்டும் நிறுவனங்களாக மாற்றப்பட்டிருக்கின்றன.

இந்த நாட்டினுடைய மேதகு ஜனாதிபதி அவர்கள் மட்டக்களப்பிலே co-operative societies இன் 98ஆவது மாநாட்டிலே, "எங்களுடைய அமைச்சரவையிலே இருக்கின்ற ஒரு சிறந்த அமைச்சர், எந்தப் பொறுப்பைக் கொடுத்தாலும் சரியாகச் செய்யக்கூடிய அமைச்சர் றிசாட் பதியுதீன்" என்று கூறினார். அதேபோன்று, மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய அரசாங்கத்திலே பல்வேறுபட்ட அமைச்சுப் பதவிகளை வகித்திருந்தாலும்கூட தமிழ் மக்களுடைய துன்பங்களை, துயரங்களைத் துடைத்து 'மெனிக் பாம்' முகாமிலே இருந்த இலட்சக்கணக்கான அகதிகளை மீள் குடியேற்றம் செய்ததில் கௌரவ அமைச்சர் றிஸாட் பதியுதீன் அவர்களின் பங்களிப்பை எந்தவொரு தமிழ் மகனும் எந்தவொரு தமிழ்ப் பிரதிநிதியும் மறந்திருக்கமாட்டார்கள். தமிழ் மக்களுடைய போராளிகளாக இருந்து புனர்வாழ்வு பெற்றவர்களும் வடக்கிலே மன்னார், முல்லைத்தீவு, வவுனியா போன்ற பிரதேசங்களில் 30க்கும் மேற்பட்ட தமிழ், கிறிஸ்தவ இளைஞர்களும் எங்களுடைய அகில இலங்கை மக்கள் காங்கிஸினுடைய பிரதிநிதிகளாகத் தெரிவு செய்யப் பட்டார்கள். தமிழ்த் தேசியக் கூட்டமைப்பினுடைய கோட்டையாக இருந்த பிரதேசங்களில் உள்ள உள்ளூராட்சிச் சபைகளைக்கூட அகில இலங்கை காங்கிஸினுடைய பிரதிநிதிகள் பெற்றுக்கொண்டார்கள். அதுமட்டுமல்ல, அகில இலங்கை மக்கள் காங்கிரஸ் கட்சியிலே போட்டியிட்ட இரண்டு தமிழ் உறுப்பினர்கள் இன்று உள்ளூராட்சிச் சபைகளுடைய தவிசாளர்களாக இருக்கின்றார்கள். அப்படியென்றால், எங்களுடைய அகில இலங்கை மக்கள் காங்கிரஸினுடைய தலைவர் இனவாதமற்ற, இனக் குரோதமற்ற ஒரு தலைவராக ஏற்றுக்கொள்ளப் பட்டிருக்கின்றார்.

'அகில இலங்கை மக்கள் காங்கிரஸ்' எனப்படும் සමස්ත ලංකා මහජන පක්ෂය முஸ்லிம் என்றோ தமிழ் என்றோ சிங்களம் என்றோ இடைச்சொற்களைக் கொண்டு உருவாக்கப்பட்ட கட்சியல்ல. இந்த நாட்டினுடைய மூவின மக்களும் ஏற்றுக் கொள்ளக்கூடிய கட்சியாக அது இருந்துகொண்டிருக்கின்றது. அப்படிப்பட்ட ஒரு கட்சியின் தலைவருக்குக் கொடுக்கப்பட்ட பொறுப்புக்களை அவர் சரியாகச் செய்துவந்தபோது இடையில் தடங்கல் ஏற்பட்டது. 52 நாட்கள் இருண்ட யுகத்திலே சம்பந்தப்பட்டவர்களுடைய வேலைத்திட்டத்திலே நாங்கள் பங்காளிகளாகவில்லை என்பதற்காக எதிர்த்தரப்பிலே இருந்து பேசுகின்ற 63 - 64 உறுப்பினர்கள் அவர்மீதான நம்பிக்கையில்லாப் பிரேரணையைக் கொண்டுவந்தார்கள். "இந்த நாட்டினுடைய இராணுவத் தளபதியை அவர் மிரட்டினார்" என்று ஆதாரமற்ற செய்திகளைக் கூறுகின் றார்கள். இராணுவத் தளபதியே அதை நிராகரித்தபோதும்கூட முன்னாள் சிரேஷ்ட அமைச்சர்களும் எதிர்த்தரப்புப் பாராளுமன்ற உறுப்பினர்களும் அவருக்குச் சேறு பூச நினைத்தார்கள். றிஸாட் பதியுதீன் என்கின்ற தனி அமைச்சர் அன்று 52 நாட்கள் இருண்ட யுகத்திலிருந்து இந்த அரசாங்கத்தை மீட்டெடுத்த வரலாறு எமது பக்கத்திலே இருக்கின்ற ஆளும் தரப்புக்கு மட்டுமல்ல, எதிர்த்தரப்புக்கும் தெரியும். தற்பொழுது, இனவாதத்தைக் கக்கிக் கொண்டிருக்கின்ற மதகுருமாரின் பின்னணியிலே இவர்கள் இருந்துகொண்டு இந்த முஸ்லிம் சமூகத்தை நிந்திக்கின்றார்கள்.

சஹ்ரான் என்கின்ற பயங்கரவாதியை நாங்கள் எந்தக் காலத்திலும் ஏற்றுக்கொண்டவர்களல்லர். சஹ்ரான் என்ற பயங்கரவாதியின் தலைவருக்கு ஒரு நாடும் இல்லை. சம்பந்தப்பட்டவர்கள் அரபு தேசத்திலே லிபியா, ஈராக், சிரியா போன்ற முஸ்லிம் நாடுகளிலே இருக்கின்ற முஸ்லிம்களைக்

கொன்று குவித்தார்கள்; அவர்களுடைய பொருளாதாரத்தை அழித்தார்கள். ஆனால், அந்த நாடுகளின் பக்கத்தில் இருக்கின்ற யூத நாடான இஸ்ரேலிலே எந்தவொரு மகனும் கொல்லப்படவில்லை; அந்த நாட்டுக்கு ஆபத்தை ஏற்படுத்தப் படவுமில்லை. அந்த இயக்கத்தினர் பயங்கரவாதிகள்! அதுமட்டுமல்ல, சர்வதேச ரீதியிலே முஸ்லிம்களுக்கு அபகீர்த்தியை ஏற்படுத்துவதற்காக இரண்டு சர்வதேசப் பயங்கரவாத அரசாங்கங்கள் அந்த இயக்கத்தை உருவாக்கியிருக்கின்றன. சஹ்ரானுடைய இயக்கத்திலே 100 - 150 உறுப்பினர்களுக்குமேல் இல்லை என்றால், ஏன் 2,000க்கும் அதிகமானோரைப் பயங்கரவாதத் தடைச்சட்டத் தின்கீழ் கைதுசெய்து துன்பப்படுத்திக்கொண்டிருக்கிறீர்கள்? மேதகு ஜனாதிபதி அவர்களுக்கு ஒரு செய்தியை நான் சொல்ல விரும்புகிறேன். நாளை புனிதப் பெருநாள் தினம்! இந்தப் பெருநாளைக் கொண்டாடுவதற்காக சிறையிலே இருக்கின்ற உலமாக்கள் உட்பட அத்தனை அப்பாவி முஸ்லிம்களையும் நீங்கள் விடுதலை செய்ய வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා දැන් කථාව අවසන් කරන්න.

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)
ஒரு நிமிடம் தருமாறு கேட்டுக்கொள்கின்றேன்.

இன்று, எங்களுடைய சமூகம் எதிர்பார்க்கின்ற அந்தச் சுமுகமான நிலைமையை ஒரு மாதத்திற்குள் உருவாக்க வேண்டும். இந்த அரசாங்கமும் ஜனாதிபதியும் இந்த நிலைமையை ஒரு முடிவுக்குக் கொண்டுவர வேண்டுமென் பதற்காக நாங்கள் எமது பதவிகளை இராஜினாமா செய்திருக்கின்றோம். எங்களுடைய சிரேஷ்ட அமைச்சர்களான கபீர் ஹாஷீம், அப்துல் ஹலீம், றவுப் ஹகீம், றிஸாட் பதியுதீன் ஆகியோரும் இராஜாங்க அமைச்சர்களான எச்.எம்.எம். ஹரீஸ், அலி ஸாஹிர் மௌலானா, பைஸால் காசிம், அமீர் அலி ஆகியோரும் நானும் சேர்ந்து - நாங்கள் ஒன்பது பேரும் - ஏன் இராஜினாமா செய்திருக்கின்றோம் என்றால் -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)
பொதுஜன ஐக்கிய முன்னணியிலே இருக்கின்றவர் களுடைய பிரச்சாரங்களுக்கு எதிராக முஸ்லிம் சமூகத்தின்மீது ஒரு நம்பிக்கையை ஏற்படுத்துங்கள்! 1983 ஆண்டைப் போன்ற ஒரு கலவரத்தை உருவாக்காதீர்கள்! முஸ்லிம் சமூகம் இந்த நாட்டையும் பொருளாதாரத்தையும் கட்டிக்காத்தவர்கள். இன்று முஸ்லிம் நாடுகள் எங்களை அவதானித்துக் கொண்டிருக் கின்றன. நாங்கள் அவர்களுடைய உதவிகளைப் பெற வேண்டுமாக இருந்தால் முஸ்லிம் சமூகத்தின்மீது நம்பிக்கை ஏற்படுத்துங்கள்! ஜனாதிபதியவர்கள் சட்டமும் ஒழுங்கும் அமைச்சைப் பிரதம மந்திரியிடமோ அல்லது பொறுப்புவாய்ந்த இன்னொரு அமைச்சரிடமோ வழங்கி, சட்டத்தையும் ஒழுங்கையும் நிலைநாட்ட வேண்டும். அதன்மூலம் முஸ்லிம் சமூகத்திற்கு நம்பிக்கையேற்படுத்துங்கள் என்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තූතියි. මීළඟට, ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා.

[பி.ப. 4.40]

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் தேயிலை ஆராய்ச்சி சபை (திருத்தம்) சட்டமூலம் குறித்த விவாதத்தில் கலந்துகொண்டு எனது கருத்துக்களையும் பதிவு செய்துகொள்வதற்கு வாய்ப்பு வழங்கியமை குறித்து முதலில் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இன்று இந்த நாட்டிலே அரசியல் ரீதியாகச் சில மாற்றங்கள் ஏற்பட்டுள்ளன. இந்த மாற்றங்களை இந்த அரசாங்கம் மிகச் சரியாகப் பயன்படுத்திக் கொள்வதற்கு முன்வர வேண்டும். அவ்வாறின்றி, தொடர்ந்தும் இனவாத ரீதியிலானதும் மத அடிப்படைவாத ரீதியிலானதுமான பாதையில் அரசியலை முன்னெடுத்து, மக்களை வழிநடத்திக் கொண்டு செல்வதற்கு யாரேனும் முயற்சிப்பீர்களேயானால், அது இந்த நாட்டுக்கு மேலும் மேலும் அழிவுகளையே கொண்டுதரும் என்பதில் மறுபேச்சுக்கு இடமில்லை என்பதை நான் இங்கு மீண்டும் மீண்டும் வலியுறுத்த விரும்புகின்றேன்.

மாற்றங்கள் ஏற்படுகின்ற நிலையில், அந்த மாற்றங்கள் எதன் அடிப்படையில் நிகழ்த்தப்படுகின்றதோ அந்த அடிப்படைகளின் முக்கியத்துவத்துக்குரிய பிரச்சினைகள் தீர்க்கப்பட வேண்டும். அதைவிடுத்து, குறுகிய, சுயலாப அரசியலுக்காக ஒரு சந்தர்ப்பத்தில் ஒன்றை நியாயப்படுத்தியும் இன்னொரு சந்தர்ப்பத்தில் அதையே குற்றஞ்சாட்டியும் சில தமிழ் அரசியல் வியாபாரிகள் போன்று செயற்படுவதால், இந்த நாட்டில் எதையுமே உங்களிடமிருந்து எமது மக்களால் எதிர்பார்க்க முடியாது என்பதையும் அவதானத்திற் கொள்ளவேண்டும்.

இன்று சகோதர முஸ்லிம் மக்களின் பிரதிநிதிகள் அனைவரும் கூட்டாகத் தங்களது அமைச்சுப் பதவிகளை இராஜினாமா செய்து, சுதந்திரமான விசாரணைகளுக்கு ஒத்துழைப்பு வழங்குவதற்கு முன்வந்துள்ளனர். இரண்டு ஆளுநர்கள் தங்களது பதவிகளை இராஜினாமா செய்துள்ளனர். கடந்த ஏப்ரல் மாதம் 21ஆம் திகதி தற்கொலைத் தாக்குதல்கள் மேற்கொள்ளப்பட்டதிலிருந்து தொடர்ந்தும் இவர்களில் ஒரு சிலர்மீது பல்வேறு குற்றச்சாட்டுக்கள் பல்வேறு தரப்பினரால் சுமத்தப்பட்டு வந்திருந்தன. இப்போது, அத்தகைய குற்றச்சாட்டுக்கள் தொடர்பில் விசாரணைகளை மேற்கொள்வதற்குக் காலக்கெடு விடுத்து, முஸ்லிம் மக்கள் பிரதிநிதிகள் தங்களது பதவிகளை இராஜினாமா செய்துள்ளனர். எனவே, இந்த அரசு உடனடியாக அதைச் செய்து முடிக்க வேண்டும். அத்துடன், இந்தப் பிரச்சினையை ஒரு முடிவுக்குக் கொண்டுவர வேண்டும். பிச்சைக்காரனின் புண்ணைப்போல் தொடர்ந்தும் இந்தப் பிரச்சினையை வைத்துக்கொண்டிருக்க முடியாது என்பதை உணர்ந்துகொள்ள வேண்டும். இந்தப் பிரச்சினை காரணமாக இன்று இந்த நாட்டில் முஸ்லிம் மக்கள் பாதுகாப்பற்றதொரு அச்ச நிலைமையில் வாழ்ந்து கொண்டிருக்கின்றார்கள். அந்த மக்களின் இத்தகைய நிலை விரைவில் மாற்றப்பட வேண்டும் என்பதை இங்கு வலியுறுத்திக்கொண்டு, இன்றைய விடயத்திற்கு வருகின்றேன்.

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

எமது நாட்டின் அந்நியச் செலாவணியில் இன்னமும் ஒரு நிரந்தரமான ஈட்டல்துறையாக விளங்குகின்ற தேயிலை உற்பத்தித்துறை தொடர்பில்கூட, தேயிலை உற்பத்தியில் ஈடுபட்டுக்கொண்டிருக்கின்ற உழைப்பாளி மக்களின் வாழ்க்கை நிலையினைப்போன்று தொடர்ந்தும் துயரமான விடயங்களையே அவதானிக்கக்கூடியதாக இருப்பது வேதனை தருகின்ற விடயமாக அமைந்திருக்கின்றது. அண்மையில்கூட, 'சிலோன் ரீ" என்கின்ற இந்த நாட்டின் அபிமானத்திற்குரிய தேயிலை ஏற்றுமதியின்போது, ஜப்பான் நாட்டின் சிகப்பு அறிவிப்பிற்கு அது உட்பட்டுள்ளதாக அறிய முடிகின்றது. 1980 - 1990 களில் இந்த நாட்டின் ஏற்றுமதித்துறையில் மிக முக்கிய பங்கினை தேயிலை ஏற்றுமதியானது வகித்திருந்தது. குறிப்பாக, 1990ஆம் வருடத்தில் 215.6 மெற்றிக் தொன் தேயிலையினை ஏற்றுமதி செய்த நாடாக உலகின் முதலாவது இடத்தை இலங்கை பெற்றிருந்தது. ஆனால், அதன் பின்னரான காலகட்டங்களில், தொடர்ந்து நடைபெற்றுவரும் தேயிலைச் செய்கை தொடர்பிலான புறக்கணிப்புக்கள், அத்துறையில் ஈடுபடுகின்ற மக்கள் தொடர்பிலான புறக்கணிப்புக்கள், கலப்படம் போன்ற பல்வேறு காரணிகள் இன்று அத்துறையினை மிகவும் அழிவு நிறைந்த பாதைக்கே இட்டுச் சென்றுள்ளது என்றே கூற வேண்டும்.

இந்த நாட்டுத் தேயிலை உற்பத்தியில் சீனி, வர்ணங்கள் என்பவற்றைக் கலப்படம் செய்கின்ற தொழிற்சாலைகள் பல இருப்பதாகவும், அத்தகைய தொழிற்சாலைகள் இனங்காணப் பட்டுள்ளதாகவும், மேற்படி கலப்படத் தொழிலில் ஈடுபடுகின் றவர்களுக்குக் கடுமையான தண்டனை வழங்கப்படுமென்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர் கூறியிருந்ததாகக் கடந்த வருடம் பெப்ரவரி மாதம் ஊடகங்கள் தெரிவித்திருந்தன. அதற்கு முந்திய வருடம் இலங்கைத் தேயிலைக்கு ரஷ்யாவினால் இடைக்காலத் தடையொன்று விதிக்கப் பட்டிருந்தது. இப்போது இலங்கைத் தேயிலை தொடர்பில் ஜப்பானின் புறக்கணிப்பு வெளிப்பட்டுள்ளது. அதாவது, ஜப்பானுக்கு ஏற்றுமதி செய்யப்பட்டிருந்த இலங்கைத் தேயிலையில் அழிவுதரக்கூடிய MCP இரசாயனக் கலப்பு காணப்பட்டதாகத் தெரிவிக்கப்பட்டுள்ளது. இந்த MCP இரசாயனம் கொண்ட களைநாசினி பயன்படுத்தப்பட்டுத் தேயிலைச் செய்கைகள் மேற்கொள்ளப்படுவதே இதற்குக் காரணம் எனச் சுட்டிக்காட்டப்படுகின்றது. இந்த வகையில், தேயிலையின் தரத்தினைப் பழுதடையச் செய்கின்ற செயற்பாடுகள் தொடர்பில் பொறுப்புக் கூறவேண்டியவர்கள் யார்? என்ற கேள்வி எழுகின்றது. கடந்த ஏப்பிரல் மாதம் 21ஆம் திகதி மேற்கொள்ளப்பட்டிருந்த தற்கொலைக் குண்டுத் தாக்குதலுக்குப் பொறுப்புக்கூற வேண்டியது யார்? என்ற கேள்விக்கு இதுவரையில் உரிய பதில் கிடைக்காதிருப் பதைப்போன்றில்லாமல், தேயிலை உற்பத்தி தொடர்பில் பொறுப்புக்கூற வேண்டிய சட்டரீதியிலான நிறுவனம் இலங்கை தேயிலைச் சபையே எனக் கூறுப்படுகின்றது. இருந்தும், இலங்கைத் தேயிலையின் தரம் தொடர்பில் தொடர்ந்தும் ஏதாவதொரு பிரச்சினை எழுந்துகொண்டேதான் இருக்கின்றது.

தரமற்ற தேயிலைச் செடிகள் விநியோகம் மற்றும் வளர்ப்புத் தொடர்பில் கடந்த ஆண்டு பிரஸ்தாபிக்கப்பட்டது. இவ்வாறு எழுகின்ற பிரச்சினைகள் தொடர்பில் அவ்வப்போது உரிய தீர்வுகள் எட்டப்படாமல், அவை பாரிய பிரச்சினைகளாக உருவாகின்ற வரையில் பார்த்துக்கொண்டிருக்கின்ற வழக்கம் காரணமாக இந்த நாட்டில் தேயிலைத்துறை மட்டுமல்லாது பல்வேறு துறைகளும் இந்த நிலைக்கு வந்துள்ளன என்பதை இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். இதுவரைகாலமும் தமிழ் மக்களின் நலன்கள் சார்ந்து செயற்படாமல், கிடைத்த சந்தர்ப்பங்களை நாசமாக்கிவிட்டு, இனிமேல்தான் தமிழ் மக்களின் எதிர்காலம் தொடர்பாகச் சிந்தித்து நிதானமாகச் செயற்படப்போவதாகக் கூறுகின்ற தமிழ்த் தலைமைகளின் இன்றைய நிலைமை போலவே இருக்கின்றது இந்த நாடும் நாட்டின் அனைத்துத் துறைகளும் என்றே கூறவேண்டியிருக் கின்றது. இவ்வளவு காலமும் தமிழ் மக்களின் எதிர்காலம் தொடர்பில் தாங்கள் சிந்தித்துச் செயற்படவில்லையென்பதை இப்போதாவது இந்தத் தமிழ்த் தலைமைகள் ஏற்றுக் கொண்டுள்ளன. அதேபோன்று, இந்தத் தமிழ்த் தலைமைகளை நம்பி அழிவுகளின்பால் போயுள்ள தமிழ் மக்களைப்போன்றே இந்த நாட்டின் அழிவுகளின்பால் போயுள்ள ஏனைய அனைத்துத் துறைகளையும் கட்டியெழுப்புவது தொடர்பில் சிந்தித்துச் செயற்பட வேண்டிய ஏற்பாடுகள் தேவை என்பதை இங்கு வலியுறுத்துவதுடன், அந்த ஏற்பாடுகள் இந்தத் தமிழ்த் தலைமைகளின் வெறும் வாய் வார்த்தைகள்போல மாத்திரம் இருந்துவிடாமல், செயற்பாட்டு ரீதியாக இருக்க வேண்டும் என்ற கோரிக்கையினையும் இங்கு முன்வைக்க விரும் புகின்றேன்.

தேயிலை உற்பத்தி சார்ந்த தொழிற்றுறையில் ஈடுபட்டிருக்கின்ற மலையக மக்கள் தொடர்பில் உரிய அவதானங்கள் செலுத்தப்படாத நிலைமை தொடர்ந் துகொண்டே இருப்பதைக் காண்கின்றோம். தொழிலிடங்களில் அவர்கள் பல்வேறு இடையூறுகளுக்கு உட்படுகின்றனர். ஊதிய ரீதியில் இன்னமும் மிகவும் பின்தள்ளப்பட்டே வைக்கப்பட்டுள்ளனர். தோட்டத் தொழிலாளர்களின் சமூக மற்றும் பொருளாதார நிலைமைகளைப் பல்வேறுபட்ட வடிவங்களில் ஆராய்தல், தொழில் பற்றாக்குறையைத் தவிர்த்தல், தொழில் வினைத்திறனை மேம்படுத்தல், கல்வி ஒத்துழைப்பு என்பன தொடர்பிலான ஒப்பந்தமொன்று 'மிச்சிக்கன்' பல்கலைக்கழகத்திற்கும் இலங்கைத் தேயிலை ஆராய்ச்சி நிறுவகத்திற்கும் இடையில் கைச்சாத்திடப் படவிருந்ததாகக் கடந்த வருடத்தில் அறியக் கிடைத்திருந்தது. அதன் இன்றைய நிலை என்ன? என்பது பற்றி அறிய விரும்புகின்றேன். குறிப்பாக, தோட்டத் தொழிலாள மக்களின் வாழ்க்கைநிலை மேம்படுத்தப்பட்டால், அவர்களது சமூக, பொருளாதார நிலை மேம்படுத்தப்பட்டால், வினைத்திறன் ரீதியில் அவர்களது உழைப்பினை மேலும் பெற இயலுமென நினைக்கின்றேன். 50 ரூபாய் ஊதிய அதிகரிப்பொன்று அவர்களுக்கு வழங்கப்படுவதாகக் கூறப்பட்டது. இன்று அதைப் பற்றி எந்தக் கதையுமே கிடையாது. இன்றும்கூட குளவிக்கொட்டுகள் உள்ளிட்ட பல்வேறு மிருகங்களின் அச்சுறுத்தல் நிலைமைகளுக்கு மத்தியில் தொழில்செய்கின்ற நிலையிலிருந்து அவர்கள் பாதுகாக்கப்பட வேண்டிய சூழலை ஏற்படுத்துவது அவசியமாகின்றது என்பதையும் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

அதேநேரம், தொடர்ந்தும் தேயிலையை வெறும் மூலப்பொருளாகவே ஏற்றுமதி செய்து கொண்டிருக்காமல், பெறுமதி சேர்க்கப்பட்ட பொருளாக ஏற்றுமதி செய்வதற்கான ஏற்பாடுகள் தேவை என்பதையும் அவதானத்தில் கொள்ளவேண்டும். அதாவது, 'உடனடித் தேநீர்' தொடர்பில் உலகில் பாரிய கேள்வி இருப்பதாகவே தெரிய வருகின்றது. தேயிலை ஏற்றுமதியில் இன்று நாம் பல நாடுகளுடன் போட்டிபோட வேண்டியுள்ளது. அதற்கேற்ப எமது உற்பத்தியின் தரத்தினை மேம்படுத்துவதற்கும் பெறுமதி சேர்ப்பதற்கும் நடவடிக்கையெடுக்க வேண்டும். அயலக நாடான இந்தியாவைப் பொறுத்தவரையில், தேயிலையுடன் பல்வேறு மருத்துவப் பொருட்களைச் சேர்த்துத் தயாரிக்கப்படும் ஆரோக்கிய பானங்கள் சந்தையிலே பிரபலமாகியுள்ளன. இலங்கையில்கூட ஒருசில தனியார்

துறையினர் இத்தகைய முயற்சிகளில் ஈடுபட்டு வருகின்றபோதிலும், அதற்கான ஊக்குவிப்புகள் மற்றும் கண்காணிப்புகள் என்பன தொடர்ந்தும் தேவை என்பதையும் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். தற்போதுகூட இந்த நாட்டின் தேயிலைக் கைத்தொழிலானது முழுமையாகவே தனியார் நிறுவனங்கள் மற்றும் ஏலம் விடுவோர் போன்ற, அரசுக்கு அப்பாற்பட்ட துறையினரின் மூலமாகவே கையாளப்பட்டு வருவதாகக் கூறப்படுகின்ற நிலையில், இதில் உடனடி மாற்றங்கள் கொண்டுவரப்பட வேண்டும். அத்தகையதொரு நிலை வரும்வரையில் இலங்கைத் தேயிலையின் தரம் தொடர்பில் உறுதிபடக் கூற முடியாத நிலை தொடர்வது தவிர்க்க முடியாது என்பதைக் கூறி, விடைபெறுகின்றேன். நன்றி.

[අ.භා. 4.51]

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, තේ පර්යේෂණ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධ විවාදයට සම්බන්ධ වීමට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. අපේ දිස්ත්‍රික්කය කුඩා තේ වතු රාශියක් තිබෙන දිස්ත්‍රික්කයක්. අපි බැලුවොත්, තේ පර්යේෂණ මණ්ඩලයෙන් කුඩා තේ වතු හිමියන්ට කෙරෙන කාර්යභාරය බොහොම අඩුයි. තේ ගස්වලට, එහෙම නැත්නම් ඒ පසට යොමු කළ යුතු පොහොර වර්ගය මොකක්ද කියලා බොහෝ කුඩා තේ වතු හිමියන් දන්නේ නැහැ. තේ පර්යේෂණ ආයතනයෙන් යම් කිසි වැඩ පිළිවෙළක් සකස් කරලා, මෙන්න මේ වර්ගයේ තේවලට, මේ පසට හරි යන පොහොර වර්ගය මේකයි කියලා ඒ අයට හරියට කියලා දෙනවා නම් ඒ විධියට කටයුතු කරන්න ඒ අයට පුළුවන්. හැබැයි, දැන් එහෙම වැඩ පිළිවෙළක් නැති නිසා තමන්ට හිතෙන හිතෙන විධියට තමයි කුඩා තේ වතු හිමියන් පොහොර යොදන්නේ. ඒ නිසා අපි බලාපොරොත්තු වන ඵලදායිතාව තේ වගාවෙන් ලබා ගන්න බැරි වෙනවා. දැන් වියදම වැඩි නිසා කුඩා තේ වතු හිමියන්ට තමන්ගේ ව්‍යාපාරය කරගෙන යන්න අමාරුයි. පොහොර දමන්න, වතු එළි පෙහෙළි කරන්න, දලු කඩන්න කියන මේ සියලු දේට වියදම් වුණාම ලාභයක් නැති නිසා තේ කර්මාන්තයෙන් ගොඩක්දෙනෙක් ඈත් වෙනවා. ඒ අය තේ වගාවෙන් ඈත් වෙලා දැන් කුරුඳු වගා කරන්න පෙලඹිලා තිබෙනවා. අපේ රටේ අවුරුදු 150ක් පමණ තිබුණු තේ වගාව දැන් ටිකෙන් ටික නැති වේගෙන යනවා. ඒකට හේතුව තමයි තේ වගාවෙන් ලැබෙන ආදායම මදි වීම. දැන් වැඩිනෙක් කුරුඳු වගාවට ගිහින් තිබෙනවා. තේ කර්මාන්තශාලා හිමියන් කියන්නේ තව අවුරුදු 25, 30ක්, 50ක් යනකොට තේ කර්මාන්තශාලා වහන්න වෙයි කියලායි. ඒකට හේතුව තමයි, අලුතින් තේ හිටුවීම අඩු වීම. ඒ නිසා තේ අක්කර ප්‍රමාණය අඩු වෙනවා. එතකොට කර්මාන්තශාලාවලට අවශ්‍ය තේ දලු නැති වෙනවා. ඒ නිසා නැවත තේ වගා කිරීමට -පරණ තේ ගස් ගලවා දමා අලුතින් වගා කිරීමට- ඒ අයට මීට වඩා උදවු කරන්න කියලා අපි මේ අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කරනවා. ගොඩක් අය අවුරුදු 25ක්, 30ක්, 35ක්, 40ක් වයස, පරණ තේ ගස්වලින් තමයි දලු කඩා ගන්නේ. ඒකට හේතුව මේකයි. තේ නැවත වගා කරලා එයින් ආදායමක් ලබා ගන්න අවුරුදු එකහ මාරක් විතර ගත වෙනවා. අවුරුදු එකහමාරක් විතර ආදායමක් නැතිව ජීවත් වෙන්න බැරි නිසා ඒ අය පරණ වගාවෙන්ම දලු ගන්න බලනවා. ඒ නිසා ඒ අයට තේ වගාව අලුතින් ආරම්භ කරන්න ලබා දෙන සහනාධාරයට අමතරව, ජීවත් වීමට මාසිකව යම් කිසි මුදලක් ලබා දෙන්න කියලා අපි කියනවා. එහෙම ලබා දුන්නොත් පරණ තේ වගාව ඉවත් කරලා අලුතින් තේ වගා කිරීමට ඒ අය කටයුතු කරයි.

2018 වසරේ වෙළෙඳ පොළේ තේ මිල රුපියල් 620යි. මේ අවුරුද්ද වෙනකොට එය රුපියල් 581 දක්වා අඩු වෙලා තිබෙනවා. යම් යම් කාලවල තේ මිල අඩු වෙනවා, වැඩි වෙනවා. තේ මිල අඩු වීමත් එක්ක තේ කර්මාන්තයේ නිතර වී සිටින අයට ඒ කර්මාන්තය කරගෙන යන්න ලැබෙන්නේ නැහැ. ඒ නිසා නව තාක්ෂණය හඳුන්වා දීලා මේ කර්මාන්තය දියුණු කිරීමට යම් කිසි වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා අපි කියනවා. සෙස් බද්ද හරහා ලැබෙන මුදල වෙන ඒවාට යොමු කරන්නේ නැතිව තේ කර්මාන්තය සඳහාම යොමු කරන්න. ලෝක වෙළෙඳ පොළේ තේ වෙන්දේසියේදී අපේ තේ වැඩි මිලකට විකුණා ගැනීමට අවශ්‍ය කටයුතු අපි කරන්න ඕනෑ. එහෙම නොකර, හැම දාම එක තැන පල් වෙවී හිටියාම තේ වෙන්දේසියේදී අපේ තේවලට ලැබෙන මිල අඩු වෙනවා. ලෝකයේ අනෙක් රටවල් එක්ක තරග කිරීමට නම් සෙස් බද්ද උපයෝගී කරගෙන වැඩ පිළිවෙළක් හදන්න කියලා අපි ඇමතිතුමාට කියනවා. "Ceylon Tea" පිළිබඳ advertisements දමලා වෙළෙඳාම දියුණු කරන්න. ප්‍රචාරණය තුළින් අවශ්‍ය නැති දේත් මිලදී ගන්න මිනිසුන් පෙලඹෙන බව අපි දන්නවා. රූපවාහිනියේ advertisements දැම්මාම ගන්නේ නැති බඩුත් මිනිස්සු ගන්නවා. තේ කර්මාන්තය රැක ගැනීමට නම්, අපි තේවලට වැඩි මිලක් ගන්න ඕනෑ. ඒ වාගේම තාක්ෂණයත් එක්ක අලුත් වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ.

අපි දන්නවා, කොපමණ තේ අක්කර ගණනක් තිබුණත් එක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට ඉන්නේ එක නිලධාරිවරයකු බව. එතකොට එම නිලධාරියාට අවුරුදු පහකට වරක්වත් එක ඉඩමකට යන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. එම නිසා අලුතෙන් නිලධාරින් බඳවාගෙන, පරීක්ෂණ කරන නිලධාරින් බඳවාගෙන, අලුත් වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ කියලා අපි කියනවා.

අපි රබර් ගහකින් අවුරුදු 25ක් හෝ 30ක් කිරි ගන්නවා නම්, අනෙක් රටවල් අවුරුදු 15කදී ඒ කිරි ටික ලබාගන්නවා. අපි කිරි ලීටර් 2ක් ගන්නවා නම්, ඒගොල්ලන් ලීටර් 4ක් ගන්නවා. එහෙම කරන්නේ අලුත් තාක්ෂණයත් එක්කයි. ඒ වාගේම අපි තේ ගහෙන් මීට වඩා දලු ගන්න පුළුවන් ක්‍රමවේදයක් හදන්නට ඕනෑ.

දැන් වතුවල වැඩ කරන අය අඩුයි. එම නිසා බොහෝ වතුවල කටයුතු කර ගන්නට එම තේ වතු හිමියන්ට බැරි වෙලා තිබෙනවා. අපි හිතනවා නව තාක්ෂණය හඳුන්වලා දීලා, ඒ අයට ආධාර කරලා මේ කර්මාන්තය ඉස්සරහට ගෙන යන්න කටයුතු කරන්න ඕනෑ කියලා. ග්ලයිෆොසේට් තහනම අයින් කරලා දෙනවා කිව්වාට, ඒවා ගන්න කොහේවත් නැහැ. අපි ගන්න ගියාම වැඩි ගාණට තමයි ගන්න තිබෙන්නේ. තිබෙනවා, හැබැයි වැඩි ගාණටයි ගන්න තිබෙන්නේ. මටත් තිබෙනවා, තේ වගාවක්. නමුත් අපට ග්ලයිෆොසේට් සොයා ගන්න විධියක් නැහැ. අවුරුද්දකට සමිතිය හරහා යම් ප්‍රමාණයක් දෙනවා කියනවා, ඒ ටික ගන්න බැරි වුණොත් ඒකත් නැති වෙනවා. එම නිසා අපි ඇමතිතුමාට කියනවා, අවුරුද්දකට දෙන ග්ලයිෆොසේට් ප්‍රමාණය ඕනෑ තැනකින් ගන්න පුළුවන් විධියට හදලා දෙන්න කියලා. එහෙම නැති වුණොත් මේක ගන්න පුළුවන්කමක් නැහැ. හැබැයි, පිට තැන්වල ඕනෑ තරම් ගන්න තිබෙනවා. මොන දේ කළත් වැඩි මිලට ගන්න තිබෙනවා.

අපි පසුගිය දින 52 ආණ්ඩුව තුළ, කුඩා තේ වතු හිමියාට නැවත වරක් පරණ මිලට තේ පොහොර දෙන්න කටයුතු කළා. එදා පොහොර මිටිය රුපියල් 3,000ට තිබුණා. ඒක අඩු කළා කිව්වාට, පුංචි ගණනකින් තමයි අඩු කළේ. මහින්ද රාජපක්ෂ මැතිතුමා අගමැති වුණු ගමන් එතුමා නැවත වරක් රුපියල් 1,300කට තේ පොහොර මිටියක් දෙන්නට කටයුතු කළා. මේ කර්මාන්තය ගොඩ නඟන්න නම්, මේ තුළින් ගොවියා වැඩි මුදලක් ලබන්න නම්, එම කර්මාන්තයේ නියැලෙන අයට රජය මීට වඩා සහන ලබා දෙන්නට ඕනෑ. ඒ නිසා අමාත්‍යාංශය සහ TRI එක හරහා වැඩ පිළිවෙළක් හදන්නට ඕනෑ කියලා අපි හිතනවා. එහෙම වැඩ පිළිවෙළක් හැදුවොත් තමයි මේක ඉස්සරහාට ගෙන යන්න පුළුවන් වෙන්නේ. දැන් අවුරුදු 150ක්

[ගරු ජානක වක්කුඹුර මහතා]

තිස්සේ අපේ රටේ තේ වගාව කරගෙන යනවා. තව අවුරුදු 50ක් යනකොට ඒක එහෙම්පිටින්ම නැති වෙනවා. මම මුලින් කිව්වා වාගේ වෙනත් භෝග වගා කරන්නට මේ අය පෙළඹෙනවා.

තමන්ගේ නිෂ්පාදනයට වැඩි ආදායමක් ගන්න බැරි වන කොට ඒ අය වෙනත් දෙයකට යොමු වනවා. මීට වඩා මේ කටයුතුවලට සහයෝගය ලබා දීලා, එම කර්මාන්ත රැක ගන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා අපි රජයෙන් ඉල්ලනවා. Tea Factoriesවල ගොඩක් ප්‍රශ්න තිබෙනවා. ගොඩක් අය සීනි කලවම් කරනවා. අපේ රටේ තේ විකුණන කොට සීනි කලවම් කරලා ඒ අය වැඩි ලාභයක් ලබන්න හදනවා. තවම තේවල තිබෙන සීනි සාන්ද්‍රණය කොච්චරද කියලා හොයා ගෙන නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කවුරු හෝ අල්ලලා, උසාවියට ඉදිරිපත් කරන්න නම් තේවල තිබෙන සීනි සාන්ද්‍රණය කොච්චරද කියලා කියන්න ඕනෑ. එහෙම නැත්නම් ඔහුට නඩුවක් දමන්න බැහැ. අපේ ඇඟේ ලේවල සීනි කොච්චර තිබෙනවාද කියලා අපි බලනවා. ඒ වාගේ තේවල තිබෙන සීනි සාන්ද්‍රණයත් මෙන්න මෙච්චරයි කියලා අපි හොයා ගන්න ඕනෑ. එහෙම නැත්නම් ඒ සම්බන්ධයෙන් නඩුවක්වත් දමන්න බැහැ. ඒ නිසා ෆැක්ටරි හිමියන් අපේ තේ කර්මාන්තය වෙනත් පැත්තකට ගෙනි යනවා නම් ඒවා තහනම් කරන්න ඕනෑ. ඒවාට නීති ගෙනෙන්න ඕනෑ. ඒ අල්ලා ගන්න කෙනාවත් තමන්ගේ හිතවත්කම් මත අත් හැරලා දාලා, ඔහුට යන්න දුන්නාම කර්මාන්තය වැටෙනවා. ඒ නිසා තරාතිරම නොබලා මේ සඳහා අවශ්‍ය කටයුතු කරන්න කියලා අපි ඇමතිවරයාට කියනවා. කුඩා තේ වතු හිමියන් වෙනුවෙන් මීට වඩා යමක් කරන්න කියලා ඉල්ලා සිටිමින් මා නිහඬ වනවා, ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. ඊළඟට, ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා.

[பி.ப. 5.01]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில், வாணிப அலுவல்கள், நீண்டகாலமாக இடம்பெயர்ந்த நபர்களின் மீள்குடியேற்றம், கூட்டுறவுத்துறை அபிவிருத்தி, தொழில் பயிற்சி மற்றும் திறன்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Rishad Bathiudeen - Minister of Industry and Commerce, Resettlement of Protracted Displaced Persons, Co-operative Development and Vocational Training and Skill Development)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, முஸ்லிம் சமூகம் 1000 வருடங்களுக்கு மேலாக இந்த நாட்டிலே வாழுகின்ற, சிங்கள, தமிழ், முஸ்லிம் மக்கள் எல்லோரும் ஒற்றுமையாக வாழ வேண்டும் என்ற உணர்வோடும் இலங்கை எமது நாடு என்ற உணர்வோடும் இந்த நாட்டுக்குள்ளே பிளவுகள் வந்துவிடக்கூடாது என்ற எண்ணத்தோடும் வாழ்ந்து வருகின்ற ஒரு சமூகமாகும். உலகப் பயங்கரவாதம் இந்த நாட்டுக்குள்ளே புகுந்து, இலங்கையிலுள்ள ஒரு சில முஸ்லிம் இளைஞர்களை அதற்குள்ளே சம்பந்தப்படுத்தி, இந்த நாட்டிலே நாங்கள் எதிர்பாராத ஆபத்தான படுபயங்கரவாதத் தாக்குதலைக் கடந்த පාස්කු ඉරිදා தினத்தில். அதாவது ஏப்பிரல் 21ஆம் திகதி நடாத்தியது. இதனால் அப்பாவிக் கத்தோலிக்கச் சமூகத்தினதும் அதேபோல, வெளிநாட்டுப் பயணிகளினதும் இந்த நாட்டிலே இருக்கின்ற ஒரு சில தமிழ்ச் சகோதரர்களினதும் உயிர்கள் அநியாயமாக பலிகொள்ளச் செய்யப்பட்டன. அந்த வேதனையிலே, துன்பத்திலே இருக்கின்ற குடும்பங்களுக்கு நாங்கள் எங்களுடைய அனுதாபங்களைத் தெரிவித்தோம். அதிலே பாதிக்கப்பட்ட, காயமுற்றவர்களுடைய நல்வாழ்வுக்காகவும் விரைவில் அவர்கள் அந்த நிலையிலிருந்து விடுபட்டுச் சுகதேகிகளாக மாறுவதற்கும் நாங்கள் பிரார்த்தித்துக்கொண்டே இருக்கின்றோம். ஆனால், இன்று இந்த நாட்டிலே வாழுகின்ற 22 இலட்சம் அப்பாவி முஸ்லிம்களையும் அந்தப் பயங்கரவாதத் தாக்குதலோடு சம்பந்தப்படுத்தி அவர்களை வஹாப்வாதிகள், அடிப்படைவாதிகள். பயங்கரவாதிகள் என்று அழகாகச் சிங்கள மொழியிலே பேசுகின்ற அரசியல்வாதிகள் இந்தப் பாராளு மன்றத்துக்குள்ளும் வெளியிலும் உருவாகியிருக்கிறார்கள். இவர்கள் இந்த 22 இலட்சம் முஸ்லிம்களையும் அவர்களின் உலமாக்களையும் அரசியல்வாதிகளையும் மிக மோசமான வார்த்தைகளால் பேசுகின்ற செயற்பாட்டை நாங்கள் பார்க்கிறோம். அதற்குச் சில ஊடகங்களும் துணை போய்க்கொண்டிருக்கின்றன. இந்த நாடு பிரிந்துவிடக்கூடாது, அழகான இந்த நாடு பாதுகாக்கப்பட வேண்டும் என்ற உணர்வோடுதான் இன்றுவரை முஸ்லிம் சமுதாயம் இந்த நாட்டில் இருந்துகொண்டு இருக்கின்றது.

ஏப்பிரல் 21ஆம் திகதி நடந்த அந்தப் பயங்கரவாதச் செயலைக் கண்டித்ததோடு மட்டுமல்லாமல், அந்தச் செயலோடு சம்பந்தப்பட்டவர்கள் முஸ்லிம்களாக இருந்தாலும் சொந்தங்களாக இருந்தாலும் நண்பர்களாக இருந்தாலும் அல்லது இரத்த உறவுகளாக இருந்தாலும் அவர்களைக் காட்டிக்கொடுக்கின்ற பணியையும் முஸ்லிம் சமூகம் செய்திருக்கின்றது. சம்பந்தப்பட்டவர்கள் சாய்ந்தமருதிலே பல இலட்சம் பணத்தோடு நின்று "எங்களைக் காப்பாற்றுங்கள்! காட்டிக்கொடுத்துவிடாதீர்கள்!" என்று உயிர்ப்பிச்சை கேட்ட பொழுது, எங்களுடைய முஸ்லிம் சமூகத்தினர் அவர்களைக் காப்பாற்றாமல் பொலிஸாருக்குத் தகவலைக் கொடுத்தார்கள். அவர்கள் அத்தனைபேரும் தங்களுக்குத் தாங்களே குண்டு வைத்துக்கொண்டு சாகின்ற அளவுக்கு பொலிஸாருக்கு ஒட்டுமொத்த ஆதரவை சாய்ந்தமருது முஸ்லிம்கள் வழங்கியிருக்கின்றார்கள். அது மாத்திரமல்ல, இந்த நாட்டிலே அந்தக் கொலைகளோடு சம்பந்தப்பட்ட ஒருவர் தன்னுடைய மனைவியிடம், தான் வெளிநாட்டுக்குச் செல்வதாகச் சொல்லிச் சென்ற இரண்டு தினங்களுக்குப் பின்னர், தன்னுடைய கணவனை TV இலே சடலமாகப் பார்த்த அவரது மனைவி, அப்பொழுதே தன்னுடைய வீட்டிலிருந்த அவருடைய கணவருடைய அத்தனை ஆவணங்கள், videos, audios, SIMs என எல்லாவற்றையும் எடுத்துக்கொண்டு "இவை என்னுடைய கணவருடைய ஆவணங்கள்" என்று சொல்லி தன்னுடைய தந்தையோடு போய் பொலிஸிலே பாரம் கொடுத்துச் சரணடைந்திருக்கிறார்.

நாங்கள் அகில இலங்கை ஜம்மியத்துல் உலமா சபைக்குக் கட்டுப்பட்ட ஒரு சமூகமாகும். உலமா சபையினுடைய தலைவர் மௌலவி அஷ்ஷெய்க் றிஸ்வி முப்தி அவர்களுடைய தலைமையிலே எல்லா அரசியல்வாதிகளும் எல்லாச் சிவில் அமைப்புகளும் எல்லாத் தலைவர்களும் ஒன்று சேர்ந்து ஒட்டுமொத்தமாக ஒரு முடிவெடுத்தோம். இந்தப் பயங்கரவாதச் செயலைக் கண்டிப்பது மட்டுமல்ல, 100% இந்தப் பயங்கரவாதிகள் அல்லது பயங்கரவாதத்தோடு சம்பந்தப் பட்டவர்கள் இந்த நாட்டிலே எங்கிருந்தாலும் அவர்களைக் காட்டிக்கொடுத்து, இந்த நாட்டிலே வழங்கப்படுகின்ற அதியுச்ச தண்டனையை அவர்களுக்குப் பெற்றுக்கொடுக்க வேண்டுமென்று முடிவெடுத்தோம். அந்த நிமிடத்திலிருந்து அவர்களுக்குத் தண்டனையைப் பெற்றுக்கொடுக்கின்ற பணியிலே அகில இலங்கை ஜம்மியத்துல் உலமா சபை, சிவில் அமைப்புகள், அரசியல்வாதிகள், சாதாரண பொதுமக்கள் என நாங்கள் எல்லோரும் சேர்ந்து ஈடுபட்டோம். அதுபற்றிப் பொலிஸாருக்குத் தெரியும். இராணுவத் தளபதியும் அதைப்பற்றிப் பலமுறை சொல்லி இருக்கிறார். அவ்வாறு இதுபற்றிப் பொலிஸார் சொல்லிய, ஜனாதிபதி சொல்லிய அதேநேரம், எதிர்க்கட்சியில் இருக்கின்ற ஒரு சில அரசியல்வாதிகள் தாம் ஆட்சிபீடத்தில் அமரவேண்டும் என்ற ஒரேயொரு நோக்கத்துக்காக 22 இலட்சம் முஸ்லிம் மக்களினதும் உள்ளங்களை உடைக்கிறார்கள்; எங்களுடைய நெஞ்சைப் பிளக்கிறார்கள்; எங்களுடைய சொத்தை அழிக்கவேண்டும் என்று திடசங்கற்பம்பூண்டு இனவாதத்தைக் கக்குகிறார்கள். நாங்கள் பயங்கரவாதிகள் இல்லை. அதற்கு நாங்கள் உதவி செய்யமாட்டோம்; உதவி செய்யவுமில்லை. எங்களுக்கே தெரியாமல் இந்த நாட்டுக்குள் உலக பயங்கரவாதம் புகுந்துவிட்டது. எனவே, இதைத் துடைத்தெறி வதற்காக நாங்கள் உங்களுக்கு ஆதரவு தருகிறோம்; உங்களோடு சேர்ந்து செயற்படுகிறோம். இங்கு வாழுகின்ற சிங்கள பௌத்த மக்கள் உட்பட எல்லோரும் சேர்ந்து வாழ்வோம் என்று நாங்கள் ஒட்டுமொத்தமாக அழைக்கின்ற பொழுது, ஏன் அப்பாவி முஸ்லிம்கள்மீது இந்தப் பழியைப் போடுகிறீர்கள்? என்று நான் கேட்கின்றேன். நாங்கள் இந்த நாட்டிலே ஒற்றுமையாக வாழ ஆசைப்படுகிறோம். நாங்கள் சந்தோஷமாக வாழ்வோம்! எங்களிடையே பிரிவினை வேண்டாம்; பிளவுகள் வேண்டாம்; பிரச்சினைகள் வேண்டாம். நாங்கள் இந்தப் பயங்கரவாதத்தை -

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට point of Order එකක් ඉදිරිපත් කරන්න තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ point of Order එක මොකක්ද, ගරු මන්ත්‍රීතුමනි?

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා කථා කරන්නේ කුමන පනත් කෙටුම්පතක් ගැනද කියා මා අහනවා. අද කථා කරන්නේ තේ පර්යේෂණ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳවයි. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව, මෙහෙම කථා කරන්න පුළුවන්ද?

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
ඒක point of Order එකක් නොවෙයි.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ඇයි නැත්තේ? [බාධා කිරීමක්]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
මගේ වෙලාවේ මට කථා කරන්න පුළුවන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, විෂයට අදාළව කථා කරන්න.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
ඒ සම්බන්ධව මා කථා කරන්නම්.

கைத்தொழில் துறையாக இருக்கலாம் அல்லது வருமானத் துறையாக இருக்கலாம் அல்லது இந்த நாட்டிலே முதலீடு செய்வதாக இருக்கலாம் அல்லது தேயிலையை உற்பத்தி செய்து, அதை வெளிநாட்டுக்கு ஏற்றுமதி செய்வதாக இருக்கலாம். இவை எல்லாவற்றுக்கும் இந்த நாட்டிலே சமாதானம் தேவை! நிம்மதி தேவை! அவ்வாறு நிம்மதியோ, சமாதானமோ இல்லாதபொழுது, இந்த நாடு இருக்கின்ற நிலையைவிட, இன்னும் மோசமானதொரு நிலைக்குச் செல்லக்கூடிய ஓர் ஆபத்துக் காத்துக்கொண்டு இருக்கின்றது. சுதந்திரத்துக்கு முன்னர் நமது நாடு பொருளாதாரத்திலே எங்கே இருந்தது? ஜப்பானுக்கு அடுத்ததாக இருந்தது. கடந்த 30 வருட கால யுத்தத்தினால் இன்று இந்த நாடு பங்களாதேசுக்குப் பக்கத்திலே இருக்கின்றது.

இன்று ஒரு சில அரசியல்வாதிகள் செய்கின்ற சதியினால், இந்த நாட்டில் இடம்பெற்ற ISIS பயங்கரவாதத் தாக்குதலை இலங்கை முஸ்லிம்களோடு சம்பந்தப்படுத்தி, அப்பாவிகளைத் துன்புறுத்துகின்றார்கள். இந்தச் சபையிலே எங்களுடைய முன்னாள் அமைச்சர் பைசர் முஸ்தபா அவர்கள் இருக்கின்றார். இது அவருக்கும் தெரியும். நேற்றைக்கு முன்னைய நாள் ஒரு சகோதரி விடுதலை செய்யப்பட்டார். அவர் என்ன காரணத்துக் காக கைதுசெய்யப்பட்டார்? மஹியங்கனை - ஹசலக பகுதியைச் சேர்ந்த மஸாஹிமா என்கின்ற ஒரு பெண் கப்பலின் சுக்கான் சின்னம் பதித்த ஆடையை அணிந்துகொண்டு வெளியில் சென்றபொழுது, அவ்வாடையில் இருப்பது பௌத்த மதத்தினுடைய தர்மச் சக்கரம் என்று சொல்லி, நோயாளித் தாயான அவரைப் பொலிஸார் ICCPR சட்டத்தின்கீழ் கைதுசெய்து, 21 நாட்கள் சிறையிலே அடைத்து வைத்திருந் தார்கள். ஆனால், மினுவாங்கொடையிலே 12 வீடுகளை உடைத்த, 64 வியாபார நிலையங்களை அழித்த, பள்ளிவாசல் ஒன்றை முற்றுமுழுதாக உடைத்த, 09 வாகனங்களை உடைத்த, 04 பேரைக் காயப்படுத்திய, 700 மில்லியன் பெறுமதியுடைய pasta தொழிற்சாலையை முழுமையாக எரித்த குற்றச்சாட்டுக்களின் பேரில் கைதுசெய்யப்பட்ட அத்தனை பேரையும் இன்று விடுதலை செய்து இருக்கிறார்கள். இதுதான் இந்த நாட்டிலே இருக்கின்ற சட்டம்! இதுதான் இந்த

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

நாட்டிலே இருக்கின்ற சட்டமும் ஒழுங்கும்! கப்பலின் சுக்கான் சின்னம் பதித்த உடையை அணிந்திருந்த தாயை 21 நாட்கள் சிறையிலே அடைக்கின்றார்கள். இத்தனை அழிவுகளையும் ஏற்படுத்திய கைதிகளை விடுதலை செய்திருக்கிறார்கள். இதுதான் இந்த நாட்டிலிருக்கின்ற சட்டம்! இதனையிட்டு நாங்கள் வெட்கப்படுகிறோம். இந்த நிலைமை மாற வேண்டுமென்று நாங்கள் வேதனையோடு சொல்கிறோம்.

அதுமட்டுமல்ல, පාස්කු ඉරිදා அன்று தாக்குதல்களை நடாத்திய பயங்கரவாதிகளைப்போலவே, இந்த நாட்டின் “பக்தர்கள்” என்று சொல்லிக்கொண்டு இருக்கின்ற இன்னுமொரு பயங்கரவாதக் கூட்டம் இருக்கிறது. அந்தக் கூட்டத்தைச் சேர்ந்தவர்கள்தான் மினுவாங்கொடையிலே அழிவுகளை ஏற்படுத்தினார்கள். நிக்கவரட்டியிலே 45 குடும்பங்களுக்குத் துன்பத்தை ஏற்படுத்தினார்கள். 22 வீடுகளை உடைத்து, நொறுக்கினார்கள். 15 வியாபார நிலையங்களை எரித்து, எங்களுடைய வியாபாரிகளுக்குப் பல பில்லியன் ரூபாய் நஷ்டத்தை ஏற்படுத்தியிருக்கிறார்கள். இரண்டு பள்ளிவாசல்களை உடைத்திருக்கிறார்கள். அதுமட்டுமல்ல, பண்டுவஸ்நுவர என்ற கிராமத்திலே 333 வீடுகளுக்குள் புகுந்து, சொத்துக்களைச் சூறையாடியிருக்கிறார்கள். 87 வியாபார நிலையங்களை எரித்து, சாம்பராக்கியிருக்கிறார்கள். அம்மக்களுக்கென இருந்த இரண்டு பொது இடங்களை அடித்து நொருக்கி, அவற்றை ஆகாத ஒரு நிலைக்குட்படுத்தியிருக்கிறார்கள்; 03 சகோதரர்களைக் காயப்படுத்தியிருக்கிறார்கள்; 91 வீடுகளை உடைத்திருக்கிறார்கள்; 15 பள்ளிவாசல்களை உடைத்திருக்கிறார்கள்; 42 வாகனங்களை உடைத்திருக்கிறார்கள். வாரியபொலவில் 02 குடும்பங்களை அடித்துத் துன்பப்படுத்தியிருக்கிறார்கள்; 02 வியாபார நிலையங்களை உடைத்திருக்கிறார்கள். குளியாப்பிட்டியிலே 53 குடும்பங்களுக்குத் துன்பத்தை ஏற்படுத்தியிருக்கிறார்கள்; 20 வியாபார நிலையங்களை அடித்து நொருக்கியிருக்கிறார்கள். அதுமட்டுமல்ல, பொதுக்கட்டடங்களை உடைத்திருக்கிறார்கள்; 07 பள்ளிவாசல்களை உடைத்திருக்கிறார்கள்; 31 வீடுகளை உடைத்திருக்கிறார்கள்; 02 பேரைக் காயப்படுத்தியிருக்கிறார்கள்; ஒரு வாகனத்தை உடைத்திருக்கிறார்கள். பிங்கிரியவிலே 24 குடும்பங்களுக்குத் துன்பத்தை ஏற்படுத்தியிருக்கிறார்கள்; 08 வியாபார நிலையங்களை உடைத்திருக்கிறார்கள்; ஒரு பொதுக் கட்டடத்தை உடைத்திருக்கிறார்கள்; 03 வீடுகளை உடைத்திருக்கிறார்கள்; 09 வாகனங்களை உடைத்திருக்கிறார்கள். சிலாபத்திலே 06 பள்ளிவாசல்களை உடைத்திருக்கிறார்கள். Facebook இலே ஏதோ ஒரு விடயத்தைப் பதிவிட்டார் என்பதற்காக ஒருவருடைய கடைக்குள்ளே புகுந்து, அட்டகாசம் புரிந்திருக்கிறார்கள்.

அதுமாத்திரமல்ல, தும்மோதரவிலே 11 வீடுகளை உடைத்திருக்கிறார்கள்; 2 வியாபார நிலையங்களை உடைத்திருக்கின்றார்கள்; 2 பள்ளிவாசல்களை உடைத்திருக்கின்றார்கள்; 9 வாகனங்களை உடைத்திருக்கின்றார்கள். கொட்டரமுல்லையிலே 4 பிள்ளைகளுடைய தந்தையான பௌசுல் அமீர்தீன் என்பவருடைய வாகனத்தை உடைத்தபொழுது, "நான் ஓர் ஏழை; என்னுடைய வாகனத்தை உடைக்காதீர்கள்" என்று கதறி அழுதார். நோன்பாளியான அவரை அந்தக் காடையர் கூட்டம் அடித்து, அவருடைய கழுத்தை வெட்டி, அவருடைய வாய்க்குள் 'அசிற்' ஊற்றி, அவருடைய பிள்ளைகள் பார்த்துக்கொண்டிருக்க அவரைக் கொலை செய்திருக்கின்றார்கள். நான் அங்கு சென்று பார்த்தேன். இவ்வாறெல்லாம் செய்த இவர்கள் பயங்கரவாதிகள் இல்லையா? இந்த நாட்டிலேயிருக்கின்ற சட்டம் இவர்களுக்கு ஒன்றும் செய்யாதா? இவர்கள் எல்லோரும் கைதுசெய்யப்பட்டு ஒரு வாரத்திலேயே விடுவிக்கப்பட்டார்கள்.

நேற்றைய தினம் நான் பார்த்தேன், கண்டி மாநகரத்திலே மதகுரு ஒருவர் உண்ணாவிரதம் இருக்கின்றார் என்று சொல்லி, "கடைகளை மூடிவிட்டுச் சந்திக்கு வாருங்கள்!" என்று மக்களை அழைத்திருக்கிறார்கள். வியாபாரிகளை மட்டுமல்ல, வேலை செய்கின்றவர்களையும் வாருங்கள் என்று அழைத்திருக் கிறார்கள். நாட்டிலே உள்ள எல்லோரையும் வாருங்கள் என்று அழைக்கின்றார்கள். தற்போது நாட்டிலே அவசரகாலச் சட்டம் நடைமுறையிலே இருக்கின்றது. அப்படி இருக்கின்றபொழுது, "வாருங்கள், நாட்டிலே உள்ளவர்களையெல்லாம் அழிப்போம்; கொலைசெய்வோம்; பயங்காட்டுவோம்; இந்த நாட்டிலே நிம்மதியைத் தொலைப்போம்; இந்த நாட்டைக் குட்டிச் சுவராக்குவோம்!" என்று மக்களை அழைக்க முடியுமா? இந்த நாட்டிலே 1983ஆம் ஆண்டிலே ஏற்பட்டதுபோல ஓர் இனக்கலவரத்தைத் தூண்டி, நாட்டை நாசமாக்குவதற்குச் சதி செய்வதைப் பொலிஸாரும் இராணுவமும் ஜனாதிபதி அவர்களும் பாதுகாப்பு அமைச்சர் அவர்களும் பார்த்துக் கொண்டு இருக்கின்றார்கள் என்றால் இது நியாயமா? என்று நான் கேட்கின்றேன். இதை ஏன் அனுமதிக்கின்றீர்கள்? என்று கேட்கின்றேன்.

ஏப்பிரல் 21ஆம் திகதி நாட்டிலே நடைபெற்ற ISIS அமைப்பின் பயங்கரவாதத் தாக்குதலை நாங்கள் வன்மையாகக் கண்டிக்கின்றோம். இந்த நாட்டிலிருக்கின்ற அதி உச்ச தண்டனையை அவர்களுக்கு வழங்குங்கள்! மரண தண்டனையாகவிருந்தாலும் அல்லது அதற்கு மேலாக எத்தகைய தண்டனையென்றாலும் அவர்களுக்கு வழங்குங்கள்! ஆனால், அப்பாவி முஸ்லிம்களைத் தண்டிக்காதீர்கள்! 2000க்கும் மேற்பட்டோர் இன்னும் சிறையிலே வாடுகின்றார்கள். இது றமழான் மாதம்! அவர்கள் குற்றம் செய்யவில்லை. 72 வயதுடைய மௌலவி ஜாபிர் ஹஸரத் அவர்கள் 'திவயின' பத்திரிகையினை வைத்திருந்தார் என்பதற்காக அவரைச் சிறையிலே அடைக்கச் சதி செய்தார்கள். கலீலுர் ரகுமான் என்பவர் ஒரு நிறுவனத்தை நடாத்திவந்தார். சுனாமியிலே பாதிக்கப்பட்டவர்களுக்கெல்லாம் முஸ்லிம்கள், தமிழர்கள் என்ற பாகுபாடு பார்க்காது வெளிநாடுகளிலிருந்து கொண்டு வந்த பணத்தில் வீடு கட்டிக்கொடுத்து உதவி செய்தார். அவ்வாறானவர்கள் எல்லாம் இன்று சிறையிலே இருக்கின்றார்கள். ஏன் இவ்வாறு செய்கின்றீர்கள்? என்று நான் கேட்கின்றேன். பயங்கரவாதத்தோடு சம்பந்தப்பட்டவர்களைக் கைதுசெய்யுங்கள்! பயங்கரவாதத்தோடு சம்பந்தப்பட்டவர்களைச் சிறையில் அடையுங்கள்! பயங்கரவாதத்தோடு சம்பந்தப்பட்டவர்களைத் தண்டியுங்கள்! ஆனால், அப்பாவிகளைத் தண்டிக்காதீர்கள்! ஏப்பிரல் 21ஆம் திகதி அந்தப் பயங்கரவாதச் சம்பவம் முடிவடைந்து 21 நாட்கள் கடந்த பின்னர்தான் மினுவான்கொடை, கொட்டரமுல்லை, நாத்தாண்டியா, சிலாபம், குளியாப்பிட்டி, நிக்கவரட்டி போன்ற இடங்களிலே 300க்கு மேற்பட்டவர்கள் எத்தனையோ கொலைச் சம்பவங்களிலும், அழிவுகளிலும் ஈடுபட்டார்கள். ஆனால், அவர்கள் எல்லாம் இன்று வீட்டிலே இருக்கின்றார்கள். நேற்றைய தினம் தலதா மாளிகைக்கு முன்னால் 3 முஸ்லிம் இளைஞர்களைக் காட்டுமிராண்டித்தனமாக அடித்துக் காயப்படுத்தியதை நான் பார்த்தேன். இது எந்த மார்க்கத்தில் இருக்கின்றது? இது தர்மமா? நோன்பாளிகளை அவ்வாறு அடித்துத் துன்புறுத்துகின்றார்கள். அதனைத் தண்டிக்கச் சட்டம் இல்லை, சம்பந்தப்பட்டவர்களுக்குத் தண்டனையும் இல்லை! இவ்வாறு எவரும் சட்டத்தைக் கையில் எடுக்க அனுமதிக்காதீர்கள்!

இந்த நாட்டிலே வாழுகின்ற 22,00,000 முஸ்லிம்களும் இந்த ISIS பயங்கரவாதம் ஒழிக்கப்பட வேண்டும், இந்த நாட்டிலிருந்து இதை வேரோடு பிடுங்கி எறியவேண்டும் என்பதையே விரும்புகின்றார்கள். அதற்கு முஸ்லிம் சமூகம் தயார்; உலமாக்கள் தயார்; முஸ்லிம் அரசியல் வாதிகள் தயார்! எதிர்காலத்திலே உங்களுடைய பிள்ளைகளோ, எங்களுடைய பிள்ளைகளோ இந்தப் பயங்கரவாதத்தினால் துன்பங்களை அனுபவிக்கக்கூடாது. தயவுசெய்து இந்த ISIS பயங்கரவாதிகளையும் இலங்கை முஸ்லிம்களையும் ஒன்றாகப் பார்க்காதீர்கள்! முஸ்லிம்களைக் கொல்வதற்காக, முஸ்லிம்களுடைய பொருளாதாரத்தை அழிப்பதற்காக, 54 முஸ்லிம் நாடுகளுடைய நிம்மதியைத் தொலைப்பதற்காக ஏகாதிபத்தியச் சதிகாரர்களால் உருவாக்கப்பட்ட பயங்கரவாதிகள்தான் இந்த ISIS அமைப்பினர். இவர்கள் குர்ஆனையோ ஹதீஸையோ நபி அவர்களையோ உண்மையான இஸ்லாத்தையோ பின்பற்றுபவர்கள் அல்லர். இஸ்லாம் கொலையை எதிர்க்கின்றது. கொலை, தற்கொலை என்பன இஸ்லாத்திலே தடுக்கப்பட்டிருக்கின்றது. ஒரு கொலையை ஒருவன் செய்தால், ஒரு சமுதாயத்தைக் கொலை செய்வதற்கு அது சமனாகும் எனவும், ஒருவருடைய உயிரை ஒருவன் பாதுகாத்தால் ஒரு சமுதாயத்தைப் பாதுகாப்பதற்குச் சமனாகும் என்று நபி ஸல்லல்லாஹு அலைஹி வஸல்லம் அவர்கள் சொல்லியிருக்கின்றார்கள். அதுதான் புனித இஸ்லாத்தின் வழிமுறையாகும்.

இஸ்லாம் அல்லது குர்ஆன், ஹதீஸ் தற்கொலையை, இன்னொருவரைக் கொலை செய்வதை, இன்னொருவரின் சொத்தை அபகரிப்பதை, இன்னொருவருக்குத் துன்பத்தை ஏற்படுத்துவதை அல்லது இன்னொரு மதத்தை அபகீர்த்தி செய்வதை, இன்னொரு மதத்துக்குக் கேடு விளைவிப்பதை அனுமதிக்கவில்லை. நாங்கள் இந்த நாட்டிலே பௌத்த மக்களோடும் இந்து மக்களோடும் கத்தோலிக்க மக்களோடும் சேர்ந்துவாழ ஆசைப்படுகின்றோம். முஸ்லிம் சமூகம் அவர்களோடு சேர்ந்து வாழ்ந்த ஒரு சமூகமாகும். வடக்கிலும் கிழக்கிலும் பயங்கரவாதம் இருந்தபோது அதற்கு எதிராகச் செயற்பட்டோம். பயங்கரவாதத்திற்குத் துணைபோகவில்லையென்று வடக்கிலிருந்து ஓரிலட்சம் பேர் வெளியேற்றப்பட்டிருந்தோம். பல உயிர்களைப் பலிகொடுத்திருந்தோம். இன்றும் நாங்கள் நிம்மதியையே எதிர்பார்க்கின்றோம். பயங்கரவாதத்தைத் தொலைப்பதற்கு அல்லது யாரையாவது விசாரிப்பதற்கு இந்த அரசாங்கத்திலே நாங்கள் அமைச்சராக இருப்பது தடையாக இருக்கின்றதென்றால் இராஜினாமா செய்ய நாங்கள் தயார் என்று நேற்று நான் மட்டுமல்ல, கௌரவ அமைச்சர் ரவூப் ஹக்கீம் அவர்கள், கௌரவ அமைச்சர் கபீர் ஹாஷிம் அவர்கள், கௌரவ அமைச்சர் அப்துல் ஹலீம் அவர்கள், இராஜாங்க அமைச்சர் கௌரவ அமீர் அலி அவர்கள், இராஜாங்க அமைச்சர் கௌரவ ஹரீஸ் அவர்கள், இராஜாங்க அமைச்சர் கௌரவ அலி ஸாஹிர் மௌலானா அவர்கள், இராஜாங்க அமைச்சர் கௌரவ பைஸால் காசிம் அவர்கள், பிரதி அமைச்சர் கௌரவ அப்துல்லா மஹரூப் அவர்கள் உட்பட நாங்கள் அனைவரும் எங்களுடைய அமைச்சுப் பதவிகளை இராஜினாமா செய்தோம். யாருக்கும் பயந்து நாங்கள் இராஜினாமா செய்யவில்லை. இந்த நாட்டுக்காக இராஜினாமாச் செய்தோம், இந்த அழகான இலங்கையைப் பாதுகாக்க வேண்டுமென்பதற்காக இராஜினாமா செய்தோம். நாங்கள் பதவிகளில் இருப்பதனால் இந்த நாடு பிளவுபட்டுவிடக்கூடாது. இந்த நாட்டிலே ISIS பயங்கரவாதிகள் மீண்டும் வந்து இந்த நிலையிலே ஊடுருவிவிடக் கூடாது. இந்த நாடு 30 வருட பயங்கரவாதத்தால் துன்பப்பட்ட நாடு! எனவே, இந்த நாட்டைப் பாதுகாக்க வேண்டும். இது நமது நாடு! பல ஆயிரம் வருடங்கள் இந்த நாட்டிலே வாழ்ந்த சமூகம் முஸ்லிம் சமூகம்! இந்த நாட்டிலே இனி ஒரு யுத்தமோ ஒரு குண்டுவெடிப்போ ஓர் அழிவோ வந்துவிடக்கூடாது. எங்களுடைய அழகான பூமியைத் தரிசிக்க சுற்றுலாப் பயணிகள் வரவேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)

இங்கே பயங்கரவாதம் இருந்தால், கொலைகள் நடந்தால், ஆர்ப்பாட்டம் நடந்தால், இவ்வாறான துன்பங்கள் நடந்தால், கடைகளை எரித்தால் வெளிநாட்டு முதலீட்டாளர்கள் வர மாட்டார்கள். இன்று இங்கே முஸ்லிம் கடைகளுக்குப் போகவேண்டாமென்று சொல்கின்றார்கள். ஆனால், முஸ்லிம் நாடுகளிலிருந்துதான் பெற்றோல் வருகின்றது. எனவே, முஸ்லிம் நாடுகளைப் பகைத்துக்கொண்டு இங்கே நாங்கள் வாழ முடியுமா? அல்லது வேறு நாடுகளைப் பகைத்துக்கொண்டு இலங்கைக்குள்ளே மட்டும் நாங்கள் வாழ்ந்தால் இலங்கையில் எல்லாத் தேவைகளையும் நிறைவேற்றக்கூடிய வகையில் எல்லாம் இருக்கின்றதா? சிறுபிள்ளைத்தனமாகப் பேசுகிறார்கள். மதகுருமார் சிலருடைய பேச்சுக்கள் மிகவும் அடிப்படைவாதத்தைத் தூண்டுகின்றன. முஸ்லிம் அடிப்படைவாதத்தை இல்லாமல் ஆக்குவோம் என்று நாங்களும் சொல்கின்றோம், நீங்களும் செல்கிறீர்கள்! சிங்கள அடிப்படைவாதங்களைப் பேசி இனங்களுக்கிடையே முறுகலை ஏற்படுத்த ஒரு கூட்டம் சதி செய்கின்றது. ஏன் அதைப்பற்றி நீங்கள் பேசுகிறீர்கள் இல்லை? உண்மையான இலங்கை பக்தர்களாக இருந்தால், இந்த நாட்டின்மீது பற்றிருந்தால் அவர்களையும் தடைசெய்யுங்கள்! இந்த நாட்டிலே சட்டம் இருந்தால் அவ்வாறான அடிப்படை வாதிகளுக்கு எதிராகவும் மற்றும் இனங்களுக்கிடையே முறுகலை ஏற்படுத்தி, இனங்களுக்கிடையே பிளவுகளை ஏற்படுத்தி, இந்த நாட்டைக் குட்டிச்சுவராக்குகின்றவர்களுக்கு எதிராகவும் நடவடிக்கை எடுங்கள்!

தாங்கள் பயங்கரவாதிகள் அல்லர், இந்தப் பயங்கரவாதத்தை ஒழிக்க வேண்டும், குறித்த பயங்கரவாதிகள் முஸ்லிம்கள் அல்லர் என்று 22 இலட்சம் முஸ்லிம்களும் சொல்லுகின்றபோது, இல்லை, இல்லை நீங்கள்தான் பயங்கரவாதிகளென்று சொல்கிறார்கள். பஸ்ஸிலே முஸ்லிம் பெண்கள் ஹிஜாப் போட்டுக்கொண்டு போகின்றபொழுது அந்தப் பெண்களை அவமானப்படுத்துகின்றார்கள். அது தொடர்பான video clip வெளியாகியிருக்கின்றது. தலதா மாளிகைக்கு முன்னால் முஸ்லிம் இளைஞர்களை அடித்தது தொடர்பான video clip வெளிவந்திருக்கிறது. கடைகளை எரித்தவர்களை நன்றாகத் தெரியும். ஆனால், அவர்களைச் சிறையிலே அடைக்கிறார்கள் இல்லை. அவர்களை ஏன் சிறைகளில் அடைக்கச் சொல்லுகின்றோம்? அவர்களில் எங்களுக்குத் தனிப்பட்ட கோபம் இல்லை. சட்டத்தைக் கையிலெடுத்து இவ்வாறான அழிவுகளை யார் செய்தாலும், அது பௌத்தரா, இந்துவா, கத்தோலிக்கரா, இஸ்லாமியரா என்று பிரித்துப் பார்க்காதீர்கள்! அவர்களுக்குத் தண்டனை வழங்குங்கள்! இல்லையென்றால் இந்த அழகான பூமியை நாளை யாரும் தரிசிக்க வரமாட்டார்கள். இந்த நாடு பொருளாதாரத்திலே மிக மோசமான நிலையில் இருக்கின்றது.

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

இந்த நிலை தொடருமானால் இன்னும் அதலபாதாளத்திற்குப் போய்விடும். முன்னாள் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களுக்குக் கடமை உணர்வு இருக்கின்றது. இந்த நிலையிலே அவரும் எங்களுடைய ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களும் அதேபோல, எங்களுடைய பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்களும் ஒன்றுசேர்ந்து செயற்பட வேண்டும். அதாவது, இந்த நிலையிலே எவ்வாறு இந்த நாட்டைக் காப்பாற்றலாம்? இந்தப் பயங்கரவாதத்தைத் எவ்வாறு துடைத்தெறியலாம்? இந்தப் பயங்கரவாதத்திற்கு எதிரான அப்பாவி முஸ்லிம்களைச் சேர்த்துக்கொண்டு நாங்கள் எவ்வாறு பயணிக்கலாம்? என்று இந்த மூன்று தலைவர்களும் சேர்ந்து பேச வேண்டும். இந்த நாட்டிலே ஒருசில அரசியல்வாதிகளுக்கு வாக்குக் கிடைக்காது. மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய முகத்தைக் காட்டி வாக்குத் தேடுகின்றவர்கள் சொல்கின்றார்கள் என்பதற்காக இனவாதத் தீயை இந்த நாட்டிலே கக்குவதற்கு முன்னாள் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்கள் ஒருபோதும் இடங்கொடுக்கக் கூடாது என்று மிகவும் அன்பாக நான் வேண்டுகோள் விடுக்கின்றேன். இந்த நாட்டிலே ஒற்றுமையை ஏற்படுத்து கின்ற பேச்சுக்களைப் பேசுங்கள்!

நான் இந்தப் பயங்கரவாதத்தோடு அணுவளவும் சம்பந்த மில்லாதவன். அப்படி ஏதாவது நீங்கள் சந்தேகப்பட்டால், என்மீது ஏதாவது குற்றமிருந்தால், media இலே பேசுவதை விட்டுவிட்டு, அங்கே இங்கே ஊர்வலம் செல்வதை விட்டுவிட்டுப் போய் CID இலே entry போடுங்கள்! பொலிஸிலே முறைப்பாடு கொடுங்கள்! அவ்வாறு செய்து எங்களை விசாரியுங்கள்! எந்த நிமிடமும் நாங்கள் விசார ணைக்கு ஒத்துழைப்பு வழங்கத் தயாராக இருக்கின்றோம். இந்தப் பயங்கரவாதத்துக்கு ஆதரவாக இருந்து நான் ஒரு தவறும் செய்யவில்லை. அவ்வாறு செய்ததாக நீங்கள் நிரூபிப்பீர்களாக இருந்தால், அவ்வாறு செய்ததாக CID இனரோ பொலிஸாரோ கண்டுபிடிப்பார்களாக இருந்தால், இந்த நாட்டிலேயிருக்கின்ற அதியுச்ச தண்டனையைத் தாருங்கள்! மரண தண்டனையாக இருந்தாலும் அதைத் தாருங்கள்! என்று கேட்கின்றேன். ஆனால், என்னைக் காட்டி என் சமுதாயத்தைப் பலியாக்காதீர்கள்! என்னைக் காட்டி எங்களுடைய முஸ்லிம்களின் வியாபாரத்தைத் தொலைக் காதீர்கள்! உங்களுடைய அரசியலுக்கு நாங்கள் உதவி செய்யவில்லை என்பதற்காக அநியாயமாக எங்களுடைய சமுதாயத்தின்மீது பழிதீர்க்காதீர்கள்! பதவியை, பட்டத்தை, அந்தஸ்தை, ஆட்சியைத் தருபவன் இறைவன் என்பதை நம்பியவன் நான் என்பதனால் இதனைச் சொல்கின்றேன். ஆகவே, மிகவும் நிதானமாக நடந்துகொள்ளுங்கள் என்று தாழ்மையாகக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

[අ.භා. 5.22]

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2015 ජනවාරි මාසයේ 08 වන දා රට වෙනුවෙන් දැක්මක්, ප්‍රතිපත්තියක් නැතුව, පෞද්ගලික විරෝධයක් වෙනුවෙන් මහින්ද රාජපක්ෂ මැතිතුමා පරාජයට පත් කිරීම සඳහා ගොනායි, බීමායි වාගේ එකට එකතුවෙලා මේ රටට කරපු සමාජ, දේශපාලන, ආර්ථික විනාශය තමයි රිසාඩ් බදියුදීන් මැතිතුමා දැන් ටිකකට කලින් ප්‍රකාශ කළේ. මේ රටේ සෑම කොනකම නැවත වතාවක් ජාතිවාදී ගැටුම් ඇති කරන්න, සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් ජනතාව අතර ගැටුම් ඇති කරන්න, ආගමික අන්තවාදය පතුරවන විවිධ කණ්ඩායම් අතර ගැටුම් ඇති කරන්න, මේ රටේ ඇතිවෙලා තිබෙන සමාජ සංස්ථා විභේදනය කරන්න, දේශපාලන නිදහස නැති කරන්න, රටේ ආර්ථිකය ඝාතනය කරමින් මේ රට වළපල්ලට දමන්න යන ගමනක් තමයි 2015 ජනවාරි මාසයේ 08 වන දා මේ රටේ පටන් ගත්තේ. ඒ ගමනේ ප්‍රධාන වගඋත්තරකරු හැටියට අද මේ රට විනාශයට පත් කරන මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට, ආරක්ෂාව භාරව සිටින ඇමතිතුමාට ඔය චෝදනා ටික ඔබතුමා කියන්න. ඔබතුමා ගිහින් ඔය චෝදනා ටික කරන්න, අගමැති රනිල් වික්‍රමසිංහ මහත්මයාට. මේ රටේ ජාතීන් අතර එකඟතාව, අන්‍යෝන්‍යතාව වෙනුවෙන් අපේ මට්ටමින් දෙන්න පුළුවන් සහයෝගය අපි දෙනවා. හැබැයි නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ, මේ රටේ ජනාධිපතිවරයාත්, අගමැතිවරයාත්ය කියන කාරණය ඔබතුමාට මතක් කරනවා. මේ රටේ නීතිය පාලනය කරන්නේ අපි නොවෙයි. මේ රටේ ආරක්ෂාව, මේ රටේ මුස්ලිම් ජනතාවගේ, ද්‍රවිඩ ජනතාවගේ, සිංහල ජනතාවගේ ආරක්ෂාව තහවුරු කරන්න ඕනෑ මේ රටේ රජයයි කියන එකත් අපි මතක් කරනවා. මේ ආණ්ඩුව බලයට පත්වුණාට පස්සේ දිගන, ගිංතොට, අම්පාර ඇතුළු ප්‍රදේශවල ජාතිවාදී කලකෝලාහල ඇති වුණා. දැන් ඒක පැතිරිලා ගිහින් තිබෙනවා. මේ රටේ නිදහසේ ජීවත් වුණු මිනිසුන්ට හදිසි නීතිය දමලා, ඇඳිරි නීතිය දමලා සාමාන්‍ය ජන ජීවිතය පවත්වාගෙන යන්න බැරි මට්ටමට රට දණ ගැස්සුවේ මේ යහ පාලන රජයයි කියන කාරණය අපි මතක් කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒකේ දිගුවක් හැටියට "යන යකා කොරහත් බිඳගෙන යනවා"යි කිව්වා වාගේ අද මේ රට ආර්ථික වශයෙන් වැටිලා තිබෙනවා.

මේ රටේ තේ කර්මාන්තය පිළිබඳව අද කථා කරනවා. මේ රටේ තේ කර්මාන්තශාලා හිමියන්ට, මේ රටේ කුඩා තේ වතු හිමියන්ට, මේ රටේ ආර්ථිකයට, වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයට ඇතිවෙලා තිබෙන හානිය අද අපට මොනවට පැහැදිලිවෙලා තිබෙනවා. මේ රජය බලයට පත්වනකොට මේ රටේ තේ කර්මාන්තයට තිබුණු කලදසාව ගැනත්, අද පත්වෙලා තිබෙන තත්ත්වය ගැනත් අපි දීර්ඝ වශයෙන් විස්තර කරන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. නමුත් ලැබී තිබෙන කාලය ඒ සඳහා ප්‍රමාණවත් නැහැ. මේ රටේ තේ කර්මාන්තශාලා 729කින් කර්මාන්තශාලා 30කට වඩා වැඩි ප්‍රමාණයක් වෙන්දේසි කරන්න අද බැංකුවලින් දැන්වීම් පළ කර තිබෙනවා. කර්මාන්තශාලා 30ක් වෙන්දේසි කරන්න ලෑස්ති කර තිබෙනවා. ඒ කර්මාන්තශාලා දියුණු කරන්න ඒ ආයෝජකයින් ගත්ත ණය ගෙවා ගන්න බැරිවෙලා තිබෙනවා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේදී ලබාගත් ණය සඳහා වූ සියයට 6, සියයට 7 පොලී අනුපාතය අද සියයට 18 දක්වා වැඩිවෙලා තිබෙනවා. එක පැත්තකින් පොලිය වැඩිවෙලා තිබෙනවා. අනික් පැත්තෙන් තේ කර්මාන්තයේ ඵලදායිතාව සම්පූර්ණයෙන් ඇණහිට තිබෙනවා. අද නැවත වගාවක් සිද්ධ වෙන්නේ නැහැ. අද තේ කර්මාන්තයේ නැවත වගාව සියයට 1යි. සියයට 3කින්, සියයට 4කින් සිද්ධ විය යුතු නැවත වගාවට ආධාර ලබා දෙන්නේ නැති නිසා තේ කර්මාන්තය සම්පූර්ණයෙන්ම කඩා වැටෙමින් තිබෙනවා. හෙක්ටෙයාර එකකට ලබාදෙන රුපියල් ලක්ෂ 5ක ආධාර මුදල ප්‍රමාණවත් නැහැ, ඒ මුදල දෙගුණ කරන්නය කියා තේ කර්මාන්තයේ නියැලෙන කුඩා තේ වතු හිමියනුත්, කර්මාන්තශාලා හිමියනුත් ඉල්ලීම් කරනවා. රජය ඒවාට ඇහුම් කන් දෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එක පැත්තකින් නැවත වගාවට ආධාර ලැබෙන්නේ නැහැ. අනික් පැත්තෙන් තේවල ප්‍රමිතිය ඉහළ මට්ටමට ගෙන යන්න අවශ්‍ය තේ පැළ මේ රටේ නැහැ. තේ පර්යේෂණ ආයතනයෙන් හෝ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියෙන් සහතික කළ පැළ ලබා ගන්නට නොහැකියාවක් තිබෙනවා, ඉතාම දුෂ්කර තත්ත්වයක් තිබෙනවා. වසර ගණනාවකින් ලංකාවේ තේ පැළවල තත්ත්වය වර්ධනය වෙලා නැහැ. ක්ලෝනකරණය පරණ මට්ටමේ තමයි සිදු වන්නේ.

ඉතා පැරණි ප්‍රභේද තමයි ලංකාවේ තේ වගාවට තවමත් එකතු වෙන්නේ. පැරණි තේ පැළවලින් අලුත් තාක්ෂණය යටතේ ඵලදාව ලබා ගන්නට හැකියාවක් නැති බව තේ කර්මාන්තයේ නියුතුව සිටින සෑම කෙනෙක්ම ප්‍රකාශ කරනවා.

නැවත වගාවක් නැහැ, අලුත් පැළ ගන්න විධියක් නැහැ, ගන්න පැළවල තත්ත්වය, ගුණාත්මක මට්ටම ඉතාම පහළයි. පසුගිය වසර කීපය පුරාවටම පොහොර ගන්න විධියක් තිබුණේ නැහැ. මේ රටේ ගොවි ජනතාවගේ ගෙල සිර කළා. කුඹුරු ටිකට, රබර් ටිකට, තේ ටිකට දෙන්න තිබුණු පොහොර නැති කරලා, මේ රටේ ගොවි ජනතාවගේ ගෙල සිර කළා. ඔවුන්ගේ ගෙල සිර කරපු නිසා තේ වගාවටත් එහි ප්‍රතිඵල ඇවිල්ලා, මේ රටේ ඵලදායීතාව, නිෂ්පාදන ධාරිතාව ඉතාම පහළට වැටුණා. සාමාන්‍යයෙන් ලංකාවේ අද තේ අක්කරයකින් ගන්න පුළුවන් ඵලදාව කිලෝග්‍රෑම් 250ට අඩු වෙලා තිබෙනවා. ලෝකයේ අනිකුත් රටවල්වල එනම් කෙන්යාවේ, ඉන්දියාවේ, චීනයේ තේ අක්කරයකින් කිලෝග්‍රෑම් 500ක ප්‍රමාණයක් ලබා ගන්න පුළුවන් මට්ටමට අද තාක්ෂණය දියුණු වෙලා තිබෙනවා. අපට ඒ ප්‍රමාණයෙන් භාගයයි ලැබෙන්නේ. තාක්ෂණයේ අඩුකම නිසාත්, නැවත වගාවක් නොමැතිකම නිසාත් තේ කර්මාන්තශාලා හිමියන්ට තමුන්ගේ කර්මාන්තශාලා පවත්වාගෙන යන්න ලැබෙන තේ දළු ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. මේ හැම කර්මාන්තශාලාවක්ම තමුන්ගේ ධාරිතාව ඉතාම අඩු මට්ටමකින් -undercapacity- තමයි පවත්වාගෙන යන්නේ. ඔවුන්ට ලැබෙන ලාභය අඩු වෙලා තිබෙනවා. තේ කර්මාන්තයෙන් ලක්ෂ හතර හමාරක්, පහක් සෘජුව වාගේම ලක්ෂ 20ක ජනතාවක් වක්‍රව යැපෙනවා. ග්‍රාමීය මට්ටමින් මේ රටේ ජනතාව විශාල ප්‍රමාණයක් යැපෙන ප්‍රධාන කර්මාන්තයක් වන තේ කර්මාන්තයට මේ විධියට පහර වැදෙන කොට, තේ කර්මාන්තශාලා වැහෙන කොට මේ රටේ ආර්ථිකය නැවත ගොඩ නඟන්න බැරි මට්ටමින් ඉතාම අකර්මණ්‍යතාවකට පත් වෙලා තිබෙනවා.

මේ රටේ තේ කර්මාන්තයෙන් ලබන අපනයන ආදායම 2020 වසර වන කොට ඇමෙරිකානු ඩොලර් බිලියන 5 දක්වා වැඩි කරන්න අපි ඉලක්කගත කරගෙන හිටියා. හැබැයි, අද තිබෙන තත්ත්වය යටතේ අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 1.5යි. පසුගිය වසරට සාපේක්ෂව අපනයන ආදායමත් අඩු වෙලා තිබෙනවා. මීට මාස කීපයකට කලින් තේ කිලෝවක් සඳහා රුපියල් 100ක මිලක් ලැබෙනවා අපි දැක්කා. ඵලදායීතාව සහ පොහොර අඩුකම නිසා ඇති වෙච්ච නිෂ්පාදනයේ අඩුකම හේතුවෙන් මිල වැඩි වුණා. දැන් නැවත වතාවක් තේ කිලෝවක් සඳහා ලබා දෙන මිල රුපියල් 80, රුපියල් 85 දක්වා අඩු වෙලා තිබෙනවා. කුඩා කර්මාන්තශාලා හිමියන් වාගේම කුඩා තේ වතු හිමියන් මේ හරහා විශාල අර්බුදයකට ලක් වෙලා තිබෙනවා. නැවත පැළ සිටුවීම සඳහා ලබා දෙන ආධාරය වැඩි කරන්න කියලා අපි ආණ්ඩුවට යෝජනා කරනවා. තේ කර්මාන්තශාලා හිමියන් ලබා ගෙන තිබෙන ණය reschedule කරන්න, ඔවුන්ට නැවත සහන කාල සීමාවක් බැංකුවලින් ලබා දෙන්න, තේ කර්මාන්තය වෙනුවෙන් තමුන් ලබා ගත් ණය දීර්ඝ කාලීනව ගෙවන්න අවශ්‍ය පසුතලය සකස් කරලා දෙන්න කියලා අපි ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. හැබැයි අපට ඒ ගැන විශ්වාසයක් නැහැ.

පසුගිය වසර කිහිපය තුළ වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ කිසිම දියුණුවක් තිබුණේ නැහැ. රජය සතුව තිබිලා පසුව වැවිලි සමාගම්වලට පවරා දීපු තේ කර්මාන්තශාලා සියල්ලත් දැන් පෞද්ගලික අංශයට බදු දෙනවා. ඔවුන්ට ඒවා කරගෙන යන්න විධියක් නැහැ. අනික් පැත්තෙන් තේ ශක්ති අරමුදල සම්පූර්ණයෙන් විනාශ කරලා, තේ ශක්ති අරමුදල යටතේ පවත්වාගෙන යන කර්මාන්තශාලා සියල්ලම පාඩු ලබන තත්ත්වයට පත් කරලා, ඒවා බදු දෙන්න ලෑස්ති කරලා තිබෙනවා.

අනෙක් පැත්තෙන් රාජ්‍ය වැවිලි සමාගමට අයත්ව තිබුණු වතුවල අලුතෙන් වගාවක් සිදු නොකළ නිසා, නැවත මේ වගාව ප්‍රවර්ධනයට කටයුතු නොකළ නිසා සහ තිබුණු වගා ඉවත් කරලා අපේ සෞඛ්‍යයට අහිතකර, අපේ දේශීය ආර්ථිකයට කිසිම පණක් ලබා නොදෙන  කටු පොල් වගාව ප්‍රවර්ධනය කිරීම නිසා විශාල ලෙස තේ නිෂ්පාදනය පහත බැහැලා තිබෙනවා. මේ කරුණු සියල්ල සලකා බැලීමේදී තේ වගාව සම්බන්ධයෙන් ලංකාවේ අනාගතය ඉතාම දුක්ඛිත තත්ත්වයට පත් වෙලා තිබෙනවා. සමහර තේ කර්මාන්තශාලා හිමියන් තේවලට සීනි මිශ්‍ර කර තේවල ගුණාත්මකභාවය අඩු කළ නිසා "Ceylon Tea" කියන නාමය සම්පූර්ණයෙන් අද අඳුරු වෙලා ලෝකයේ තවත් එක් තේ නිෂ්පාදන රටක් බවට අපේ රට පත් වෙමින් තිබෙනවා. ඒ නිසා මම විශ්වාස කරනවා, මේ සම්බන්ධව රජයට වගකීමක් තිබෙනවා කියලා. අපේ රටේ ජීවනාලිය බඳු තේ වගාව, අනාදිමත් කාලයක සිට අපේ ආර්ථිකයට විශාල ශක්තියක් ලබා දීපු තේ වගාව ආරක්ෂා කරන්නට ආණ්ඩුවට පැහැදිලි වගකීමක් තිබෙනවා. මේ සම්බන්ධව ඉන්නා ඇමතිවරයාට ඒ පිළිබඳ පැහැදිලි වගකීමක් තිබෙනවා. ඒ ඇමතිතුමා ඒ වගකීම් හරිහැටි තේරුම් අරගෙන කටයුතු කරනවාද කියන සැකය අපට තිබෙනවා.

අපි දැක්කා, පසුගිය දවස්වල ගාලු කොටුව අභ්‍යන්තරයේ පිහිටි කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ගාල්ල කාර්යාලය ගාලු නගරයෙන් පිටතට ගෙන ගිය බව. රුපියල් කෝටි 30ක්, 40ක් වටිනා ඉතා අනර්ඝ රජයේ දේපළක් ඒ ස්ථානයෙන් ඉවත් කරලා, තමන්ට අයිති ස්ථිර රජයේ ගොඩනැගිල්ලක් තිබියදී, මාසික  බදු පදනමක් යටතේ රුපියල් ලක්ෂ දෙකක මුදලකට ගාලු නගරයෙන් පිටත වෙනත් ගොඩනැඟිල්ලකට අරගෙන ගියා. දැන් අද කථා වෙනවා, දැවැන්ත වටිනාකමක් තිබෙන, රුපියල් කෝටි ගණනක් වටිනා ගාල්ල කොටුව අභ්‍යන්තරයේ තිබෙන මේ අනර්ඝ රාජ්‍ය දේපොළ ඇමතිවරයාගේ හිතවතුන් හරහා  විදේශීය සමාගමකට බදු පදනම යටතේ තුට්ටු දෙකකට පවරන්න සූදානම් වෙනවා කියලා. මේ, රජයේ දේපොළ. මේවා දීර්ඝ කාලයක් තිස්සේ මේ රටට වත්කම් උපයලා දෙන්න භාවිත කරපු ආයතන. අද තේ ශක්ති කර්මාන්තශාලා ටික ඉවරයි. කුඩා තේ වතු හිමියන්ගේ අනාගතය සම්පූර්ණයෙන්ම අඳුරුයි. අනෙක් පැත්තෙන් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සතු ජාතික දේපොළ වත්කම් විනාශ කරන්න, විකුණලා දාන්න ආණ්ඩුව කටයුතු කරනවා. "යන යකා කොරහත් බිඳ ගෙන යනවා" කිව්වා වාගේ, පසුගිය සතියේ ගාල්ල දිස්ත්‍රික්කයේ තිබෙන අනර්ඝතම වතු යාය වන වලහන්දූව රාජ්‍ය වතු යාය හෙක්ටෙයාර් 400ක් තමන්ගේ දේශපාලන හිතවතුන්ට බෙදලා දෙන්න ගැසට් නිවේදනයක් නිකුත් කර තිබෙනවා අපි දැක්කා. වලහන්දූව රාජ්‍ය වතු යායේ හෙක්ටෙයාර 400ක් රජයෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට -LRC එකට-  අරගෙන ඒ හරහා තමන්ගේ දේශපාලන හිතවතුන්ට බෙදා දෙන්න වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. මේ ආණ්ඩුව භාර ගත්ත දවසේ ඉඳලා රාජ්‍ය දේපොළ විනාශ කළා; රාජ්‍ය සම්පත් අවභාවිත කළා; තමුන්ගේ දේශපාලන හිතවතුන් තර කරන්නට මේ සම්පත් භාවිත කළා. ඒ නිසා අපි ඉල්ලා සිටින්නේ, ආණ්ඩුවට මේ පිළිබඳ වැඩ පිළිවෙළක් නැත්නම්, ආණ්ඩුව අඛණ්ඩව මේ රටේ ජනතාව ආර්ථිකමය, සමාජමය, දේශපාලනමය වශයෙන් අපහසුතාවට පත් කරන එකට අවසානයක් නැත්නම්, ජනතාවගේ නාමයෙන්, මේ රටේ මාතෘ භූමියේ නාමයෙන් තමුන්නාන්සේලා බලය අතහැරලා ගෙදර යන්න කියලායි. එය තමයි මේ රටට කරන්න තිබෙන ලොකුම යුතුකම. මේ රටේ ජනතාවට ඊට එහා බලාපොරොත්තුවක් නැති බවත් ප්‍රකාශ කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි. මීළඟට, ගරු ටී. රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා.

[අ.භා. 5.32]

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බොහොම ස්තුතියි. අද දින තේ පර්යේෂණ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ දෙවෙනි වර කියවීමේ විවාදය පවතින අවස්ථාවේදී, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරමින් විෂයභාර ඇමතිතුමා විසින් යම් ආකාරයක කරුණු පැහැදිලි කිරීමක් කළා. මේ පනත් කෙටුම්පතේ අඩංගු වෙලා තිබෙන වගන්ති කරුණු සහ පරමාර්ථ සම්බන්ධව අපේ කිසිදු විරෝධතාවක් නැහැ. මේ පනත් කෙටුම්පතේ අඩංගු කරලා තිබෙන ඇතැම් වගන්ති ඉතාම අවශ්‍යයි. මේවා සිදු විය යුතුයි. ඒ සම්බන්ධව තර්කයක් නැහැ. අපි ඒවාට එකඟ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා ගරු සභාව අමතමින් කිව්වා, මේ පර්යේෂණ සඳහා වැවිලි කර්මාන්ත ඇමතිවරයා විධියට මුදල් ප්‍රතිපාදන ඉල්ලා සිටියාට එතුමාට භාණ්ඩාගාරයෙන් මෙම මුදල් ප්‍රතිපාදන ලැබෙන්නේ නැත කියලා. ඒක ඉතාම කනගාටුදායක තත්ත්වයක්. ඒ වාගේම රජයේ ප්‍රබල වගකිවයුතු ඇමතිවරයෙක් හැටියටත් තමන්ට භාර දීලා තිබෙන විෂය පථය අනුව අදාළ මුදල් ප්‍රතිපාදන ලබා දෙන්නේ නැහැයි කියලා පාර්ලිමේන්තුවේදී කියනවා නම්, ඒ ඇමතිවරයාගේ තිබෙන බංකොළොත්භාවය හෝ වැඩ බැරිකම තමයි අපට පෙනෙන්නේ. හැබැයි, පර්යේෂණ සඳහා භාණ්ඩාගාරයෙන් මුදල් දෙන්නේ නැහැයි කියනකොට කියන්න ඕනෑ, පසුගිය දිනවල සිංහල, දෙමළ, ඉංග්‍රීසි පත්තරවල පිටු පිරෙන්න දැන්වීම් දාලා තිබුණු බව. පත්තරවල පිටු පිරෙන්න වර්ණ දැන්වීම් දාලා "වැවිලි සවිය" සඳහා රුපියල් මිලියන සිය ගණනක් වියදම් කරනකොට, තමන්ගේ දේශපාලන ප්‍රතිරූපය පුම්බන්න, තමන්ගේ ආණ්ඩුවේ දේශපාලන ප්‍රතිපත්තීන් මේ ක්ෂේත්‍රය හරහා ගෙනයන්න කටයුතු කරනකොට, පර්යේෂණ සඳහා ඒ මුදල් ටික දැම්මා නම් මොකද කියන ප්‍රශ්නය අපට අහන්න වෙනවා.

හැබැයි එවැනි දෙයක් කරන්නේ නැතිව, "ආණ්ඩුවෙන් -මහා භාණ්ඩාගාරයෙන්- සල්ලි දෙන්නේ නැහැ" කියනවා. එක අතකින් භාණ්ඩාගාර ලේකම්වරයා ඇතුළු භාණ්ඩාගාර නිලධාරින්ට වග කීමකුත් තිබෙනවා, ඇමතිවරු මුදල් කාබාසිනියා කරනවා නම් සල්ලි නොදී සිටීමට. එහෙම නම් 'වැවිලි සවිය'ට ගත්ත සල්ලි ටික පර්යේෂණවලට දාලා ඒ ටික කරන්න තිබුණා නේ. එහෙම කරන්නේ නැතුව පාර්ලිමේන්තුවට ඇවිත් තමන්ගේ බැරි බැරියාව වහගෙන, ආණ්ඩුවේ ඇමතිවරු තමන්ගේ අඳෝනාව කියනවා. අපට ඇහෙන්න ඒවා කියලා වැඩක් නැහැ.

මීට ටික වෙලාවකට කලින් රිසාඩ් බදියුදීන් හිටපු ඇමතිවරයා යහ පාලනයේ ශෝකාලාපය අපි ඉස්සරහ රටටම කිව්වා. නීතිය රජයන්නේ නැහැ ලු. එක ජන කොට්ඨාසයකට පහර දෙනවා ලු. නීතිය කාටත් සමාන වෙන්න ඕනෑ කියලා. එතුමා ඇහුවා, මේකද නීතිය කියලා. ඒක කියන්න ඕනෑ අපටද? රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා ඒක කියන්න ඕනෑ, ජනාධිපතිතුමාට හෝ අගමැතිතුමාට. ඒ වාගේම මේ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයට. එහෙම නොකර අපේ පැත්තට අත දික් කරලා අපෙන් අහනවා, "මෙහෙමද, මෙහෙමද, මෙහෙමද?" කියලා. ලජ්ජා වෙන්න ඕනෑ. යහ පාලනයේ අවුරුදු හතරහමාරක ශෝකාලාපය දැන් මෙතැන කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඉදිරි දින 120 ඇතුළත තවත් බොහෝ ඇමතිවරු තම තමන්ගේ ශෝකාලාප ඉදිරිපත් කරයි. ශෝක ප්‍රකාශ, දැන්වීම් සහ යෝජනා ඉදිරිපත් කරයි, "යහ පාලනයේ සිද්ධ වෙච්ච දෙයක් නැහැ" කියලා. හැබැයි, එදා රිසාඩ් බදියුදීන් මන්ත්‍රීවරයා ඇතුළු ඒ කණ්ඩායම යහ පාලනය රජ කරවන්න, මාස හැටෙන් ස්ථාවර රටක් හදන්න, දින 100න් අලුත් රටක් හදන්න ගිහිල්ලා හදපු රට තමයි දැන් මේ තිබෙන්නේ. දැන් අඬනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද ගරු සභාවේ විවාද කරන්නේ, තේ පර්යේෂණ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත ගැන. හැබැයි එතුමා මෙතැන කථා කළේ, සහජීවන පර්යේෂණ පනත ගැන. සහජීවන පර්යේෂණයෙන් ආණ්ඩුව fail. අපි අද කථා කරන්නේ, තේ පර්යේෂණ මණ්ඩල පනතේ සංශෝධන ගැන. හැබැයි, ඔබතුමියත් එතුමාට ඕනෑ තරම් කථා කරන්න දුන්නා. ස්ථාවර නියෝගවලට අනුව එය පටහැනි බව මම කිව්වා. නමුත්, මම කියපු දේ පිළිගත්තෙත් නැහැ. කමක් නැහැ. ඒ කොහොම නමුත්, මේ ආණ්ඩුවේ ඇමතිවරුන්ගේ බැරි බැරියාව තමයි අද මෙතැන කියැවෙන්නේ. ඒ නිසාම, අතන උපවාස කරනවා; මෙතැන උපවාස කරනවා; දළදා මාළිගාව ළඟ රතන හාමුදුරුවෝ උපවාස කරනවා කියලා අපට කියලා වැඩක් නැහැ. ආණ්ඩු කරන අය දැන ගන්න ඕනෑ එවා නොවන සේ කටයුතු කරන්න.

අනෙක් එක දැන් බලනකොට සහරාන්ලාත් එක්ක, ISIS එකත් එක්ක කවුරුවත් සම්බන්ධකම් පවත්වලා නැහැ නේ. කවුරුවත් සම්බන්ධකම් පවත්වලා නැහැ. ඒකට මේ ආණ්ඩුවේ කවුරුවත් උඩගෙඩි දුන්නේ නැති විධියට තමයි කථා කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, යම් ඇමතිවරයෙක් තමන්ගේ තනතුරෙන් ඉල්ලා අස් වුණාට පස්සේ පිටුපස ආසනයකට යන හැටි අපි දැක්කා. ගරු රවි කරුණානායක ඇමතිතුමා මුදල් ඇමතිවරයා හැටියට මේ මුල් පේළිවල හිටියා. එතුමා ඉල්ලා අස් වුණාම පිටුපස එහා කෙළවරේ පුටුවකට ගිහින් වාඩි වෙලා හිටියා. තිලක් මාරපන ඇමතිතුමා ඉල්ලා අස් වුණා. එතුමාත් ඊට පස්සේ එහා පැත්තට ගියා. හැබැයි, ඉල්ලා අස් වෙච්ච බදියුදීන්ලාගේ කණ්ඩායම ඉස්සරහ පුටුවල ඉඳගෙන කථා කරනවා. ගරු කථානායකතුමාට බැරිද ඒගොල්ලන්ට හරියට ආසන ලැහැස්ති කරන්න? නියම ආසන ලබා දෙන්න බැරිද? එහෙම ලැහැස්ති නොකරන්නේ, ඒගොල්ලෝ ඉල්ලා අස් වුණා කියන්නේ නාමිකව නිසා. එය ජනතාව රවට්ටන්න කරපු බොරුවක්. ඉල්ලා අස්වුණා නම් යන්න එපාය පසු පෙළට. කිව්වේ, "අපි යනවා පසු පෙළට" කියලා. හැබැයි, ඉන්නේ ඉදිරි පෙළ. තමන්ගේ නිල වාහන, කාර්යාල සහ තමන් පත් කරපු ලේකම්වරු, සභාපතිවරු හා ක්‍රියාකාරී මණ්ඩල අධ්‍යක්ෂවරු ඔක්කෝම තියාගෙන කියනවා, "පර්යේෂණවලට සහය දෙන්න අපි ඉල්ලා අස් වුණා" කියලා. අනේ, ෂෝක්. එහෙමයි ඉල්ලා අස් වෙන්න ඕනෑ. අදත් ඒ ආසනවල ඉඳගෙන ආණ්ඩුවට, විපක්ෂයට හා රටට අභියෝග කරනවා, "පුළුවන් නම් ඔප්පු කරන්න" කියලා. ඉල්ලා අස් වුණා නම්, ලජ්ජා නැද්ද ඉදිරි පෙළ ආසනවල ඉන්න? යන්නකෝ පිටු පස්සට. පුටුව දාලා යන්න අකැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම-

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

Madam Presiding Member, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා, ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා දැන් ටික වෙලාවකට කලින් හිටපු ඇමතිතුමාට කථා කරන්න දුන්නෙත් නැහැ. දැන් අපි පරීක්ෂණයක් ඉල්ලනකොට පරීක්ෂණයක් කරන්නත් එපා කියනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එය රීති ප්‍රශ්නයක් නොවෙයි. ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
වාඩි වෙන්න. වාඩි වෙන්න. ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමනි, වාඩි වෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම නැවත මගේ මාතෘකාවට එනවා. කර්මාන්තශාලාවලදී තේවලට සීනි මිශ්‍ර කිරීමේ අකටයුතුකම් සිද්ධ වන බව කිව්වා. [බාධා කිරීමක්] දැන් හරි නේද? ආවා නේද පීල්ලට?

තේවලට සීනි මිශ්‍ර කරනවා, අපි මේකට විරුද්ධව ඉක්මනින් කටයුතු කරන බව කියනවා. හැබැයි, අපි ළඟ කරුණු තිබෙනවා. අපි මේ ගරු ඇමතිතුමාට නින්දා හෝ අපහාස කරන්න කියනවා නොවෙයි. ඇතැම් කර්මාන්තශාලා හිමියන් නිෂ්පාදිත තේවලට සීනි මිශ්‍ර කළාය කියා නිලධාරින් ගිහින් අත් අඩංගුවට ගත්තාම, දේශපාලන හිතවත්කම් මත ඒ බලපත්‍රය සතියක් ඇතුළත නැවත දීපු කර්මාන්තශාලා තිබෙනවා. ඒවා කෙරෙනකොට මේ වැවිලි කර්මාන්ත ඇමතිතුමා දන්නේ නැද්ද? එය තේ කර්මාන්තය කඩා වැටෙන්න හේතුවක් වුණේ නැද්ද? සීනි මිශ්‍ර කරලා තේ කුඩු නිෂ්පාදනය කරපු කර්මාන්තශාලා ගණනාවක බලපත්‍ර තහනම් කරලා ආපහු සතියෙන් තේ පාලක මණ්ඩලය විසින් බලපත්‍රය දීපු අවස්ථා තිබෙනවා. එහෙම නම් තේ පාලක මණ්ඩලයේ නිලධාරින්ට බලපෑම් කරන්නේ කවුද? ඇමතිවරයාද, එහෙම නැත්නම් ඇමතිවරයා දන්නේ නැද්ද? එසේ සිදු වෙද්දි, තේ කර්මාන්තය කඩා වැටුණා කියලා මෙතැන ඇවිත් කියනවා. ඒ නිසා අපි මේ කාරණය මතක් කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පාලන කාලයේ, 2008 වර්ෂයේ ඉරානය සහ ඉරාකය අතර බරපතළ යුද්ධයක් තිබුණා. ලංකාවේ ප්‍රධාන තේ ගැනුම්කරුවකු තමයි, ඉරානය. එදා අපේ තේ ටික විකුණා ගන්න බැරිව අපි අපහසුතාවට පත් වනකොට මහින්ද රාජපක්ෂ මැතිතුමා උපදෙස් දුන්නා, "රාජ්‍ය භාණ්ඩාගාරයේ සල්ලි යොදලා තේ වතු හිමියා සහ කර්මාන්තශාලා අයිතිකරුවන් ආරක්ෂා කරන්න ස්ථාවර මිලකට තේ මිලදී ගන්න" කියලා.

එදා තේ මිලදී ගෙන ඒවා ගබඩා කළා. ඉන් අනතුරුව නියම මිලකට දෙන්න පුළුවන් වුණා; ගොවියා සහ කර්මාන්තකරුවා ආරක්ෂා කළා. අද වැවිලි කර්මාන්ත ඇමතිතුමා කියනවා, ඒ ගිණුමේ ඇමෙරිකානු ඩොලර් මිලියන පනහක් තිබෙනවා කියලා. රවි කරුණානායක ඇමතිතුමා ඒක ගන්න හැදුවත් දුන්නේ නැහැ කියලාත් කිව්වා. දුන්නේ නැති එක හොඳයි. නැත්නම් මහ බැංකුවට වෙච්ච දේ තමයි වෙන්නේ. ඒ ඩොලර් මිලියන පනහ ආරක්ෂා කරගත්තා නම්, අද කුඩා තේ ඉඩම් හිමියා සහ තේ කර්මාන්තශාලා හිමියා ආරක්ෂා කරන්න මේ ඇමතිතුමාට වැඩ පිළිවෙළක් සකස් කරන්න බැරි ඇයි? ඒකට නේ, රජයක් තිබෙන්නේ. එවැනි ආකාරයේ සාධනීය පියවර ආණ්ඩුවකින් ගත යුතුයි. අගමැතිතුමා කිව්වා, ගෝලීය ත්‍රස්තවාදය ශ්‍රී ලංකාව කරා ආවා කියලා. දිනා ගන්න බැරි මහ ලොකු දෙයක් ඒ ගොල්ලන් දිනා දුන්නා -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
හොඳමයි. ගෝලීය ත්‍රස්තවාදයත් ගෙනැල්ලා දුන්නා. දැන් කියනවා, ගෝලීය ආර්ථිකයේ කඩා වැටීමත් එක්ක තේ මිල කඩා වැටීම පාලනය කළ නොහැකියි කියලා. ඕක කියන්න නම්, ඇමතිවරයෙක් හෝ ආණ්ඩුවක් හෝ ඉන්න ඕනෑ නැහැ නේ. ආණ්ඩුව ඉන්නේ මේවාට ක්‍රමවේද සකස් කරන්නයි. කිසිම දෙයකට ආරක්ෂාව දෙන්න බැරි ආණ්ඩුව, ආර්ථිකය හදන්න බැරි ආණ්ඩුව, තේ ගොවියා ආරක්ෂා කරන්න බැරි වෙච්ච ආණ්ඩුව ගෝලීය මොකක්ද කුණුහරුපයක් කියලා ඒකත් මේ පැත්තට දමන්න හදනවා. මේකට ආණ්ඩුවක් ඕනෑ නැහැ නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ නිසා අපි ඉතා පැහැදිලිව කියනවා, රටේ කිසිම ආකාරයක සංවර්ධනයක් හෝ ආරක්ෂා කිරීමක් කරන්න බැරි වෙච්ච ආණ්ඩුවට තේ කර්මාන්තය ආරක්ෂා කරන්නත් බැහැ කියන එක.

ඊළඟට, ගරු රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා කිව්වා වාගේ, ගාල්ලේ වලහන්දූව වත්තෙන් හෙක්ටෙයාර 400ක් අරගෙන බෙදන්න හදනවා. ඒ වාගේම රත්නපුර දිස්ත්‍රික්කයේත් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සතු, වැවිලි සමාගම් සතු ඉඩම් කොච්චර තිබෙනවාද කියලා දැන් හඳුනා ගනිමින් යනවා, ඒවා අරගෙන නැවත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පවරා තමන්ගේ දේශපාලන හිතවතුන්ට බෙදා දීම සඳහා. රට පුරා මේ වැඩසටහන ක්‍රියාත්මක කෙරෙනවා. 1972දී ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුවෙන් "රන් පවුම්" සහ "රුපියල්" වතු රජයට පවරා ගත්තේ රටේ අභිවෘද්ධියට මිසක්, එකඑක්කෙනාට, දේශපාලන හෙංචයියන්ට දෙන්න නොවෙයි. තව දින 120යි මේ ආණ්ඩුවට තිබෙන්නේ. දැන් ඉතින් නගින-දෙහින කාලේ යන යකා කොරහත් බිඳගෙන යනවා වාගේ ඉඩම් ටිකත් අරගෙන තමතමන්ගේ අයට දීලා, කීය-කීය හරි දීලා, එහෙන් මෙහෙන් ඡන්ද ටිකක් කොටාගෙන, අතමිට සරු හෙටක් එක්සත් ජාතික පක්ෂයට - කිරිඇල්ල ඇමතිතුමා කිව්වා නේ, "සමෘද්ධිය දෙන්නේ අපේ අයට විතරයි" කියලා. එක්සත් ජාතික පක්ෂයේ කට්ටියට සමෘද්ධියත් දෙනවා; ඉඩම් ටිකත් දෙනවා; තව තව තිබෙන දේවලුත් දෙනවා. හැබැයි, ඒ දෙන නියෝගවලට අත්සන් කරන, කටයුතු කරන නිලධාරින්ට දින 120න් පස්සේ මේවාට පැහැදිලිව උත්තර දෙන්න සිද්ධ වෙයි කියලා අපි කියනවා. රාජ්‍ය දේපළ, රාජ්‍ය සම්පත් එක එක්කෙනාට ඕනෑ-ඕනෑ විධියට පරිහරණය කළ නොහැකියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කාදිනල්තුමා කිව්වා වාගේ -

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
Madam Presiding Member, I rise to a point of Order.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මගේ විනාඩි දෙක මට දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා.

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, -

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මට මගේ කථාව අවසන් කරන්න අවස්ථාව දෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කාදිනල්තුමා කිව්වා වාගේ අගමැතිතුමාට හෝ ජනාධිපතිතුමාට මේ රට අයිති නැහැ. ඔවුන් මේ රටේ භාරකරුවන් පමණයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන්න.

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වැරදි අර්ථයක් යනවා, හැන්සාඩ් වාර්තාවට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සමෘද්ධිය දෙන්නේ ප්‍රාදේශීය ලේකම්වරු හදපු ලැයිස්තුවට. එක්සත් ජාතික පාක්ෂිකයන්ට නොවෙයි, ප්‍රාදේශීය ලේකම්වරුන් හදපු ලැයිස්තුවට අනුව සමෘද්ධිය දෙන්නේ. මේ මන්ත්‍රීතුමා වැරදි අර්ථ කථනයක් දෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි. ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
ඔබතුමියත් දන්නවා, මේවා දෙන්නේ කොහොමද කියලා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
බොහොම හොඳයි. බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා එහෙම කියනවා. සභානායකතුමා අර විධියට කිව්වා. සභානායකතුමාට එරෙහිව කථා කිරීම පිළිබඳව බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමාට අපේ ගෞරවය! [බාධා කිරීමක්] හරි, හරි. ඔබතුමා හරි. ඔබතුමා හරියටම හරි. සභානායකතුමා වැරදියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම අවසාන වශයෙනුත් කියන්නේ අද දවසේ දෙවැනිවර කියවීමට ඉදිරිපත් කළ තේ පර්යේෂණ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පතට අදාළව ගෙනෙන කිසිදු වගන්තියකට අපේ කිසි විරෝධතාවක් නැහැ කියන එකයි. ඒ වාගේම, ගරු ඇමතිතුමා කරපු ඇතැම් ප්‍රකාශ සහ රජයේ වැඩ පිළිවෙළටත්, තේ කර්මාන්තකරුවා සහ තේ ගොවියා අනාරක්ෂිත කරලා, විනාශ කරලා, වළපල්ලට යවපු වැඩ පිළිවෙළටත් අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරමින්, මට මේ අවස්ථාව සලසා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු සුසන්ත පුංචිනිලමේ මන්ත්‍රීතුමා.

[අ.භා. 5.43]

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, තේ පර්යේෂණ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත යටතේ -

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
Madam Presiding Member, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නවින් දිසානායක ඇමතිතුමා.

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඇත්තවශයෙන්ම මෙතැනදී කරුණු ව්‍යාකූල කරලා රංජිත් සොයිසා මන්ත්‍රීතුමා කථා කළා. මම ඒ ගැන කනගාටු වෙනවා. මගේ කථාවේ මම කිව්වේ, පර්යේෂණ සම්බන්ධව මුදල් දෙන්නේ නැති සංස්කෘතියක් අපේ රටේ තිබෙනවා කියන එකයි. මම නිරන්තරයෙන්ම කියන්නේ පර්යේෂණවලට සියලුම ආණ්ඩුවලින් මුදල් ලබා දීලා නැහැ කියන එකයි. මේ කථාව විකෘති කරලා අනිත් පැත්තට කියනවා, මම සල්ලි ඉල්ලන කොට, භාණ්ඩාගාරයෙන් දෙන්නේ නැහැ කියලා.

Hon. (Dr.) Ramesh Pathirana, I considered you as a friend. But, your speech was totally wrong. You said that 30 factories have been closed down. That is not true. Ten factories have been closed down, out of 700 factories. You mentioned that fact. There are 700 factories. You come and give different figures. රටට දෙන්න හදන්නේ සියලු තේ කර්මාන්තශාලා වැහෙනවා කියලායි. නමුත්, තේ කර්මාන්තශාලා 15ත්, 20ත් අතර ප්‍රමාණයක් තමයි වැහිලා තිබෙන්නේ. ඒ කර්මාන්තශාලා වැහිලා තිබෙන්නේත් ඒ ගොල්ලන්ගේ අකාර්යක්ෂමතාව නිසායි.

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
Hon. Minister, very clearly I said that there are 700 factories and out of that 30 factories are to be auctioned. So, I made a humble request to reschedule the loans. Very clearly I said that. You do that. You were not here during my speech.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමන්ලා ලබා ගත්ත මගේ කාලය මට ලබා දෙන්න.

තේ පර්යේෂණ මණ්ඩල සංශෝධන පනත ගැන කථා කිරීමට ප්‍රථම, හිටපු ඇමති රිසාඩ් බදියුදීන් මැතිතුමා මෙතැනදී කළ කථාව සම්බන්ධයෙන් යමක් කියන්න කැමැතියි. රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමාගේ කථාවේදී මේ අවස්ථාවේ පාර්ලිමේන්තුවේ නොසිටි, හිටපු ජනාධිපති පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද රාජපක්ෂ මහතාගේ නම ප්‍රකාශ කළා. එතුමා පිළිබඳව ප්‍රකාශ කළ ඒ දේවල්

හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මොකද, ඒවාට උත්තර දෙන්න එතුමා මෙතැන නොසිටි නිසා. විරුද්ධ පක්ෂයේ කවුරු හරි කෙනෙක් මොනවා හරි කරදරයක් හෝ මොනවා හරි ප්‍රකාශයක් එතුමාට විරුද්ධව කළා නම්, මහින්ද රාජපක්ෂ මහතාගේ නම කියන්නේ නැතිව ඒ කාරණය එක එල්ලේ එය ප්‍රකාශ කිරීමට එතුමාට ශක්තිය තිබිය යුතුයි. එම නිසා මහින්ද රාජපක්ෂ මහතාගේ නම හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන ලෙස මම කාරුණිකව ඉල්ලා සිටිනවා.

ගරු නවින් දිසානායක ඇමතිතුමාගේ කථාවට මම සම්පූර්ණයෙන්ම ඇහුම් කන් දුන්නා. ඒ කථාවෙන් අපට තේරුණා, තේ කර්මාන්තය මේ රටේ ප්‍රචලිත කරලා ලෝකයේ හොඳම තේ කර්මාන්තකරුවා බවට අපේ රට පත් කරන්න එතුමාට උනන්දුවක් තිබෙන බව. ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම කුඩා තේ වතු හිමියකු හැටියටත්, අතීතයේදී තේ කර්මාන්තශාලා තිබුණු පවුලක කෙනකු හැටියටත් තේ කර්මාන්තය පිළිබඳව යම් දැනුමක් මටත් තිබෙනවා. විශේෂයෙන්ම ඔබතුමාට මතක් කර දෙන්න ඕනෑ, 2002-2004 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේ අමාත්‍යාංශයක් භාරව මාත් හිටපු බව. ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමාත් ඒ පිළිබඳව දන්නවා. විශේෂයෙන් කුඩා තේ වතු අංශය භාරව කංකානම් ඇමති හැටියට මා හිටියා. කංකානම් වුණත් හිටියා. ඒ වකවානුවේ අපේ රටේ වැඩියෙන්ම තේ නිෂ්පාදනය කළේ, අපේ රටේ තේ කර්මාන්තය සඳහා වැඩියෙන්ම දායක වුණේ කුඩා තේ වතු හිමියන්. ඒක අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. හැබැයි, හිටපු ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ ආණ්ඩුව කාලයේ ඒ කුඩා තේ වතු හිමියන් රකින්න "තේ ශක්ති" කියලා අරමුදලක් පිහිටුවා තිබුණා. එදා ඒ අරමුදල සතු කර්මාන්තශාලා තිබුණා; ඒ කර්මාන්තශාලා නවීකරණය කරලා තිබුණා. එවැනි කර්මාන්තශාලා ගණනාවක් පිහිටුවා තිබුණා. තවත් කර්මාන්තශාලා ගණනාවක් පිහිටුවන්නත් තිබුණා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා තමයි, එවකට මගේ කැබිනට් ඇමතිවරයා හැටියට සිටියේ. එහෙම නේද ඇමතිතුමනි?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔව්.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ඒ කාලයේ අපි කුඩා තේ වතු හිමියන්ගේ සංගමයෙන් එහෙම නැත්නම්, කුඩා තේ වතුහිමියන්ගෙන් ගත් මුදල්වලින් අරමුදලක් පිහිටුවා තිබුණා. ඒ සඳහා ආණ්ඩුවෙනුත් යම් මුදලක් දීලා තිබුණා. කුඩා තේ කර්මාන්තශාලා හිමිකරුවන් අමාරුවේ වැටෙන අවස්ථාවලදී ඒ අරමුදල සතු මුදල් පාවිච්චි කර ඒ අයට සහන ලබා දුන්නා. මට මතකයි, අපේ කාලයේ අපි ඒ අයට ලාභ පවා බෙදා දුන්නා. එහෙම තිබුණු තේ ශක්ති ව්‍යාපාරය, ඒ කර්මාන්තශාලා, ඒ සම්පූර්ණ ව්‍යාපෘතියම අද වනකොට ඇන හිට තිබෙනවා.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි, ඔබතුමාට පුළුවන් නම්, මේ තේ ශක්ති අරමුදලට මොකද වුණේ, ඒ අරමුදල පහත වැටෙන්න හේතුව මොකක්ද, ඒ නිසා කුඩා තේ වතු හිමියන්ට ඇති වෙලා තිබෙන බලපෑම් මොනවාද කියලා සොයා බලන්න කියලා. ඒ extension programmesවලට ඒ මිනිසුන් ගොඩක් උදව් වුණා. මොකද, කුඩා තේ වතු හිමියන් ස්වකීය ශක්තියෙන්, තමන්ගේ පවුලේ අය සම්බන්ධ කර ගෙන තමයි මේ කර්මාන්තය දියුණු කර ගෙන ගියේ. ඒ වාගේම, එදා තිබුණු වෙළෙඳ පොළට කුඩා තේ වතු හිමියන් තමයි ගොඩක් දායක වුණේ. අපි මැද පෙරදිගට යවන කළු තේ ටික ලැබුණේ දකුණු පළාතේ තිබෙන තේ වතුවලින්.

ඔබතුමා නියෝජනය කරන උඩරට පළාතේ ඒ දිස්ත්‍රික්කවලින් එන තේවලින් කළු තේ ගන්න බැහැ, ඒවා දුඹුරුයි. ඒවායින් ලැබෙන කහට ප්‍රමාණය අඩු නිසා, ගුණය පිළිබඳව නොවෙයි, පාට පිළිබඳ ප්‍රශ්නයක් තමයි තිබෙන්නේ. කුඩා තේ වතු හිමියන් වෙනුවෙන් තේ කර්මාන්තය නඟාසිටුවන්නට වැඩ පිළිවෙළක් යොදන්න කියා මම විශේෂයෙන්ම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම, ඒ කාලයේ -2002ට කලින්- "තේ ශක්ති" හරහා තේ විශාල ප්‍රමාණයක් අපි රුසියාවට යවලා තිබුණා. ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා ඒ ගැන දන්නවා. එදා ලැබුණු ඒ මුදල බැලුවාම, අද රුපියල් බිලියන ගණනක්. ගරු ඇමතිතුමනි, මොනම පරීක්ෂණයක්වත් කරලා, ඒ මුදල්වලට මොනවාද වුණේ කියලා අද වෙනකොටවත් කිසිම විභාගයක් කරලා නැහැ. මෙන්න මේ විධියට මේ රටේ ජාතික ධනය පිට රටට ගිහින් තිබෙනවා. මේ පිළිබඳව දැන්වත් විමර්ශනයක් කරලා නැවත ඒ විශාල මුදල ඔබතුමාගේ අමාත්‍යාංශය යටතට ලබාගෙන, කුඩා තේ කර්මාන්තශාලාවලට, එහෙම නැත්නම් කුඩා තේ වතු හිමියන්ට ලබා දුන්නොත් මේ කර්මාන්තය තව තවත් දියුණු කිරීමට හැකියාව ලැබෙයි කියලා මා විශ්වාස කරනවා.

ගරු විජිත හේරත් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් තිබෙන ආංශික අධීක්ෂණ කාරක සභාවේදී, ග්ලයිෆොසේට් භාවිතය නැවැත්වීම පිළිබඳව සොයා බලන කමිටුවකට මා පත් කළා. ඔබතුමා කිව්වා වාගේම, ග්ලයිෆොසේට් භාවිතය එකවරම නතර කළා. එකවරම නතර කරන්න තීරණය කරනකොට ඒ අයට කිසිම expertise එකක් තිබුණේ නැහැ. කාගේ හරි පණ්ඩිතකමට, එහෙම නැත්නම් දන්නවා වැඩිකමට ග්ලයිෆොසේට් භාවිතය නතර කළා. අපටත් එකපාරටම හිතාගන්න බැරි වුණා ඒවා භාවිතය නතර කළේ මොකද කියලා. පසුව හොයා ගෙන යනකොට දැනගත්තා, ග්ලයිෆොසේට් නතර කළේ ඒ පිළිබඳව දැනුමක් නැති නායකයන්ගේ උපදෙස් ගත්ත නිසා බව. මම හිතන විධියට, ඒ අය තේ ගහක් පියවි ඇසින්වත් දැකලා නැහැ. යන්තම් එහෙන් මෙහෙන් තේ ගහක් දැක්ක කෙනෙක්, "මෙන්න මේ ගසට මේ වස යෙදුවාට පස්සේ මෙහෙම වෙනවා" කියලා කිව්වාම ඒවා භාවිතය නතර කළා. වඩිවේල් සුරේෂ් අපේ රාජ්‍ය ඇමතිතුමා මෙතැන ඉන්නවා. නවින් දිසානායක ඇමතිතුමාත් ඉන්නවා. එතුමන්ලා මේ ගැන දන්නවා. ඒ විධියට ග්ලයිෆොසේට් භාවිතය නතර කළ නිසා, මුළු කඳුකරයේම තිබෙන අපේ මුළු තේ කර්මාන්තයම තව පොඩ්ඩෙන් කඩා වැටෙනවා. මොකද, විශාල වතු තිබෙන උදවියට පාළු වැඩි නිසා ග්ලයිෆොසේට් පාවිච්චි කළොත් විතරයි යන්තම් cost එක අඩු කරගන්න පුළුවන් වන්නේ. ඒ කටයුතුවලට කම්කරුවන් යෙදීමෙන් වෙන්නේ ඒ මිනිසුන්ට ලොකු පාඩුවක්. දැනටත් ඒ මිනිස්සු පාඩු ලබමින් තමයි වතු කරගෙන යන්නේ. හැරී ජයවර්ධනලා වාගේ අය අතින් සල්ලි දාලා වතු කරගෙන යනවා. ටාටා සමාගමත් අතින් සල්ලි දාලා වතු කරගෙන යනවා. නමුත්, අනෙක් companiesවලට එහෙම කරන්න බැහැ. ඔබතුමාගේ මැදිහත්වීම මත මගේ වාර්තාවත් හදාගෙන ගියා. මටත් එකපාරටම කළු ගල් එක්ක හැප්පෙන්න බැහැ. මගේ ජීවිතයේ හැප්පිලා තියෙන ප්‍රමාණය හොඳටම ඇති. වැඩි දවසක් යන්න කලින් මම ඒ වාර්තාව ඉදිරිපත් කරනවා. ඒ වාර්තාවේ තිබෙන්නේත් ග්ලයිෆොසේට් භාවිතයට ඉඩ දෙන්න ඕනෑ කියලායි. ඒවා නතර කරන්න ඕනෑ තමයි. හැබැයි, ඔබතුමා කිව්වා වාගේ ඒකට කාලයක් දෙන්න ඕනෑ. අපේ රංජිත් ද සොයිසා මැතිතුමා කිව්වා වාගේ මම අද කුඩා තේ වතු හිමියෙක් නොවෙයි. මගේ තිබුණු ඒවා අතහැරලා දැම්මා. මම දැන් අවුරුදු දොළහක් තිස්සේ ඉන්නේ නැඟෙනහිර පළාතේ, කරිජ්ජත් එක්ක. නමුත්, මගේ ඇඟේ මේ කර්මාන්තය තියෙනවා. මා දන්නා විධියට, අද වෙනවිට ආදායම් ලබන ලක්ෂ 15ක් පමණ කුඩා තේ වතු හිමියන් අපේ දිස්ත්‍රික්කයේ ඉන්නවා. එවැනි අය ආරක්ෂා කරන්න, මේ රටේ සම්පත් වැඩි දියුණු කරගන්න නම් අපි ඒ ගොල්ලන්ට අවශ්‍ය සහයෝගය දිය යුතුයි. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියලා.

[ගරු සුසන්ත පුංචිනිලමේ මහතා]

මම විශේෂයෙන්ම ගයන්ත කරුණාතිලක ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමාගේ ගෙන යන වැඩසටහන පිළිබඳව මම දන්නවා. මේ වතු LRC එකට අයිතිද, නැද්ද, කාටද අයිති කියන එක හොයාගෙන යන වැඩසටහන ඉතාම හොඳයි. මොකද, වතු කොම්පැනි කිසිම බදු ගෙවීමක් කරන්නේ නැතිව LRC එකට අයිති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට වෙන් වුණු ඉඩම්වල අයිතිය, සාරය සම්පූර්ණයෙන්ම උරාබොමින් ඉන්නවා. ඒ අය ඒ වතු ප්‍රයෝජනයට ගත්ත කාල සීමාව ගණනය කරලා, ඒවාටත් එක්ක යම් කිසි බදු මුදලක් ලබාගෙන, LRC එකටත් ආදායම ලබාගන්න පුළුවන් විධියට ඒ ගෙල්ලන්ටත් ඒ කටයුතු කරන්න දුන්නොත් හොඳයි. මම හිතන විධියට රටේ ඉඩම් ප්‍රමාණය අඩු නිසාත්, ජනගහනය වැඩි වෙන නිසාත්, ඉඩම් බෙදීමේදී වැවිලි කර්මාන්තයක් සඳහා ඉඩම් දුන්නාට කිසි වරදක් නැහැ. නමුත්, ගෙවල් හෝ ගොඩනැඟිලි හැදීමේදී අපේ වතුවල තිබෙන ඉඩම් පුළුවන් තරම් කළමනාකරණය කරගෙන කටයුතු කරන්න ඕනෑ. මොකද, අපේ පළාතක නාය යෑමක් වුණොත්, සමහරවිට වත්තක ඉඩමක් ඉල්ලුවාට අපට දෙන්නේ නැහැ ගරු ඇමතිතුමනි. කොම්පැනිකාරයෝ ඒකට දහසක් දේවල් කියනවා. ඒ නිසා ඒ කටයුතුවලටත් ඉඩ තියාගෙන කටයුතු කරන්න ඕනෑ. මොකද, අපේ කාලයෙන් පසුවත් මේ රට ඉදිරියට යන්න ඕනෑ. ඒ නිසා ඒ කටයුතු කළමනාකරණය කරගෙන කටයුතු කරන්න කියලාත් ගරු ඉඩම් ඇමතිතුමාගෙන් වාගේම වැවිලි කර්මාන්ත ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම, අපේ තේ නිෂ්පාදනයේ ගුණාත්මකභාවය වැඩි කරන්න කටයුතු කළොත් ගරු ඇමතිතුමනි, අපට වෙළෙඳපොළේ ඉල්ලුමක් හදා ගන්න පුළුවන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව විනාඩියක කාලයක් දෙන්න.

එය කරන්නට නම් ගරු ඇමතිතුමනි, අපේ extension service එක වැඩි කරන්න. ගරු මන්ත්‍රීතුමෙක් කිව්වා වාගේ අපේ extension service එක බොහොම අඩුයි. ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියා ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට ගරු ශ්‍රීනේෂන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10 කාලයක් තිබෙනවා.

[பி.ப. 5.55]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)bb
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தேயிலை ஆராய்ச்சி சபை (திருத்தம்) சட்டமூலம் பற்றிய இன்றைய விவாதத்தில் கலந்துகொள்வதற்கு இடமளித் தமைக்காக முதலில் நன்றி கூறுகின்றேன். எமது இலங்கைத் தேயிலையோடு பிற நாடுகள் எந்தளவுக்குப் போட்டி போட்டுக்கொண்டிருக்கின்றன; அதன்மூலமாக எமது இலங்கைத் தேயிலையின் சந்தைவாய்ப்புகள், சந்தை மானங்கள் எவ்வாறு இருக்கின்றன என்பது பற்றியெல்லாம் நாங்கள் சிந்திக்க வேண்டி இருக்கின்றோம். அந்த வரிசையில் பார்க்கின்றபோது, உலகளாவிய மட்டத்தில் தேயிலையின் நுகர்வானது கடந்த 10 ஆண்டுகளில் 30 மில்லியன் கிலோ கிராமிலிருந்து 52 மில்லியன் கிலோ கிராமாக அதிகரித் துள்ளது. அதாவது, தேயிலைப் பாவனையாளர்களின் எண்ணிக்கையானது கிட்டத்தட்ட 13 மில்லியன்களால் அதிகரிக்கப்பட்டிருக்கின்றது. அதேவேளை சீனா, இந்தியா, இலங்கை, கென்யா போன்ற நாடுகள் உலகத் தேயிலை சந்தைவாய்ப்புகளில் முதலாம், இரண்டாம், மூன்றாம், நான்காம் இடங்களில் இருக்கின்றன. சில வேளைகளில் கென்யா எமது நாட்டின் இடத்தைப் பிடிக்கக்கூடிய விதத்திலும் இருந்துவருவதை கௌரவ அமைச்சர் அவர்கள் ஏற்றுக் கொண்டிருக்கின்றார். அந்த அடிப்படையில் பார்க்கின்றபோது, கென்யாவானது எமது தேயிலை உற்பத்திற்கு அல்லது எமது தேயிலைச் சந்தைவாய்ப்பிற்குச் சவால் விடுகின்ற ஒரு நாடாக அண்மையில் மாறி வந்துள்ளமையை நாங்கள் அவதானிக்க கூடியதாக இருக்கின்றது. 1967ஆம் ஆண்டில் 1.5% உற்பத்திப் பங்களிப்பை வழங்கிய கென்யா, 2018இல் 8.4%ஆகத் தனது உற்பத்திப் பங்களிப்பை வழங்கியிருக்கின்றது என்பதை அறியக்கூடியதாக இருக்கின்றது. அதாவது, அதன் உற்பத்தியானது பல மடங்கு உயர்ந்துகொண்டு செல்கின்றது.

கென்யா, இலங்கை போன்ற நாடுகளுக்குச் சந்தை வாய்ப்புக்களைத் தருகின்ற நாடுகளாக ரஷ்யா, ஈரான் போன்ற நாடுகள் காணப்படுகின்றன. அதேவேளை, இலங்கைத் தேயிலையின் சந்தைவாய்ப்புகள் 1960இல் 24%, 2000இல் 10.5%, 2018இல் 5.2% என்ற வகையில் குறைந்திருப்பதை நாங்கள் அவதானிக்க வேண்டி இருக்கின்றது. இந்தப் புள்ளிவிபரங்களின் அடிப்படையில் பகுப்பாய்வு செய்து பார்க்கின்றபோது, எமது நாட்டுத் தேயிலையோடு பிற நாட்டுத் தேயிலையானது போட்டியிடுகின்ற அளவுக்கு அல்லது சவால் விடக்கூடிய ஒரு நிலைக்கு வந்திருப்பதை நாங்கள் அவதானிக்கலாம். எனவே, எமது தேயிலை உற்பத்தியின் அளவைவிட அதன் தரத்தை அதிகரிக்க வேண்டி இருக்கின்றது. Quantity, quality என்று சொல்வார்கள். Quantity அளவோடு சம்பந்தப்பட்டது; Quality தரத்தோடு சம்பந்தப்பட்டது. உலகச் சந்தையில் அநேகமான நாடுகள் போட்டி போடுகின்றபோது எமது தேயிலையின் அளவானது ஒரு பக்கமாக இருக்க, சந்தைமானத்தைப் பெறுவதற்கு எமது தேயிலையின் தரத்தை உயர்த்த வேண்டிய தேவைப்பாடு இருக்கின்றது. அதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டிய கடப்பாடு உரிய அமைச்சுக்கு இருக்கின்றது.

அதேவேளை, இலங்கையில் தேயிலை ஏற்றுமதி 2000ஆம் ஆண்டில் 21 வீதத்தால் குறைந்துள்ளது என்பதையும் நாங்கள் கவனத்திற்கொள்ள வேண்டும். 2018இல் தேயிலை ஏற்றுமதி வீதம் 14.5 வீதமாக வீழ்ச்சிகண்டிருக்கின்றது. இதற்கெல்லாம் காரணம், வெளிநாடுகளின் தேயிலை எமது நாட்டுத் தேயிலையுடன் போட்டியிடுகின்ற தன்மையாகும். எனவே, அதனைக் கவனத்தில் கொள்ளவேண்டியவர்களாக நாம் இருக்கின்றோம். இலங்கையில் இணையம் மூலமான கொள்வனவு என்கின்ற விடயம் போதுமானதாக இல்லை யென்றும் கென்யா போன்ற நாடுகளில் அது சாத்தியமான நிலையிலிருப்பதாகவும் கூறப்படுகின்றது. இலங்கைத் தேயிலைக்கான சந்தைவாய்ப்புக்கள் ஈரான், ஈராக், துருக்கி, லிபியா போன்ற நாடுகளில் எங்களுக்குக் கிடைக்கக்கூடியதாக

இருக்கின்றன. எனவே, எமது நாட்டில் முக்கியமான பெருந் தோட்டப் பொருளாதாரத்தில் நீண்டகாலமாக எமக்குக் கூடுதலான சந்தை வாய்ப்புக்களைப் பெற்றுத்தருகின்ற தேயிலை தொடர்பான விடயத்தில் நாங்கள் கவனமாக இருக்க வேண்டும். குறிப்பாக, இயற்கையான மலை வளத்தைக் கொண்ட எமது நாட்டில் உற்பத்தி செய்யப்படுகின்ற எமது தேயிலைக்கு ஒரு நல்ல சந்தைமானம், நல்ல மரியாதை, மதிப்பு இருக்கின்றது. எனவே, அந்த மரியாதையை, மதிப்பைப் பேணக்கூடிய விதத்தில் நாங்கள் இந்தத் தேயிலையின் உற்பத்தியை வளர்த்துக் கொள்வதோடு, அதனுடைய தரத்தையும் உயர்த்திக்கொள்ள வேண்டும் என்ற கருத்தினை நான் இந்த இடத்தில் முன்வைக்க விரும்புகின்றேன்.

அதேவேளை, இந்தத் தேயிலையோடு சம்பந்தப்பட்ட விடயத்தைப் பார்க்கின்றபோது, தோட்டத் தொழிலாளர்கள் எமது நாட்டுக்கு அந்நியச் செலாவணியைப் பெற்றுத் தருவதில் கூடுதலான பங்களிப்பை வழங்கிக்கொண்டிருக்கின்றார்கள். எனவே, அந்த அந்நியச் செலாவணியைப் பெறுவதில் கூடுதலான பங்களிப்பை வழங்குகின்ற தோட்டத் தொழிலாளர்களின் தரத்தினை, அவர்களது வாழ்க்கை நிலையினை உயர்த்துவது என்பது அவர்கள் ஊக்கத்துடன் இந்தத் தொழிலில் ஈடுபடுவதற்குரிய சந்தர்ப்பத்தை அளிப்ப தாக அமையும். எனவே, இந்த விடயத்தில் நாங்கள் கூடுதலான கவனம் செலுத்த வேண்டும். ஏனென்றால், எமக்கு அந்நியச் செலாவணியைப் பெற்றுக்கொள்கின்ற விடயத்தில் தேயிலை முக்கியமான உற்பத்திப் பொருளாக இருக்கின்றது. அதேபோன்று, ஆடைத் தொழிற்சாலைகளும் முக்கியமானவையாகக் காணப்படுகின்றன. வெளிநாடுகளில் பணியாற்றுகின்ற பெண்கள் மூலமாகக் கிடைக்கின்ற வருமானமும் அந்நியச் செலாவணியில் முக்கிய இடத்தைப் பிடித்திருக்கின்றது. ஆயினும், உள்நாட்டில் தேயிலை உற்பத்தியை நாங்கள் மேலும் வளப்படுத்தி, பலப்படுத்தி வெளிநாடுகளிலிருந்து மேலும் அந்நியச் செலாவணியைப் பெற்றுக் கொள்வதற்குரிய விதத்தில் செயற்பட வேண்டு மென்ற கருத்தினை நான் முன்வைக்க விரும்புகின்றேன்.

அதேவேளையில், அண்மையில் எமது நாட்டில் இடம்பெற்று வருகின்ற இடர்பாடுகள் பற்றியும் கவனம் செலுத்த வேண்டியிருக்கின்றது. ஏனென்றால், நாட்டில் ஒற்றுமை, ஐக்கியம் அல்லது சீரான தன்மை இல்லாது விட்டால், எமது பொருளாதாரத்துக்குப் பலவிதமான சவால்கள் ஏற்பட வாய்ப்பிருக்கின்றது. அதாவது, ஆக்கத்துக்காகச் செலவு செய்யவேண்டிய எமது நிதியினை அழிவுகளைப் புனர்நிர்மாணம் செய்வதற்காகச் செலவு செய்யவேண்டிய ஒரு நிலைமை ஏற்படுமாக இருந்தால், எமது நாட்டின் நிலைமை மோசமாகக்கூடிய ஒரு தன்மை காணப்படும். உள்நாட்டில் அல்லாது வெளிநாடுகளோடு தொடர்புபட்ட இந்தத் தீவிரவாதம் - பயங்கரவாதம் இருக்கின்ற இந்தச் சூழ்நிலையில், நாங்கள் உண்மையான குற்றவாளிகளை அடையாளங்கண்டு அவர்களுக்குரிய தண்டனைகளைக் கொடுக்க வேண்டும். அதேவேளையில், தமிழர், சிங்களவர், முஸ்லிம், பறங்கியர் என்ற பேதமில்லாமல் அப்பாவிகள் தண்டிக்கப்படாமலும் நாங்கள் பார்த்துக் கொள்ளவேண்டிய தேவையிருக்கின்றது. 30 வருடகால யுத்தத்தின்போது, பல அப்பாவித் தமிழர்கள் தண்டிக்கப் பட்டதையும் நாங்கள் அறிவோம். எனவே, அப்பாவிகள் தண்டிக்கப்படாது, உண்மையான குற்றவாளிகளை அல்லது குற்றம் செய்தவர்களை இனங்கண்டு, அவர்களுக்குத் தண்டனைகளை வழங்கக்கூடிய நிலைமை இருக்க வேண்டும்.

1957ஆம் ஆண்டு காலப்பகுதியில் பண்டா - செல்வா ஒப்பந்தம் கொண்டுவரப்பட்டபோது, அது நிறைவேற்றப் படாமல் இருப்பதற்குப் பல எதிர்ப்புகள் கிளப்பப்பட்டன. அப்படியான எதிர்ப்புகள் காரணமாகத்தான் நாங்கள் இந்த நாட்டில் 30 வருட கால யுத்தத்தைச் சந்தித்திருக்கின்றோம். அதனையொத்த எதிர்ப்புகள் இந்த நாட்டிலே எழுமாக இருந்தால், அந்த எழுச்சி என்பது நிச்சயமாக எமது நாட்டில் வாழுகின்ற முஸ்லிம்களுக்கு மாத்திரமல்ல, ஒட்டுமொத்த மக்களுக்கும் பாதிப்பை ஏற்படுத்தக்கூடியதாக இருக்கும் என்பதைப் பொறுப்புணர்வுடன் அரசாங்கம் உணர்ந் துகொள்ள வேண்டும். ஏனென்றால், இந்த நாட்டில் ஏற்படுகின்ற அனர்த்தங்கள், ஆபத்துக்கள், இடர்பாடுகள் என்பன ஒட்டுமொத்தமாக எல்லா மக்களையும் பாதிக்கும். மேலும், அது இந்த நாட்டின் புகழை, கீர்த்தியை, கௌரவத்தைப் பாதிக்கும் என்பதிலும் கவனம் செலுத்தவேண்டும். எனவே, அப்பாவிகள் என்கின்ற விடயத்தில் மிகவும் கவனம் செலுத்தி, அப்பாவிகள் பாதிக்கப்படாத விதத்தில்தான் எந்தவொரு நடவடிக்கை யையும் மேற்கொள்ளவேண்டும். அதேவேளை, உண்மையான குற்றவாளிகள் இனம் காணப்பட்டு, அவர்களுக்குத் தண்டனைகள் வழங்கப்படவேண்டும் என்ற கருத்தினையும் முன்வைத்து, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු ඇමතිතුමා.

[අ.භා. 6.03]

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට අන්තිමටම කථා කරන්න දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
වෙනත් කථිකයෝ නැහැ, ගරු ඇමතිතුමනි. සියලු දෙනාම කථා කර අවසානයි.

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම අද උදේ විනාඩි 25ක් පමණ කථා කළා. අද දින නැඟුණු මැසිවිලි හා චෝදනා ගැන මේ අන්තිම හෝරාවේ යම් පැහැදිලි කර දීමක් කළොත් හොඳයි කියලා මා හිතනවා. එය මගේ මතය. ගරු පතිරණ මන්ත්‍රීතුමා, ගාල්ලේ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ගොඩනැඟිල්ල ගැන ඉතාමත් වැරදි විදියට කරුණු දැක්වූවා. විශේෂයෙන්ම සංචාරක අමාත්‍යාංශයෙන් අපට ප්‍රකාශ කළා, මේ ගොඩනැඟිල්ල ලෝක උරුම ගොඩනැඟිල්ලක්ය කියලා. අපට පමණක් නොවෙයි, අනෙකුත් සියලුම කාර්යාලවලට එතැනින් අයින් වෙන්න කිව්වා. අපි ඒකට කැමති වුණේ නැහැ. මක්නිසාද, එය අපට තිබුණු හොඳ ගොඩනැඟිල්ලක් නිසා. අපි එතැන සිට වතු හිමියන්ට නොයෙකුත් සේවාවන් ලබා දුන්නා. නමුත් අපට දුන් නියෝගයක් අනුව ඇත්ත වශයෙන්ම අපට එම තීරණය ගන්නට සිද්ධ වුණා. එම නිසා අපි ඉතාමත් විනිවිදභාවයකින් තවත් ගොඩනැඟිල්ලක් තෝරාගෙන, අපි එම ගොඩනැඟිල්ලට ගියා. ඒ තිබුණු ගොඩනැඟිල්ල තවමත් අපට අයත්ව තිබෙනවා. ඒ වත්කම තවමත් අප සතුව තිබෙනවා. නානාවිධ අර්ථ කථනයන් දෙන්නට හැදුවා, මගේ මිත්‍රයන්ට මේක දෙන්නට හදනවා කියලා. ඒ සියලු දෙයක්ම අසත්‍ය. මම ඒවා ප්‍රතික්ෂේප කරනවා. විශේෂයෙන්ම මේ

[ගරු නවීන් දිසානායක මහතා]

තිබෙන ටෙන්ඩර් පටිපාටිය අනුව අද නීති රීති ගොඩක් තදයි. කොහොමත් එහෙම කරන්නට බැහැ. අනෙක් කාරණය, මම එහෙම කරන පුද්ගලයෙකුත් නොවෙයි.

ඊළඟට තේ ශක්ති අරමුදල. අපේ ගරු කිරිඇල්ල ඇමතිතුමාත් මේ අවස්ථාවේ සභාවේ ඉන්නවා. මා වැවිලි කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යවරයා හැටියට කටයුතු කළ කාලයේ එතුමා මගේ හිටපු අමාත්‍යවරයා විධියට මට අත් දෙක දිග හැර වැඩ කරන්නට ඉඩ දුන්නා. මා හැම අවස්ථාවකම එතුමාගේ නම ඉතාමත් ආදරයෙන්, ගෞරවයෙන් මතක් කරනවා. විශේෂයෙන්ම අපෙන් පසුව - 2004 වර්ෂයෙන් පසුව - නිරන්තරයෙන්ම අවුරුදු 10ක් තිස්සේ, කුඩා තේ වතු හිමියන්ගේ කොටස් ලබා ගෙන ඔවුන් ඒවාට මුදල් දී මිලියන හාර සියයක පන්සියයක පමණ දූෂණයක් සිදු වුණා, තේ ශක්ති අරමුදල තුළින්. අපි බලයට ආවාට පසුව මේ මුදල්වලට මොනවාද වුණේ කියා අපි දන්නේ නැහැ. විශාල නාස්තියක් සිද්ධ වෙලා තිබුණා; විශාල දූෂණයක් සිද්ධ වෙලා තිබුණා. අපි මේ සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගත්තා. මේ මුදල්වලට මොනවාද වුණේ කියා සොයා බලන්නටය කියා, අපි CID එකට වාර්තා කළා. නමුත් පැහැදිලිවම විශාල දූෂණයක් සිදුවුණා. අපේ ආණ්ඩුවෙන් මේ ගැන තීරණයක් ගත්තා. මේ තේ ශක්ති අරමුදලේ කර්මාන්ත පහළොවක් පමණ තිබුණා. රාජ්‍ය මුදල් යොදවා, මහජනයාගේ මුදල් යොදවා, අපට මේවා දිගටම නඩත්තු කරන්න බැහැ. මොකද, මේ මුදල් අපට ලැබෙන්නේ මහා භාණ්ඩාගාරයෙන් .

මහා භාණ්ඩාගාරයට මුදල් ලැබෙන්නේ කොහොමද? මේ රටේ ජනතාවගේ බදුවලින් තමයි භාණ්ඩාගාරයට මුදල් ලැබෙන්නේ. තේ ශක්ති අරමුදල, 'රජයේ කොටස් පංගුව' කියලා නිරන්තරයෙන්ම මිනිසුන්ගෙන් මුදල් ගන්නවා, ඒ මුදල් නැති වෙනවා. අපි මේ තත්ත්වය දිහා දිගටම බලාගෙන ඉන්නවාද? විශේෂයෙන්ම ගනුදෙනු කිරීමේදී, business කිරීමේදී, රජයේ මේ ආයතනවල විශාල හොරකම් සිද්ධ වෙනවාය කියා මම කියන්නේ ඒ නිසායි. තේ ශක්ති අරමුදලටත් සිද්ධ වුණේ ඒකයි. දිගටම ඒක කරන්න නොහැකියි කියා අප හිතපු නිසා අප ඒ වගකීම් භාර ගන්නේ නැතිව තේ ශක්ති අරමුදලේ තිබුණු සියලුම කර්මාන්තශාලා බදු දුන්නා. ඉතාම විනිවිදභාවයෙන් යුතුව, ටෙන්ඩර් පටිපාටි අනුවයි අපි ඒවා බදු දීලා තිබෙන්නේ. ඒවා විකිණීමක් නොවෙයි කර තිබෙන්නේ. ඒ සම්පත්වල අයිතිය තිබෙන්නේ අපේ අමාත්‍යාංශයටයි. එයින් අපට වාසි කීපයක් ලැබෙනවා. පළමුවැනි වාසිය මේකයි. අපි කුලියක් ගන්නවා; වත්කමක් එනවා; ආදායමක් එනවා. දෙවැනි එක තමයි, ඒ අය ඒ කර්මාන්තශාලා හොඳින් කළමනාකරණය කරන එක. තුන්වැනි එක තමයි වැදගත්ම කාරණය වන්නේ. එම කර්මාන්තශාලා වටේ සිටින කුඩා තේ වතු හිමියන්ට market එකේ තිබෙන මුදල අතට ලැබෙනවා. එක අතකින්, තේ ශක්ති අරමුදල රජය සතුව තිබිය යුතුයි. නමුත්, එය රජය සතුව තිබෙන කොට හොරකම් සිද්ධ වෙනවා. හැම දේකටම රජය මැදිහත් වෙන්න ඕනෑය කියන කාරණයත් එක මතවාදයක්. නමුත් අපි අනෙක් පැත්තෙන් වෙනත් තර්කයක් ඉදිරිපත් කරලා, ඒවා පෞද්ගලික අංශයට බදු දීලා ආර්ථික වාසියක් ගන්නවා. ඇමතිවරයෙක් හැටියට මම ඒ තත්ත්වය ගැන සතුටු වෙනවා.

ඊළඟට, ඉඩම් සම්බන්ධවත් මම යමක් කිව යුතුයි. LRC එකෙනුත් ඉඩම් දෙනවාය කියා අපේ ගරු ඇමතිතුමාටත් චෝදනාවක් කළා. නමුත්, අපි ඒ ඉඩම් දෙන්නේ ඉතාම විනිවිදභාවයෙන් යුතුවයි. තේ ඉඩම් ඒ විධියට කාටවත් දෙන්න අපේ බලාපොරොත්තුවක් නැහැ. විශේෂයෙන්ම සමාගම් සතුව තිබෙන ඉඩම් අපට කොහොමවත් දෙන්න බැහැ. එහෙම දෙනවා නම්, ඒ සමාගම් ගැන මම එක කාරණයක් කියන්න අවශ්‍යයි. එම සමාගම් මිනිසුන්ගේ පැත්තෙන් බලන්නේ නැහැය කියා නොයෙක් චෝදනා කළා. මම උදාහරණයක් කියන්නම්. මීට අවුරුදු දෙකකට කලින් කෑගල්ල දිස්ත්‍රික්කයේ විශාල නාය යෑම් ඇති වුණා. ඒ අවස්ථාවේදී ඒ මිනිසුන් නැවත පදිංචි කරවීමට ඒ වතු සමාගම් ඉතාම පරිත්‍යාගශීලීව ඉඩම් ලබා දුන්නා. යම්කිසි අනේනියක් වෙලා, එහෙම නැත්නම් එවැනි හදිසි අවස්ථාවක් වෙලා මිනිසුන් පදිංචි කරවීම සඳහා ඉඩම් අවශ්‍ය වූ වෙලාවක, එම සමාගම් සමඟ සාකච්ඡා කරලා ඉඩම් ලබා ගැනීමට අපට ඕනෑම අවස්ථාවක ඉඩ තිබෙනවාය කියන කාරණය මම පැහැදිලිව ප්‍රකාශ කරන්න කැමැතියි.

අද මේ සාකච්ඡාවේදී මේ කටයුතුවල තිබෙන අඩු පාඩුකම් පෙන්වාදීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමන්ලාට මා ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ extension services අපි මීට වඩා ශක්තිමත් කළ යුතුයි කියන කාරණය මම පිළිගන්නවා. ඒ වාගේම අපගේ තේවල ගුණාත්මකභාවය, pure "Ceylon Tea" කියන නාමය එලෙසම ආරක්ෂා කිරීමට සියලුම කටයුතු කරනවාය කියන එකත් මම මතක් කරන්න ඕනෑ. Sri Lanka Tea Board එකේ සිටින inspectorsලා පොලිස් සේවයක් නොවෙයි කරන්නේ. ඔවුන් policemenලා නොවෙයි. නමුත්, කනගාටුයි කියන්න, අද වන විට ඔවුන්ට සිද්ධ වෙලා තිබෙන්නේ, තේ කම්හල්වලට ගිහිල්ලා, තේවලට නොයෙකුත් දේවල් දමනවාද, නැද්ද කියන එක පරීක්ෂා කරන්නයි. ඔවුන්ගේ කාර්ය භාරය ඒක නොවෙයි. නමුත් ඔවුන් අද ඒ තත්ත්වයට පත්වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අපට දැන් හොඳ විද්‍යානුකූල පදනමක් තිබෙනවා, තේවලට සීනි කලවම් කරලාද, නැද්ද කියන එක තේ පර්යේෂණායතනය හරහා පරීක්ෂා කර බලන්න. අපි ඒ විධියටම කටයුතු කරනවා. කිසිම කෙනෙකුට සමාවක් දෙන්නේ නැහැ. මෙහිදී මට බලපෑම් එන්න පුළුවන්. නමුත්, ඇමතිවරයා හැටියට මම තේ කර්මාන්තය ආරක්ෂා කිරීම සඳහා කටයුතු කරනවා. තේවලට සීනි හෝ අනෙකුත් දේවල් කලවම් කිරීම ගැන දැඩි ලෙස කටයුතු කිරීමට මා බලාපොරොත්තු වෙනවා. එම නිසා, තේ පර්යේෂණායතනය ශක්තිමත් කිරීමට අද දින ඉදිරිපත් කළ මෙම සංශෝධන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් දැක් වූ සියලුම අදහස් මම අගය කරනවා. මෙම පනත හරහා තේ කර්මාන්තයට විශාල ගැම්මක්, පන්නරයක් ලැබෙයි කියා මා විශ්වාස කරනවා. ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***'පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ගරු ගයන්ත කරුණාතිලක මහතා]***
*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" - [மாண்புமிகு கயந்த கருணாதிலக்க]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Gayantha Karunatileka.]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
[HON. PRESIDING MEMBER *in the Chair.]*

***1 සිට 5 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகத்திலிருந்து 5ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 1 to 5 ordered to stand part of the Bill.*

*ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.*
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendment.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ නිවැරැදි කර ගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙසට ද මා ඉල්ලා සිටිනවා.

"පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන් වන වර කියවා සම්මත කරන ලදී.*
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා.

### මුලතිව් සහ මන්නාරම දිස්ත්‍රික්ක සඳහා ක්‍රීඩාංගණ
### முல்லைத்தீவு மற்றும் மன்னார் மாவட்டங்களுக்கான விளையாட்டு மைதானங்கள்
### STADIUMS FOR MULLAITIVU AND MANNAR DISTRICTS

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
நன்றி. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ප්‍රශ්නයට උත්තර දෙන ඇමතිතුමා කවුද? ක්‍රීඩා ඇමතිතුමා තමයි මේකට උත්තර දෙන්න ඕනෑ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ක්‍රීඩා ඇමතිතුමා නොමැති නිසා පිළිතුර අපට එවා තිබෙනවා, එතුමාට ලබා දෙන්නය කියා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
උත්තරය දෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

[பி.ப. 6.14]

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பின்வரும் ஒத்திவைப்புவேளைப் பிரேரணையை முன்வைக்கின்றேன்:

> "முல்லைத்தீவு மாவட்டத்தில் நீண்டகாலமாக மாவட்ட விளையாட்டு மைதானம் இன்மையால் விளையாட்டு வீரர்கள் தமது திறமைகளை முழுமையாக வெளிப்படுத்த முடியாமலும் தேசிய போட்டிகளில் திறம்படச் செயற்பட முடியாமலும் இருந்தமையைக் கருத்தில்கொண்டும், முற்றுமுழுதாக யுத்தத்தால் பாதிக்கப்பட்ட இம்மாவட்டத்திற்கு மாவட்ட விளையாட்டு மைதானத்தினை அமைக்க நீண்டகாலமாகக் கோரிக்கை முன்வைக்கப்பட்டு, கடந்த காலப்பகுதியில் முள்ளிவாய்க்காலில் இதற்கான இடம் ஒதுக்கப்பட்டும் இன்றுவரை அதற்கான ஆரம்ப வேலைகளோ ஏனைய வேலைத்திட்டங்களோ முன்னெடுக்கப்படவில்லை. இதனால் முல்லைத்தீவு மாவட்டத்தில் விளையாட்டு வீரர்களின் ஆளுமைகள் தொடர்ந்தும் பின்தள்ளப்படுகின்ற நிலையே தொடர்கிறது. எனவே, குறித்த மாவட்ட விளையாட்டு மைதான ஆரம்ப வேலைகளை ஆரம்பிப்பதற்கான நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும்.
>
> அத்தோடு, மன்னார் மாவட்டத்திலும் பல்வேறு கோரிக்கைகளுக்குப் பின்பும், மாவட்ட அபிவிருத்திக் குழுத் தீர்மானத்திற்கமைவாகவும் மாவட்ட விளையாட்டு மைதானத்திற்கான அனுமதி அமைச்சினால் வழங்கப்பட்டு, அதற்கான வேலைத்திட்டங்களுக்கான நிதிகளும் வழங்கப்பட்டு வேலைத்திட்டமும் விரைவாக முன்னெடுக்கப்பட்டது. 50 வீத வேலைத்திட்டங்கள் முடிவடைந்த நிலையில், தொல்பொருள் திணைக்களம் குறித்த காணியினை பரிசீலனை செய்யவேண்டுமெனக் கூறி, மேற்கொள்ளப்பட்ட வேலைத் திட்டத்தினை ஒரு வருட காலமாக இடைநிறுத்தியதால் வேலைகள் முடக்கப்பட்டு, தற்பொழுது தொல்பொருள் திணைக்களத்தினால் அனுமதி வழங்கப்பட்டு 2 மாதங்களுக்கு மேலாகியும் இதுவரையில் மீள் புனரமைப்பு வேலைகள் ஆரம்பிக்கப்படவில்லை. எனவே, மன்னார் மாவட்டத்திற்கான மாவட்ட விளையாட்டு மைதானத்தினை விரைவாக மீளப் புனரமைப்பதற்கான நடவடிக்கையினை மேற்கொள்ள வேண்டும்."

கௌரவ அமைச்சர் அவர்களே, முல்லைத்தீவு மாவட்டத்தினுடைய விளையாட்டு மைதானம் என்பது மிக மிக முக்கியமாக அந்த மாவட்டத்திலிருக்கின்ற விளையாட்டு வீரர்கள், குறிப்பாக இளைஞர் யுவதிகள் எதிர்பார்திருக்கின்ற விடயமாகும். இந்த விடயம் தொடர்பாகக் கடந்த ஒக்ரோபர் 26ஆம் திகதிய அரசியல் சூழ்ச்சிக்குப் பிறகு, இந்த நாட்டினுடைய பிரதமர் அவர்கள் முல்லைத்தீவு மாவட்டத்தினுடைய மாவட்ட அபிவிருத்தி தொடர்பான கலந்துரையாடல்களுக்கு முல்லைத்தீவுக்கு வந்திருந்தார். அம்மாவட்டச் செயலகத்தில் நடைபெற்ற கூட்டத்தில், முல்லைத்தீவு மாவட்டத்துக்கான மாவட்ட விளையாட்டு மைதானத்தை அமைப்பதற்கு இடம் ஒதுக்கப்பட்டு, அதற்குக் கிட்டத்தட்ட 250 மில்லியன் ரூபாய் தேவையென விளையாட்டுத்துறை அமைச்சினால் மதிப்பீடு செய்யப்பட்டும்கூட, இன்னும் அதன் நிர்மாணப் பணிகளை ஆரம்பிக்க

[ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා]

முடியாத சூழ்நிலை இருக்கிறது. எனவே, அதற்குரிய நிதியை ஒதுக்கீடு செய்வதற்கு உரிய நடவடிக்கைகளை எடுக்கும்படி நான் பிரதம அமைச்சரிடம் கேட்டேன். அதற்கு அவர், "இது தொடர்பில் கவனம் செலுத்தி, உரிய நடவடிக்கைகளை எடுக்கும்படி தான் விளையாட்டுத்துறை அமைச்சருக்குக் கூறுகின்றேன்" என்று உறுதியளித்திருந்தார். ஆனால், அந்த விளையாட்டு மைதானத்துக்குரிய நிதி வரவுசெலவுத் திட்டத்தில் ஒதுக்கப்படவில்லை. 2019ஆம் ஆண்டில் இந்த முல்லைத்தீவு மாவட்ட விளையாட்டு மைதானத்தின் நிர்மாணப் பணிகள் எவ்வளவு நடைபெற முடியுமோ, அதற்குரிய நிதியை மட்டும் விளையாட்டுத்துறை அமைச்சினூடாகப் பெற்றுத்தருவதற்கு நடவடிக்கை எடுக்கும்படி, நான் கௌரவ நிதி அமைச்சர் மங்கள சமரவீர அவர்களை நேடியாகச் சந்தித்து எழுத்துமூலம் கோரிக்கையொன்றை முன்வைத்தேன். அப்பொழுது நிதி அமைச்சர் அவர்கள், "தான் இது தொடர்பாக விளையாட்டுத்துறை அமைச்சரிடம் தெரிவிக்கின்றேன்" என்று கூறினார். அதன் பிறகு, என்னைச் சந்தித்த நிதி அமைச்சர் அவர்கள், "விளையாட்டுத்துறை அமைச்சுக்கு மேலதிக நிதி ஒதுக்கப்படவிருக்கின்றது. அந்த நிதிக்குள் முல்லைத்தீவு மாவட்ட விளையாட்டு மைதானத்தின் வேலைகளையும் ஆரம்பிக்கும்படி நான் விளையாட்டுத்துறை அமைச்சரிடம் கூறியிருக்கின்றேன்" என்று கூறினார். நான் இது தொடர்பாக விளையாட்டுத்துறை அமைச்சரிடம் இரண்டு, மூன்று தடவை கேட்டபோது, "வேலைகள் ஆரம்பிக்கப்படும், வேலைகள் ஆரம்பிக்கப்படும்" என்று கூறுகிறாரே ஒழிய, வேலைகள் ஆரம்பிக்கப்பட்டதாக இல்லை. அந்த மாவட்டத்தின் இளைஞர், யுவதிகளுடைய விளையாட்டுத் திறமைகளை வளர்ப்பதற்கு உடனடியாக அதன் நிர்மாணப் பணிகள் ஆரம்பிக்கப்பட வேண்டும் என்பது அங்கிருக்கின்ற இளைஞர் யுவதிகள் மற்றும் விளையாட்டு வீரர்கள் உட்பட அனைத்து மக்களினதும் கோரிக்கையாக இருக்கின்றது. கௌரவ அமைச்சர் அவர்களே, முல்லைத்தீவு மாவட்ட விளையாட்டு மைதானத்தின் நிர்மாணப் பணிகள் மிக விரைவில் ஆரம்பிக்கப்பட வேண்டும். அப்பணிகள் எப்போது ஆரம்பிக்கப்படும் என்பதை நான் உங்களுடைய பதில் உரையில் எதிர்பார்க்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, மன்னார் மாவட்டத் தினுடைய விளையாட்டு மைதானத்தின் நிர்மாணப் பணிகள் அப்போதிருந்த அரசாங்க அதிபர் திரு. வேதநாயகம் அவர்களுடைய பரிந்துரையின் பேரில் 2011ஆம் ஆண்டு ஆரம்பிக்கப்பட்டன. அரசியல் குழப்பங்களினால் அதன் நிர்மாணப் பணிகள் இழுபறிபட்டு வந்தன. நாங்கள் பாராளுமன்றத்துக்குத் தெரிவு செய்யப்பட்ட பின்பு ஒரு பொதுவான இடம் தெரிவு செய்யப்பட்டு, அதில் அப்பணிகள் ஆரம்பிக்கப்பட்டன. வேலைகள் ஆரம்பிக்கப்பட்டு, கிட்டத்தட்ட 50% வேலைகள் நிறைவடைந்ததன் பின்பு, தொல்பொருள் திணைக்களம் அங்கு பரிசீலனை செய்ய வேண்டும் என்ற ஒரு கோரிக்கையை முன்வைத்தது. சில வேளைகளில் தொல்பொருள் சார்ந்த தடையங்கள் அங்கு இருக்கலாம் என அவர்கள் சந்தேகப்பட்டார்கள். அந்தத் திணைக்களம் அந்தப் பணியினைச் செய்வதற்கு நீண்ட காலம் எடுத்தது. தொல்பொருள் திணைக்களத்தின் பணிப்பாளருடன் நேரடியாகக் கதைத்து அந்த விசாரணைகளை, அந்த நிலத்தைச் சோதனையிடுவதை - பரீட்சிப்பதை முடிந்தளவு விரைவுபடுத் தினேன். அவர்களுடைய அனுமதிக் கடிதத்தைப் பெற்றுக்கொண்டு விளையாட்டுத் திணைக்களத்தின் உதவிப் பணிப்பாளரிடம் நான் நேரடியாகச் சென்று கையளித்தேன். ஆனால், இன்றுவரை அந்த விளையாட்டு மைதானத்தை ஆரம்பிப்பதற்குரிய எந்த நடவடிக்கைகளும் எடுக்கப் படவில்லை. ஒப்பந்தக்காரர்கள் தங்களுடைய பொருட்களை ஏற்றிக்கொண்டு தங்களுடைய இடங்களுக்குச் சென்றுவிட்டார்கள். இந்த இரண்டு விளையாட்டு மைதானங்கள் தொடர்பாக நான் இந்தச் சபையில் கௌரவ அமைச்சர் அவர்களின் கவனத்திற்குக்கொண்டு வருகின்றேன். கௌரவ அமைச்சர் அவர்களே, இந்த விளையாட்டு மைதானத்தின் நிர்மாணப் பணிகளைத் தொடர்ச்சியாக முன்னெடுப்பப்பது தொடர்பிலும் முல்லைத்தீவு மாவட்டத்தில் புதிதாக விளையாட்டு மைதானமொன்றை ஆரம்பிப்பது தொடர்பிலும் இந்த ஒத்திவைப்புப் பிரேரணையின் பதிலுரையில் பதில் வழங்கப்படுமென நான் எதிர்பார்க்கிறேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම.

[பி.ப. 6.21]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நன்றி. வன்னி மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற கௌரவ பாராளுமன்ற உறுப்பினர் சாள்ஸ் நிர்மலநாதன் அவர்களால் கொண்டுவரப்பட்ட இந்த ஒத்திவைப்புப் பிரேரணையை நான் வழிமொழிகின்றேன்; ஆமோதிக்கின்றேன். முல்லைத்தீவு மாவட்டத்தில் ஒரு மைதானம் அமைப்பது சம்பந்தமாக இந்தப் பிரேரணை அமைந்திருக்கின்றது. இவர் இந்த விடயம் சம்பந்தமாக கௌரவ நிதி அமைச்சர் மங்கள சமரவீர அவர்களோடு வரவு செலவுத்திட்டத்திற்கு முன்னர் பிரஸ்தாபித்திருந்தார் என்பது எனக்கும் தெரியும். அவரும் அது தொடர்பான கருத்தாடலைச் செய்திருந்ததை அறியக் கூடியதாக இருந்தது. வட பகுதியில் யுத்தத்தினால் அதிகளவு பாதிக்கப்பட்டதும் இறுதி யுத்தம் நடைபெற் றதுமான ஒரு மாவட்டம்தான் முல்லைத்தீவு மாவட்டம் என்பதைத் தாங்கள் அறிவீர்கள். அந்த அடிப்படையில், யுத்தத்தினால் பாதிக்கப்பட்ட இடங்களுக்கு விசேட கவனம் செலுத்தப்பட்டு, அங்கிருக்கின்ற மக்களின் அபிலாஷைகளை நிறைவேற்ற வேண்டியது அரசாங்கத்தின் தார்மீகப் பொறுப்பாக அமைந்திருக்கின்றது. முல்லைத்தீவு போன்ற மாவட்டங்களில் விளையாட்டுக்களில் மிகவும் சாதுரியமான திறைமைகளைப் படைக்கக்கூடிய இளைஞர், யுவதிகள் காணப்படுகின்றார்கள். அப்படியான ஒரு சூழ்நிலையில், அவர்களுக்கான மைதானத்தை அமைத்துக் கொடுக் கின்றபோது அவர்கள் நிச்சயமாக தேசிய மட்டத்தில் மாத்திரமல்ல, சர்வதேச மட்டத்திலும் இந்த நாட்டுக்குப் பெருமை சேர்ப்பார்கள். அந்தளவுக்குத் திறமைவாய்ந் தவர்களாக அவர்கள் காணப்படுவார்கள். இதுவொரு சாதாரண விடயமாக அமைந்திருந்தாலும்கூட, உளவியல் ரீதியாகப் பார்க்கின் றபோது இளைஞர், யுவதிகளின் உடலில் காணப்படுகின்ற சக்திகள் சரியான முறையில் வெளியேற்றப் படுதற்கு நிச்சயமாக விளையாட்டுத்துறை பயனளிக்கின்றது. அவ்வாறில்லாமல், அந்தச் சக்தியானது தேங்கிக் கிடக்குமாக இருந்தால் அவர்கள் வேறு விடயங்களில், வேறு சிந்தனைகளில் கவனம் செலுத்துவார்கள். கௌரவ பாராளுமன்ற உறுப்பினர் சாள்ஸ் நிர்மலநாதன் அவர்களால் கொண்டுவரப்பட்ட இந்த ஒத்திவைப்புப் பிரேரணைக்கு நிச்சயமாகத் தகுந்த பதில் கிடைக்குமென்று நாங்கள் எதிர்பார்க்கிறோம். இளைஞர், யுவதிகளோடு சம்பந்தப்பட்ட விடயங்களைக் கால இழுத்தடிப்புச் செய்கின்றபோது, அவை அவர்களுக்கு உசிதமான விடயங்களாக அமையாது. அவ்வாறு செய்வது அவர்களின் சிந்தனைகளை வெவ்வேறு

வழிகளில் கொண்டு செல்வதற்கு ஒரு வழிவிடுவதாக அமைந்துவிடும். கடந்த காலத்திலும்கூட, இளைஞர்களுக்கு உரிய வாய்ப்புக்கள் கொடுக்கப்படாமை, இளைஞர்களது எதிர்பார்ப்புக்கள் நிறைவேற்றப்படாமை எனப் பல்வேறுபட்ட தவறுகள் விடப் பட்டன. விளையாட்டுத்துறையில் மாத்திரமல்லாது, அவர்களுக்குரிய தொழில்வாய்ப்புக்கள், அவர்களுடைய உரிமையோடு சம்பந்தப்பட்ட விடயங்கள், அபிவிருத்தி தொடர்பான விடயங்கள் மற்றும் அவர்களுடைய அபிலாஷைகள் சார்ந்த விடயங்கள் போன்ற பல்வேறுபட்ட விடயங்களில் கவனம் செலுத்தாமல் இருந்தமையினால் பாரிய விளைவினை நாங்கள் சந்தித்திருக்கின்றோம். ஆகவே, இந்தச் சாதாரண விடயங்களை நிறைவேற்றிக் கொள்கின்ற விடயத்தில் நாங்கள் விசேடமான கவனம் செலுத்த வேண்டும்.

அதேநேரத்தில், நாங்கள் நன்றி சொல்லவேண்டிய ஒரு விடயமும் இருக்கின்றது. அதாவது, கிளிநொச்சி மாவட்டத்தில் விளையாட்டுத்துறை அமைச்சர்மூலமாக மாவட்ட விளையாட்டு மைதானத்தின் ஒரு பகுதி பூர்த்திசெய்து தரப்பட்டது. அதற்காக நாங்கள் நன்றி சொல்ல விரும்புகின்றோம். அதேபோன்று, இப்படியான பாதிக்கப்பட்ட மாவட்டங்களில் மேலும் கால நீடிப்புக்கள் செய்யாமல் தரமான விளையாட்டு மைதானங்களை அமைத்துக் கொடுப் பதன்மூலமாக இளைஞர், யுவதிகளின் மனங்களில் ஒரு நன்றியுணர்வு ஏற்படுவதற்குரிய வாய்ப்பிருக்கின்றது. பல்வேறுபட்ட மனக்காயங்கள் ஏற்பட்ட நிலையில் காணப்படுகின்ற அந்த இளைஞர், யுவதிகளுக்கு இப்படியான விடயங்களை நாங்கள் செய்து கொடுக்கின்றபோது, அது ஒரு பிரதியுபகாரமாக அல்லது அதை நினைத்து அவர்கள் ஓரளவுக்கு நன்றியுள்ளவர்களாக இருக்க வழிகோலும்.

நான் கிழக்கு மாகாணத்தின் மட்டக்களப்பு மாவட்டத்தைச் சேர்ந்தவன் என்ற அடிப்படையில், நானும்கூட கௌரவ அமைச்சர் அவர்களைச் சந்திப்பதற்கு இரண்டு தடவை அமைச்சுக்குச் சென்றிருந்தேன். துரதிருஷ்டவசமாக அவரைச் சந்திக்கக்கூடிய வாய்ப்பு எனக்குக் கிடைக்கவில்லை. அதன் காரணமாக, நான் சில கோரிக்கைகள் பற்றிய ஆவணத்தை அங்கே அவருடைய இணைப்புச் செயலாளராகச் செயற்படுகின்ற ஒருவரிடம் கொடுத்துவிட்டு வந்திருந்தேன். மட்டக்களப்பு மாவட்டத்திலும்கூட, இதேபோன்று மைதானங்கள் அமைக்கப்படவேண்டிய தேவைகள் இருக் கின்றன. குறிப்பாக, இளைஞர், யுவதிகள் சீர்படுத்தப்படாத நிலங்களில்தான் தங்களுடைய விளையாட்டுத்துறை சார்ந்த பயிற்சிகளைச் செய்கின்றார்கள். சிலவேளைகளில் அந்த நிலங்கள் வயல் நிலங்களாகக்கூட இருக்கின்றன. அவ்வாறான நிலங்கள் சிலவேளைகளில் மாரி காலங்களில் குளங்களாக இருக்கும். கோடை காலத்தில்தான் அவை நிலங்களாக இருக்கும். ஆனால், அந்தப் பிரதேசங்களில் அவர்களுக்குரிய மைதான வசதிகள் ஏற்படுத்திக் கொடுக்கப்படவில்லை. கடந்த காலத்தில் விளையாட்டுத்துறை அமைச்சராக இருந்த கௌரவ தயாசிறி ஜயசேகர அவர்களிடம் சில கோரிக்கைகளை விடுத்தபோது, அதில் சிலவற்றை அவர் நிறைவேற்றித் தந்திருந்தார் என்பதையும் நான் இந்த இடத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றேன். கௌரவ விளையாட்டுத்துறை அமைச்சர் ஹரின் பர்னாந்து அவர்கள்கூட இளைஞராக இருக்கின்றார். யுத்தத்தினால் பாதிக்கப்பட்ட பிரதேசங்களுக்கு இவ்வாறான விளையாட்டு மைதானங்களை ஏற்படுத்திக் கொடுப் பதன்மூலமாக இளைஞர், யுவதிகளின் மனங்களில் நன்றியுணர்வை ஏற்படுத்தக்கூடிய விதத்திலும் அவர்களுடைய விளையாட்டுத் திறன்களை வெளிப்படுத்தக்கூடிய விதத்திலும் சந்தர்ப்பமளிக்க வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன். குறிப்பாக, மட்டக்களப்பு மாவட்டத்தை எடுத்துக்கொண்டால், அங்கே 400 மீற்றர் ஓட்டச் சுவட்டைக்கொண்ட மைதானங்களை அமைக்க வேண்டியிருக்கின்றது. அந்த விசாலமான மாவட்டத்தில் நகரத்தின் மத்தியில் ஒரு மைதானம் காணப்படுகின்றதே ஒழிய, ஏனைய பகுதிகளில் அப்படியான மைதானங்கள் எதுவும் அமைக்கப்படவில்லை. குறிப்பாக, யுத்தத்தில் முழு அளவில் பாதிக்கப்பட்ட படுவான்கரைப் பிரதேசத்தில் மகிழடித்தீவு என்று சொல்லப்படுகின்ற இடத்தில் பாரிய நிலப்பரப்பு இருக்கின்றது. அது ஒரு மைதானமாக இப்பொழுது பயன்படுத்தப்பட்டு வருகின்றது. அந்தப் பகுதியிலிருக்கின்ற இளைஞர், யுவதிகள் விளையாட்டுத்துறை சம்பந்தப்பட்ட தங்களது திறமைகளை, தங்களது புகழை மாவட்ட மட்டத்தோடு அல்லது மாகாண மட்டத்தோடு மழுங்கடித்துக் கொள்ளாமல் தேசிய மட்டத்திலும் சர்வதேச மட்டத்திலும் கொண்டு செல்வதற்கு அந்த இடத்தில் ஒரு நவீனரக விளையாட்டு மைதானத்தை ஏற்படுத்திக் கொடுப்பதற்கு நடவடிக்கைகளை எடுக்கவேண்டுமென்று இந்த இடத்தில் உங்களிடம் கேட்டுக்கொள்கின்றேன்.

வடக்கு, கிழக்கு மாகாணங்களில் பிரதேச செயலக மட்டங்களில் இளைஞர், யுவதிகளுக்காக அதிகளவு நிதியினைச் செலவு செய்யாது விட்டாலும்கூட, சில மில்லியன் ரூபாய் செலவிலாவது மைதானங்களை அமைத்துக் கொடுக்கின்றபோது, இளைஞர்கள் பிழையான பாதையில் செல்லாமல் விளையாட்டுத்துறை சார்ந்த பாதைகளில் செல்வார்கள். அவர்கள் தமது மனதைச் செழுமைப்படுத்திக் கொள்வதோடு, ஆளுமையுள்ளவர்களாக, தலைமைத்துவமுள் ளவர்களாகத் தங்களை வளர்ந்துகொள்வதற்கும்கூட விளையாட்டுத்துறை சார்ந்த பயிற்சிகள் அவர்களுக்கு உதவி செய்யும் என்பதைச் சுட்டிக்காட்ட விரும்புகின்றேன். இப்பொழுது இங்கு கௌரவ விளையாட்டுத்துறை அமைச்சர் அவர்கள் இல்லாதுவிட்டாலும், எங்களது கருத்துக்களை விளையாட்டுத்துறை அமைச்சர் அவர்களிடம் கொண்டு சென்று அதன்மூலமாக ஒரு மாற்றத்தை ஏற்படுத்துமாறு அல்லது தேவையை அல்லது அபிலாஷைகளை நிறைவேற் றக்கூடிய விதத்தில் செயற்பாடுகளை முன்னெடுக்குமாறு இந்த இடத்தில் பதிலளிப்பதற்காக வந்திருக்கின்ற அமைச்சர் அவர்களிடம் கேட்டுக் கொள்கின்றேன். விளையாட்டுத்துறை சார்ந்த விடயம் இளைஞர்கள் அதிகமாக விரும்புகின்ற ஒரு துறையாக இருக்கின்றபடியால், அத்துறை தொடர்பில் இருக்கின்ற பிரச்சினைகள் தீர்க்கப்பட வேண்டும் என்பதைக் கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි. මීළඟට, ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමා.

[අ.භා. 6.28]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවට පිළිතුරු සැපයිය යුත්තේ ක්‍රීඩා අමාත්‍යතුමා වුණත්, එතුමාට මේ වෙලාවේ සභාවට ඒමට අපහසු නිසා, එතුමාව දැනුවත් කරමින් මේ පිළිතුර ලබා දෙන්න කියලා මා වෙත ලබා දී තිබෙනවා. මේ යෝජනාව ඉදිරිපත් කරද්දීත්, ස්ථිර කරද්දීත් අදහස් කිහිපයක් ඉදිරිපත් කළා, ඒ පළාතේ තරුණ -තරුණියන්ගේ ප්‍රයෝජනය සඳහා. ඒ සියලුම කාරණා ගරු ක්‍රීඩා ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්නටත් කටයුතු කරන බව මා සඳහන් කරන්න කැමැතියි.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

විශේෂයෙන්ම එතුමාගේ යෝජනාවේ තිබුණා, මුලතිව් දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය පිළිබඳව. මෙහි ශක්‍යතා වාර්තා සහ සැලසුම් මේ වන විට සකස් කරමින් පවතින බව ඇමතිතුමා දන්වන්න කිව්වා. නමුත්, 2019 වර්ෂයට අවශ්‍ය ප්‍රතිපාදන සීමිත වීම නිසා අදාළ ඉදිකිරීම් ආරම්භ කිරීමට තවමත් නොහැකි තත්ත්වයක් තමයි තිබෙන්නේ. එහෙම වුණත්, 2020 වර්ෂයේදී ප්‍රතිපාදන ලැබුණු වහාම ඉදිකිරීම් කටයුතු සිදු කරන්නට කටයුතු කරන බව ගරු මන්ත්‍රීතුමාට දන්වන ලෙස ක්‍රීඩා ඇමතිතුමා මා වෙත දැනුම් දී තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවේ තිබෙනවා, මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය සම්බන්ධව. මන්නාරම් දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු සිදු කරගෙන යාමේදී, පුරා විද්‍යා වටිනාකමින් යුක්ත පුරාවස්තු හමු වීම හේතුවෙන් ඉදිකිරීම් තාවකාලිකව නවතාලීමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව නියෝග කර තිබෙනවා. ඒත් නැවතත් ඉදිකිරීම් ආරම්භ කිරීමට අමාත්‍යාංශයට අනුමැතිය ලබා දීලා තිබෙන බව ඇමතිතුමා දන්වන්න කියා තිබෙනවා. එසේ වුණත්, ව්‍යාපෘතිය ඉදිකිරීම තාවකාලිකව නතර කිරීම නිසා මිල ගණන් හා සැලසුම් නැවත සකස් කිරීමට අමාත්‍යාංශයට දැන් සිදු වෙලා තිබෙනවා. ඒ නතර කර තිබුණු කාලය ඇතුළත ඇස්තමේන්තු කරපු මිල ගණන්වල වෙනස්කම් ද ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මිල ගණන් සහ සැලසුම් නැවත සකස් කිරීම දැන් අමාත්‍යාංශයට කරන්න සිදු වෙලා තිබෙනවා. මේ හේතුව නිසා සුළු ප්‍රමාදයන් සිදු වෙලා තිබෙන බව අමාත්‍යාංශය පිළිගන්නවා. කොහොම වුණත්, මේ වන විටත් ඉදිකිරීමේ කටයුතුවලින් සියයට 50ක් පමණ අවසන් කරලායි තිබෙන්නේ කියලා එතුමා දන්වනවා.

නව මිල ගණන් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලබාගෙන මේ වන විට විශ්ලේෂණය කරමින් පවතින බවත්, බොහෝ විට 2019 ජූලි -ඒ කියන්නේ ලබන මාසයේ.- මුල් සතිය ඇතුළත ක්‍රීඩා පිටියේ කටයුතු යළි ආරම්භ කිරීමට අපේක්ෂා කරන බවත් ගරු ක්‍රීඩා ඇමතිතුමා ඔබතුමාට දන්වන්න කියලා මේ පිළිතුරේ සඳහන් කර තිබෙනවා.

ඊට අමතරව තව තිබෙන කාරණා සම්බන්ධයෙනුත් අපි එතුමාව දැනුවත් කරලා ඔබතුමාගේ මේ ඉල්ලීම් දෙක රජයක් හැටියට ඉටු කිරීමට අමාත්‍යතුමාගේ අවධානය යළිත් වතාවක් යොමු කරවනවා.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
ගරු ඇමතිතුමනි, හරින් ප්‍රනාන්දු ඇමතිතුමා උත්තර දීලා තිබෙන්නේ, මුලතිව් දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීම 2019 ආරම්භ කරන්න අමාරුයි, 2020 වන කොට කරන්න පුළුවන් කියලා කියන විධියට. නමුත්, ගරු ඇමතිතුමනි, Prime Minister මුලතිව්වලට ආපු වෙලාවේ මම ඉල්ලීම් කළාම, මුලතිව් දිස්ත්‍රික්ක ජනතාව, අදාළ Head of the Department ඉන්න meeting එකේදී පොරොන්දු වුණා, මේ අවුරුද්දේ පටන් ගන්න පුළුවන් කියලා. මේ ජූනි මාසය. මේ අවුරුද්දේ අපට වැඩ කරන්න තිබෙන්නේ, තව මාස 5ක විතර කාලයක්. එතකොට, රුපියල් මිලියන 30ක්, 35ක් ඇති, මේක මේ අවුරුද්දේ පටන් ගන්න. මේ යෝජනාව හරහා මම ඉල්ලීම් කරනවා, රුපියල් මිලියන 35ක් විතර වෙන් කරලා, ඒ වැඩේ පටන් ගන්න කියලා. රජය විධියට අනෙක් වැඩවලට ඔබතුමන්ලා සල්ලි වියදම් කරනවා නේ. හදිසි කටයුත්තක් ආවොත් වියදම් කරනවා. දැන් මේකට ඉඩම වෙන් කරලා අවුරුදු තුනයි. ඒ වාගේම, Prime Minister අපේ දිස්ත්‍රික්කයට ඇවිල්ලා පොරොන්දු වුණා, මේ අවුරුද්දේ පටන් ගන්න පුළුවන් කියලා. නමුත්, ඒක මේ අවුරුද්දේ පටන් ගන්න බැහැ කියලා කියනවා නම්, මේ රජයට ඒක කරන්න බැරිකමක් තිබෙනවා කියලයි ජනතාව කියන්නේ.

එතකොට ඒක Prime Ministerටත් හොඳ නැහැ. ඒ නිසා මා ඉල්ලීමක් කරනවා. ජනාධිපතිවරණයත් ඉදිරියේදී එනවා. ඒ මිනිස්සු ඔක්කෝම බලාගෙනයි ඉන්නේ. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා, ඉදිරියට තව මාස 5ක් විතර තිබෙන නිසා මේ වැඩේ රුපියල් මිලියන 35ක් හෝ වෙන් කරලා දැන් කොහොම හෝ ආරම්භ කරන්න කියලා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඔබතුමා විශේෂයෙන්ම කිව්වේ, මුලතිව් ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් කටයුතු 2020 වර්ෂයේදී ආරම්භ කරනවා කියා කිව්වත් එතකල් ඉන්නේ නැතිව මුල් වියදම දරලා ඒ කටයුතු ආරම්භ කරන්න හෝ කටයුතු කරන්න කියලායි.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
පොඩි ගණනක් තමයි ඕනෑ කර තිබෙන්නේ. ඒ නිසා මේ අවුරුද්දේ එය පටන් ගන්න කියන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු ක්‍රීඩා ඇමතිතුමාට දැනුම් දෙන්න අපට පුළුවන්. ගරු අග්‍රාමාත්‍යතුමා ඒ ප්‍රදේශයට ගිය වෙලාවේත් මේ යෝජනාව ආ බවත්, එතුමාගේත් සහය අරගෙන හෝ එයට මුදල් යොදවන්න කියලා නේ ඔබතුමා කියන්නේ?

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
ඔව්.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
අපි ඒ කාරණය එතුමාට දැනුම් දෙන්නම්. මන්නාරම ක්‍රීඩාංගණයට අදාළ කටයුතු නම් නතර වුණේ, එම කටයුතු කරගෙන යද්දී ඇති වූ පුරාවිද්‍යා ප්‍රශ්නය නිසායි. එසේ නතර වුණාට පසුව ඇස්තමේන්තුව අලුතින් හදන්න සිදු වීම නිසා පොඩි ප්‍රමාදයක් සිදු වෙලා තිබෙනවා. නමුත් ජූලි මාසයේ මුල් සතියේදී ඒ කටයුතු ආරම්භ කරන නිසා ඒ ගැන ඔබතුමාට ගැටලුවක් ඇති වන එකක් නැහැ කියලායි මා හිතන්නේ. මුලතිව් ක්‍රීඩාංගණය ඉදිකිරීමේ කටයුත්ත කොහොම හරි කඩිනමින් පටන් ගන්නයි අවශ්‍ය කියන එක අපි යෝජනා කරමු. එතකොට ලබන අවුරුද්දේ ලැබෙන සල්ලිවලින් ඉතිරි ටික කරන්න පුළුවන්. අපි එම යෝජනාව වැදගත් අදහසක් හැටියට පිළිගන්නවා. අපි එය ගරු ක්‍රීඩා ඇමතිතුමාගේ අවධානයට යොමු කරවනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 6.35ට, අද දින සභා සම්මතිය අනුව, 2019 ජූනි මස 06 වන බ්‍රහස්පතින්දා පූ.භා. 10.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி.ப. 6.35 மணிக்கு பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்திற்கிணங்க, 2019 யூன் 06, வியாழக்கிழமை மு.ப. 10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 6.35 p.m. until 10.30 a.m. on Thursday,06th June, 2019, pursuant to the Resolution of Parliament of this day.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන
නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා
**හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.